

අපගේ දැක්ම හඬායමින්...

වාර්ෂික වාර්තාව 2020

ගුවන්තොටුපළ හා ගුවන්සේවා
(ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

අපගේ දැක්ම
හඬායමින්

වාර්ෂික වාර්තාව 2020

ගුවන්තොටුපළ හා ගුවන්සේවා
(ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

අපගේ දැක්ම හඬායමින්

ක්‍රියාව සමඟම දැක්ම පැවතීම ඕනෑම අවස්ථාවකදී ධනාත්මක ශක්තියක් වනු ඇත. ‘‘තිරසාර ආර්ථිකයක් තුළින් වූ ගෝලීය සම්බන්ධකයේ වඩාත් මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම යන දැක්ම සහිත ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම කුමන අභියෝගයන් මධ්‍යයේ වුවද සමාගමේ දැක්ම කරා පියමැනීම අරඹා ඇත. අපගේ සුවලාභීතාවය සහ නවෝත්පාදනයන් ඕනෑම දුෂ්කරතාවයක් පසුකරයාමට අපට උපකාරී වේ.

කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් 2020 වසර ලොවටම පහසු නොවීය. රාජ්‍ය සීමා මායිම් මගී ප්‍රවාහන සේවා සඳහා විසාදැමීම හේතුවෙන් ගුවන්සේවා කර්මාන්තය විශාල ලෙස පීඩාවට පත් විය. කෙසේ වෙතත්, අපගේ දැක්ම කරා යන ගමනේදී අපේ සුවලාභීතා බව සහ නවෝත්පාදනය තුලින් අපට වර්ධනය කර ගත හැකි අංශ ඉස්මතු කර දැක්වීමෙන් කොවිඩ්-19 හි බලපෑම අවම කර අපට සාර්ථකත්වයක් ගෙන දුන්නේය. කොවිඩ්-19 වසංගතය අතරතුර අපගේ ගමනට බාධාවක් නොවන පරිදි භාණ්ඩ මෙහෙයුම් සඳහා අපි අපේ අවධානය සහ කාලය යෙදවූයෙමු. අපට දකුණු ආසියානු කලාපයේ ප්‍රමුඛ භාණ්ඩ මධ්‍යස්ථානය විය හැකි බව එයින් අවබෝධ විය.

දැන් අපි සිටින්නේ මගීන් සඳහා පමණක් නොව ශ්‍රී ලංකාවේ ආර්ථිකයට තිරසාර සවියක් ගෙන දෙන භාණ්ඩ සඳහා ද මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීමේ ගමනේ ය. ”තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම” වන අපේ දැක්ම කරා යන අපගේ ගමන තවදුරටත් වඩාත් සාර්ථක ලෙස ඉදිරියට යනු ඇත.

දැක්ම

“තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම”

මෙහෙවර

‘‘උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ තෘප්තිමත්භාවය තහවුරු කරන අතරම තරඟකාරී, ආරක්ෂිත ගුවන්සේවා පහසුකම් සහ හොඳම පරිචයන්ගෙන් සහ නවීන තාක්ෂණයෙන් සමන්විත විශිෂ්ඨතම ආගන්තුක අත්දැකීම් සැපයීම’’.

වටිනාකම්

- **හරිත සංකල්පය** - වඩාත් පරිසර හිතකාමී සහ පරිසර විද්‍යාත්මක වගකිව යුතු තීරණ හා ජීවන රටාවකට මඟ පෑදිය හැකි දැනුම හා පරිචයන් අනුගමනය කරයි.
- **නව්‍යතාව** - නව අදහස් හා වඩා කාර්යක්ෂම ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීමෙන් ඵලදායිතාව වැඩි දියුණු කිරීමේ ක්‍රම සොයයි.
- **සුහදශීලී බව** - විධිමත් රාමු ඉක්මවා අපගේ කාර්ය මණ්ඩලය හරහා ජාත්‍යන්තර මට්ටමේ පාරිභෝගික අත්දැකීමක් ලබා දීම තුළින් අපේක්ෂාවන් අතික්‍රමණය කර ඇත.
- **කණ්ඩායම් හැඟීම** - මිනිසුන්ගේ ශක්තිය හා නිපුණතා එක්කර ගැනීම විශ්වාස කර ශ්‍රේෂ්ඨත්වය සාක්ෂාත් කරයි.
- **විනිවිදභාවය** - සාධාරණ හේතුවක් ඇති, හෙයින් අපගේ ක්‍රියාවන් කරුණු වලින් තහවුරු කළ හැකිය.
- **විවෘතභාවය** - නව තත්ත්වයන් සඳහා විවෘත වීම, විවේචනයන් ඉවසීම, කුතුහලය, සවන්දීම සහ සන්නිවේදනය
- **වෘත්තීයමය දක්ෂකම** - අප කරනා කාර්යයන්හිදී මෙන්ම චර්යාවන්හි උසස් ප්‍රමිතීන් අඛණ්ඩව පවත්වාගැනීම.

පටුන

සංක්ෂිප්තව වසර 2020	08
මූල්‍ය සුවිශේෂිතා	10
කාර්යසාධන සුවිශේෂිතා	11
අපගේ ඓතිහාසික සන්ධිස්ථාන	13
ආයතනික ව්‍යුහය	18
සභාපතිතුමාගේ පණිවිඩය	20
උප සභාපතිතුමාගේ පණිවිඩය	24
නායකත්ව කණ්ඩායම	28
සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	30
මෙහෙයුම් අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය	36
ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය	37
අවදානම් කළමනාකරණය අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය	38
විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව	40
ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම	44
කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය	48
මූල්‍ය සමාලෝචනය	60
මානව ප්‍රාග්ධන කළමනාකරණය	66
අවදානම් කළමනාකරණය	74
සාමූහික පාලනය	78
විගණනය කරන ලද මුල්‍ය ප්‍රකාශන	86
විගණකාධිපති වාර්තාවට අදාල පැහැදිලි කිරීමේ සටහන්	121
ආයතනික තොරතුරු	ඇතුල් පිටුව

සංක්ෂිප්තව වසර 2020

2,375,056



ජාත්‍යන්තර මගී සංචලන

20,881



ජාත්‍යන්තර ගුවන්යානා සංචලන

16,370



පියාසර සංචලන

150,075 මෙ.ටො



භාණ්ඩ සංචලන

රු.මි. 7,788



පිරිවැටුම

4,098



සේවකයන් ගණන

රු.මි. 2,504



බදු ගෙවීමෙන් පසු ශුද්ධ අලාභය

507



සේවකයින් පුහුණු කිරීම්

මූල්‍ය සුවිශේෂිතා

	2020 රු. මි	2019 රු. මි	2020/2019 වෙනස	2018 රු. මි	2019/2018 වෙනස
ලාභ සහ අලාභ					
පිරිවැටුම	**7,788**	25,693	-70%	28,739	-11%
ක්ෂය කිරීමට පෙර මෙහෙයුම් වියදම්	**9,562**	10,649	-10%	9,539	12%
පොලී, බදු සහ ක්ෂය කිරීම්වලට පෙර ඉපයුම්	**(1,805)**	15,012	-100%	19,168	-22%
ස්ථාවර වත්කම් ක්ෂය කිරීම	**2,837**	2,841	0%	2,680	6%
ශුද්ධ මූල්‍ය පිරිවැය/(ආදායම)	**(878)**	(3,018)	-71%	6,063	-100%
බදු පෙර ලාභය/ (අලාභය)	**(3,733)**	15,222	-100%	10,458	46%
ආදායම් බදු	**(1,228)**	4,226	-100%	5,145	-18%
බදු පසු ලාභය	**(2,504)**	10,996	-100%	5,313	100%
කොටස්හිමියන් අතර බෙදා හැරිය හැකි ලාභය / (අලාභය)	**(2,504)**	10,996	-100%	5,313	100%
මුදල් ප්‍රවාහ					
ලාභාංශ	**-**	500	-100%	300	67%
දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ	**826**	2,480	-67%	8,167	100%
වර්ෂය සඳහා මුළු ප්‍රාග්ධන වියදම	**2,169**	4,068	-47%	1,747	100%
මූල්‍ය තත්ත්වය					
දෙසැම්බර් 31 දිනට කොටස් හිමියන්ගේ අරමුදල	**36,983**	39,231	-6%	28,479	38%
දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල මුළු ධාරන වටිනාකම	**55,571**	55,300	-0.5%	52,515	5%
දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වත්කම්	**47,645**	52,975	-10%	48,320	10%
දෙසැම්බර් 31 දිනට මුළු ජංගම වගකීම්	**6,202**	7,323	-15%	13,834	-47%

අපගේ දැක්ම හඹායමින් ...

ප්‍රවර්තන වර්ෂයේ ඉදිරිපත් කිරීම් සමඟ අනුකූල වීම සඳහා කලින් වර්ෂයේ සංඛ්‍යා අවශ්‍ය තැන්වල දී යළි සකසා ඇත.

සියලු සංඛ්‍යා වැටයීම් වෙනස්කම්වලට යටත් වේ.

-100% හෝ +100% මඟින් 100% වැඩි විචලනයන් පෙන්වයි.

කාර්යසාධන සුවිශේෂිතා

		2020	2019	2018	2017	2016
මෙහෙයුම් සුවිශේෂිතා						
ජාත්‍යන්තර ගුවන්යානා සංචලන	ගණන	**20,881**	62,195	67,351	62,850	61,637
මගී සංචලන ★	ගණන	**2,375,056**	9,958,688	10,884,028	9,957,502	9,466,248
භාණ්ඩ සංචලන ★★	මෙ.ටො.	**150,075**	259,089	279,559	274,044	248,348
පියාසර සංචලන	ගණන	**16,370**	45,674	43,804	39,413	35,118
දෙසැම්බර් 31 දිනට මුළු සේවක සංඛ්‍යාව	ගණන	**4,098**	4,182	3,836	3,908	3,810
අනුපාත සුවිශේෂිතා						
හිමිකම මත ප්‍රතිලාභ	%	**(7)**	28	19	37	42
බදු පෙර ශුද්ධ ලාභය / (අලාභය) මුළු ශුද්ධ ආදායමට	%	**(48)**	59	36	52	38
බදු පෙර ශුද්ධ ලාභය/ (අලාභය) කොටස්හිමියන්ගේ අරමුදල්වලට	%	**(10)**	39	37	47	42
මුළු ආදායම මුළු වත්කම්වලට	වාර ගණන	**0.08**	0.24	0.29	0.24	0.26
එක් සේවකයෙකුට මුළු වත්කම්	රු.000	**25,187**	25,891	26,286	22,267	18,661
එක් සේවකයෙකුට මුළු කාර්යමණ්ඩල පිරිවැය	රු.000	**1,809**	1,944	1,947	1,644	1,578
එක් යානාවක් හැසිරවීමට මුළු පිරිවැය	රු.000	**727**	235	318	202	216
එක් මගියෙකුට ආදායම	රු.	**3,279**	2,580	2,640	2,085	1,936
එක් මගියෙකුට බදු පසු ලාභය	රු.	**(1,054)**	1,104	488	875	731
එක් සේවකයෙකුට ගුවන්යානා සංචලන	ගණන	**5**	15	18	16	16
ගුවන් යානයකට මගීන්	ගණන	**114**	160	162	158	154
එක් සේවකයෙකුට මගීන්	ගණන	**580**	2,381	2,837	2,548	2,485
තෝලන අනුපාතය	%	**19**	13	20	35	48
මුළු වත්කම් මත ප්‍රතිලාභ	%	**(2)**	10	5	10	10
ලාභදායිතා අනුපාතය	%	**(32)**	43	18	42	38
ප්‍රාග්ධන ඵලදායිතා දර්ශකය	වාර ගණන	**0.10**	0.25	0.29	0.24	0.26
කොටසක ඉපයුම	රු.	**(12,522)**	54,979	26,566	43,574	34,598
ජංගම අනුපාතය	වාර ගණන	**7.68**	7.23	3.49	2.78	2.64
මුළු ආදායමට මුළු වියදම	වාර ගණන	**0.75**	2.04	1.49	1.85	1.52

★ මගී සංචලනයන්හි පැමිණීම, පිටත්වීම, මාරුවීම් සහ මාර්ගස්ථ මගීන් ඇතුළත් වන අතර අභ්‍යන්තර ගුවන් මගීන් ඇතුළත් නොවේ.
★★ ගුවන් භාණ්ඩ සංචලනවලට අපනයන, ආනයන සහ එක් යානයකින් වෙනත් යානයකට මාරුකිරීම් ඇතුළත් වන අතර අභ්‍යන්තර භාණ්ඩ සහ ගුවන් ලිපි ඇතුළත් නොවේ.

අපගේ දැක්ම හඹායමින් ...

ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව 2020



අපගේ ඓතිහාසික සන්ධිස්ථාන

ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම (ගු.ගු.සේ.ස.) 1983 දී සංස්ථාපිත කරන ලද්දේ "ආසියානු කලාපය තුළ වඩාත් කාර්යක්ෂම බවින් සහ සුහදත්වයෙන් යුත් ප්‍රමුඛතම ගුවන්සේවා කේන්ද්‍රස්ථානය වීම" යන දැක්මෙනි. මේ දක්වා අපට වසර 37 ක ඉතිහාසයක් ඇත. අද අපි ලොව පුරා සිටින අපගේ සියලුම පාර්ශවකරුවන් සඳහා අනර්ඝතම සේවාවක් ලබා දෙන්නෙමු.

1932 එක්සත් රාජධානිය සහ ඉන්දියාව අතර ගුවන් තැපැල් සේවාව ලංකාව හරහා දීර්ඝ කිරීමට ලංකා අග්‍රාණ්ඩුකාරවරයා සාකච්ඡා කරයි.

1934 රත්මලානේහි ගහන යාත්‍රාංගනයක් ඉදිකිරීමට ලංකා රාජ්‍ය සභාව තීරණය කරයි.

1936 රත්මලානේ ගහන යාත්‍රාංගනය නිම කර ඇති අතර ලංකා ගුවන් සමාජය මහජනතාවට ගුවන් ගමන් අවස්ථා සලසයි.

1937 පළමු ගුවන් සංචාලන රෙගුලාසි ප්‍රකාශයට පත් කෙරේ. ශ්‍රී ලංකා ලියාපදිංචි ලකුණ දරන පළමු ගුවන් යානා තුන ගුවන් යානා ලේඛනයට ඇතුළත් කරයි.

1938 රත්මලාන ගුවන් තොටුපල (ර.ගු.) විවෘත කරන ලද්දේ පෙබරවාරි 28 දිය. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂවරයා ලෙස පොදු වැඩ අධ්‍යක්ෂවරයා පත් කරන ලදී.

1939 පුත්තලමේ හදිසි ගොඩබෑමක් සිදු කෙරිණි. ගුවන්තොටුපලේ කටයුතු රාජකීය ගුවන් හමුදාව යටතට පත්විය.

1942 දෙවන ලෝක යුද්ධය ආරම්භ වීමත් සමඟම රත්මලාන ලංකාව හරහා ආරම්භ විය.

1945 එක්සත් රාජධානිය - ඕස්ට්‍රේලියාව - 'ලැන්කස්ට්‍රියානු' ගුවන් සේවය

1946 ප්‍රවාහන අමාත්‍යාංශය යටතේ සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. රත්මලාන ගඟන යාත්‍රාංගනය සිවිල්ගුවන් ගමන් සඳහා රාජකීය ගුවන් හමුදාව විසින් පවරා ගන්නා ලදී.



1947 එයාර් සිලෝන් - ජාතික ගුවන් සේවය සන්නිවේදන සහ වැඩ අමාත්‍යාංශය යටතේ පිහිටුවන ලද අතර කොළඹ සිට යාපනය හරහා මදුරාසියට ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කළේය.

1948 ශ්‍රී ලංකාව ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයේ (**ICAO**) සාමාජිකයෙකු ලෙස පත් කරන ලදී.

1950 1950 අංක 15 දරන ගුවන් නාවික පනත ප්‍රකාශයට පත් කරන ලදි. නියමුවන් පුහුණු කිරීම සඳහා ඒයතනයක් පිහිටුවන ලදී.

1955 එයාර් සිලෝන් සමාගම KLM රාජකීය ලන්දේසි ගුවන් සමාගම සමඟ ගිවිසුමකට එළඹුණි.

1959 ජාත්‍යන්තර ගුවන් ගමන් කටුනායකට ගෙන යන ලදී.

1963 කටුනායක ගුවන්තොටුපළ සංවර්ධන වැඩසටහන ආරම්භ කෙරේ. RAF ධාවන පථය කැනඩා රජයේ ආධාර මත මීටර් 1840 සිට මීටර් 3,350 දක්වා පුළුල් කරන ලදී. ප්‍රධාන ගොඩනැගිල්ල වසරකට මගීන් 150,000 ක් රැඳවීම සඳහා ඉදිකරන ලදී.

1967 කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ (බ.පා.ගු.) විවෘත කරන ලදී.

1968 විශාල ප්‍රධාන ගොඩනැගිල්ලක්, ගුවන්යනා හැසිරවීමේ අංගනයක් සහ ගුවන් ධාවන පථයට පිවිසුම් මාර්ග ඉදිකරන ලදී.

1979 ජාතික ප්‍රවාහකයා ලෙස ලංකා ගුවන් සේවය ආරම්භ කළේය. 1979 දී ගුවන්තොටුපළ අධිකාරී පනත ප්‍රකාශයට පත් කර ගුවන්තොටුපළ අධිකාරිය පිහිටුවන ලදී.

1980 ගුවන්තොටුපළ අධිකාරිය විසින් සිවිල් ගුවන් සේවා දෙපාර්තමේන්තුව යටතේ පැවති සිවිල් ගුවන්තොටුපළ මෙහෙයුම් භාරගැණිනි.

1981 ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා කටයුතු සඳහා රජය සතු සමාගමක් පිහිටුවීමට රජය තීරණය කළේය.

1982 ගුවන් නාවික පනත වෙත සංශෝධන ඉදිරිපත් කරන ලදි.

1983 ගුවන් තොටුපළවල සමස්ත සංවර්ධනය, නඩත්තු කිරීම, පරිපාලනය සහ සේවා සැපයීම අධීක්ෂණය කිරීම සඳහා ගු.ගු.සේ.ස. ස්ථාපිත කරන ලදී.

1984 නව ධාවන පථයක්, මගී පර්යන්ත ගොඩනැගිල්ලක්, භාණ්ඩ ගොඩබහාලන සංකීර්ණයක්, පාලක කුලුනු සහ සංඥා සේවා සහ නඩත්තු සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සංවර්ධන වැඩසටහනක් ආරම්භ කරන ලදී.

87/88 සංවර්ධන වැඩසටහනක් අවසන් වූ අතර වාර්ෂික මිලියන් 3.5 ක මගීන් ප්‍රමාණයක් හැසිරවීමේ ධාරිතාවයෙන් යුත් නව ධාවන පථය සහ මගී පර්යන්ත ගොඩනැගිල්ල ආරම්භ කරන ලදී.

1992 ගුවන් භාණ්ඩ බහාලුම් ගම්මානය විවෘත කෙරිණි.

1998 ඩුබායි පදනම් කරගත් එමිරේට්ස් සමාගම විසින් එයාර් ලංකා සමාගම අර්ධ වශයෙන් අත්පත් කර ගැනීමෙන් පසුව "ශ්‍රී ලංකන් ගුවන් සමාගම" ලෙස සන්නාමගත කරන ලදී.

2005 ගුවන් පාලම් අටක්, පුළුල් කළ පර්යන්තය, විවේකාගාර සහ වෙනත් පහසුකම් සමගින් නොවැම්බර් මාසයේදී ගුවන්තොටුපළට සම්පූර්ණයෙන්ම නව මුහුණුවරක් ලැබිණි.

2008 ගු.ගු.සේ.ස. සිය 25 වන රිදී ජුබිලිය සැමරුවේය.

2010 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත පාර්ලිමේන්තුවේදී සම්මත විය. සිවිල් ගුවන් සේවා අධිකාරිය ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු ලෙස ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් සේවා ක්‍රියාත්මක කිරීම සඳහා සහතිකය සහ බලපත්‍රය ගු.ගු.සේ.ස. වෙත නිකුත් කළේය.

2012 සිවිල් ගුවන් සේවා අංශය වසර 100ක සේවා කාලයක් සම්පූර්ණ කළ අතර එහි පළමු ගුවන් යානය 1912 දෙසැම්බර් 7 දින කොළඹ තුරඟ තරග පිටියේදී සිය සාර්ථක ගුවන් ගමන ආරම්භ කළේය.

2013 ශ්‍රී ලංකාවේ දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළ හම්බන්තොට මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ ම.රා.ජා.ගු. මාර්තු 18 දා විවෘත කෙරේ.

2015 ම.රා.ජා.ගු. ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, රජය විසින් ගුවන් සමාගම් සඳහා ලබා ගත හැකි ගුවන් සේවා නව වැදෑරුම් නිදහස සහිත ම.රා.ජා.ගු හි පූර්ණ "විවෘත අහස ප්‍රතිපත්තියක්" ප්‍රකාශයට පත් කළේය.

2017 බ.ජා.ගු. හි ධාවන පථය "එෆ්" කේත අනුකූලතාවයට උසස් කරන ලදි. ධාවන පථයේ පළල මීටර් 60 සිට මීටර් 75 දක්වා පුළුල් කිරීමෙන් A380 ගුවන්යානාවන්ට බහාලිය හැක.

2018 මඩකලපුව ගුවන්තොටුපළ (ම.ජා.ගු.) මාර්තු මාසයේදී සිවිල් මෙහෙයුම් සඳහා නැවත විවෘත කරන බව ප්‍රකාශ කරන ලදී.

2019 යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ (යා.ජා.ගු.) නැවත විවෘත කිරීමෙන් ගු.ගු.සේ.ස. සිය ජාත්‍යන්තර ගුවන්තොටුපළ මෙහෙයුම් ජාලය ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය දක්වා ව්‍යාප්ත කර තිබේ.

2020 බ.ජා.ගු. 2 වන පර්යන්තය හි මුල් ගල තැබීමේ උත්සවය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අගමැති, ගරු මහින්ද රාජපක්ෂ සහ ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අතිගරු අකිරා සුගියමා ගේ පැමිණීමෙන් 2020 නොවැම්බර් 18 දින චාර්ත්‍රානුකූලව පැවැත්විණි.

ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම ආයතනික ව්‍යුහය



"වෛද්‍ය සේවා ඒකකය" ගුවන් තොටුපළ කළමනාකරණ අංශය යටතේ තබා ඇත

සභාපතිතුමාගේ පණිවිඩය

හිතවත් පාර්ශවකරුවනි,

වාසනාවන් මිශ්‍රවූ අභියෝගාත්මක 2020 වසර සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම ගැන මම ඉතාම සතුටු වෙමි. අපි වසර ආරම්භ කළේ පෙර නොවූ විරූ අභියෝග සමඟිනි. කෙසේ වෙතත්, සියලුම පාර්ශවකරුවන්ගේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අපි අපේ උපරිමය සිදුකළෙමු.

2020 වසරේ සැකෙවින්

නව වසර උදාවීමත් සමඟ චීනයේ වුහාන්හි නියුමෝනියා රෝගය වැළඳුණු පොකුරු සමූහයක් සොයාගෙන ඇති බවට වාර්තාවක් ලැබුණු විට, මෑත ඉතිහාසය තුල ලෝකය මුහුණ දුන් දරුණුතම වසංගතයකට මුහුණ දෙමින් සිටින බව ලෝකය පුරා සිටින කිහිපදෙනෙකු තේරුම් ගත්හ. නමුත් ගුවන්සේවා කර්මාන්තයට විශාල අභියෝගයක් එල්ල වන බව ගුවන්සේවා විශේෂඥයින් දැන සිටි අතර, කොවිඩ්-19 වෛරසය මිනිසාගෙන් මිනිසාට සම්ප්‍රේෂණය වීමේ අවදානම දරාගැනීමටද සුදානම් විය. ශ්‍රී ලංකාව මාර්තු මාසයේදී සම්පූර්ණයෙන්ම හුදෙකලා කිරීමත් සමඟම, ඉතා වැදගත් ආදායම් මාර්ගයන් වූ අපගේ ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් සහ ගු.ගු.සේ.ස. ජාලය යටතේ තිබූ දේශීය ගුවන්තොටුපළවල්වල පැමිණීමේ පර්යන්තයන් අපි වසා දැමුවෙමු. මේ අනුව, සමාගමට දුෂ්කර වසරක් ආරම්භ විය.

වසංගතය මගී පර්යන්තයේ මෙන්ම අපගේ ප්‍රධාන ගුවන්තොටුපළ වන බ.ජා.ගු. හි භාණ්ඩ ප්‍රවාහන මධ්‍යස්ථානයේ තදබදයට මුහුණ දීමේ බර අපෙන් අඩු කළේය. නමුත් එය අපව දැඩි මූල්‍ය අර්බුදයකට ඇද දැමූ අතර, අපගේ සාමාන්‍ය සංවර්ධන උපාය මාර්ග වෙනුවට පැවැත්ම සහ ප්‍රතිසාධන උපාය මාර්ග කෙරෙහි පූර්ණ අවධානය යොමු කරන ලෙස අපට දැඩි පීඩනයක් එල්ල කළේය. ප්‍රතිසාධනය, මිලකරණ ව්‍යුහයන්, කඩිසර වැඩ, නවෝත්පාදන ආදායම් ආකෘති ආදිය තුළින් ව්‍යාපාරයේ බොහෝ වෙනස්කම් ඇතිවිය. රු.බිලියන 2.5 ක පෙර නොවූ විරූ අලාභයකින් වසර අවසන් විය. අභියෝගාත්මක ව්‍යාපාරික තත්ත්වයන් සහ සේවා ලබා දීමේ ප්‍රමිතීන් සඳහා වූ නව ඉල්ලීම් හේතුවෙන් අපි ආයතනයක් වශයෙන් ඉගෙනුම් වක්‍රය ඉහළ නංවා ගත්තෙමු. වඩාත් හොඳ මාර්ග අනුගමනය කරමින් ශක්තිමත්ව ගොඩනැඟීම සඳහා එය අපව ප්‍රබෝධමත් කළේය.

සෞඛ්‍යය විසින් නිර්වචනය කරන ලද පරිච්ඡේදයක්

වසර ආරම්භ වූයේ ගෝලීය සංචාරක සීමා කිරීම්, ගුවන් ගමන් තහනම් කිරීම් මෙන්ම සංචාරයට පෙර සහ පසු සෞඛ්‍ය පරීක්ෂණ, වෛරසයට විරෙහිව සටන් කිරීම සඳහා ගනු ලැබූ අනෙකුත් පියවර සමඟිනි. තවද එම උභතෝකෝටිකය අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් ද පැවතිණි. ගුවන්සේවා මෙරටට පිළිගැනීමේදී මෙන්ම මගීන්ට ගුවන්තොටුපළට / පිටතට පියාසර කිරීමට අනුමත කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටි කොවිඩ් 19 වැළැක්වීමේ කාර්ය සාධක බලකාය විසින් සළකුණු තබා ගත් එක් වැදගත් කේන්ද්‍රස්ථානයක් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, රට තුළ සහ රට තුළට පියාසර කරන ගුවන්සේවා ජාලයෙන් ආවරණය වන රටවල් තුළ පවතින වසංගතයේ අවදානම් මට්ටම පදනම් කර ගනිමින් ගුවන් සමාගම් සහ මගීන් විසින් අනුගමනය කළ යුතු නීති රීති හා ක්‍රියාපටිපාටි අඛණ්ඩව සංශෝධනය කරන ලදි.

සමාලෝචනය කරන ලද වර්ෂයේ, දින 14ක් තුළ සංචාරක ඉතිහාසය, එන්නත් කළ, එන්නත් නොකළ වැනි සාධක මත ගුවන් සමාගම් විසින් මගීන් වෙන්කිරීමේ නව මිණුම් දඬු යෙදීම දක්වා ද දේශසීමා හරහා ගමන් කිරීමේදී ආපසු හැරවිය නොහැකි සීමා මෙන්ම උපරිම මගීන් ප්‍රමාණයන් දක්වා ඉහළ ගිය මිණුම්ද කර්මාන්තය ක්‍රියාත්මක තුළ විය. ලොව පුරා සිටින සංචාරකයින්ගේ විශ්වාසය ගොඩනැගීම සඳහා ගුවන්තොටුපළවල සෞඛ්‍ය හා ආරක්ෂක යාන්ත්‍රණ තිබීම අවශ්‍ය විය. ICAO හි සිවිල් ගුවන් සේවා ප්‍රතිසාධන කාර්ය සාධක බලකායේ (CART) මගී හා භාණ්ඩ සැකසීමේ ප්‍රතිසාධන මාර්ගෝපදේශ අනුගමනය කරමින් ගුවන්තොටුපළ හරහා වෛරස් සම්ප්‍රේෂණය අවම කිරීමේ සෑම පියවරක්ම අපි අනුගමනය කළ අතර ගුවන්තොටුපළ ජාත්‍යන්තර කවුන්සිලය (ACI) විසින් සිදු කරන ලද වසර 2020 සෞඛ්‍ය ප්‍රතිනය සඳහා අපි අයදුම් කළෙමු. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ACI හි සාමාජික ගුවන්තොටුපළ 1,900 කට වැඩි ප්‍රමාණයක් අතරින් වරලත්භාවය පිළිබඳ සහතිකය ලබා ගත් ලොව ප්‍රථම ගුවන්තොටුපළ 200 අතරට එක් වීමට 2021 ජනවාරි මාසයේදී බ.ජා.ගු. හැකිවිය.

ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් පසුගිය කාලයේ හඳුසි අවස්ථා මාරාන්තික වෛරසයන් ලෙස ප්‍රකාශයට පත් කරන ලද සාර්ස්, එව්වන් එන් වන්, මර්ස්, ඉබෝලා ආදී තත්ත්වයන්හි සිටම දේශසීමා හරහා තරණයවීමේ අවදානම අවම කිරීම සඳහා ගුවන්තොටුපළ හඳිසි සැලසුම් යටතේ අනිවාර්ය අංගයක් වන මහජන සෞඛ්‍ය හඳිසි සැලසුම් කටුනායක සහ මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපළ දෙකේම ක්‍රියාත්මක විය. 2020 ජනවාරි වන විට චීනයේ වුහාන්හි වාර්තාකරණයත් සමඟ සියළුම මහජන සෞඛ්‍ය හඳිසි සැලසුම් පියවර ක්‍රියාත්මක කිරීමෙන් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් පූර්ණ ලෙස සීරුවෙන් තැබිණි. ගුවන්තොටුපළ හඳිසි සැළසුම් මඟින් අපගේ සේවකයින් විවිධ ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් හා හඳිසි වෛද්‍ය සැලසුම් සක්‍රීය කිරීමෙන් විවිධ හඳිසි අවස්ථා වලට ප්‍රතිචාර දැක්වීමේ සූදානම පරීක්ෂා කළ අතරම එමඟින් ඇති වූ අවදානමට ප්‍රතිචාර දක්වමින් මෙහෙයුම් කාර්යක්ෂමව මෙහෙයවීමට අපට හැකි විය.

පුනර්ජීවනය කලදැක්ම

වසර තුළ ගුවන්තොටුපළේදී සිදු කරන ලද වෛද්‍ය පරීක්ෂණ වල නව පියවරයන් සමඟ ගුවන්තොටුපළේ මගී ගමනට සම්බන්ධ වූ අතරමැදි පාර්ශවකරුවන්ගේ සංවිධාන සංඛ්‍යාව පුළුල් වූ අතර නිරෝධායනය සඳහා සිදු කළ යුතු මඟීන් වෙන් කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව සෘජුවම සම්බන්ධ විය. ශ්‍රී ලංකාව හා ගෝලීය සබඳතාවන්හි සුරක්ෂිත බව සහතික කිරීම සඳහා සියලු පාර්ශ්වයන්හි සහායයෙන් නැවත අර්ථ දක්වා ඇති හා පැහැදිලිව නිර්ණය කරන ලද නව ක්‍රියාවලීන් සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) ක්‍රියාත්මක විය.

ඉදිරිය පැහැදිලි නොවූ අවිනිශ්චිතතාවයට පත් වූ අපගේ බදු කුලී ගෙවින්නන්ගේ අපහසුතා ගු.ගු.සේ.ස. අප විසින් භාර ගත් අතර ඔවුන්ට කුලී අනුග්‍රාහක ගාස්තු මත සහ සහන ලබාදෙමින් සිය මෙහෙයුම් පිරිවැය අඩු කිරීම වෙනුවෙන් සිය වෙළඳසැල් වල මෙහෙයුම් වේලාවන් කලින් නියම කළ සීමිත පැය ගණනකට සක්‍රීයව පැවතුණි. පෙර නියම කළ සීමිත පැය ගණනකට සක්‍රීයව පවත්වාගැනීමට පරිමාව පදනම් කරගත් ගැලපීම් සහිතව සහන කාලය 2021 දී තවදුරටත් දීර්ඝ කිරීමට සැලසුම් කෙරෙමින් පවතී.

ගුවන්සේවා කර්මාන්තයේ මෙන්ම ආයතනික ප්‍රතිසාධන සැලසුම් සංචාරක ව්‍යාපාරය සහ ගුවන්සේවා පොකුරු පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් සකස් කරන ලද අතර එය අවසන් වීමට පෙර සෞඛ්‍ය අංශය සමඟ තහවුරු කරන ලදී. වසංගතය හේතුවෙන් මතුවූ පෙළඹ ආරක්ෂිත බුබුලු යාන්ත්‍රණය යටතේ මගී සුවපහසුව, ආරක්ෂාව සහ කාර්යක්ෂමතාවය සැලකිල්ලට ගනිමින් ගුවන්තොටුපළෙන් ආරම්භයේ සිට අවසානය දක්වා ගමන් සිතියම්කරණය පරීක්ෂා කරන ලදී.

ම.රා.ජා.ගු. ලෙස හඳුන්වන ශ්‍රී ලංකාවේ දෙවන විශාලතම ජාත්‍යන්තර ගුවන්තොටුපළ වසංගත වාතාවරණය මධ්‍යයේ වුවද 2020 දෙසැම්බර් මස සිට පෙළඹ ආරක්ෂිත බුබුලු යටතේ සැලකිය යුතු මගීන් ගණනක් සහිත ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් යානා, නාවිකයින් මෙන්ම මානුෂීය ආධාර ඇතිව පැමිණෙන ගුවන් යානා අභිලාෂකාමී ව්‍යාපාර සැලැස්මක් මත දිවෙන සංචාරක නියමු ව්‍යාපෘතිය යටතේ ආරම්භ කෙරිණ. සත්‍යය වශයෙන්ම, ගුවන්තොටුපළ සමුදු කර්මාන්තයේද අත්‍යවශ්‍ය අංගයක් බවට පත් කිරීම තුළින් මුහුදු කාර්ය මණ්ඩල මාරුවීම් සඳහා කැමති ගමනාන්තයක් ලෙස යාත්‍රා හිමියන් ම.රා.ජා.ගු. තෝරා ගත් බැවින් නාවිකයින්ගේ ආගමනය වේගවත් විය.

මෙම පසුබිම තුළ, අපගේ මෙහෙවරෙහි තීරණාත්මක කර්මාන්තය තුළ අපගේ දැක්ම නැවත පණ ගැන්වුණු වසරක් ලෙස අපි 2020 වසර සලකමු.

මූලික කරුණු ස්ථාපනය

අපගේ ව්‍යාපාරික ආකෘතීන් නැවත නිර්වචනය කරමින් මූලික කරුණු යළි සකසන ලෙසට අපට මෙම වසර අභියෝග කළේය. වසංගත කාල වකවානුවේ ව්‍යාපාරික සන්දර්භය තුළ සක්‍රීය වන ගුවන්තොටුපළ ආයතනික සැලැස්ම හරහා ආරම්භ වන අපගේ වාර්ෂික ව්‍යාපාර සැලසුම් අපි සකස් කළෙමු. සෑම අංශයකින්ම පාහේ වියදම් අඩු කර ගැනීමට සහ මෙහෙයුම් කටයුතු ලිහිල් කිරීමට අවශ්‍ය උපදෙස් ලැබුන අතර ඒවාට වාසිදායක ප්‍රතිචාර ලැබුණි. දැනටමත් පවතින විගණන හා කළමනාකරණ කමිටුවට අමතරව අපගේ පාලන ව්‍යුහය තවත් මණ්ඩල අනුකමිටු හයක් හඳුන්වා දීමෙන් අපගේ තීරණ ගැනීමේ ආකෘතිය අපි ශක්තිමත් කළෙමු. මෙම වාර්තාවේ සාමූහික පාලනය සමාලෝචනය මෙන්ම අනු කමිටු අධ්‍යක්ෂවරුන් විසින් නිකුත් කරන ලද ප්‍රකාශයන් මඟින් යාන්ත්‍රණය මෙන්ම එක් එක් කමිටුවේ කටයුතු පිළිබඳව තොරතුරු ලබා දෙනු ඇත.

අපගේ පිරිවැය ව්‍යුහයේ සේවකයින්ගේ වියදම ඉහලම වුවත්, වෙනත් බොහෝ ආයතන විසින් අනුගමනය කරන ලද පිරිවැය ඉතිරි කිරීමේ පියවරයන්ට වෙනස්ව යමින්, ගු.ගු.සේ.ස. තුළින් එක් සේවකයෙකුටවත් තම ජීවනෝපාය අහිමි නොවන්නට අපි වග බලා ගත්තෙමු. සේවා විශිෂ්ටත්වය ලබා දීමේ නව ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කරන ලෙස ඉල්ලා සිටීමට පෙර අභ්‍යන්තර පාරිභෝගිකයා තෘප්තිමත් විය යුතුයි යන විශ්වාසය මත අපි ඉදිරියට ගියෙමු.

අතිමහත් මූල්‍ය බරකට යටත් වී ඇති ගුවන් සමාගම් සඳහා අපගේ සහයෝගය ලබා දීමේ මාධ්‍යයක් ලෙස අපි ම.රා.ජා.ගු. සඳහා ගුවන්තොටුපළ ගාස්තු නිදහස් කිරීම අඛණ්ඩව ඉදිරියට ගෙන ගියෙමු. ගු.ගු.සේ.ස. විසින් මෙම මිල අඩු කිරීමේ උපායමාර්ගය රටේ දෘෂ්ටිකෝණයෙන් පරිපූර්ණව අධ්‍යනය කළ අතර, මෙම අත්හැරීම තුළින් ගු.ගු.සේ.ස. විසින් ලැබූ ආදායම් අහිමිවීමට වඩා රටට සෘජු හා විකුව ආර්ථික ප්‍රතිලාභ ලැබෙන බව පිළිගැණිනි.

ගුවන් ගමනාගමන සංඛ්‍යාලේඛන සහ විවිධාංගීකරණය නොවන ආදායම් ආකෘතිය මත අපි තවදුරටත් යැපීම මත අප අභියෝගයට ලක් වූ අතර සාම්ප්‍රදායික නොවන ඉපයීම් ප්‍රභවයන් තුළින් අපට සේවය කළ හැකි විකල්ප ගනුදෙනුකරුවන් මෙන්ම ව්‍යාපාරික කොටස් ද හඳුනා ගැනීමට අපි කටයුතු කළෙමු.

අනාගතවාදී ධාවකය

දේශසීමා හරහා පියාසර කිරීමේ අවශ්‍යතා හා ඕනෑකම් වර්තමාන සුවිශේෂී වාතාවරණයන් යටතේ යටපත් වී ඇති අතර, රටවල් සාමාන්‍ය තත්ත්වයට පත්කරමින් විවෘත කිරීමේ විශ්වීය උත්සාහය සමඟ නුදුරු අනාගතයේ දී වත්මන් උදාසීන තත්ත්වය අතුගා දමනු ඇතැයි ගුවන්සේවා කර්මාන්තය දිගු කාලීනව අපේක්ෂා කරමින් පවතී.

මෙම අදහස පෙරදැරිව 2020 මාර්තු මාසයේදී අපගේ ප්‍රධාන ගුවන්තොටුපළ වන බ.ජා.ගු. මගීන් හැසිරවීමේ ධාරිතාව මිලියන 9 කින් පුළුල් කිරීම සඳහා දෙවන මගී පර්යන්තය ඉදිකිරීමට අපි ජපන් ජාත්‍යන්තර සංස්ථා ඒජන්සිය (JICA) සමඟ ගිවිසුම් අත්සන් කිරීමට ඉදිරිපත් වූයෙමු. වර්ෂය ආරම්භයේදී ක්‍රියාත්මක වෙමින් තිබූ අපගේ අනෙකුත් ප්‍රධාන ප්‍රාග්ධන ව්‍යාපෘති කිසිදු වෙනසක් නොකර අපි කරගෙන ගියෙමු. කෙසේ වෙතත්, ප්‍රාග්ධන වියදම් අඩු කිරීමේ අරමුණින් සියළුම ප්‍රාග්ධන ව්‍යාපෘතිවලට ප්‍රමුඛතාවය දෙනු ලැබුවේ එහි ප්‍රගතිය සහ ව්‍යාපාරික විවේචනාත්මකභාවය මතය. එම නිසා, සමස්ත ප්‍රාග්ධන වියදමෙන් 27% ක් ප්‍රමුඛතාවයෙන් ඉවත් කර සංවිධානයේ ද්‍රවශීලතා පිහිටීම මත පදනම්ව අවසාන අදියරේදී නැවත සක්‍රීය කිරීම සඳහා අත්හිටුවා ඇත.

මගී ප්‍රවාහන හා භාණ්ඩ ප්‍රමාණය වැඩි දියුණු කිරීම සඳහා පුළුල් පාරිසරික පද්ධතියක් තුළ එහි හැකියාවන් ප්‍රයෝජනයට ගැනීමේ අරමුණින් ම.රා.ජා.ගු. සඳහා වූ ගුවන්සේවා සාකච්ඡා ද අපි සක්‍රීය කළෙමු. කොවිඩ්-19 හරහා ගුවන් සහෝදරත්වයේ විශ්වාසය දිනාගැනීමට යම් බලපෑමක් ඇතිවුවද යටිතල පහසුකම් හා සේවා සැපයීම් වල කැපී පෙනෙන දියුණුවේ ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචනය කළ වර්ෂයේදී ගුවන් ගමනාගමන සංඛ්‍යාලේඛන වැඩිදියුණු විය. සමහර දකුණු ආසියානු ජාත්‍යන්තර ගුවන් සමාගම් සහ දේශීය ගුවන්සේවා සමඟ සම්බන්ධ වීම කෙරෙහි ද ර.ගු. අවධානය යොමු කළ අතර දැනටමත් ස්ථාපිත වෙළඳපල ශක්තිමත් කිරීම හැරුණු විට පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්විණි. මගී ගමනාගමනය වෙනුවෙන් යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මඩකලපුව දේශීය ගුවන්තොටුපළ වෙනුවෙන් සකස් කර තිබූ දිගු කාලීන සැලසුම් කාලෝචිත තීරණයක් ලෙස දැනට අත්හිටුවා ඇත.

අගය කිරීම

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සෑම අතින්ම අපේ ජාතියේ සහ සංවිධානයේ ධෛර්යය අපි දුටුවෙමු. ගුවන් සේවා ශ්‍රී ලංකාවේ අත්‍යවශ්‍ය සේවාවක් ලෙස ලැයිස්තු ගත කර ඇති හෙයින්, අපේ සේවකයින් ඉදිරි පෙළ සේවාවන්හි මෙන්ම විවිධ ක්ෂේත්‍ර වල කාර්යයන්හි නියුතුවූවන්ද සැලකිය යුතු සෞඛ්‍ය අවදානමක් දැරූ අතර අනෙක් සේවකයින් වටිනාකම් දාමයේ හරස්කඩ සම්බන්ධතාවය නොවෙනස්ව පවතින බවට සහතික විය. ඔවුන්ට අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවෙන් අපගේ හෘදයාංගම ස්තූතිය පිරිනමමි.

බලවත්, අන්තර් ක්‍රියාකාරී සහ දිදුලන භූමිකාවන්හි නියැලෙමින් සිටි අපගේ කොටස් කරුවන්ට ඔවුන්ගේ විශිෂ්ඨ සහයෝගය වෙනුවෙන් ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

සියලු උපායමාර්ගික හා මෙහෙයුම් කටයුතු සඳහා නියමාකාරයෙන් සහභාගී වූ අධ්‍යක්ෂක මණ්ඩලය මෙතෙක් සිදු වූ සියලු දේ පිටුපස අපගේ ගාමක බලවේගය විය. ඔවුන් ගැන සංවිධානයේ කෘතඥතාව පළ කිරීමට ද මම කැමතියි. රජයට බරක් නොවී දිගුකල් පවතින ආයතනයක් වීමට අපට උපකාර වූ ශක්තිමත් සංචිත ප්‍රදානය කළ ආයතනයට පෙර සිටි සියලුම සභාපතිවරුන්ට සහ අධ්‍යක්ෂක මණ්ඩලයට සහ සමාගමේ හිටපු සේවකයින්ට විශේෂ ස්තූතිය පිරිනැමේ.

අපේ සංවිධානය භාරව සිටින කැබිනට් ඇමතිවරයා සහ රාජ්‍ය අමාත්‍යවරයා අදාළ සියලු ව්‍යාපාරික හා පරිපාලනමය තීරණ වලදී අප සමඟ එක්වී කඩිනමින් පියවර ගැනීම පිළිබඳ ගෞරවය ලැබිය යුතුයි. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා රටේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ මූලිකත්වය දරමින් ගුවන්සේවා කර්මාන්තය මෙන්ම අපේ ආයතනය ද ආර්ථික වර්ධන ධාවකයේ කොටසක් ලෙස සැමවිටම සැලකූ අතර එම පදනම මත අඛණ්ඩව කටයුතු කළේය. වත්මන් වාතාවරණය යටතේ ගුවන්සේවා සඳහා හොඳම යෙදුම ඔහු නියම කළ අතර එම නායකත්වය ගැන අපි ඇත්තෙන්ම විශ්මයට පත්වීමු.

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc
සභාපති
2021 අගෝස්තු 10

උප සභාපතිතුමාගේ පණිවිඩය

ගු.ගු.සේ.ස. 2020 වර්ෂයේදී ක්‍රියා කළ ආකාරය පිළිබඳව ඔබට ලිඛිතව දැනුම්දීමට හැකියාව ලැබීම ගැන මම ඉතාමත් සතුටු වෙමි.

අපේ කර්මාන්ත ව්‍යාපාරයේ ඉතාමත් අභියෝගාත්මක යුගයක සිටියදී, 2020 වර්ෂය සඳහා ගු.ගු.සේ.ස. හි කාර්ය සාධනය ගැන මෙනෙහි කිරීම සතුටට කරුණකි. මෙම කොවිඩ් කළමනාකරණය සඳහා පරිපූර්ණ හා ඵලදායී දායකත්වයක් ලබා දෙමින් මෙම දුෂ්කර කාල පරිච්ඡේදයේදී අප සමඟ සිටි අපගේ කර්මාන්තයේ හවුල්කරුවන්, සෞඛ්‍ය හා හමුදා වෘත්තිකයින්, අපගේ කාර්ය මණ්ඩල සාමාජිකයින්, බාහිර ගනුදෙනුකරුවන් සහ අප සමඟ සිටි අපගේ සගයින්ට මම මුලින්ම ස්තුති කළ යුතුයි. ඔබ අපේ වත්කම් හා ධෛර්යයයි.

අපේ ශක්තිය ... අපේ කාර්ය මණ්ඩලය ...

ගු.ගු.සේ.ස. සෑම තැනකම සිටින වසංගතය හේතුවෙන් පීඩාවට පත් වූ සිය කාර්ය මණ්ඩලය සඳහා විශිෂ්ට සෞඛ්‍ය හා ආරක්ෂිත ප්‍රතිපත්ති පවත්වා ගෙන යන අතර සියළුම සහයෝගය ලබා දී ඇත. තවද, කොවිඩ්-19 වැළැක්වීම සඳහා බොහෝ ගුවන්තොටුපළ සේවකයින්ට එන්නත් ලබා දීමට ගු.ගු.සේ.ස. කටයුතු යොදා ඇත.

සංවර්ධන ධාවකය

අපගේ සියලුම ගුවන්තොටුපළවල් වලින් අඩු මගීන්, භාණ්ඩ හා ගුවන් යානා සංචලනය පෙන්නුම් කර ඇති අතර, අපි කිසිදු හානියක් නොවන පරිදි උපරිම සැපයීමක් ලබාදීම වෙනුවෙන් අපගේ අභ්‍යන්තර පාරිභෝගිකයින් සහ එහි ශක්තිය පවත්වාගෙන ගියෙමු. වර්තමාන පසුබෑම පෙර නොවූ විරූ නමුත් වසංගත තත්ත්වය සමනය වූ විගස ගුවන් මගීන්ගේ ඉල්ලුම නැවත ඉහළ යනු ඇතැයි අපට දැඩි විශ්වාසයක් ඇත. මේ හේතුව නිසා, කර්මාන්තයට සහ සමාජයට අවශ්‍ය සියළුම ආරක්ෂාව සේවා මට්ටමින් සපුරාලමින්, කිසිදු මිනිත්තුවක ප්‍රමාදයකින් තොරව අනාගත ඉල්ලීම් සපුරාලීම සඳහා අපගේ දිගු කාලීන සංවර්ධන සැලසුම් අපි පවත්වාගෙන යන්නෙමු.

ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව 2020

අපගේ දැක්ම හඹායමින් ...

බ.ජා.ගු. හි පළමු පර්යන්තය

කොවිඩ්-19 හේතුවෙන් ගුවන්සේවා කර්මාන්තයට බාධා ඒල්ල වුවද, ගු.ගු.සේ.ස. අපගේ දිගු කාලීන දැක්ම තුළින් අපගේ ගුවන්තොටුපළ කර්මාන්තයේ උසස් ප්‍රමිතීන්ට අනුකූලව සංවර්ධනය කර කළමනාකරණය කිරීමේ අවධානයෙන් අප දුරස්ථ වී නැත.

2020 දී ආපසු ගු.ගු.සේ.ස. ගුවන්තොටුපළ සංවර්ධන වැඩසටහන අඛණ්ඩව කරගෙන ගිය අතර අපගේ සියලු ව්‍යාපෘති වල සැලකිය යුතු ප්‍රගතියක් ලබා ඇත. වැසි ජල අපවහන පද්ධතිය වෙනස් කරමින් මිනුවන්ගොඩ මාර්ගය මංතීරු හතරක් දක්වා වැඩි දියුණු කිරීමෙන් ගුවන්තොටුපළ ප්‍රවේශ පද්ධති සංවර්ධනය කිරීමේ පළමු අදියර අපි සම්පූර්ණ කර, ඒකාබද්ධ වාණිජමය සංවර්ධනයක් වන පිටත්වීමේ මහජන ආලින්දය අවසන් කළෙමු. බ.ජා.ගු. මගී පර්යන්තයට හොඳින් සම්බන්ධ වන පරිදි වර්ග අඩි 20,000 ට වැඩි ප්‍රදේශයේ වෙළඳ, ආහාර සහ විනෝදාත්මක පහසුකම් සඳහා නව වපසරියක් සැලසුම් කිරීම තුල ඔවුන් කටුනායක ප්‍රධාන ගුවන්තොටුපළ වෙත සැලකිය යුතු දියුණුවක් එක් කර ඇත.

බ.ජා.ගු. දෙවන වන පර්යන්තයේ සහ භාණ්ඩ සංවර්ධනය

මෙම අවස්ථාවේ දී, අපගේ ගනුදෙනුකරුවන් සඳහා වර්ග මීටර් 180,000 ක සහ වාර්ෂික මගී ධාරිතාව මිලියන 9ක අති නවීන මගී පර්යන්තයක් කඩිනමින් ඉදිකිරීමට අපි කටයුතු කර ඇති බව පැවසීම පිළිබඳ අපි ආඩම්බර වන්නෙමු. තවද, භාණ්ඩ පර්යන්තයට වාර්ෂිකව මෙට්‍රික් ටොන් 150,000 ක ධාරිතාවක් එකතු කරමින් බ.ජා.ගු. ප්‍රධාන සැපයුම් හා ගුවන් භාණ්ඩ මධ්‍යස්ථානය දක්වා දියුණු කිරීමට අපි කටයුතු කර ඇත්තෙමු. භාණ්ඩ පෙරමුනේදී, 2023 අවසානයේ විවෘත කිරීමට නියමිත මෙම වාර්ක සැපයුම් මධ්‍යස්ථානය ඉදිකිරීම සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන භාණ්ඩ හා සැපයුම් වෙළෙඳපොළ තුළ අවස්ථා ලබා ගැනීමට බ.ජා.ගු. සහ එහි ව්‍යාපාරික හවුල්කරුවන්ට උපකාරී වේ.

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ

කොවිඩ් 19 හේතුවෙන් පසුගාමී වුවද, ම.රා.ජා.ගු. මගීන්ගේ හා භාණ්ඩ සංචලන කටයුතු වල කැපී පෙනෙන වර්ධනයක් ලබා ඇත. අප සංචාරක ව්‍යාපාරය සහ සැපයුම් යන අංශ ගවේෂණය කිරීම හරහා ම.රා.ජා.ගු. ගමනාන්තයක් සංවර්ධනය කිරීමට පියවර ගෙන ඇත. අභිප්‍රේරණය කළ සේවකයින් සමඟ ම.රා.ජා.ගු. ඉහළ යන ප්‍රවණතාවක් වන ගුවන් ගමන් වාණිජ ආර්ථික ධාවකයක් ස්ථාපිත කිරීමේ අපේක්ෂාවෙන් දියුණු වෙමින් පවතී.

ගු.ගු.සේ.ස. හි කළමනාකරණ කණ්ඩායමේ සාමාජිකයෙකු වශයෙන්, ර.ගු., ම.ජා.ගු. සහ යා.ජා.ගු. හි පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා අපි පුළුල් පියවර ගෙන ඇති බව දැනුම් දීම මගේ භාග්‍යයකි. අපි දැනට රත්මලානේ ගුවන් සැලසුම් පද්ධති සංවර්ධනය, මගී පර්යන්ත පුළුල් කිරීමේ කටයුතු සැලසුම් කර තිබෙන අතර ර.ගු. විසින් මෙහෙයවනු ලබන ප්‍රදේශ පාලනය වැනි සියළුම තාක්ෂණික කටයුතු වෙනුවෙන් පහසුකම් සැලසීම සඳහා ගුවන්තොටුපළ පහසුකම් ගොඩනැගිල්ලක් ඉදිකෙරමින් පවතියි. මෙම පහසුකම් 2023 අවසානයේදී ලබා ගත හැකි බව අපගේ විශ්වාසයයි.

ගු.ගු.සේ.ස. ඉතිහාසයේ ඉතාමත් අසීරුතම වසර ගෙවී ගොස් ඇත. මෙම අර්බුදකාරී අවස්ථාවේදී ගුවන් තොටුපළ ප්‍රජාවට සහ අපගේ ව්‍යාපාරික හවුල්කරුවන්ගේ නොපසුබට උත්සාහය සහ සහයෝගය පිළිබඳව මම මාගේ බලවත් ස්තූතිය පුදු කරමි.

සියළුම අංශවල කැපවීම වෙනුවෙන් මෙන්ම අනෙකුත් සියළුම පාර්ශවකරුවන්ගේ දායකත්වය වෙනුවෙන් මම ස්තූතිවන්ත වෙමි.

මෙම දුෂ්කර කාල සීමාව තුළ විශිෂ්ඨ නායකත්වයක් හා මඟ පෙන්වීමක් ලබා දීම පිළිබඳව සභාපතිවරයාට සහ හිතවත් අධ්‍යක්ෂක මණ්ඩල සාමාජිකයින්ට මම ස්තූතිවන්ත වන අතර අවසානයේදී ගරු සංචාරක අමාත්‍යතුමාට, ගුවන් හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමාට රජයේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී ලබාදුන් මඟපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් අවංක ස්තූතිය පුදු කරමි.

රජිවසිරි සූරියආරච්චි
උප සභාපති
2021 අගෝස්තු 10



නායකත්ව කණ්ඩායම

ඉදිරි පෙළ අසුන් - වමේ සිට දකුණට

1 ඩෙයඩ්‍රි ඒ ද ලිවේරා (මිය) - අධ්‍යක්ෂ
2 මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc - සභාපති
3 රජිවසිරි සූරියආරච්චි - උප සභාපති
4 වී ලක්මාලි උඩුගම්පොල (මෙනවිය), AAL - සමාගම් ලේකම්

පසුපස පේළිය - වමේ සිට දකුණට

5 ඒ එච් සුනිල් ගුණවර්ධන - ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂක
6 ආර් ඒ ප්‍රදීප් විජේරත්නසේකර - අධ්‍යක්ෂ
7 ඉංජිනේරු එස් එම් ඒ උපුල් එස් මංචනායක - අධ්‍යක්ෂ
8 අරුණ එස් සී වරුෂහෙන්නැදිගේ - අධ්‍යක්ෂ
9 ෂෙහාන් එන් සුමනසේකර - අධ්‍යක්ෂ
10 චන්දික පී විතාරන - අධ්‍යක්ෂ
11 ඩබ්ලිව් එම් ගිහාන් රශාන්ත - අධ්‍යක්ෂ
12 ඩී ඇලෙක්ස් පී වීරත්න PC- අධ්‍යක්ෂ
13 ජී ඒ ඒ ප්‍රියන්ත - අධ්‍යක්ෂ / භාණ්ඩාගාර නියෝජිත (පින්තූරයේ නැත)



ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව 2020

සමාගමේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද මුල්‍ය ප්‍රකාශන සමඟ අපගේ වාර්තාව සතුටින් ඉදිරිපත් කරමු.

මෙහි දක්වා ඇති විස්තර, 2007 අංක 07 දරන සමාගම් පනත මඟින් අවශ්‍ය යැයි තහවුරු කරන තොරතුරු සපයන අතර හොඳම ගිණුම්කරණ භාවිතයන් මඟින් නිර්ණය කර ඇත. මෙම වාර්තාව සංක්ෂිප්තව ඉදිරිපත් කිරීම තුළින් සමාගමේ කටයුතු වල තත්වය සහතික කිරීම මෙන්ම ගිණුම්කරණ කාලය තුල සිදු වූ වෙනස්කම් වෙතොත් ඒ පිළබඳව කොටස් හිමියන්ට තහවුරු කර ඇත.

1. සමාගම ගැන

ගු.ගු.සේ.ස. යනු ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන්තොටුපළ කළමනාකරණය හා සංවර්ධනය කිරීමේ ව්‍යවස්ථාපිත බලතල සහිත සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජය සතු සමාගමකි.

2. ප්‍රධාන ක්‍රියාකාරකම්

2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත මඟින් 2010 නොවැම්බර් 4 දින පළ කරන ලද ගැසට් පත්‍රය අනුව පවරා ඇති බලතල යටතේ පහත දැක්වෙන ගුවන්සේවා වල එකම ව්‍යවස්ථාපිත සේවා සැපයුම්කරු ලෙස ගු.ගු.සේ.ස. මූලික මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ඉටු ක්‍රියාත්මක කරයි.

2.1 බ.ජා.ගු. ම.රා.ජා.ගු. ර.ගු. ම.ජා.ගු. යා.ජා.ගු. හි සංවර්ධනය, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම.

2.2 ඉහත සඳහන් ගුවන් පර්යන්තවල සුපරීක්ෂා කිරීම් ගැහීමේ සහ ගිනි නිවීමේ සේවා සහ ගුවන් ආරක්ෂක සේවා සැපයීම සහ නඩත්තු කිරීම.

2.3 සන්නිවේදනය, සංචලන, නිරීක්ෂණය, කොළඹ ගුවන් ගමන් තොරතුරු කලාපය (FIR) තුළ සියලුම ගුවන් යානා වල සහ මගීන්ගේ ආරක්ෂාව සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා ගුවන් ගමනාගමන සේවා, ගගන නාවික තොරතුරු සේවා, ගගන නාවික සන්නිවේදන සේවා සහ ගගන නාවික ආධාර සැපයීම.

3. මෙහෙයුම් සමාලෝචනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී මූල්‍ය හා මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ සමාලෝචනයක් සහ අනාගත ව්‍යාපාර ගු.ගු.සේ.ස. හි දියුණුව පිළබඳ සභාපතිතුමාගේ පණිවිඩය (පිටුව 20 සිට 23 දක්වා), කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය (පිටු 48 සිට 59 දක්වා) සහ මූල්‍ය සමාලෝචන (60 සිට 65 දක්වා) වාර්ෂික වාර්තාවේ සඳහන් කර ඇත. මෙම වාර්තා සහ සමාගමේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සමඟ සමාගමේ අදාළ කාරණා වල තත්වය පිළිබිඹු කරන අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව වාර්ෂික වාර්තාවේ අනිවාර්ය අංගයකි.

"තිරසාර ආර්ථිකයක් තුළින් වූ ගෝලීය සම්බන්ධකයේ මිත්‍රශීලී ගුවන්සේවා සහකරු" වීමේ දැක්ම සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් ප්‍රධාන කාර්ය සාධන දර්ශක ක්‍රියාත්මක කරමින් අධ්‍යක්ෂ මණ්ඩලය අඛණ්ඩව මෙහෙයුම් ක්‍රියාකාරිත්වය අධීක්ෂණය කරයි.

4. මූල්‍ය ප්‍රකාශන

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු විසින් අත්සන් කරන ලද සමාගමේ මූල්‍ය ප්‍රකාශන 91 සිට 120 දක්වා පිටු වල දක්වා ඇත.

5. වර්ෂය තුල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වෙනස්කම්

සමාගම විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRSs/LKASs) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදී. සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කරන ලද සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති 95 සිට 104 දක්වා පිටු වල දක්වා ඇත. සමාගම විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල කිසිදු වෙනස්කමක් සිදු නොවූ බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තහවුරු කරයි.

6. මූල්‍ය ප්‍රකාශන සඳහා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම

2007 අංක 7 දරන සමාගම් පනත මඟින් තහවුරු කර ඇති ආකාරයට සමාගමේ තත්ත්වය පිළිබඳව සත්‍ය හා සාධාරණ දැක්මක් ලබා දීම සඳහා අධ්‍යක්ෂවරුන් විසින් සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඉදිරිපත් කළ යුතු වේ. 91 සිට 120 දක්වා පිටුවල ඇති මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, සමාගම් පනත, ගිණුම්කරණ හා විගණන ප්‍රමිති පනතේ හා අනෙකුත් මූල්‍ය වාර්තාකරණ නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව බව අධ්‍යක්ෂවරුන්ගේ අදහසයි.

7. ස්වාධීන විගණකවරුන්, විගණක වාර්තාව සහ පාරිශ්‍රමික

2015 මැයි 15 දිනැති 19 වන සංශෝධනයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වගන්තියට අනුව, 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලිඛිතව ලියාපදිංචි කර ඇති සියලුම රාජ්‍ය ආයතන වල විගණන කටයුතු සිදු කිරීමට විගණකාධිපතිවරයාට බලය ඇත. මෙම උපදෙස් වලට අනුකූලව 2020 වර්ෂය සඳහා වූ ගු.ගු.සේ.ස. හි විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ස්වාධීන විගණක වාර්තාව මෙම වාර්තාවේ 86 සිට 90 දක්වා පිටු වල දක්වා ඇත. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වූ විගණන ගාස්තුව ශ්‍රී ලංකා රුපියල් 1,793,000 ක් (2019: ශ්‍රී ලංකා රුපියල් 966,740) සහ සහ විගණන ආශ්‍රිත සේවා සහ විගණන නොවන සේවා සඳහා වෙනත් ගාස්තු විගණකවරුන් සඳහා ගෙවා නොමැත.

අධ්‍යක්ෂවරුන්ගේ දැනුවත්වීම පරිදි විගණකවරුන්ට සමාගමේ විගණකවරයා වීම හැර සමාගම සමඟ වෙනත් කිසිදු සම්බන්ධතාවක් නැත.

8. අභ්‍යන්තර පාලනයන් සහ ප්‍රධාන අභ්‍යන්තට පාලන ක්‍රියාවලීන්

සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය එහි වත්කම් ආරක්ෂා කිරීම සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සහ හඳුනාගැනීම සඳහා සාධාරණ පියවර ගෙන ඇත. මෙම අරමුණ සඳහා සමාගම විසින් වසර පුරා මුහුණ පාන සැලකිය යුතු අවදානම් හඳුනා ගැනීම, පටිගත කිරීම, ඇගයීම සහ කළමනාකරණය කිරීම වෙනුවෙන් අධ්‍යක්ෂවරුන් විසින් කාර්යක්ෂම හා සවිස්තරාත්මක අභ්‍යන්තර පාලන ක්‍රම ස්ථාපිත කර ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිතිපතා සමාලෝචනය කෙරේ.

මෙය අභ්‍යන්තර සමාලෝචන, අභ්‍යන්තර විගණනය සහ අවශ්‍ය මූල්‍ය හා අනෙකුත් පාලන පද්ධතීගෙන් සමන්විත වේ. මෙහෙයුම් විධිමත් ලෙස පවත්වාගනිමින් වත්කම් ආරක්ෂා කිරීම, වංචා හා වෙනත් අක්‍රමිකතා වැළැක්වීම සහ හඳුනාගැනීම සහ හැකිතාක් දුරට වාර්තා වල නිරවද්‍යතාවය සහ විශ්වසනීයත්වය සුරක්ෂිත කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. සමාගමේ අභ්‍යන්තර විගණකවරුන්, රජයේ විගණකවරුන් සහ නියාමන අධිකාරීන් විසින් හඳුනාගන්නා අභ්‍යන්තර පාලන ගැටලු විගණන හා කළමනාකරණ කමිටුව (AUMC) විසින් නිතිපතා සමාලෝචනය කරයි. අභ්‍යන්තර පාලන ක්‍රමයේ ප්‍රමාණවත් බව කළමනාකාරිත්වය විසින් තක්සේරු කෙරේ.

9. සමාගමේ ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්වය

9.1 ආදායම

2020 වර්ෂය සඳහා සමාගම විසින් උත්පාදනය කරන ලද ආදායම ශ්‍රී ලංකා රුපියල් බිලියන 7.8 කි (2019 ශ්‍රී ලංකා රුපියල් බිලියන 25.7) එය පෙර වසර හා සසඳන විට 70% ක පමණ පහත වැටීමකි. ව්‍යාපාර අංශ මත පදනම් වූ සමාගම් ආදායම පිළිබඳ විශ්ලේෂණයක් 104 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශන 5 වෙනි සටහන මඟින් හෙළිදරව් කර ඇත.

9.2 මෙහෙයුම්

2020 න් අවසන් වූ වසර තුළදී ශ්‍රී ලංකා රුපියල් බිලියන 4.6 ක මෙහෙයුම්

අලාභයක් සමාගම විසින් වාර්තා කළ අතර එය පෙර වසරට සාපේක්ෂව 138% ක අඩු වීමකි (2019: මෙහෙයුම් ලාභය - ශ්‍රී ලංකා රුපියල් බිලියන 12.2).

පසුගිය වසර හා සසඳන විට ගුවන් යානා සහ මගී සංචලනයන් 66% සහ 76% කින් අඩු වීම හේතුවෙන් 2019 දී වාර්තා කළ ශ්‍රී ලංකා රුපියල් බිලියන 11 ක බදු පසු ලාභයට සාපේක්ෂව 2020 වසර තුළදී සමාගම බිලියන 2.5 ක ශුද්ධ අලාභයක් වාර්තා කර ඇත. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා සංචාරක තහනමක් පැනවීම මෙයට හේතුවයි.

පසුගිය වසර හා සසඳන කල ගුවන් යානා සහ මගී සංචලනයන් 66% සහ 76% කින් අඩු වීම මෙය හේතු විය.

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ, පරිපාලන හා ආයතනික පිරිවැය 8% කින් අඩු වී ඇති අතර පොලී අනුපාතයේ අහිතකර උච්චාවචනයන් සහ තැන්පතු ආපසු ගැනීම හේතුවෙන් මූල්‍ය ආදායම 12% කින් අඩු වී ඇත.

මූල්‍ය පිරිවැය, ණය සහ ණයකර මත පොලී වියදම් සහ ණය ස්ථාවර තැන්පතු පරිවර්තනයන් මත විනිමය ලාභ/(අලාභ) වලින් සමන්විත වේ. ණය පොලිය 3% කින් අඩු වුවත්, ඇමරිකානු ඩොලර් හා ජපාන යෙන් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල් හි අගය ක්ෂයවීමේ ප්‍රතිඵලයක් වශයෙන් අත්විඳින ලද ණය පරිවර්තනයේ විනිමය අලාභය හේතුවෙන් මූල්‍ය වියදම් ඉහළ ගොස් තිබේ.

වසර දෙකක මෙහෙයුම් ප්‍රතිඵල සංසන්දනය කිරීමේ වගුවක් පහත දක්වා ඇත:

විස්තරය	2020 ශ්‍රී ලංකා රු මිලියන	2019 ශ්‍රී ලංකා රු මිලියන
මෙහෙයුම් (පාඩු) / ලාභය	(4,611)	12,204
මූල්‍ය ආදායම	3,665	4,165
පොලී වියදම	(1,290)	(1,326)
විනිමය (අලාභය) / ලාභ	(1,497)	180
බදු ගෙවීමට පෙර ලාභය /(අලාභය)	(3,733)	15,222
ආදායම් බදු වියදම්	1,228	(4,226)
බදු ගෙවීමෙන් පසු ලාභය (අලාභය)	(2,504)	10,996

9.3. සංචිත

සමාගමේ සංචිත කොටස් ප්‍රාග්ධනය, අනෙකුත් සංචිත සහ රඳවා ගත් ඉපැයීම් වලින් සමන්විත වේ. මෙය 2019 දෙසැම්බර් 31 දින සිට 2020 දෙසැම්බර් 31 දින වන විට 31 බිලියන 37 දක්වා අඩු විය. සමාගමේ සංචිත වල සංචලනය 93 වන පිටුවේ හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශයෙහි දක්වා ඇත.

9.4. ලාභාංශ

සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී සමාගම ලාභාංශ ප්‍රකාශ කර නොමැත.

9.5. පරිත්‍යාග

වර්ෂය තුළදී, සමාගම විසින් සිදුකළ පරිත්‍යාග වල වටිනාකම ශ්‍රී ලංකා රුපියල් 410,290 කි. (2019: ශ්‍රී ලංකා රුපියල් 84,200)

9.6. ප්‍රාග්ධන වියදම්

සමාලෝචනය කරන ලද වර්ෂය තුළදී, සමාගම 2019 දී වැය කළ රුපියල් බිලියන 4.1 ට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම ලෙස රුපියල් බිලියන 2.2 ක් වැය කර ඇත. දේපල ගොඩනැගිලි, උපකරණ සහ ආයෝජන වත්කම් සඳහා වූ ආයෝජනය මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 11 සහ 12 හි දක්වා ඇත.

9.7. රජයට දායක වීම

ගුවන්තොටුපළ තුළ අදාළ සේවාවන් සපයන රජයේ ආයතන වන ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකන් ගුවන් සේවය, ආදියට ගු.ගු.සේ.ස. අඛණ්ඩව යටිතල පහසුම්කම් හා අවශ්‍ය අනෙකුත් පහසුකම් සපයයි. මෙම ගනුදෙනු සහ ගිණුම් ශේෂයන් 119 සහ 120 පිටු වල මූල්‍ය ප්‍රකාශන සඳහා වන සටහන් වල 32 වෙනි සටහනෙහි පාර්ශව ගනුදෙනු යටතේ හෙළිදරව් කෙරේ.

ගතවූ වසර 3 තුළ බදු ගෙවීම තුළින් වක්‍රව රජයට ලබා දුන් දායකත්වය පහත වගුවේ සහ ප්‍රස්ථාරයේ දක්වා ඇත.

ශ්‍රී ලංකා රු. මිලියන				
වසර	ලාභාංශ	එකතු කළ අගය මත බදු	ආදායම් බදු	උපයන විට ගෙවීම්
2018	300	1,570	1,653	110
2019	500	1,543	6,579	112
2020	-	207	1,618	7



9.8. ආයෝජන

පහත වගුවේ දක්වා ඇති පරිදි වසර අවසානයේදී ආයෝජනය එකතුවේ වටිනාකම රුපියල් බිලියන 1.6 කින් අඩු වී ඇත.

විස්තරය	2020.12.31 වන විට (ශ්‍රී ලංකා රුපියල් බිලියන)	2019.12.31 වන විට (ශ්‍රී ලංකා රුපියල් බිලියන)
භාණ්ඩාගාර බිල්පත්/බැඳුම්කර	0.4	1.7
කෙටි කාලීන බැංකු තැන්පතු	41.9	43.4
දිගු කාලීන බැංකු තැන්පතු	1.2	-
ණයකර වල ආයෝජන	5.6	5.6
	49.1	50.7

9.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය

මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වන සමාගමේ කොටස් ප්‍රාග්ධනය රුපියල් 100/- බැගින් වූ සාමාන්‍ය කොටස් වලින් සමන්විත වේ. 2020 දෙසැම්බර් 31 දිනට කොටස් හිමිකාරිත්වය පහත පරිදි විය

කොටස් ගණන	වටිනාකම - ශ්‍රී ලංකා රු	දරන්නේ
200,000	20,000,000	මහා භාණ්ඩාගාර ලේකම්
1	100	ලේකම් - සංචාරක අමාත්‍යාංශය
1	100	සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්
200,002	20,000,200	

9.10. වාර්තා කිරීමේ කාල වකවානුවෙන් පසු සිදුවීම්

120 වන පිටුවේ මූල්‍ය ප්‍රකාශන අංක 33 දරණ සටහනෙහි සඳහන් පරිදි මූල්‍ය ප්‍රකාශන වල ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් අවශ්‍ය වාර්තා කරන දිනට පසුව සිදුවූ ද්‍රව්‍යමය සිද්ධීන් නොමැත.

9.11. අඛණ්ඩ පැවැත්ම

කොවිඩ්-19 වසංගතය පැතිර යාමත් සමඟ ව්‍යාපාර හා සංචරණ සීමා කිරීම් 2020 මාර්තු මස මැද භාගයේ සිට සමාගමේ කටයුතුවලට අහිතකර ලෙස බලපෑවේය. ගු.ගු.සේ.ස. ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය බලධාරීන් විසින් නියම කර ඇති සියළුම සෞඛ්‍යය සහ ආරක්ෂිත මාර්ගෝපදේශ වලට අනුකූලව කටයුතු කලේය. පවතින තොරතුරු මත පදනම්ව, කළමනාකරණය විසින් දේශසීමා වසා දැමීමෙන් පසු අපේක්ෂිත ආර්ථික බලපෑම් සහ ඉදිරියේදී අඛණ්ඩ පැවැත්මට සැලකිලමත් විය යුතු භාවිතයන්හි යෝග්‍යතාවය තක්සේරු කළහ.

එබැවින් යුහුසුළුව විමසීමෙන් පසුව, සාමාන්‍ය පුරෝකථන ක්‍රියාවලිය අධ්‍යනය කර අනාගත බලාපොරොත්තු හා අවදානම් හැකියාවන් සලකා බැලීමෙන් පසු, අධ්‍යක්ෂවරුන් සලකා බලන්නේ ගු.ගු.සේ.ස. හි ප්‍රමාණවත් සම්පත් ඇති බවත්, බලාපොරොත්තු වූ අනාගතය වෙනුවෙන් මෙහෙයුම් පැවැත්මට අවශ්‍ය ණය පහසුකම් ලබා දී ඇති බවත් ය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇති බව යන කාරණා පදනම් කරගෙනය.

9.12. අසම්භාවයන් සහ බැඳීම්

අසම්භාවය බැරකම් පිළිබඳ විස්තර අංක 297 දරන මූල්‍ය ප්‍රකාශන ආශ්‍රිතව 118 සහ 119 පිටුවල හෙළිදරව් කර ඇත.

10 අධ්‍යක්ෂ මණ්ඩල සහ මණ්ඩල අනුකමිටු වල තොරතුරු

10.1. අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපතිවරයා පත්කිරීම (79 වන වගන්තිය) සහ විධායක නොවන අධ්‍යක්ෂවරුන් පත්කිරීම (82 වැනි වගන්තිය) ගු.ගු.සේ.ස. හි සාංගමික ව්‍යවස්ථාවලියට අනුකූල විය. සභාපති සහ උප සභාපති යන අය විධායක අධ්‍යක්ෂ තනතුරු දැරූ අතර අනෙක් සියලුම අධ්‍යක්ෂවරුන් සමාගම තුළ විධායක නොවන අධ්‍යක්ෂ තනතුරු දැරූහ.

10.2 වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ විස්තර

නම	තනතුර	පත්වීමේ දිනය
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී.ඒ. චන්ද්‍රසිරි RWP USP VSV ndc psc	සභාපති	12.12.2019
ආර් සූරියආරච්චි	උප සභාපති	06.12.2019
ඒ එස් සී වරුෂහෙන්නැදිගේ	අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ ව්‍යාපෘති	12.12.2019
එස් එන් සුමනසේකර	අධ්‍යක්ෂ/ අධ්‍යක්ෂ මෙහෙයුම්	12.12.2019
ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක	අධ්‍යක්ෂ	12.12.2019
සී පී විතාරන	අධ්‍යක්ෂ	31.12.2019
ඩී ඒ ද ලිවේරා	අධ්‍යක්ෂ	31.12.2019
ආර් ඒ පී විජේරත්නසේකර	අධ්‍යක්ෂ	31.12.2019
ඩබ්ලිව් එම් ගිහාන් රශාන්ත	අධ්‍යක්ෂ	05.02.2021
ජී ඒ ඒ ප්‍රියන්ත	අධ්‍යක්ෂ / (භාණ්ඩාගාර නියෝජිත)	11.06.2021
ඩී ඒ පී වීරත්න PC	අධ්‍යක්ෂ	02.03.2020
ඒ එච් එස් ගුණවර්ධන	ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයෙන් නිරීක්ෂක	31.12.2019

10.3 2020 වර්ෂය තුළ ඉල්ලා අස්වූ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර

නම	තනතුර	පත්වීම ලබා දුන් දිනය	ඉල්ලා අස්වූ දිනය
පී ටී වීරසිංහ	අධ්‍යක්ෂ	12.12.2019	10.09.2020
එස් ඩී කරුණාරත්න	අධ්‍යක්ෂ	31.12.2019	25.02.2020

ඉහත සඳහන් අධ්‍යක්ෂවරුන්ට අමතරව 2021 අප්‍රේල් 27 දින අධ්‍යක්ෂ ආර් එම් ඒ රත්නායක (අධ්‍යක්ෂ/භාණ්ඩාගාර නියෝජිත) ඉල්ලා අස්විය.

10.4. අධ්‍යක්ෂ මණ්ඩල අනු කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දැක්වීම සඳහා අනු කමිටු හතක් පත් කර තිබේ. වාර්තා කරන දිනයේදී ඉහත කාරක සභා වල සංයුතිය පහත පරිදි වේ:

උප කමිටු	සංයුතිය
විගණන හා කළමනාකරණ කමිටුව	ජ ඒ ඒ ප්‍රියන්ත - සභාපති
	ඉංජිනේරු එස් එම් ඒ යූ එ ස් මංචනායක - සාමාජික
	ඩී ඒ පී වීරත්න PC සාමාජික
	එම් කේ පී තැන්නගේ - කැඳවුම්කරු
	එස් ඒ ඩී දිල්රුක්ෂි - නිරීක්ෂක - රජයේ විගණන අධිකාරී
	වී එල් උඩුගම්පල AAL - ලේකම්
මානව සම්පත් හා වැටුප් කමිටුව	ආර් සූරියආරච්චි - සභාපති
	ඒ එස් සී වරුෂහෙන්නැදිගේ -සාමාජික
	ඩී ඒ පී වීරත්න PC සාමාජික
	ඒ එච් එස් ගුණවර්ධන - සාමාජික
	එම් රත්නසිංහ - සාමාජික
	කේ ඩබ්ලිව් ජයසේකර - සාමාජික
	ඩබ්ලිව් හතුරුසිංහ - ලේකම්
උපායමාර්ගික සැලසුම් සහ කළමනාකරණ කමිටුව	මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජ ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc - සභාපති
	ආර් සූරියආරච්චි - සාමාජික
	ඒ එස් සී වරුෂහෙන්නැදිගේ - සාමාජික
	එස් එන් සුමනසේකර - සාමාජික
	ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක - සාමාජික
	ඩී ඒ ද ලිවේරා -සාමාජික
	කේ ඩී වයි චාන්දනී - ලේකම්
අවදානම් කළමනාකරණ කමිටුව	ඩී ඒ ද ලිවේරා - සභාපති
	ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක - සාමාජික
	ආර් ඒ ප්‍රදීප් විජේරත්නසේකර - සාමාජික
	කේ ඩී වයි චාන්දනී - ලේකම්
සංඛ්‍යාත, යටිතල පහසුකම් සහ තොරතුරු තාක්ෂණ කමිටුව	ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක - සභාපති
	පී.ඒ.ඒ. ප්‍රියන්ත - සාමාජික
	ඒ.එස්.සී. වරුෂහෙන්නැදිගේ - සාමාජික
	එල්. විජේසිරිවර්ධන - ලේකම්
සියළුම ගුවන්තොටුපළ සඳහා ආදායම් උත්පාදන කමිටුව	මේජර් ජෙනරාල් (විශ්‍රාමික) පී.ඒ. චන්ද්‍රසිරි RWP USP VSV ndc psc - සභාපති
	ආර්. සූරියආරච්චි - සාමාජික
	ඒ එස් සී වරුෂහෙන්නැදිගේ - සාමාජික
	එස් එන් සුමනසේකර - සාමාජික
	ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක - සාමාජික
	සී පී විතාරන - සාමාජික
	ඩී ඒ ඩී ලිවේරා - සාමාජික
	එස් එස් ද සිල්වා - සාමාජික
	ඩී ජේ යූ පුරසිංහ - ලේකම්
මූල්‍ය කළමණාකරණ කමිටුව	මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජ ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc - සභාපති
	ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක - සාමාජික
	ඩී ඒ ද ලිවේරා -සාමාජික
	ජේ ඒ එම් ඩී එස් එස් අබේවර්ධන - ලේකම්

10.5 කොටස් හෝ ණයකර සම්බන්ධ අධ්‍යක්ෂවරුන්ගේ ගනුදෙනු හෙළිදරව් කිරීම

කිසිදු අධ්‍යක්ෂවරයෙකු කොටස් හෝ ණයකර හිමිකම් දරන්නේ නැත.

10.6. කොන්ත්‍රාත් සහ යෝජිත කොන්ත්‍රාත් කෙරෙහි අධ්‍යක්ෂවරුන්ගේ උනන්දුව

සමාලෝචනය කරන ලද වර්ෂය තුළ සමාගමේ ව්‍යාපාර හා සම්බන්ධ කොන්ත්‍රාත් හෝ යෝජිත කොන්ත්‍රාත් පිළිබඳව කිසිදු අධ්‍යක්ෂවරයෙක් සෘජුව හෝ වක්‍රව උනන්දුවක් දක්වා නැත.

10.7 අධ්‍යක්ෂවරුන්ගේ වැටුප් සහ වෙනත් ප්‍රතිලාභ

2020 වර්ෂය සඳහා අධ්‍යක්ෂ වැටුප් වශයෙන් සමාගම රුපියල් මිලියන 6.6 ක් ගෙවා ඇත. (2019 - රුපියල් මිලියන 11.8)

වසර අවසානයේදී විධායක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු සිටි අතර එම වර්ෂය තුළදී ඔවුන්ට රුපියල් මිලියන 3.6 ක වැටුපක් ගෙවන ලදී. අධ්‍යක්ෂ දීමනා, සේවක අර්ථ සාධක, සේවා නියුක්තීන්ගේ භාර අරමුදල, ප්‍රසාද දීමනා සංග්‍රහ වියදම් ආපසු ගෙවීම, දුරකථන සහ වෙනත් දීමනා යන සියළුම මූල්‍ය ප්‍රතිලාභ මෙයට ඇතුළත් විය. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගී වීම සඳහා ගමන් වියදම් සහ අධ්‍යක්ෂ ගාස්තු වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ට වර්ෂය තුළදී රුපියල් මිලියන 3 ක මුදලක් ගෙවන ලදී.

10.9. අධ්‍යක්ෂවරුන් සඳහා වන ණය සීමා කිරීම

මූල්‍ය වර්ෂය තුළ කිසිදු අධ්‍යක්ෂවරයෙක් සමාගමෙන් ණය ලබාගෙන නොමැත.

11. සාමූහික පාලනය

ඵලදායි සාමූහික පාලන රාමුවක් පවත්වා ගෙන යාමට සහ ආයතනික පාලනයේ හොඳම භාවිතයන් සහතික කිරීම සඳහා අවශ්‍ය පද්ධති මෙන්ම ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීමටත් ඒවා ඵලදායීව ක්‍රියාත්මක කිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය කැපවී සිටියි.

12. ව්‍යවස්ථාපිත ගෙවීම්

අධ්‍යක්ෂමණ්ඩලය තම උපරිම දැනුමට අනුව සමාගම විසින් ගෙවිය යුතු සියලු බදු, ගාස්තු සහ අය කිරීම්, සමාගමේ සේවකයින් වෙනුවෙන් සහ ඔවුන් සම්බන්ධයෙන් ගෙවිය යුතු සියලු දායක මුදල්, අයකිරීම සහ බදු මෙන්ම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දිනට සමාගම විසින් ගෙවිය යුතු වෙනත් දන්නා ව්‍යවස්ථාපිත ගෙවීම් කර ඇති බව හා ඒ වෙනුවෙන් අදාළ ප්‍රතිපාදන සලසා ඇති බව සහතික කරයි.

13. වාර්ෂික මහා සභා රැස්වීම

වාර්ෂික මහා සභා රැස්වීම 2021 අගෝස්තු 26 දින ප.ව. 3:00 ට ගු.ගු.සේ.ස. හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ශාලාවේදී පවත්වනු ලබයි.

14. ස්තූතිය

සමාගමේ තවත් කැපී පෙනෙන සාර්ථක වසරක් සම්පූර්ණ කිරීම පිළිබඳව කළමනාකාරිත්ව කණ්ඩායමට අධ්‍යක්ෂ මණ්ඩලයේ සුභපැතුම් එක් කරමු. මෙම වසර කොවිඩ්-19 ගෝලීය වසංගතය හේතුවෙන් සංචාරක සීමා පැනවීම නිසා ගුවන්සේවා අංශයට ඉතා අභියෝගාත්මක වසරක් විය.

සමාගමේ පාර්ශවකරුවන් සහ නියාමකයා වශයෙන් සමාගමේ කටයුතු සඳහා අඛණ්ඩව සහය වූ සංචාරක අමාත්‍යාංශයට සහ අනෙකුත් ආයතනවලට අපගේ විශේෂ ස්තූතිය පිරිනමන්නෙමු.

තවදුරටත්, අප කෙරෙහි තැබූ අඛණ්ඩ විශ්වාසය සඳහා පාරිභෝගිකයින් ඇතුළු සමාගමේ ජයග්‍රහණය සඳහා දායක වූ සහ සම්බන්ධ වූ සියළුම පාර්ශවකරුවන්ට අපගේ අවංක ස්තූතිය හා කෘතඥතාව පළ කරමු. අවසාන වශයෙන් මෙම පෙර නොවූ විරූ අභියෝගාත්මක වර්ෂය තුළ දීර්ඝ කාලීන කැපවීම, අඛණ්ඩතාව සහ වෙහෙස මහන්සි වී වැඩ කිරීම පිළිබඳව ගු.ගු.සේ.ස. හි සියළුම කාර්ය මණ්ඩලයට අපගේ කෘතඥතාවය පළ කරමු.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි

මේජර් ජෙනරාල් (විශ්‍රමික) ජ ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc
සභාපති

2021 අගෝස්තු 10



මෙහෙයුම් අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය

කොවිඩ්-19 සමඟ සටන ආරම්භ වී ඇත්තේ ලොව පුරා රටවල් දේශසීමා පාලනයන් කළමනාකරණය කරන ආකාරය, ගුවන් ගමන් අවශ්‍යතා ලිහිල් කිරීම සහ වෛරසය පාලනය සඳහා වෛද්‍ය ප්‍රතිකාර ක්‍රම මත යැපෙමින් සිදුකරන සංචාරක ප්‍රතිසාධනයත් සමඟ ය. එන්නත සහ එහි ප්‍රතිඵල අනුව ගුවන් ගමන්වල ප්‍රකෘතිමත් වීමේ මාවත බොහෝ දුරට තීරණය වේ. තත්ත්වය පහව යාමේ සලකුනු නොපෙන්වීමත් සමඟ අනාගතය පිළිබඳ අවිනිශ්චිතතාවක් හටගනී.මෙම අසීරු කාලයන් තුළ අභියෝගයන්ට මුහුණ දීමට මෙන්ම අපේ ගුවන්තොටුපළ මෙහෙයවීමට අපි හොඳින් සූදානම් බව කිව යුතුමය.

2020 මූල්‍ය වර්ෂයේ අවසාන කාර්තුවේදී, මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සංචාරක ඉල්ලුම ඉහළ යාම මගින් මගී ගමනාගමනයේ අඛණ්ඩ වර්ධනයක් පෙන්නුම් කරයි. වසංගතය නොතකා, මෙම කාල සීමාව තුළදී නව ගුවන් සේවා 4 ක් (යුක්රේන් ජාත්‍යන්තර, ස්කයිප් එයාර්, ස්කැට් එයාර් සහ එයාර් ඇස්ටානා) ම.රා.ජා.ගු විසින් පිළිගත් අතර දැනටමත් නිතිපතා පවතින ඉන්ඩිගෝ එයාර් සහ මාලදිවයින එයාර් වෙත නැගෙනහිර යුරෝපා නව ගුවන් මාර්ග හතරක් ශීත සෘතුවේදී එකතු කළේය. මෙම මගී ගමනාගමනය ඉහළ යාම ම.රා.ජා.ගු හි කුඩා නමුත් දිරිගන්වන වර්ධනයක් ලෙස සැල කිය හැකි අතර ඉහළ අනුග්‍රාහක ලබදෙමින් මූල්‍යමය වශයෙන් තිරසාර ගුවන් තොටුපළක් දෙසට ම.රා.ජා.ගු. පරිවර්තනය විය. ම.රා.ජා.ගු. හි හවුල්කාර ගුවන් සමාගම් සඳහා අපි ගුවන් සේවා ආදායමෙන් නිදහස් කිරීම් සහ වට්ටම් වැනි විවිධ ආධාර යෝජනා ක්‍රම ද සකස් කළෙමු. තවද, නව ආදායමක් එකතු කරමින් අපි ම.රා.ජා.ගු. හි තීරුබදු රහිතවද ස්ථාපනය කළෙමු.

කලාපීය ව්‍යාපාර ගුවන් සේවා ග්‍රහණය කර ගනිමින් MRO පහසුකම් ස්ථාපිත කිරීමට අපි සැලසුම් සකස් කර ඇත්තෙමු. එක් නැවතුමක භාණ්ඩ බෙදාහැරීම පහසු කිරීම පහසුව සඳහා භාණ්ඩ මධ්‍යස්ථානයක් ම.රා.ජා.ගු. හි ආරම්භ කිරීමට සැලසුම් සංවර්ධනය කර ඇත. මෙය සැබෑ තිරසාර දෙවන ජාත්‍යන්තර ගුවන්තොටුපළක් ශ්‍රී ලංකාවේ නිර්මාණය කිරීම සඳහා වන අපගේ කැපවීම සහතික කරයි. දුෂ්කරතා මාධ්‍යයේ වුවත්, ම.රා.ජා.ගු. ආසියානු කලාපයේ ගුවන් සේවා වල අනිවාර්ය අංගයක් වනු ඇත.

මෙහෙයුම් සූදානම සහ ආරක්ෂාව

විගණන අවසන් වීමෙන් පසුව, ජාත්‍යන්තර ගුවන්තොටුපළ කවුන්සිලය (ACI) අපගේ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළට සෞඛ්‍ය ප්‍රතීතන සහතිකය පිරිනැමූ අතර එමඟින් අපගේ සේවකයින්ගේ හා ගුවන් මගීන්ගේ ආරක්ෂාව කෙරෙහි ඇති අපගේ කැපවීම තවදුරටත් පෙන්නුම් කෙරේ.

වඩාත් අන්තර්කර්ණීය වූ ගුවන් තොටුපලක් නිර්මාණය කිරීමට අපගේ කැපවීම තුළ, අපගේ ගුවන්තොටුපළ කළමණාකාරිත්ව කණ්ඩායම සියලු සෞඛ්‍ය පියවරයන් අනුගමනය කරමින් වර්තමාන වසංගතයට ගැලපෙන පරිදි පර්යන්තය තුළ ක්‍රියාවලීන් පරිවර්තනය කර ඇත.

කොවිඩ්-19 ආරම්භයේදී ගුවන්තොටුපළ සේවකයින් සහ මගීන් ආරක්ෂා කිරීම අපගේ ක්ෂණික ප්‍රමුඛතාව විය. උෂ්ණත්වය පරීක්ෂා කිරීම, වැඩි දියුණු කළ පිරිසිදු කිරීම් සහ ආරක්ෂිත දුරස්ථභාවය වැනි පූර්වාරක්ෂක පියවරයන් සකස් කර තිබූ අතර, ගුවන්තොටුපළවල් පිරිසිදු කිරීමේ ප්‍රමිතීන් ඉහළ මට්ටමක තබා ගැනීම සඳහා අපි වැඩි වශයෙන් වෙහෙස වූයෙමු.

ගුවන්තොටුපලේදී, අපගේ ගුවන්තොටුපළ මෙහෙයුම් සැළසුම් සහ ගුවන්පථ කණ්ඩායම රට තුල සිටම භාවිතා කරන ගුවන් යානා වල නිසි ලෙස භාවිතායට නොගත් ගුවන් යානා නැවැත්වීම පහසු කිරීම සඳහා සෑම අතින්ම සූදානම්ව සිටියහ.

ගුවන්තොටුපලේ අනුග්‍රාහකයින්ගේ ආදායම මගී ගමනාගමනය දැඩිව පහත වැටීම සමඟ සෘජුව සම්බන්ධ වේ. කොවිඩ්-19 හේතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මගීන් ප්‍රමාණය අවම වීම තදින් බලපා ඇති අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් අපගේ ගුවන් නොවන ආදායම පෙර නොවූ විරූ ලෙස පහත වැටීමකට ලක් විය. මෙම දුෂ්කර කාල සීමාව පසුකිරීමට ඔවුන්ට උපකාර කිරීම සඳහා තිරසාර පැවැත්ම වෙනුවෙන් විවිධ කුලී මත ආධාර පැකේජ ලබා දෙන ලදී.

මගී ගුවන් ගමන් ඉතිහාසයේ අවම මට්ටම වර්තමානයේ වාර්තා වී තිබුනත් අපේ ගුවන් තොටුපළවල් ගෝලීය සැපයුම් දාම ප්‍රවාහනය සක්‍රීය කිරීම සඳහා භාණ්ඩ ප්‍රවාහන ගුවන් ගමන් පහසු කිරීම සඳහා අඛණ්ඩව ප්‍රධාන භූමිකාවක් ඉටු කරයි. විදේශයන්හි සිට පැමිණෙන ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් ගුවන් ගමන් පහසු කිරීම සඳහා අපි දිගටම කටයුතු කරන්නෙමු.

අපේ මගීන්ට සේවය කරන තරමටම සෑම ගුවන්තොටුපළ සේවකයෙකුගේම යහපැවැත්ම සහතික කිරීමට ද අපි කැපවී සිටින්නෙමු. අර්බුදයේ මුල් දිනවල මුහුණු ආවරණ සහ උෂ්ණත්වමාන වැනි අයිතමයන් සැපයුම් හිඟයක් ඇති වූ විට ගු.ගු.සේ.ස. මේවා මෙන්ම පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) අපේ කාර්ය මණ්ඩලය සඳහා පමණක් නොව ගුවන්තොටුපළ හවුල් කරුවන් සඳහාද මිලදී ගනු ලැබීය.

මෙම අවිනිශ්චිත කාලයන් නව පියවරයන් ගවේෂණය කිරීම සඳහා ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම අපේක්ෂා කළද , අපගේ විශිෂ්ඨත්වය, නව නිපැයුම් ස්වභාවය, මගීන්ට සේවය කිරීමේ ආශාව සහ මිනිසුන් රැකබලා ගැනීම යන සියල්ල එකසේ පවතිනු ඇත. කොවිඩ්-19 හි විනාශකාරී බලපෑමෙන් අප සුවය ලබන විට ගු.ගු.සේ.ස හි වර්ධනයට සහ සංවර්ධනයට ආධාරක වන පසුබිම බවට මෙය පත්වී ඇත.

දිගු කාලීනව ගුවන් සේවා කර්මාන්තය බලාපොරොත්තු තැබිය හැකි අතර, විවේකය සහ ව්‍යාපාර අවශ්‍යතා දෙකම වෙනුවෙන් නැවත පියාසර කිරීම සඳහා මිනිසුන් තුල උනන්දුව හා ඉල්ලුම තවමත් පවතී. අපගේ ප්‍රධාන ජාත්‍යන්තර ගුවන්තොටුපළ දෙක වන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළ සිය ගුවන් මගීන්ගේ අපේක්ෂිත ගුවන් ගමන් පිළිගැනීමට මහත් උනන්දුවෙන් සූදානම්ව සිටී.

ෂෙහාන් සුමනසේකර

අධ්‍යක්ෂ - ප්‍රධාන මෙහෙයුම් - සියලුම ගුවන්තොටුපළ



ව්‍යාපෘති අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය

ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම ගු.ගු.සේ.ස හි අනන්‍යතාව සැමවිටම යොමු වී ඇත්තේ අනාගතය කේන්ද්‍ර කරගත් සංවර්ධනයන් වෙත ය.

ඒ සමඟම, අපි දැනට ශ්‍රී ලංකාවේ ගුවන් සේවා අත්දැකීමේ ක්‍රමය වෙනස් කරන ප්‍රධාන යටිතල පහසුකම් සංවර්ධනයන් කිහිපයක් නිර්මාණය කිරීමේ කාර්යයේ නියැලී සිටින අතර ශ්‍රී ලංකාවට ඇතුළු වන ඕනෑම අයෙකුට විධිමත් අත්දැකීම් නිර්මාණය කරමින් ඉදිරියට යන්න එය සුදුසු මාර්ගය බව මම විශ්වාස කරමි.

අද්විතීය යටිතල ව්‍යපෘතියක් වන බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ 2 වන පර්යන්තය ඉදිකිරීමත් සමඟම, බාධාවකින් තොරව පහසු සංචාරක අත්දැකීමක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීමට සංචාරක ගමන නව මානයකට නැංවීමේ මූලික අඩිතාලම බවට පත්වන එක් ප්‍රධාන සංධිස්ථානයකි. කොවිඩ්-19 වසංගතය, ගුවන් කර්මාන්තයට ගෙන ආ පසුබෑම් නොතකා, තවමත් ජීවිතය සමඟ පොරබදන අතර වර්තමාන වටපිටාව සඳහා පමණක් නොව අනාගත අවස්ථාවන් සඳහා ද එය පසුබිම සකස් කර ඇත. ගු.ගු.සේ.ස. හි අපි අනාගතයේදී ගුවන්සේවා අපේක්ෂාවන් නිසි ලෙස හඳුනාගෙන අපගේ පහසුකම් සහ සමස්ත සංචාරක අත්දැකීම වර්ධනය කර ගැනීම කෙතරම් තීරණාත්මක දැයි අපි දැඩිව විශ්වාස කරමු.

දෙවන පර්යන්ත ව්‍යාපෘතියේ මේ වන විට දෙවන අදියර සංවර්ධනය වෙමින් පවතින අතර, ඒ අනුව පැකේජය ඒ සහ පැකේජය බී යනුවෙන් විධිමත් ලෙස කොටස් දෙකකට බෙදා ඇත.

ඒ පැකේජය යටතේ, මගී පර්යන්ත ගොඩනැගිලි රාශියක් ඉදිවෙමින් පවතින අතර, බී පැකේජය යටතේ, වඩාත් කාර්යක්ෂමව අනුව සැලසුම් කළ දුරස්ථ යාත්‍රාංගන සහ පිවිසුම මත දැකිය හැක. මෙම වැදගත් ව්‍යාපෘතියේ එකම මූල්‍ය හවුල්කරුවා වන ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) මෙන්ම ව්‍යාපෘතියේ මුළුමනින්ම ප්‍රාථමික කොන්ත්‍රාත්කරු ලෙස කටයුතු කරන කාර්යක්ෂම ඉදිකිරීම් සඳහා ප්‍රසිද්ධ තායිසෙයි සංස්ථාවේ සහාය ඇතිව දෙවන පර්යන්ත ව්‍යාපෘතියේ සංවර්ධනය ආරම්භ කෙරේ. මෙම ව්‍යාපෘතියේ මුළු ආයෝජනයේ ඇස්තමේන්තුගත මුළු වටිනාකම ඩොලර් මිලියන 580 කි (රුපියල් බිලියන 116). මෙම ව්‍යාපෘතිය සංචාරක අමාත්‍යාංශයේ නිසි අවධානය සහ අධීක්ෂණය යටතේ සිදු කෙරෙන බව සඳහන් කිරීම ද වැදගත් ය.

ලොව පුරා ඇති වන බලපෑම සිතුවිලි ස්වල්පයක් පමණක් වන අතර තාක්ෂණික දියුණුව නිවැරදි ලෙස භාවිතා කිරීම සහ ගෝලීය ප්‍රවනතාවයන් හොඳින් අධ්‍යයනය කිරීම තුළින් මෙම ව්‍යාපෘතිය ගැන අප එතරම් ප්‍රබෝධමත් නොවන්නේ නම් එය කණගාටුවට කරුණකි. සෞන්දර්යාත්මක හා සේවකයන්ට වඩාත් පහසුවෙන් සිය කර්තව්‍යයන් සිදුකළ හැකි ලක්ෂණ ගුවන්තොටුපළ තුල ක්‍රියාත්මක කිරීම සඳහා අපි නිරන්තරයෙන් උත්සාහ කරමු. වර්තමාන වාතාවරණය විසින් අභියෝගයන්ට මුහුණ දී සිටියත්, අනාගතය සහ මෙමැනි මාවතක් සතුව තිබිය හැකි අතිවිශාල ශක්‍යතාවයන් පිළිබඳව අපි තවමත් සුබවාදී ය.

මෙවැනි වැදගත් සංවර්ධනයන් දියත් කිරීම භාරව සිටීම මවිසින් ගෞරවයක් ලෙස සලකන අතර ගෝලීය වශයෙන් ගුවන්ගමන් වල පෙරමුණේ සිටින ශ්‍රී ලංකාව තවදුරටත් ඉදිරියෙන් තැබීම සඳහා කළ හැකි නිර්මාණාත්මක උත්සාහයන් මොනවාදැයි අධ්‍යනය කිරීම ගැන මම මහත් සේ සතුටු වෙමි.

අරුණ වරුෂහෙන්නැදිගේ

අධ්‍යක්ෂ,
ගුවන් ව්‍යාපෘති - සියලුම ගුවන්තොටුපළ



අවදානම් කළමනාකරණ අධ්‍යක්ෂවරයාගේ පණිවිඩය

අවදානම් කළමනාකරණ කමිටුවේ සභාපතිවරිය සහ මෙම තනතුර දැරූ ප්‍රථම අධ්‍යක්ෂවරිය වශයෙන් මම විශ්වාස කරනු ලබන්නේ ඕනෑම ආයතනයකට තම අනාගත පැවැත්ම හා ආරක්ෂාව වෙනුවෙන් පවතින අවදානම් ආවරණය වන පරිදි ශක්තිමත් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති තිබීම සහ ක්‍රියාත්මක කිරීම අත්‍යවශ්‍ය අංගයක් බවයි.

පසුගිය කාලය තුළ, අනාගතයේ ඇති විය හැකි තර්ජන අවබෝධ කර ගැනීම සහ අවදානම් ඵලදායීව අවම කර ගන්නේ කෙසේද යන්න පිළිබඳව අපි වැඩි විශ්වාසයකින් සිතා බැලුවෙමු. තවද, අපගේ හැකියාවන් වැඩිදියුණු කරන ඵලදායි අවදානම් කළමනාකරණ උපායමාර්ග කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරන ශක්තිමත් ආයතනික පාලන යාන්ත්‍රණයක් අප සතුව ඇත. එය අපව වඩාත්, අපේ ඉලක්ක කරා යාමට අපව පොළඹවයි.

වර්තමාන දුෂ්කර වසංගත තත්ත්වය යටතේ වුවද ගුවන්ගමන් කර්මාන්තය තුළ අවදානම අවම කිරීම සහ පැවැත්ම සඳහා අපි විවිධ ආදේශකවල යෙදී සිටිමු. අපගේ මූලික අවශ්‍යතාවයක් වී ඇත්තේ කොවිඩ් 19 ගෝලීය වසංගතය තුළ මතුව ඇති අවදානම් වලින් අපගේ සේවකයින් සහ සමාජය ආරක්ෂා කර ගැනීමයි. ගු.ගු.සේ.ස කාර්ය මණ්ඩලයේ සියලු දෙනාම එක්ව මෙම අවදානම් මඟහරවා ගැනීමට කටයුතු කර ඇති අතර සංචාරක තහනම පැනවුවද මෙම කාලය තුළ රටේ ගුවන්තොටුපළ කිසිවක් වසා නොදැමීමට තරම් තිබූ ඔවුන්ගේ කැපවීම පිළිබඳව මම ආඩම්බර වෙමි. අවශ්‍ය කාර්යය සැලැස්ම පවත්වා ගැනීමට සහ සියළුම අත්‍යවශ්‍ය දේ සහතික කිරීම සඳහා අපි කඩිසරව වැඩ කිරීමේ උපායමාර්ග භාවිතය මෙන්ම අවශ්‍ය භාණ්ඩ සංචලනයන් ද සමඟ ගමන් අවශ්‍යතා ද සපුරාලන ලදී.

පත් කරන ලද අනු කමිටුවක් විසින් නිවසේ සිට වැඩ කිරීමේ ක්‍රම පිළිබඳව නිරන්තරයෙන් සොයා බලමින් සිටින අතර, අපගේ සියලුම

ගුවන්තොටුපළවල බාධාවකින් තොරව සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා දුරස්ථ ස්ථාන මෙහෙයුම් ක්‍රියා පටිපාටි වැඩිදියුණු කරමින් පවතින අතර ව්‍යාපාර අවශ්‍යතා සපුරාලන ලෙසත් ව්‍යවසාය සම්පත් සැලසුම් ක්‍රමය (ERP) සජීවීව පවත්වාගෙන යන තුරු කාලය කළමනාකරණය කිරීමටත් වර්තමාන වැඩ සැලසුම් සරල කිරීම බහුලව සිදු කෙරේ. මෙම දුෂ්කර කාලය තුළ කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය පවත්වා ගැනීම සහ කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීම තවත් අභියෝගයක් වී ඇති අතර, වර්තමාන සිදුවීම් පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා අපි ප්‍රවෘත්ති දැන්වීම් මාලාවක් ආරම්භ කළෙමු. තවද, කාර්ය මණ්ඩල කැපවීම සහ තරඟකාරී බව ගොඩනැගීම සඳහාත් වඩා හොඳ අන්තර් දෙපාර්තමේන්තු සබඳතා පවත්වාගැනීම සඳහාත් "බ්‍රේන් චැම්ප්ස් ප්‍රශ්නාවලිය" නමින් ප්‍රශ්න විචාරාත්මක සැසියක් ආරම්භ කරන ලදී.

මෙම දුෂ්කර කාලය තුළ කාර්ය මණ්ඩලයේ අභිප්‍රේරණය පවත්වා ගැනීම සහ කාර්ය මණ්ඩලය සේවයේ නියුක්ත කිරීම තවත් අභියෝගයක් වී ඇති අතර, කාර්යක්ෂමතාව කළමනාකරණය කිරීම සඳහා ගු.ගු.සේ.ස කාර්ය මණ්ඩල ප්‍රවාහන යාන්ත්‍රණයන් පිළිබඳ ගැඹුරු විශ්ලේෂණයක් කිරීමේ කර්තව්‍යය තවත් කෘත්‍යාධිකාරී මණ්ඩලයකට පවරා ඇත.

ඒ සඳහා නිරෝධායන සෞඛ්‍යය මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් සංචාරක සීමා වරින් වර පනවා ඇති ප්‍රදේශ අනුව ප්‍රවාහන පද්ධතිය ලාභදායී හා ආරක්ෂිත බවට පත් කිරීමට අපේක්ෂා කරයි.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ගුවන්සේවා කර්මාන්තය සමස්තයක් වශයෙන් පීඩාවට පත් වී ඇති අතර සේවකයින්ගේ සහ පාර්ශවකරුවන්ගේ සෞඛ්‍ය හා යහපැවැත්ම සුරැකීම සඳහා අපි දැඩි වෙහෙසක් දැරීමු.

සෑමවිටම කොටස් හිමියන්ගේ අරමුණු සලකා බලා මෙම උත්සාහය කෙරෙහි ඔවුන්ගේ විශ්වාසය අපි අඛණ්ඩව ගොඩනඟා ගන්නෙමු.

මෙම උත්සාහයේදී අනුග්‍රාහක මෙහෙයුම් සහ අපගේ වටිනා බිම් කුළී ගෙවන්නන් කළමනාකරණය කිරීම සඳහා අපි බොහෝ තොරතුරු රැස් කිරීමේ වේදිකා සහ උපකරණ පුවරු ආරම්භ කර ඇත්තෙමු. ණය කළමනාකරණය සඳහා වූ යාන්ත්‍රණයන් වැඩිදියුණු කරන අතරම අපේ ගුවන් නොවන ආදායම හොඳින් කළමනාකරණය කිරීම සඳහා අපි විකුණුම් ලක්ෂය පද්ධතියක් (POS) ආරම්භ කළෙමු.

අවදානම් අවම කර ගනිමින් නව ව්‍යාපාර අවස්ථා වල නියැලෙමින් ඕනෑම අවිනිශ්චිතතාවයකට මුහුණ දීමට අප ශක්තිමත් බව අපට විශ්වාසය. මෙම කරුණු සැලකිල්ලට ගෙන, 2020 වර්ෂය තුළදී සමස්ත මෙහෙයුම් ප්‍රවාහයේ වැඩිදියුණු කිරීම සහ සංවිධානයේ අවදානම් කළමනාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා කමිටුව බොහෝ සංවර්ධන කටයුතුවල ක්‍රියාකාරීව නිරත වී තිබේ.

විධිවිධාන නිකුත් කිරීම සහ ප්‍රතිපෝෂණය සක්‍රීයව කළමනාකරණය කිරීම මෙන්ම අධීක්ෂණය කිරීම සඳහා, අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර ගු.ගු.සේ.ස හි නිවැරදි අවදානම් කළමනාකරණ සංස්කෘතියක් ඇති කිරීමට සෑම අංශයකින්ම කමිටු සාමාජිකයින් පත් කර ගැනීම ඉවහල් වී ඇත.

ගු.ගු.සේ.ස හි පවතින අවදානම් කළමනාකරණ රාමුව තුළ සේවකයින්ගේ අවදානම පිළිබඳ දැනුවත් කිරීමේ මට්ටම තක්සේරු කිරීම සඳහා ස්වාධීන, වෘත්තීය උපදේශකයෙකුගේ සහාය ඇතිව පළමු නිල අවදානම් කළමනාකරණ ඇගැවුම් විනිශ්චය සමීක්ෂණය 2020 මැයි මාසයේදී සිදු කරන ලදී

වර්තමාන ගෝලීය වාතාවරණය අනුව ගු.ගු.සේ.ස හි අවදානම් ලේඛනය තවදුරටත් වර්ගීකරණය කර යාවත්කාලීන කළයුතු වනුයේ වගකිව යුතු ඕනෑම පුද්ගලයෙක් හා ආයතනයක් හඳුනා ගැනීම සඳහා එමඟින් විවිධ කාල පරාසයන් තුළ ඇති විය හැකි අවදානම් අවම කර ගත හැකි වන නිසාය.

කඩිනම් වැඩ කිරීමේ ක්‍රියාවලියක් වෙනුවෙන් සහයෝගය පවත්වා ගනිමින් පවත්වන ලද මණ්ඩල රැස්වීම් වල කාර්යක්ෂමතාව ඉහළ නංවන මෘදුකාංග විසඳුමක අපි ආරම්භ කළ බව සතුටින් පවසන්නෙමු. මේ වන විට එය අධ්‍යක්ෂ මණ්ඩලයේ මඟ පෙන්වීම යටතේ පරීක්ෂණයට භාජනය වෙමින් පවතී. නුදුරු අනාගතයේදී වේගයෙන් ව්‍යපාර කටයුතු සිදුකිරීම අරමුණු කරගනිමින් අවදානම් කළමනාකරණ කමිටුව කොවිඩ්- 19 පශ්චාත් කාලීන මධ්‍ය සැලසුම් ආරම්භ කර ඇත. ඒ අතරම, මෙම කාලය තුළ කාර්යක්ෂම සහ අත්‍යවශ්‍ය ආරක්ෂක අවශ්‍යතා පිළිබඳව කාර්ය මණ්ඩලයට සිහිපත් කිරීම සඳහා අපි අපගේ අභ්‍යන්තර සන්නිවේදන වේදිකාවන් ශක්තිමත් කළෙමු.

අපගේ වටිනා පාර්ශවකරුවන්ට සහ සංචාරකයින්ට වැඩි සේවාවක් සැපයීම සඳහා අපි යාවත්කාලීන කරන ලද පැමිණිලි කළමනාකරණ පද්ධතියක් (CMS) හරහා පැමිණිලි පරීක්ෂා කරන්නෙමු. දැනට පවතින පද්ධතිය අපගේ අභ්‍යන්තර තොරතුරු තාක්ෂණ අංශයේ සහාය ඇතිව වෙනස් කරන ලද අතර දැන් එය විවිධ පරිශීලක අංශ හරහා පරීක්ෂණ මට්ටමේ පවතී. තවද, පාර්ශවකරුවන්ට සුදුසු ප්‍රතිචාර ලබා දීම සඳහා වූ මැදිහත් යාන්ත්‍රණයක් ලෙස පැමිණිලි නිවැරදි ලෙස ගෙන ඒමට සහ ක්‍රියාත්මක වීමට මෙය ඉඩ සලසයි. එමඟින් අපගේ සංචාරකයින්ට තත්‍යකාලීන පැමිණිලි කිරීමට සහ/හෝ ප්‍රතිචාර ලබා දීමට හැකි අතර එම පැමිණිලිවල ප්‍රතිපෝෂණය කෙසේ දැයි සොයා බැලීමට කළමනාකරණයට ඉඩ සලසයි. සංවිධානයේ නිරන්තර දියුණුව සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වන අභ්‍යන්තර දෘෂ්ටි කෝණයකින් අප මුහුණ පාන අවදානම් හඳුනාගැනීම සඳහා සේවකයින්ගේ ප්‍රතිපෝෂණය අත්‍යවශ්‍ය අංගයක් ලෙස අපි සලකමු. කණ්ඩායම් අතර අභ්‍යන්තර සන්නිවේදන බාධකයන් හඳුනාගෙන ඒවාට පිළියම් යෙදීම සඳහා හරස් ක්‍රියාකාරී කණ්ඩායම් සන්නිවේදනය සිදුවුණි. එමඟින් කණ්ඩායම් අතර ලුහුඬු සටහන් පිළිබඳ විස්තරාත්මක ක්‍රියාකාරී සංවාදයක් සිදු වූ අතර කණ්ඩායම් සන්නිවේදන කේන්ද්‍රය ශක්තිමත් විය.

තොරතුරු තාක්ෂණය ආශ්‍රිත අවදානම් අවම කිරීම ඕනෑම ආයතනයක අත්‍යවශ්‍ය කර්තව්‍යයකි, විශේෂයෙන් සයිබර් ආරක්ෂාව, තොරතුරු අස්ථාන ගතවීම සහ අනිසි ලෙස භාවිතය හා සම්බන්ධ අනෙකුත් ගුවන්සේවා කර්මාන්තයේ විෂය පථය සැලකිල්ලට ගැනීමේදී ඇතිවන තාක්ෂණික අවදානම් සලකා බැලිය යුතුය. එසේම දේශගුණික විපර්යාසයන් වැදගත් අංගයක් ලෙස අපි සලකමු. දේශගුණික විපර්යාස, කාලගුණ විපර්යාස සහ අපේ සියලු ගුවන් යානා වලට බලපෑ හැකි ස්වාභාවික විපත් වලදී ව්‍යාපාර අඛණ්ඩතාව සැලසුම් කිරීම (BCP) සහ ආපදා ප්‍රතිසාධන සැලසුම් (DRP) සහ පුරුදු ශක්තිමත් කිරීම පිළිබඳව මූලික කණ්ඩායමට උපදෙස් දීම සඳහා අපි අනු කමිටුවක් පිහිටුවා ගත්තෙමු. තවත් ප්‍රධාන කරුණක් නම් නිරන්තරයෙන් සැලකිලිමත් වන වනජීවී තර්ජනයයි. සතුන්ගේ හා පක්ෂීන්ගේ යහපැවැත්ම ගැන සැලකිලිමත් වෙමින් යානා වලට ඇති අවදානම අවම කිරීම සඳහා හොඳම විසඳුම් ලබා දීම සඳහා කෘත්‍යාධිකාරී මණ්ඩලයක් ද පත් කරන ලදී.

ඉහත සඳහන් කළ පරිදි, අපි බොහෝ නවෝත්පාදන ලබා දී ඇති බව පැවසීමට හැකිවීම ගැන මම සතුටු වෙමි. සාර්ථකත්වය ඉහළ නැංවීම සහ සමස්ත කාර්ය සාධනය සහතික කිරීම සඳහා ගු.ගු.සේ.ස වෙත නව්‍ය විසඳුම් ඉදිරිපත් කර තවදුරටත් සමාගම ශක්තිමත් කිරීම අපගේ අරමුණයි. අවදානම් කළමනාකරණ රාමුව ඉලක්ක කර ඇත්තේ අවදානම් සාධක හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ අවම කිරීම තුළින් මෙහෙයුම්, උපායශීලී හෝ උපායමාර්ගික වශයෙන් කුමක් මගින් වුවත් ඇති විය හැකි අවදානම් වලට මුහුණ දීමයි. අපගේ පාර්ශවකරුවන්ගේ පරමාර්ථයන් සපුරාලමින් අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා සියළුම උත්සාහයන් සංකල්පීය කර ක්‍රියාත්මක කර ඇති අතර ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා වෙහෙස මහන්සි වී වැඩ කළ මගේ සම අධ්‍යක්ෂවරුන්ට සහ ඉතා කැපවීමෙන් කැප වූ කණ්ඩායමට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

2020 වසර සඳහා වන වාර්ෂික වාර්තාවට මෙම පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම ගැන මම ඉතාමත් සතුටු වෙමි. තවද, ජාත්‍යන්තර ගුවන්සේවා සහ දේශීය සමාගම් කිහිපයකම වැඩ කර ඇති කර්මාන්තකරුවෙකු වශයෙන්, ජාතික ගුවන්සේවා කර්මාන්තයේ කොටස්කරුවෙක් වීමට අවස්ථාව ලැබීම සහ සේවය කිරීමට මෙම අවස්ථාව උදා කර දීම ගැන නිහතමානීව සතුටුවන බවද පැවසීමට කැමැත්තෙමි.

අවදානම් කළමනාකරණ කමිටුව හරහා මගේ උපරිම දක්ෂතාවයෙන් ආයතනය උසස් මට්ටමක් කරා ගෙන ඒමට මම දැඩි උද්යෝගයකින් කටයුතු කරන අතරම ආයතනයේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා කාර්ය සාධනීය අවදානම් කළමනාකරණය අත්‍යවශ්‍ය අංගයක් යැයි මම විශ්වාස කරමි.

ඩෙයඩ්‍රි ද ලිවේරා

අවදානම් කළමනාකරණය සඳහා වූ මණ්ඩල අනුකමිටුවේ අධ්‍යක්ෂ සහ සභාපති

විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව (AUMC)

විගණන සහ කළමණාකරණ කමිටුවෙහි මූලික කාර්යභාරය වන්නේ අධ්‍යක්ෂ මණ්ඩලයට එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීමේදී සහාය වීමයි. AUMC පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසිනි.

විගණන හා කළමනාකරණ කමිටුවේ (AUMC) සංයුතිය

විගණන සහ කළමණාකරණ කමිටුවෙහි සාමාජිකයින් පත් කරනු ලබන්නේ පොදු ව්‍යවසාය චක්‍රලේඛයේ (PED) අංක 55 හි නියම කර ඇති විධිවිධානවලට අනුකූලවය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විශේෂිත කොන්දේසි පිළිබඳ නියමයන්ට (TOR) අනුකූලව කමිටු ක්‍රියාදාමයන් සිදු කරන ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් (03) සමන්විත විගණන සහ කළමණාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලැබේ. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කමිටුවේ සංයුතිය පහත පරිදි විය.

කමිටු සාමාජික	සිට සාමාජික	තනතුර
ආර් එම් ඒ රත්නායක - භාණ්ඩාගාර නියෝජිත	16.01.2020	සභාපති
ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක	12.12.2019	සාමාජික
ඩී ඒ පී වීරරත්න PC	23.10.2020	සාමාජික
පී ටී වීරසිංහ	12.12.2019 සහ 10.09.2020 යන දින ඉල්ලා අස්විය.	සාමාජික

රැස්වීම්

රට තුළ පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව මගින් අවම වශයෙන් රැස්වීම් දෙකක් (02) පැවැත්වීමේ අවම අවශ්‍යතාවය වුවත් විගණන සහ කළමණාකරණ කමිටුව අවස්ථා හතරකදී (04) 2020 දී රැස් විය. විගණන සහ කළමණාකරණ කමිටු සාමාජිකයින්ගේ පැමිණීම පහත දැක්වේ:

අධ්‍යක්ෂවරයාගේ නම	සහභාගී වූ කමිටු රැස්වීම් ගණන
ආර් එම් ඒ රත්නායක	04
ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක	04
ඩී ඒ පී වීරරත්න PC	03
පී ටී වීරසිංහ	01

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විගණන සහ කළමණාකරණ කමිටු ප්‍රඥප්තිය මගින් අවශ්‍ය වන පරිදි විගණන සහ කළමණාකරණ කමිටු රැස්වීම්වල ක්‍රියාදාමයන් ප්‍රමාණවත් විස්තර සහිතව සටහන් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිතිපතා වාර්තා කරන ලදී.

විධිනියෝගය සහ භූමිකාව

විගණන සහ කළමණාකරණ කමිටුව විසින් 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වැනි වගන්තිය සහ 2010 දෙසැම්බර් 14 දිනැති PED 55 චක්‍රලේඛය මගින් සිය වගකීම් ඉටු කිරීමේදී ලබා දී ඇති විධිනියෝග පිළිගෙන ඇත. මූල්‍ය වාර්තාකරණය, තත්ත්ව සහතිකය, මූල්‍ය අවදානම් කළමනාකරණය, අභ්‍යන්තර පාලන පද්ධතිය, අභ්‍යන්තර හා බාහිර විගණන පිළිබඳ එහි සමස්ත අධීක්ෂණය ඉටු කිරීමට විගණන සහ කළමණාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය.

කොන්දේසි පිළිබඳ නියමයන් (TOR)

මුදල් වර්ෂය තුළ විගණන කමිටු ප්‍රඥප්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී. PED 55 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව සකස් කරන ලද සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද විශේෂිත කොන්දේසි පිළිබඳ නියමයන් (TOR) මගින් කමිටුව පාලනය වේ. කොන්දේසි පිළිබඳ නියමයන් සහ රජයේ අවශ්‍යතාවය අනුව තම වගකීම් ඉටු කිරීමේදී විගණන සහ කළමණාකරණ කමිටුව පහත සඳහන් අරමුණු කෙරෙහි අවධානය යොමු කරයි.

1. අභ්‍යන්තර විගණන අංශයේ විෂය පථය සහ වගකීම් තීරණය කිරීම.
2. වාර්ෂික විගණන සැලැස්ම සහ කාර්යමාලාව සමාලෝචනය කර අනුමත කිරීම.
3. ආයතනයේ සියලුම ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති සමාලෝචනය කර ඇගයීම.
4. බාහිර විගණකවරුන් සමඟ සම්බන්ධ වී විගණකාධිපතිගේ කළමනාකරණ ලිපිය සහ ඒ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය පිළිබඳ පසු විපරම් කිරීම.
5. අයවැය සමාලෝචන වාර්තා ඇතුළු මූලික අභ්‍යන්තර මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
6. ගිණුම්කරණ ප්‍රමිතීන් සහ මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම.
7. අභ්‍යන්තර විගණක සහ බාහිර විගණකවරුන් සමඟ අන්තර් ක්‍රියා කිරීම.
8. ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කාර්ය මණ්ඩලය ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නීති රීති හා රෙගුලාසි පිළිබඳව හුරුපුරුදු බව සහතික කර ගැනීම සහ ඔවුන්ගේ ව්‍යවස්ථාපිත සහ අනෙකුත් නීති රීතිවලට අනුකූල වීම සමාලෝචනය කිරීම.
9. අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තාව/ විමසුම් නිතිපතා සමාලෝචනය කිරීම සහ පෙන්වා දී ඇති අඩුපාඩු පිළිබඳව එක් එක් අංශ ප්‍රධානීන් විසින් ගන්නා ලද කඩිනම් ක්‍රියාමාර්ග සහතික කිරීම.
10. බාහිර විගණකවරුන්ගේ වාර්තාව/ විමසුම් සමාලෝචනය කර පුනරාවර්තනය වීම වැළැක්වීමට අවශ්‍ය විය හැකි නිවැරදි ක්‍රියාමාර්ග ගන්න.
11. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE) නිර්දේශ ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම සහ ඒවා පිළිබඳ ක්‍රියාමාර්ග/ සහතික කිරීම් වරින් වර අධීක්ෂණය කිරීම.
12. අභ්‍යන්තර විගණකවරුන්ගේ අඛණ්ඩ අපක්ෂපාතීත්වය සහ ඔවුන්ගේ කාර්යක්ෂමතාවය සමාලෝචනය කරන්න.
13. අභ්‍යන්තර/බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සහ කෝප් කමිටුවේ නිර්දේශ සමාලෝචනය කර ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලයට උදව් කිරීම.
14. ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන පද්ධතියක් හඳුන්වා දීමට සහ ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීම.
15. අවම වශයෙන් මාස තුනකට වරක් රැස්වී එහි නිර්දේශ නිවැරදි ක්‍රියාමාර්ග ගැනීමට පහසුකම් සැලසීම සඳහා රැස්වීමේ මිනිත්තු සමඟ ඉක්මනින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම.

2020 වසරේ ක්‍රියාකාරකම්

කොවිඩ්-19 පැතිරීම සම්බන්ධ ක්‍රියාකාරකම්

2020 මාර්තු මාසයේ සිට ගෝලීය වශයෙන් කොවිඩ්-19 පැතිරීම සහ පැතිරීම ගු.ගු.සේ.ස මෙහෙයුම් වලට බාධා ඇති කර ඇති අතර ශ්‍රී ලංකාව තුළ පමණක් නොව ලොව පුරා සියලුම රටවල් අතර පුළුල් අවිනිශ්චිතතාවයක් ද ඇති කර තිබේ.

මෙම තත්ත්වයන් යටතේ, විශේෂයෙන් පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලෙස විගණන සහ කළමණාකරණ කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කළේය:

- සමාගම සඳහා ආදායම් ලැබිය හැකි වෙනත් මූලාශ්‍ර හඳුනා ගැනීමේ හැකියාව ගවේෂණය කිරීම.
- ව්‍යාපාරයේ පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය වියදම්, ප්‍රසම්පාදනය සඳහා පමණක් ඉඩ සලසන වියදම් සම්බන්ධයෙන් දැඩි ක්‍රියාමාර්ග යෙදීම.
- නියමිත කාල පරාසයන් තුළ අයවැය සමඟ වියදම් වැඩසටහන් සමාලෝචනය කිරීම සහ සමීපව අධීක්ෂණය කිරීම සහ පහසුවෙන් කල් දැමිය හැකි වියදම් කපා හැරීම / කල් දැමීම සහ අත්‍යවශ්‍ය වියදම් පියවා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සුදුසු පරිදි ආරම්භ කිරීම.
- සැලකිය යුතු ලෙස අඩුවෙමින් පවතින ආදායම නිසි ලෙස ගිණුම්ගත කර කාලෝචිත ලෙස එකතු කර ඇති බවට වග බලා ගැනීම.

ප්‍රතිපාදන නිවැරදිව ග්‍රහණය කර ගත්තේද යන්න තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පිළිබඳ අභ්‍යන්තර පාලනය තවදුරටත් ශක්තිමත් කිරීම සහතික කිරීම සඳහා විගණන සහ කළමණාකරණ කමිටුව විසින් කොවිඩ්-19 කාල සීමාව තුළ අවශ්‍ය පියවර ආරම්භ කරන ලදී.

මූල්‍ය වර්ෂය තුළ, කමිටුවේ මගපෙන්වීම අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ මූල්‍ය ප්‍රකාශනවල අනුකූලතාව පිළිබඳ සුදුසු මතයක් ප්‍රකාශ කිරීම සඳහා ප්‍රධාන බාධක/සීමාවන් ලෙස බාහිර විගණක විසින් සලකා බලා ඇති දිගුකාලීන ගැටලු කිහිපයක් නිවැරදි කිරීමට කළමනාකාරිත්වය නිවැරදි ක්‍රියාමාර්ග ගන්නා ලදී.

මූල්‍ය වාර්තාකරණය

වාර්තාකරණ කාලසීමාව තුළ පාර්ශ්වකරුවන්ට සපයනු ලබන තොරතුරුවල විශ්වසනීයත්වය සහතික කිරීම සඳහා මූල්‍ය වාර්තාකරණ පද්ධතියේ සඵලතාවය කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. ගිණුම් පොත් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සත්‍ය සහ සාධාරණ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම ඉටු කිරීමට කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය විය. සියලුම ගනුදෙනු නිවැරදිව සහ සම්පූර්ණයෙන් ගිණුම් පොත්වල සටහන් කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සහ ක්‍රියා පටිපාටිවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී සිදු කරන ලද සැලකිය යුතු උපකල්පන සහ විනිශ්චයන් ඇතුළත් ආධාරක තොරතුරු සමඟින් මාසික පදනමින් සකස් කරන ලද අතුරු මූල්‍ය ප්‍රකාශන කමිටුව විසින් සමාලෝචනය කරන ලදී. එසේම, කාරක සභාව විසින් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශන කෙටුම්පත්, 2021 වසර සඳහා සකස් කළ අයවැය කෙටුම්පත සහ 2021-2023 සඳහා ආයතනික සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර සමාලෝචනය කරන ලදී. පවතින අභ්‍යන්තර පාලන පද්ධති සහ

ක්‍රියා පටිපාටි තක්සේරු කිරීමෙන් පසු, සමාගමේ මූල්‍ය තත්ත්වය හොඳින් නිරීක්ෂණය කර නිවැරදිව වාර්තා කර ඇති බවට සාධාරණ සහතිකයක් ලබා දීම සඳහා ප්‍රමාණවත් පාලන සහ ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක බව කමිටුවේ අදහසයි.

අභ්‍යන්තර පාලන

විගණන සහ කළමණාකරණ කමිටුව විසින් 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලනයේ සඵලතාවය තක්සේරු කරන ලදී. මෙම ක්‍රියාවලිය විවිධ අවදානම් අවම කිරීම සඳහා සහ නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව සහ සඵලතාවය තක්සේරු කරන ලදී.

ගු.ගු.සේ.ස. අභ්‍යන්තර පාලන පද්ධතිවල සඵලතාවය වැඩිදියුණු කිරීම සඳහා අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික (IA&QA) ප්‍රධානියාගේ නිර්දේශ මත කළමනාකාරිත්වය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බවට විගණන සහ කළමණාකරණ කමිටුව සහතික කරයි. අභ්‍යන්තර පාලන රාමුවේ පදනම තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට එහි කාර්යයන් කරගෙන යාමට සහ අවශ්‍ය පියවර ගැනීමට හැකි වේ.

අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන (IA) ශ්‍රිතය ස්වාධීන සහ වෛෂයික සහතික කිරීමේ කාර්යයක් වන අතර එය ගු.ගු.සේ.ස. හට එහි සමස්ත පාලන රාමුව වැඩිදියුණු කිරීමට සහාය වේ. IA කාර්යය නඩත්තු කිරීමට දායක වේ. ගු.ගු.සේ.ස. අවදානම් කළමනාකරණය, පාලනය සහ සාමූහික පාලන ක්‍රියාවලීන්හි සැලසුම් සහ සඵලතාවය ඇගයීම සහ වැඩිදියුණු කිරීම සඳහා ක්‍රමානුකූල සහ විනයගරුක ප්‍රවේශයක් ඇත.

විගණන සහ කළමණාකරණ කමිටුව විසින් ගු.ගු.සේ.ස. හි මූල්‍ය සහ ගිණුම්කරණ මෙහෙයුම් සත්‍ය වශයෙන්ම සිදු කිරීම සඳහා වගකිව යුතු අය මෙන්ම යෝජනා ක්‍රම සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හෝ ඉටුකරන ලද කාර්යයන් සහ සේවාවන් ක්‍රියාත්මක කිරීමෙහි නියැලී සිටින අයගේ පාලනයෙන් ස්වාධීනව අභ්‍යන්තර විගණන ක්‍රියාකාරිත්වය සහතික විය. ගු.ගු.සේ.ස. යහපත් පාලන අනුකූලව අපක්ෂපාතීව ප්‍රවීණත්වය සහ නිශ්චිත වෘත්තිය පරිචයකින් යුතුව සිදුකරනු ලබයි. විගණන සහ කළමණාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික කිරීමේ අංශයේ ක්‍රියාකාරකම්වල විෂය පථය, සම්පත්, ප්‍රමාණය සහ සඵලතාවය අධීක්ෂණය කර සමාලෝචනය කරන ලදී.

විගණන සහ කළමණාකරණ කමිටුව විසින් 2021 වර්ෂය සඳහා වන වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සමාලෝචනය කර, තක්සේරු කර අනුමත කරන ලදී. විගණන සහ කළමණාකරණ කමිටුව විසින් අභ්‍යන්තර විගණනයේ සැලකිය යුතු විගණන සොයාගැනීම් සහ නිර්දේශ සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාරය සමාලෝචනය කර අධීක්ෂණය කරන ලදී.

බාහිර විගණනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව (19 වැනි සංශෝධනය) අනුව ගු.ගු.සේ.ස. හි බාහිර විගණනය සිදු කිරීමට විගණකාධිපතිට බලය පවරා ඇත. ඒ අනුව, විගණකාධිපති 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සමාගමේ බාහිර විගණකවරයා ලෙස කටයුතු කරයි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමඟ මූල්‍ය ප්‍රකාශනවල අනුකූලතාව පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට වගකිව යුතු පාර්ශවය ලෙස බාහිර විගණක සමඟ සමීපව සම්බන්ධ වේ.

සියලුම විගණන සහ කළමණාකරණ කමිටුව රැස්වීම් සඳහා ස්වාධීන නිරීක්ෂකයෙකු ලෙස බාහිර විගණකවරයාට ආරාධනා කරන ලද අතර, කමිටුවට ඔවුන්ගේ අදහස් දැරීමට සහ නියාමන සහ අනුකූලතා අවශ්‍යතා සහ පාලන හෝ ක්‍රියා පටිපාටි දුර්වලතා ඇත්නම් ඒවා පිළිබඳ ඔවුන්ගේ අවබෝධය සාකච්ඡා කිරීමට හැකි විය.

යහපත් සාමූහික පාලනය

PED චක්‍රලේඛය වැනි නියාමන අවශ්‍යතා අනුගමනය කිරීමේ වැදගත්කම සහ අවශ්‍යතාවය පිළිබඳව දැනුවත් කිරීම මගින් ගු.ගු.සේ.ස. හි සාමූහික පාලනය, ක්‍රියාශීලී සංස්කෘතිය ප්‍රවර්ධනය කිරීම සඳහා විගණන සහ කළමණාකරණ කමිටුව ඉමහත් දායකත්වයක් ලබා දිය හැකිය.

නිගමනය

මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලීන්, අභ්‍යන්තර පාලන පද්ධතිවල ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය බාහිර විගණන සහ රෙගුලාසි වලට අනුකූලව ගු.ගු.සේ.ස. ක්‍රියාවලියන් සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීම් සහ වගකීම් ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය සහ මගපෙන්වීම සමඟ ගු.ගු.සේ.ස. හි ව්‍යාපාරවල ස්වාධීන අධීක්ෂණය සමතුලිත කිරීමට විගණන සහ කළමණාකරණ කමිටුව උත්සාහ කර ඇත. නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම නිරීක්ෂණය කිරීම සඳහා ගු.ගු.සේ.ස. හි ක්‍රියාවලිය. විගණන සහ කළමණාකරණ කමිටුව වසර තුළ සිය රාජකාරී සාර්ථකව සහ උසස් ප්‍රමිතියකින් ඉටු කර ඇති බවට විශ්වාසය තැබීමට හේතු රාශියක් ඇති බව කමිටුව විශ්වාස කරයි, එමඟින් සමාගමේ වටිනාකම සඵල කිරීමට උපකාරී වේ.

සභාපති - විගණන සහ කළමනාකරණ කමිටුව (AUMC)

2021 අගෝස්තු 10



ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්ව කණ්ඩායම

අසුන් ගෙන සිටින - වමේ සිට දකුණට

1 යූ එස් ජාගොඩ- සිවිල් ඉංජිනේරු ප්‍රධානී (නඩත්තු)
2 එස් පී පාලගම - යාන්ත්‍රික ඉංජිනේරු වැඩබලන ප්‍රධානී
3 එම් කේ පී තැන්නගේ (මිය) - අභ්‍යන්තර විගණන හා තත්ත්ව සහතික කිරීමේ ප්‍රධානී
4 කේ එච් සී කුමාරසිංහ - බුද්ධි හා ආරක්ෂණ මෙහෙයුම් ප්‍රධානී
5 එන් සී අබේවර්ධන - ගුවන් සන්තරණ සේවා ප්‍රධානී
6 යූ ජේ ලොකුආරච්චි - තොරතුරු තාක්ෂණ ප්‍රධානී

සිටගෙන - වමේ සිට දකුණට

1 එස් එස් ද සිල්වා- අලෙවිකරණ හා ආයතනික සන්නිවේදන ප්‍රධානී
2 කේ ඩී වයි චාන්දනී (මිය) - උපායමාර්ගික කළමනාකරණ අංශයේ ප්‍රධානී
3 එස් ඩී ඒ එස් නිශාන්ත - සමාගම් වෛද්‍ය නිලධාරී
4 එස් එම් ඩී විජේසූරිය - ගිනි හා මුදවාගැනීමේ සේවා ප්‍රධානී
5 යූ එම් වීරවර්ධන - විදුලි ඉංජිනේරු අංශ ප්‍රධානී
12 එම් සී ජී මහිපාල (මිය) - මානව සම්පත් ප්‍රධානී (පින්තූරයේ නැත)

ගුවන් තොටුපල සහ ගුවන් සේවා ශ්‍රී ලංකා (පෞද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව 2020

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව කණ්ඩායම



අසුන්ගෙන - වමේ සිට දකුණට

1 ඒ අයි බී කරුණාරත්න- ව්‍යාපෘති ප්‍රධානී
2 එච් ඒ ඒ කේ එම් සෙනෙවිරත්න - සිවිල් ගුවන් සේවා පුහුණු ප්‍රධානී
3 එම් රත්නසිංහ (මිය) - නීති ප්‍රධානී
4 එච් එස් හෙට්ටිආරච්චි - ගුවන්තොටුපළ කළමනාකරණ ප්‍රධානී
5 ජේ එම් ද කෘස් රුබින් - ගෘහ නිර්මාණ භූමි අලංකරණ සහ අභ්‍යන්තර නිර්මාණ ප්‍රධානී
6 ඩී ජේ යූ පුරසිංහ - වාණිජ හා දේපල ප්‍රධානී

සිටගෙන - වමේ සිට දකුණට

1 ජේ ඒ එම් ඩී එස් එස් අබේවර්ධන - වැඩබලන මුල්‍ය ප්‍රධානී
2 ජේ කේ රත්හින්ද - ඉලෙක්ට්‍රොනික හා ගුවන් සංකරණ ඉංජිනේරු ප්‍රධානී
3 එච් පී එල් සිරිමාන්න - සැපයුම් දාම කළමනාකරණ ප්‍රධානී
4 ආර් ඩබ්ලිව් එල් බී මැදවැව - භාණ්ඩ හා ගුවන් භාණ්ඩ කළමනාකරණ ප්‍රධානී
11 මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ඒ පී පල්ලාවෙල - ගු.ගු.සේ.ස හි සියලුම ජාත්‍යන්තර ගුවන්තොටුපළ සඳහා උපායමාර්ගික ආරක්ෂක උපදේශක (පින්තූරයේ නැත)

අපගේ දැක්ම හඹායමින් ...

කළමනාකරණ සාකච්ඡාව සහ සමාලෝචනය

"අපගේ දැක්ම හඹායාමේදී" මූලික ව්‍යූහාත්මක වෙනස්කම් සිදුකිරීම.

පෙරදැක්ම, පසුදැක්ම සහ සූක්ෂම විමර්ශනය තුලින් අනෙක් අයට දැකිය නොහැකි දෙය දැකීම.

ගෝලීය තත්වය සහ ශ්‍රී ලංකාවේ තත්වය

කොවිඩ්-19 වසංගතයේ පැතිරීම ගෝලීය ආර්ථිකයට සුවිශාල අභියෝග නිර්මාණය කර ඇත. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සංචාරක හැසිරීම් වල සිදුවූ වෙනස් වීම, සංචරණය සීමා කිරීම සහ පසුව ඇතිවූ ආර්ථික අර්බුදය, ගුවන් සේවා සහ ගුවන්තොටුපළ මෙහෙයුම් සඳහා වූ ඉල්ලුම අහිතකර ලෙස අඩු කිරීමට හේතු විය. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයට අනුව සමස්ථ ලෝකයම ගෝලීය වශයෙන් 2020 වසරට අදාළව ගුවන් මගී ගමනාගමනයෙහි 60%ක අඩුවීමක් අත්විඳ ඇත. ගෝලීය වශයෙන් ගුවන් ගමන් වල යෙදුණු මගීන් සංඛ්‍යාව බිලියන 1.8 කින් පහත වැටී ඇත. වර්ෂ 2020 මැයි මස 18 වැනිදා වන විට ලෝකයේ බොහෝ සංචාරක ගමනාන්තයන් තම තමන්ගේ රටවල් තුල සංචරණ සීමාවන් පණවා තිබේ

තව දුරටත් සංචාරක ගමනාන්තයන්ගෙන් 85% ක් පමණ ජාත්‍යන්තර සංචාරක කටයුතු සඳහා දේශසීමා සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් වසා දමා ඇති අතර, ගමනාන්තයන්ගෙන් 11 ක් (5%) ජාත්‍යන්තර ගුවන් ගමන් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් අත්හිටුවා ඇත. ලෝක ගමනාගමන හා සංචාරක කවුන්සිලයේ (WTTC) දත්ත පදනම් කරගෙන ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) පවසන පරිදි 2020 දී ගමනාගමන හා සංචාරක ක්ෂේත්‍රයේ රැකියා මිලියන 197 ක් අහිමි වී ඇත. 2019 හා සසඳන විට ජාත්‍යන්තර ගුවන් ප්‍රවාහන සංගමය (IATA) 2020 දී කිලෝමීටරයකට මගී ආදායමේ 65.9% ක පහත වැටීමක් ගණනය කර ඇත.

ශ්‍රී ලංකාවේ සන්දර්භය තුළ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ පෙර නොවූ විරූ අභියෝග මුළු රටටම දැඩි ලෙස බලපෑවේය. 2019 දී වාර්තා වූ 2.3%ක වර්ධනයට සාපේක්ෂව, 2020 දී සියළුම කර්මාන්ත ඇතුළුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය 3.6% කින් පමණ සෘණාත්මක වර්ධනයක් වාර්තා කළේය. වසර 2020, දී 2019 හා සැසඳීමේදී ජාත්‍යන්තර ගුවන් තොටුපළවල මගී සංචලනය 76% කින් අඩු වී ඇති අතර පියාසැරි ප්‍රමාණයේ 64% ක අඩු වීමක් සිදු විය.

සිවිල් ගුවන්තොටුපොළ ක්‍රියාකරු ලෙස සීමාසහිත ගුවන්තොටුපොල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ (ගු.ගු.සේ.ස) දායකත්වය

සීමාසහිත ගුවන්තොටුපළ හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම (ගු.ගු.සේ.ස) මෙරට සිවිල් ගුවන්තොටුපළ ක්‍රියාකරු වශයෙන් ගුවන්තොටුපළ මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීමේදී ශ්‍රී ලංකා සෞඛ්‍ය බලධාරීන්ගේ මඟ පෙන්වීම් වලට අනුකූලව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුවල සමාජ දුරස්ථභාවය සහ නිසි විෂබීජ නාශක ක්‍රියාවලීන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් අපි ගු.ගු.සේ.ස හි සියළුම මෙහෙයුම් කටයුතු සුමටව කරගෙන ගියෙමු. මේ අතර මෙම දුෂ්කර කාලයේදී විවිධ සහන ලබා දීමෙන් අනෙකුත් සියලුම ප්‍රධාන පාර්ශවකරුවන් ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ඔවුන් සමඟ අත්වැල් බැඳගනිමින් කටයුතු කරන ලදී.

තවද ගු.ගු.සේ.ස විසින් 2020 වසර තුළදී බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (බ.ජා.ගු.) සහ මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ (ම.රා.ජා.ගු.) හරහා භාණ්ඩ මෙට්‍රික් ටොන් 150,075 ක් හසුරුවමින් භාණ්ඩ ප්‍රවාහන කර්මාන්තයේ අවශ්‍යතා සඳහා ප්‍රධාන භූමිකාවක් ඉටු කරමින් ශ්‍රී ලංකා ආර්ථිකයට දායක විය. මෙම ගෝලීය අර්බුද කාලසීමාව පුරාම ගු.ගු.සේ.ස ශ්‍රීලංකා රජයේ සහ සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් යටතේ අපගේ ආර්ථිකය නගා සිටුවීම සඳහා බණ්ඩාරණායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ (බ.ජා.ගු.) සහ මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ (ම.රා.ජා.ගු.) යන දෙකෙහිම ක්‍රියාත්මක වන ගුවන් සමාගම් සමඟ එකට එක්ව කටයුතු කරන ලදී. ඒ අනුව ලොව පුරා අතරමංව සිටි ශ්‍රී ලාංකිකයින් 82,000 කට අධික සංඛ්‍යාවක් ආපසු සිය රටට ගෙන්වාගෙන තිබේ.

ලාභය, පුද්ගලයන් සහ ප්‍රේව ගෝලීය යන අතිශය වැදගත් මූලිකාංග කෙරෙහි සමාන ලෙස අවධානය යොමු කරමින් 2020 වසර විශ්ලේෂණය

කොවිඩ්-19 ගෝලීය වසංගතය විසින් ඇති කරන ලද සියලු අභියෝග මධ්‍යයේ වුවද ගු.ගු.සේ.ස සිය දැක්ම සාක්ෂාත් කරගැනීමේ අරමුණ නොකඩවා ලුහුබැඳ යන අතර, පහත රූප සටහන 01 හි දක්වා ඇති පරිදි ලාභය, පුද්ගලයින් සහ ප්‍රේව ගෝලීය යන විචල්‍යයන්ගේ අපේක්ෂාවන් තිරසාර අන්දමින් සපුරාලීම සහතික කරයි. 2020 වසර පුරාම ගු.ගු.සේ.ස විසින් සමස්ත තිරසාරභාවය පවත්වා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රධාන කාරණා පහක් අනුගමනය කරන ලදී.

1. ප්‍රාග්ධන හා වාණිජ ව්‍යාපෘති කෙරෙහි අවධානය
2. කාර්යක්ෂමතා / ඵලදායීතා වර්ධනය
3. සේවා ගුණාත්මකභාවය
4. සුරක්ෂිතභාවය
5. ආරක්ෂාව

ත්‍රිත්ව පතුලේ රේඛාව (Triple Bottom Line) මත පදනම් වූ තිරසාරභාවය පිළිබඳ දැක්ම - 3Ps



රූපය 01: ආයතනික ඉදිරිදර්ශනය සහ ගුවන්තොටුපළ මෙහෙයුම්

01. සවිබල ගැන්වූ වාණිජ හා ප්‍රාග්ධන ව්‍යාපෘතීන් සමග වසංගතය ජයගැනීම

වසංගතය අතරතුර ලෝකයේ සෑම ගුවන් තොටුපළකම පාහේ මූලික ව්‍යාපාර දැඩි ලෙස පීඩාවට පත් විය. දැක්ම සාක්ෂාත් කර ගැනීමේදී නව කෙටිකාලීන හා මධ්‍යකාලීන විසඳුම් සෙවීම වැදගත් වේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ බොහෝ සමාගම් අතර පොදු සහ ජනප්‍රියම තේමාව නම් කිසිදු නව නිපැයුමක් ආරම්භ නොකර 'නොනැසී පැවතීම පමණි' යන්නයි. එම න්‍යායට සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ දිශාවට ගමන් කරමින් ගු.ගු.සේ.ස. ගෝලීය පශ්චාත් කෝවිඩ්-19 යුගයේ මගීන් සඳහා යහපත් හා සංපෘහසු වාතාවරණයක් ඇති කිරීමේ දැක්ම ඇතිව 2020 වසර පුරා නව වාණිජමය ව්‍යාපාර රාශියකට යොමු විය. ඊට අමතරව නව ගුවන්සේවා ආකර්ෂණය කර ගැනීම සඳහා සහයෝගිතා සාකච්ඡා ආරම්භ කරන ලදී.

නව උපායශීලී දැක්මක් සමග මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොළ නවීකරණය කිරීම

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන්ගේ ප්‍රතිපත්තිය වූ 'සෞභාග්‍යයේ දැක්ම' යටතේ සහ ජාත්‍යන්තර ගුවන්තොටුපළ සංවර්ධනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ ම.රා.ජා.ගු සංවර්ධනය සඳහා හඳුනාගෙන ඇත. ම.රා.ජා.ගු කෙටි කාලසීමාවක් තුල ඉහළ මගී සංචලනයකට පහසුකම් සැලසීම මගින් එහි දියුණුව පෙන්නුම් කර ඇත. 2020 දී ම.රා.ජා.ගු මගින් හසුරුවන ලද සමස්ථ මගී සංචලනය 17,421 ක් වන අතර ගුවන් යානා සංචලනය 349 කි.

ම.රා.ජා.ගු කෙරෙහි ගුවන්සේවා සමාගම් නියෝජිතයන්ගේ දැඩි උනන්දුව

ම.රා.ජා.ගු විදේශීය සංචාරක කර්මාන්තය පදනම් කරගත් ගමනාන්තයක් බවට පත්කිරීම සඳහා වූ නව අභිලාෂයන් සමඟ ගුවන් සමාගම් නියෝජනය කරන නියෝජිත කණ්ඩායමක් 2020 ජූනි 3 දින මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ නිල සංචාරයක නිරත විය. උපායමාර්ගික අලෙවිකරණ අවස්ථා පිළිබඳව ගුවන් සේවා ක්‍රියාකරුවන් දැනුවත් කිරීම සහ ම.රා.ජා.ගු සහ ප්‍රධාන ආසියානු හා යුරෝපීය සංචාර සඳහා ම.රා.ජා.ගු සිට නව ගුවන් මාර්ග ආරම්භ කිරීමේ හැකියාවන් ගවේෂණය කිරීම මෙම සංචාරයේ ප්‍රධාන පරමාර්ථය විය. විත්මන් රජයේ සංවර්ධන සැලැස්ම යටතේ ගු.ගු.සේ.ස. ජාත්‍යන්තර ගුවන් සමාගම් ආකර්ෂණය කර ගැනීමට සහ ගුවන් සමාගම් සඳහා ආකර්ෂණීය දිර දීමනා ලබා දෙමින් ම.රා.ජා.ගු වෙතින් නැවත ජාත්‍යන්තර ගුවන් ගමන් ආරම්භ කිරීමට උපායමාර්ගික පියවර ගෙන ඇත. කාල සටහන්ගත ජාත්‍යන්තර ගුවන් සමාගම් සඳහා ගොඩබෑමේ සහ නැවැත්වීමේ ගාස්තු සඳහා සහන ලබාදීම් සහ සංචාරකයින්ගෙන් ගුවන් යානාවට නැගීමේ ගාස්තු ඉවත් කිරීම සඳහා විශේෂ කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කෙරිණි. ප්‍රවර්ධන දිර දීමනාවක් වශයෙන් ම.රා.ජා.ගු. එක් මගියෙකුට ඩොලර් 60 බැගින් වූ ගුවන් යානාවට නැගීමේ ගාස්තු මුළුමනින්ම අත්හිටුවන ලද අතර කාල සටහන්ගත ජාත්‍යන්තර ගුවන් සේවා සඳහා ගොඩබෑමේ සහ නැවැත්වීමේ ගාස්තුව වසරකට අත්හිටුවා ඇත.

ම.රා.ජා.ගු. ජාත්‍යන්තර නෞකා කාර්ය මණ්ඩල හුවමාරු මධ්‍යස්ථානයක් බවට පත්කිරීම

මූලෝපායික පිහිටීම හේතුවෙන්ද, ජාත්‍යන්තර මට්ටම දක්වා සේවා මට්ටම් වැඩි දියුණු කිරීම තුලින්ද, ගුවන්තොටුපළ වරාය සහ සේවා සපයන්නකු ලෙස ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මුහුදු හා ගුවන් සේවා කර්මාන්තයේ ජනප්‍රිය ගමනාන්තයක් බවට පත්වෙමින් තිබේ. මාගම්පුර මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර වරාය සහ ගාල්ල වැනි ගුවන්තොටුපළ හා වරාය සම්බන්ධ කරන සංවර්ධිත මාර්ග පද්ධතිය මෙම සාර්ථකත්වය පසුපස ඇති තවත් ප්‍රධාන කරුණකි. අංගසම්පූර්ණ මාගම්පුර වරායට ශ්‍රී ලංකාවේ දකුණු මුහුදු වෙරළේ සිට නාවික සැතපුම් හයේ සිට දහය දක්වා දුරින් (කිලෝමීටර් 19) පිහිටි නැගෙනහිර - බටහිර නැව් මාර්ගයේ යාත්‍රා කරන නැව් වලට ඉන්ධන ලබාදීම, නාවුක අළුත්වැඩියා කටයුතු, නැව් ඉදිකිරීම සහ නාවික කාර්යමණ්ඩල හුවමාරුව ආදී වූ සේවා ලබා දීමේ හැකියාව තිබේ.

2020 වසරේදී කොවිඩ්-19 වසංගතය පැතිරීම රට තුළ පාලනය කර ඇති හෙයින්, නාවික කටයුතු ආරක්ෂිතව පවත්වාගෙන යාමේදී තීරණාත්මක වැදගත්කමක් ඇති කාර්යයක් වන, නැව් කාර්ය මණ්ඩල හුවමාරු කිරීමට පහසුකම් සැළසීමේ ක්‍රියාවලියේදී, ඒ සඳහා සුරක්ෂිත ස්ථානයක් වශයෙන් ජාත්‍යන්තර නාවික ප්‍රජාවගේ අවධානය දිනාගැනීමට ශ්‍රී ලංකාවට හැකි වී තිබේ. මෙම අවස්ථාව සැළකිල්ලට ගනිමින් ම.රා.ජා.ගු.අග්නිදිග ශ්‍රී ලංකාවේ සේවය කරන විශාලතම ජාත්‍යන්තර



රාජ්‍ය අමාත්‍ය ඩී.වී. චානක මැතිතුමා මහින්ද රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපොලේ සිදුකළ නිරීක්ෂණ චාරිකාව

ගුවන්තොටුපළ වශයෙන් ජාත්‍යන්තර නැව් කාර්ය මණ්ඩල හුවමාරුව සඳහා කේන්ද්‍රස්ථානයක් බවට පත්වීමට සූදානම් ය. බෝයිං 767-300 ER දරණ විශේෂ මගී ගුවන් යානයක් ඇම්ස්ටර්ඩෑම් හි සිට ම.රා.ජා.ගු. වෙත පැමිණියෙහ. මෙම හුරුපුරුදු කිරීමේ කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩ සටහනේ පරමාර්ථය වූයේ ලංකාවෙන් භාණ්ඩ අපනයනය ඉහළ නැංවීම සඳහා වූ උපාය මාර්ගික අවස්ථාවන් උපයෝගී කර ගැනීමේ සහ භූගෝලීය පිහිටීම ප්‍රයෝජනයට සඳහා යොදා ගැනීමේ හැකියාව සොයා බැලීමත් කලාපයේ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක් ලෙස ම.රා.ජා.ගු. මූලෝපායිකව ස්ථාපිත කිරීමත් වේ.

ම.රා.ජා.ගු. හි භාණ්ඩ අපනයන වර්ධනය

භාණ්ඩ අපනයන කරුවන්ගේ සංගම් සහ ගුවන් සමාගම් නියෝජිතයින් කණ්ඩායමක් 2020 සැප්තැම්බර් 11 දින ම.රා.ජා.ගු. වෙත පැමිණියහ. මෙම හුරුපුරුදු කිරීමේ කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩ සටහනේ පරමාර්ථය වූයේ ලංකාවෙන් භාණ්ඩ අපනයනය ඉහළ නැංවීම සඳහා වූ උපාය මාර්ගික අවස්ථාවන් උපයෝගී කර ගැනීමේ සහ භූගෝලීය පිහිටීම ප්‍රයෝජනයට සඳහා යොදා ගැනීමේ හැකියාව සොයා බැලීමත් කලාපයේ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයක් ලෙස ම.රා.ජා.ගු. මූලෝපායිකව ස්ථාපිත කිරීමත් වේ.

ගු.ගු.සේ.ස හි ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති

මුළු ලෝකයම කොවිඩ්-19 වසංගතයෙන් පීඩා විඳින විට ගු.ගු.සේ.ස අභියෝග ජයගැනීමට තරම් ප්‍රමාණවත් ස්ථාවරත්වයක් ගොඩනගාගෙන ඇති අතර, අපගේ දැක්ම වන 'තිරසාර ආර්ථිකයක් තුළින් ගෝලීය සම්බන්ධකයේ වඩාත් මිත්‍රශීලී ගුවන්සේවා හවුල්කරුවා වීම' වෙත ලඟා වීමට අවශ්‍ය සැලසුම් හා අරමුණු ඉදිරියට ගෙන යාමට තරම් ශක්තිමත් ස්ථාවරයක සිටිමු. ඒ අනුව මෙම අභියෝගාත්මක තත්වයන් යටතේ පවා තම කාලීන සැලසුම් කළ ව්‍යාපෘති සාර්ථකව කරගෙන යාමට ගු.ගු.සේ.ස ක්‍රියා කළේය.

කටුනායක බ.ජා.ගු. හි අභිනවයෙන් ඉදිකෙරෙන සන්තරණ සේවා සංකීර්ණ ගොඩනැගිල්ල

ගු.ගු.සේ.ස විසින් සන්තරණ සේවා සංකීර්ණ ගොඩනැගිල්ල 2020 ජනවාරි 27 දින සම්පූර්ණ කරන ලද අතර එහි මුළු කොන්ත්‍රාත් මිල රුපියල් මිලියන 190 කි. ගු.ගු.සේ.ස හි සේවා මට්ටම ඉහළ නැංවීම සඳහා ගුවන් සන්තරණ සේවා අංශය සහ ඉලෙක්ට්‍රොනික හා ගුවන් සන්තරණ ඉංජිනේරු අංශය සඳහා අතිරේක කාර්යාල ඉඩ පහසුකම් සැලසීම සඳහා ගොඩනැගිල්ල මහල් තුනකින් සමන්විතව ඉදිකර තිබෙන අතර එහි මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 2,658 කි.

කොළඹ රත්මලාන ගුවන්තොටුපොළේ දැනට ඇති ආසියානු ගුවන් සේවා රැදවුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීම

ගු.ගු.සේ.ස විසින් මුළු කොන්ත්‍රාත් මිල රුපියල් මිලියන 16 ක් වූ රත්මලාන කොළඹ ගුවන්තොටුපොළේ දැනට පවතින ආසියානු ගුවන් සේවා රැදවුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරීමේ ව්‍යාපෘතිය 2020 ජූලි 27 වන දින අවසන් කරන ලදී. මෙම ව්‍යාපෘතිය සිදු කෙරුණේ එකී රැදවුම් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කිරීමේ දීර්ඝ කාලීන අවශ්‍යතාවය සපුරාලීම සඳහා වේ. කොළඹ ගුවන්තොටුපොළේ ගුවන් යානා නඩත්තු කිරීම පහසු කිරීම සඳහා රැදවුම් ගොඩනැගිල්ලේ ව්‍යුහය ද්වාර රාමු සැකසීම සහ බිත්ති ආවරණ වෙනස් කිරීමත් අති නවීන යටිතල පහසුකම් ඊට එකතු කිරීමත් මෙම ව්‍යාපෘතිය යටතේ සිදුවිය.

ආරක්ෂිත හා විශ්වාසදායක ගුවන් ආරක්ෂක පද්ධතියක් සහ ගුවන් අවකාශයක් ඇතිකර ගැනීමේ අරමුණින් සිදුකෙරෙන අති නවීන යටිතල පහසුකම් ව්‍යාපෘති වල තත්වය

ගුවන් ගමනාගමන ආරක්ෂාව සහතික කිරීම, මෙහෙයුම් ධාරිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම මෙන්ම සන්නිවේදනය, සංචලනය, නිරීක්ෂණය සහ ආරක්ෂක පරීක්ෂණ අංශ පිළිබඳ ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ නීර්දේශ හා මාර්ගෝපදේශයන්ට අනුකූලව ගු.ගු.සේ.ස විසින් ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කර ඇත. ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානයේ මාර්ගෝපදේශයන්ට අනුකූලව ආරම්භ කරන ලද මෙම පද්ධති ස්ථාපන ව්‍යාපෘති හරහා ගුවනතොටුපළවල තත්වය යාවත්කාලීන කිරීම මෙන්ම අති නවීන පද්ධති යටිතල පහසුකම් වලින් සමන්විත තත්වයක් කරා වැඩිදියුණු කිරීම අපේක්ෂිතය. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් අදාළ සීමා කිරීම් තිබියදීම ගු.ගු.සේ.ස, 2020 දී පහත ලැයිස්තුගත ව්‍යාපෘති සමඟ ඉදිරියට ගොස් ඇත.

1. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළට ගුවන් ප්‍රවාහන කළමනාකරණ (ATM) ක්‍රමයක් හඳුන්වාදීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
2. ගගන ඉංජිනේරු තොරතුරු කළමනාකරණ පද්ධතියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.
3. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ සහ කොළඹ ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ සන්නිවේදන පද්ධති වැඩි දියුණු කිරීම.
4. පිදුරුතලාගල හි දෙවැනි නිරීක්ෂණ රේඩාර් පද්ධතියක් ස්ථාපිත කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
5. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ස්වයංක්‍රිය කාලගුණ නිරීක්ෂණ පද්ධතිය (AWOS) සහ ගුවන් තොටුපල පර්යන්ත තොරතුරු පද්ධතිය (ATIS) සැපයීම ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම
6. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ සහ පිදුරුතලාගල අතර ක්ෂුද්‍ර තරංග රේඩියෝ සම්බන්ධකය පිහිටුවීම.
7. කොළඹ රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපළ සඳහා හඬ පටිගත කිරීමේ පද්ධතියක්.
8. කොළඹ රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ගුවන් ප්‍රවාහන කළමනාකරණ පද්ධතියේ ගුවන් ගමන් පාලක (ATC) සංදර්ශක වැඩි දියුණු කිරීම.
9. රත්මලාන ජාත්‍යන්තර ගුවන් තොටුපොළ සහ පිදුරුතලාගල අතර ක්ෂුද්‍ර තරංග රේඩියෝ සම්බන්ධකයෙහි හි ධාරිතාව ඉහළ නැංවීම.
10. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපළට ගමන්මළු පරීක්ෂා කරන එක්ස් කිරණ යන්ත්‍ර සැපයීම සවි කිරීම සහ ක්‍රියාත්මක කිරීම.
11. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ මගී ගමන් මළු සඳහා පුපුරණ ද්‍රව්‍ය හඳුනා ගැනීමේ පද්ධතිය (EDS) සැපයීම ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

ර.ගු. සහ බ.ජා.ගු. හි දැනට පවත්නා සන්නිවේදන පද්ධති ප්‍රතිස්ථාපනය කිරීම

බ.ජා.ගු. සහ ර.ගු. හි දැනට පවතින පැරණි සන්නිවේදන හුවමාරු පද්ධති වෙනුවට නවීන තාක්ෂණයේ ප්‍රවේශය සහ නව උපකරණ ලබාදීම සඳහා මෙය ආරම්භ කරන ලදී. ගුවන් ගමන් පරිපාලක ගුවන් නියමුවන් සමඟ මෙන්ම ගුවන්තොටුපළේ සේවය කරන බොහෝ කාර්ය මණ්ඩල සමඟ ගුවන් විදුලි හා දුරකථන සන්නිවේදන ක්‍රමවේදයන් හරහා සන්නිවේදනය කරයි. හඬ සන්නිවේදන හුවමාරු පද්ධති (VCSS) මගින් එසේ භාවිත වන සංකීර්ණ සන්නිවේදන පද්ධති සියල්ල ඒකාබද්ධ කර කුඩා ස්පර්ශ සංවේදී තිරයක් මගින් මෙහෙයැවීමට ගුවන් ගමන් පාලකවරයාට හැකියාව ලැබේ. නව ක්‍රමයේ මූලිකාංගය වන්නේ අන්තර්ජාල ශබ්ද මූලලේඛ තාක්ෂණය හෙවත් VOIP (Voice Over Internet Protocol) වේ.

මෙම නව VOIP තාක්ෂණය භාවිතා කිරීමේ එක් වාසියක් නම් පද්ධතියේ සමස්ථ ධාරිතාවය වැලඳායි අන්දමින් භාවිත කිරීමේ අවකාශය හරහා නිර්මාණය වන සංකීර්ණ සන්නිවේදන පද්ධතියේ ස්ථිරසාර බව සහ ඉතා ඉක්මනින් වැරදි යථා තත්ත්වයට පත් කිරීමේ හැකියාව හේතුවෙන් සංකීර්ණ සන්නිවේදන ජාල වල අඛණ්ඩතාව තහවුරු වීමයි. ඉලෙක්ට්‍රොනික හා ගුවන් සන්තරණ ඉංජිනේරු ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම අපේක්ෂිත සැලසුම් සහ පද්ධති නිර්මාණ ශිල්පය අනුව පිරිවිතරයන් සකස් කර ඇති අතර, ජාත්‍යන්තර තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් පසු මේ සඳහා සුදුසු තරඟකාරී සැපයුම්කරුවෙකු තෝරාගෙන ඇත. ඒ අනුව ගු.ගු.සේ.ස සමාගම ඉතාලියේ විදුලි සංදේශ උපකරණ සැපයුම්කරුවෙකු වන Special Impianti Telescriventi Telefonici Interni (SITTI) SpA සමාගම සමඟ ගිවිසුම් අත්සන් කර ඇති අතර එකී සමාගම විවන් සේවා සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලොව ප්‍රමුඛතම හඬ සන්නිවේදන හුවමාරු පද්ධති නිෂ්පාදකයින් අතර සිටී. මෙම නව පද්ධතිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය මේ වන විටත් ආරම්භ කර ඇති අතර ඉහත අංශයේ ව්‍යාපෘති කළමනාකරණ කණ්ඩායම යටතේ සන්ධිස්ථාන කිහිපයක් සාර්ථක අන්දමින් පසු කර තිබේ.



ඉලෙක්ට්‍රොනික හා ගුවන් සන්තරණ ඉංජිනේරු කාර්මික කණ්ඩායම ඉතාලියේ SITTI කර්මාන්තශාලාවේදී ප්‍රායෝගික පුහුණුව ලබමින්

වාර්ෂික ගුවන් පරීක්ෂණ සහ ගුවන් වලංගුකරණය

ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා සංවිධානය (ICAO) සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරිය (CAASL) විසින් නියම කරන ලද ප්‍රමිති සහ නිර්දේශිත ක්‍රමවේදයන් (SARPs) හි දැක්වෙන අනිවාර්ය අවශ්‍යතා අනුව වාර්ෂිකව ජාත්‍යන්තර ගුවන්තොටුපොළවල් සහ ඒවායේ ඇති යාත්‍රා ගොඩබෑමේ පද්ධතිය (ILS), ගුවන් ස්ථාන නිරීණ පද්ධති (DVOR-Doppler VHF Omnidirectional Range), නිරවද්‍ය ප්‍රවේශ මාර්ග දර්ශකය (PAPI-Precision Approach Path Indicator), විදුලි ආලෝක සහ දුර මාපක වැනි ගුවන් විදුලි සහ දෘෂ්‍ය සංචලන ආධාරක වැනි ගුවන් ගමන් ආධාරක පද්ධති වල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කිරීම (FI – Flight Inspection) අත්‍යවශ්‍ය වේ.

කෙසේ වෙතත් Covid-19 වසංගතයට එරෙහිව නියාමන සහ බාධාවන් පැණවීම හේතුවෙන් 2020 වර්ෂයේදී එවැනි මෙහෙයුමක් ක්‍රියාත්මක කිරීම ගැටලුසහගත බව මුලින් හඳුනාගෙන තිබුණි. විදේශීය කාර්ය මණ්ඩල නිරෝධායනය කිරීමට යටත්ව මෙම ක්‍රියාකාරකම සිදුකිරීම කාලය සීමිත වීම සහ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සිදුකිරීම අපහසු බව හඳුනා ගන්නා ලදී.

මෙම සියලු කාරණාවන් සහ මෙම මෙහෙයුමේ අවශ්‍යතාවය සළකා බැලීමෙන් පසු ගු.ගු.සේ.ස හි සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී.ඒ. චන්ද්‍රසිරි RWP USP VSV ndc psc මහතාගේ සෘජු මග පෙන්වීම යටතේ අනිවාර්ය නිරෝධායන ක්‍රියාවලිය සඳහා විශේෂ නිදහස් කිරීමක් ඉල්ලා සිටින ලදී. ප්‍රධාන වසංගත රෝග විද්‍යාඥයා වෙත පෞද්ගලිකව පැහැදිලි කිරීමක් සිදුකිරීමෙන් පසුව එකී අනිවාර්ය නිරෝධායනය කිරීමේ ක්‍රියාවලිය සඳහා විශේෂ නිදහස් කිරීමක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන ලදී.

පැවති අභියෝගාත්මක වාතාවරණය සළකා බලන කල, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ආරක්ෂක අමාත්‍යංශය, සෞඛ්‍ය අමාත්‍යංශය, විදේශ කටයුතු අමාත්‍යංශය, කොවිඩ්-19 වැලැක්වීමේ ජාතික ක්‍රියාන්විත මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය, ශ්‍රී ලංකන් ගුවන් සේවය සහ ශ්‍රී ලංකා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ ආයතන ගණනාවක නැණවත් දායකත්වය සහ සහයෝගය නොමැතිව මෙම ව්‍යාපෘතිය සාර්ථක කරගැනීමට නොහැකි විය හැකිව තිබුණි.



ඉලෙක්ට්‍රොනික හා ගුවන් සන්තරණ ඉංජිනේරු කණ්ඩායම ගුවන් විදුලි සංචලන ආධාරක සමඟ සිදුකරන ක්‍රමාංකණයක් සිදුකරමින්

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ ගමන්මළු පික්ෂා කිරීමේ පහසුකම් ශක්තිමත් කිරීම.

ගමන්මළු පරීක්ෂා කිරීමේ වේගය වැඩි කිරීම මගින් මගීන්ට බලා සිටීමට සිදුවන කාලය අවම කොට මගීන්ට පහසුකම් සැළසීම සඳහා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ගමන් මලු පරීක්ෂා කිරීමේ පහසුකම් ශක්තිමත් කිරීමේ දීර්ඝ කාලීන අවශ්‍යතාව සපුරාලමින් එක්ස් කිරණ පරීක්ෂා කිරීමේ යන්ත්‍ර සහ පුපුරණ ද්‍රව්‍ය අනාවරක (ETD) සවිකිරීමට ගු.ගු.සේ.ස ආයෝජනය කර ඇති ප්‍රමාණය රුපියල් මිලියන 195කට වඩා වැඩිය.

ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියට (CAASL) අනුව මේ සියළුම අති නවීන පද්ධති යුරෝපා සිවිල් ගුවන්සේවා සම්මේලනයේ (ECAC), එක්සත් රාජධානියේ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ (DFT UK) සහ එක්සත් ජනපද ප්‍රවාහන ආරක්ෂක පරිපාලනයේ (TSA) මෙන්ම ජාතික ආරක්ෂක ප්‍රමිතීන්ට අනුකූල වේ. තරඟකාරී ලංසු ක්‍රියාවලියකින් පසු ලැබුණු සෘජු ආයෝජන හරහා දැනට දියුණු මට්ටමේ මගී ගමන්මළු පරීක්ෂා කරන එක්ස් කිරණ යන්ත්‍ර (ACBX) දෙකක් බඩුභොග පරීක්ෂා කරන එක්ස් කිරණ යන්ත්‍ර හතරක් සහ පුපුරන ද්‍රව්‍ය හඳුනාගන්නා යන්ත්‍ර (ETD) 10ක් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ස්ථාපනය කර ඇත.

අත්තිඩිය සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයේ අධි සංඛ්‍යාත තරංග (HF) පණිවිඩ හුවමාරු අධීක්ෂණය සඳහා එම ආයතනයේම නිපදවන ලද තත්ව අධීක්ෂණ පද්ධති ස්ථාපනය කිරීම

මෙය ගු.ගු.සේ.ස හි තරුණ ගුවන් ප්‍රවාහන සුරක්ෂිතතා ඉලෙක්ට්‍රෝනික ඉංජිනේරු (ATSEEO) නිලධාරීන් දෙදෙනෙකු විසින් සමාගමට සැළකියයුතු මුදලක් ඉතිරි කරමින් සාර්ථකව සැළසුම් කර සාදා සවිකරන ලද තත්ත්ව නිෂ්පාදනයකි.

ගුවන් යානා සමඟ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා ගුවන් තොරතුරු කලාප (FIR) මායිමෙන් ඔබ්බට පියාසර තොරතුරු කලාපය ආවරණය වන පරිදි ගුවන් පංගම සන්නිවේදන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ ප්‍රධාන සන්නිවේදන ක්‍රමය අධි සංඛ්‍යාත ක්‍රමවේදයයි. අධි සංඛ්‍යාත සම්ප්‍රේෂක මෙම පරිශ්‍රයේ සවි කර ඇති අතර මෙම පද්ධතිය භාවිතා කිරීමෙන් උෂ්ණත්වය සහ ආර්ද්‍රතා තත්ත්වය අඛණ්ඩව අධීක්ෂණය කරන අතර එය නියමිත සීමාව ඉක්මවා ගියහොත් අනතුරු ඇඟවීමක් සිදු කෙරේ.

අත්තිඩිය අධි සංඛ්‍යාත සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයේ සවි කර ඇති ක්ෂුද්‍ර තරංග සන්නිවේදන උපකරණ මඟින් කොළඹ පියාසර තොරතුරු කළාපයේ ගුවන් ගමන් සේවා සපයන අතර ගු.ගු.සේ.ස විසින් නඩත්තු කරන සන්නිවේදන ජාලයේ ප්‍රධාන කොඳු නාරටිය

එයයි. රත්මලාන ගුවන්තොටුපළේ ප්‍රාදේශීය පාලන මධ්‍යස්ථානය සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ ප්‍රවේශ පාලන මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සඳහා අත්‍යවශ්‍ය වන හඬ පණිවුඩ දත්ත සහ තොරතුරු (RADAR, ADS-B, AMHS) මෙම සම්බන්ධකය හරහා හුවමාරු වේ.

මෙම නව පද්ධති දෙක හඳුන්වාදීමත් සමඟම විදුලිය බිඳවැටීම් සන්නිවේදන අසමත්වීම් සහ අධික උෂ්ණත්ව තත්ත්වයන් තුළදී දුරස්ථ අධීක්ෂණ පහසුකම් සහ තත්ත්ව නඩත්තු හා අනතුරු ඇඟවීම් යන අංශ වලින් රාජකාරියේ නියුතු නිලධාරීන්ට පහසුකම් සැලසේ.

ගු.ගු.සේ.ස මඟින් දැනට ක්‍රියාත්මක කරන ව්‍යාපෘති

බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළේ 2වැනි පර්යන්ත ව්‍යාපෘතිය

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ දැක්ම වූ සෞභාග්‍යයේ දැක්ම සමඟ ඉදිරියට යමින් ගු.ගු.සේ.ස ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන්තොටුපළ දියුණු කිරීමට පුරෝගාමී කාර්යභාරය ඉටුකරන ලදී. දිගු කාලීන ප්‍රමාදයන් හඳුනා ගැනීම සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ දෙවැනි පර්යන්තය ඉදිකිරීම් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රමුඛතාවය දෙමින් ඒ සඳහා මුල්ගල් තැබීමේ උත්සවය 2020 නොවැම්බර් 18 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා, ශ්‍රී ලංකාවේ ජපාන තානාපති අතිගරු අකිරා සුගියාමා මහතා, සංචාරක අමාත්‍ය ප්‍රසන්න රණතුංග මැතිතුමා, ගුවන් සේවා සහ අපනයන කළාප සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ඩී. වී. චානක මැතිතුමා ඇතුලු තවත් පාර්ලිමේන්තු මන්ත්‍රී තුමන්ලාගේද, ගු.ගු.සේ.ස සභාපති විශ්‍රාමික මේජර් ජෙනරාල් ජී.ඒ. චන්ද්‍රසිරි RWP USP VSV ndc psc මහතා, උපසභාපති රජිවසිරි සූරියආරච්චි මහතා, ගු.ගු.සේ.ස ව්‍යාපෘති අධ්‍යක්ෂ අරුණ වරුෂහෙන්නැදිගේ මහතා, අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් මෙන්ම ශ්‍රී ලංකා සිවිල් ගුවන්සේවා අධිකාරියේ සභාපති උපුල් ධර්මදාස මහතා ඇතළු අනෙකුත් සම්භාවනීය අමුත්තන්ගේ සහභාගිත්වයෙන් උත්සවාකාරයෙන් ආරම්භ කරන ලදී.

වැඩ නිම කිරීමෙන් පසු නව පර්යන්තයට වාර්ෂිකව මඟින් මිලියන 9 ක් හැසිරවිය හැකි අතර එමඟින් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ මඟී හැසිරවීමේ සමස්ථ වාර්ෂික ධාරිතාවය මඟින් මිලියන 15 දක්වා වැඩි කෙරේ.

2 වන පර්යන්තය ව්‍යාපෘතිය මඟින් ශ්‍රී ලංකාව පරිවර්තනීය වෙනසකට ලක් කිරීම සඳහා වන රජයේ දැක්ම පහසු කරනු ඇති අතර නව පර්යන්ත ඉදිකිරීමත් සමගම අද්විතීය හා සුවිශේෂී ශ්‍රී ලාංකික සංස්කෘතිය පිළිබිඹු කරන ලෝක මට්ටමේ ගුවන්තොටුපළක් ලෙස බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළ හි ජාත්‍යන්තර ප්‍රමිතීන් දක්වා ඉහළ නැංවෙනවා ඇත.

කලාපයේ ගුවන් කේන්ද්‍රස්ථානයක් වීමෙහිලා බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ 2 වැනි පර්යන්තය ඉදිකිරීම යෝධ පියවරක් වනු ඇත. පැමිණීම සහ පිටවීම සිරස් අතට වෙන් කර ඇති මට්ටම් ගණනාවකින් සමන්විත පර්යන්ත ගොඩනැගිල්ලකින් මෙම ව්‍යාපෘතිය සමන්විතය. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපොළේ දෙවැනි පර්යන්තය සුහුරු ගුවන්තොටුපළ සංකල්පය යටතේ ඉදිකෙරෙන අතර මෙම ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීමෙන් දේශීය මෙන්ම විදේශ සංචාරකයින්ට වඩාත් ප්‍රසන්න වූ සංචාරක අත්දැකීමක් ලබා ගැනීමට ඉඩ සළසනවා ඇත.

සංචාරකයින් සඳහා වන බහු-මහල් රථගාල, නව ගුවන්තොටුපළ විවේකාගාර, ගේට්ටු විවේකාගාර, එකිනෙක හා සම්බන්ධිත බහුවිධ ප්‍රවාහන සේවා යනාදී බොහෝ පහසුකම් මඟින් මඟීන්ගේ පහසුව හා සංචාරක අත්දැකීම ඉහළ නැංවිය හැකිය. නව පර්යන්තයේ මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 185,000 වන අතර නව පර්යන්තය සමඟ මුළු බිම් ප්‍රමාණය වර්ග මීටර් 275,000 දක්වා වැඩි කෙරේ. නව කවුන්ටර 96 ක් එකතු කිරීමත් සමඟ මඟින්ගේ ඇතුළු වීමේ කවුන්ටර ගණන 149 දක්වා වැඩි කෙරේ. එයට අමතරව නව පිටත්වීමේ ගමන් බලපත්‍ර පාලක කවුන්ටර 32 ක්, අඵත් පැමිණීමේ ගමන් බලපත්‍ර කවුන්ටර 56 ක්, සම්බන්ධතා දොරටු 16 ක්, බස් රථ ප්‍රවේශ දොරටු 10 ක්, ගුවන් සේවා විවේකාගාර 6 ක්, ගමන් මළු ලබාගැනීමේ අංගන 7 ක් ගමන් මළු සැකසුම් අංගන 7 ක් සහ ගුවන් යානා නවතා තැබීමේ ස්ථාන 23 සිට 28 දක්වා ප්‍රමාණයක් නව පර්යන්තයට එකතු කෙරේ.

මෙම ව්‍යාපෘතිය වසර තුනක් ඇතුළත අවසන් කිරීමට නියමිතය. ජපාන ගුවන්තොටුපළ උපදේශක සමාගම සහ සීමාසහිත නිපෝන් කෝයි සමාගම ව්‍යාපෘතියේ උපදේශකයින් වන අතර ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA) අරමුදල් සපයන සහකරු වේ. මෙම ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වන්නේ ජපානයේ TAISEI සමාගමයි.







ශ්‍රම බලකා බලමුළු ගැන්වීමේ සැලසුම් හා සම්බන්ධ කරුණු පිළිබඳ නිල සාකච්ඡා

පවතින පහසුකම් සහ ව්‍යාපෘතිය මඟින් යෝජිත පහසුකම් (BIADP PII S2)

පහසුකමේ ස්වභාවය	දැනට පවත්නා (1 වන පර්යන්තය)	අභිනවයෙන් ඉදිකෙරෙන (2 වැනි පර්යන්තය)	2 වැනි පර්යන්තය ඉදිකිරීමෙන් පසු සමස්ථ ධාරිතාවය
භූමි ප්‍රමාණය (ව.මීටර්)	90,000 m2	185,000 m2	275,000 m2
ඇතුළු වීමේ කවුළු ගණන	53	96	149
පිටවීමේ ගමන් බලපත්‍ර පිරික්සුම් කවුළු ගණන	21	32	53
පියාසැරි ආරක්ෂක හා පාලන ස්ථාන ගණන	1 වන මඟී පාලම අසළ ස්ථාන 8යි බස්රථ ගේට්ටුව අසළ ස්ථාන 2යි	2 වන සහ 3 වන මඟී පාලම් අසළ ස්ථාන 20යි	ස්ථාන 30යි
සම්බන්ධක ගේට්ටු	8	16	24
බස්රථ ගේට්ටු	6	10	16
ගුවන්සේවා විවේකාගාර	4	6	10
පැමිණීමේ ගමන් බලපත්‍ර පිරික්සුම් කවුළු ගණන	27	56	83
ගමන්මළු ලබාගැනීමේ අංගන	6	7	13
ගමන්මළු සැකසීමේ අංගන	3	7	10
ගුවන්යානා නැවැත්වීමේ ස්ථාන	26	23 සිට 28 දක්වා	49 සිට 54 දක්වා

02. කාර්යක්ෂමතාවයෙන්/ ඵලදායිතාව ඉහළ නැංවීමෙන් වසංගතය ජය ගැනීම

ආර්බුදයකදී, ආයතනයක් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම සහ වැඩි ඵලදායිතාවයක් ලබා ගැනීම ප්‍රධාන අභියෝග වේ. කොවිඩ්-19 වසංගතය ගුවන්තොටුපළේ සියලුම ප්‍රධාන කාර්ය සාධන දර්ශක සහ ශ්‍රී ලංකාවේ ගුවන්සේවා කර්මාන්තයේ සාර්ව අස්වැන්න කෙරෙහි ක්ෂණික, සැලකිය යුතු බලපෑමක් ඇති කළේය. කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය හේතුවෙන් ගුවන් ගමන් ශිඝ්‍රයෙන් පහත වැටුණු අතර සමස්ත ගුවන්තොටුපළ මෙහෙයුම් දැඩි ලෙස අභියෝගයට ලක් විය.

ඒ අනුව, කොවිඩ්-19 හි අනපේක්ෂිත හා සැලකිය යුතු බලපෑම් ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජාත්‍යන්තර ගුවන්තොටුපළවල සාමාන්‍ය මෙහෙයුම් වලට බලපෑවේය. බ.ජා.ගු., ම.රා.ජා.ගු. සහ අනෙකුත් සිවිල් ගුවන් තොටුපළවල් වන ර.ග., යා.ජා.ගු. හි මෙහෙයුම් සහ ම.ජා.ගු. ශ්‍රී ලංකාවේ සහ ලොව පුරා නියාමන බලධාරීන් විසින් ගුවන් සේවා අත්හිටුවීම හේතුවෙන් ඇති වූ ගුවන් ගමන් අඩුවීම හේතුවෙන් බලපෑමට ලක් විය.

කෙසේ වෙතත්, ගු.ගු.සේ.ස. මෙරට සිවිල් ගුවන්තොටුපළ ක්‍රියාකරු ලෙස මෙම වසංගත කාලසීමාව තුළ අපගේ ගුවන් තොටුපළවල ප්‍රධාන මෙහෙයුම් කිසිවක් කිසි විටෙක වසා දැමුවේ නැත.

කොවිඩ්-19 වසංගතය මධ්‍යයේ මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය තුළින් පිළිබිඹු වන කාර්යක්ෂමතාව වැඩි දියුණු

කොවිඩ්-19 වසංගතය තිබියදීත්, බ.ජා.ගු. මඟී සංචලන 2,375,056 ක්, ගුවන් යානා චලනයන් 20,881 ක් හසුරුවා ඇති අතර භාණ්ඩ කර්මාන්තයේ අවශ්‍යතා සඳහා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරමින්, බ.ජා.ගු. විසින් 2020 වසර තුළ භාණ්ඩ මෙට්‍රික් ටොන් 150,075 ක් හසුරුවා ඇත. සැලකිය යුතු ලෙස, කොවිඩ්-19 වසංගතය යටතේ පවා බලපෑමට ලක් වූවත් බ.ජා.ගු. හුදකලාව ගතහොත් එය 2020 දෙසැම්බර් 31 වන විට ලාභයක් උපයා ඇත. මෙය ඵලදායිතාව ඉහළ නැංවීම සම්බන්ධයෙන් ඉතා ආකර්ෂණීය සොයා ගැනීමකි.

තවද, මෙම අභියෝගාත්මක තත්ත්වයන් මධ්‍යයේ, 2020 වර්ෂය තුළ මඟී සංචලන 17,421ක්, ගුවන් යානා චලනයන් 349ක් සහ මෙට්‍රික් ටොන් 90ක භාණ්ඩ ප්‍රවාහනය කරමින් ම.රා.ජා.ගු පුනර්ජීවනය කිරීමට ගු.ගු.සේ.ස. සමත් විය. අර්බුදයකදී තම උපායමාර්ගික වැදගත්කම ම.රා.ජා.ගු. ඔප්පු කළේ ආදරණීයයන් නැවත නිවසට ගෙන ඒම සඳහා රජයේ නැවත ගෙන්වා ගැනීමේ වැඩසටහනට පහසුකම් සැලසීමෙනි.

ප්‍රාග්ධන මුදල් සම්භාරයක් වියදම් කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම තුළින් කාර්යක්ෂමතාව වැඩි කිරීම

වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, සම්පත් භාවිතයේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා බොහෝ ව්‍යාපෘති ආරම්භ කර ඇත.

- බ.ජා.ගු. හි පිටත්වීමේ පර්යන්ත ගොඩනැගිල්ලේ අංක 2KK1 හි සිසිලන බලාගාර කාමරයේ සිසිලන යන්ත්‍ර, සිසිලන කුළුණ, පොම්ප, අමතර ද්‍රව්‍ය සමඟ පොම්පය ප්‍රතිස්ථාපනය කිරීම

බ.ජා.ගු. මගී පර්යන්තයේ වායු සම්කරණය හරහා මගී පහසුකම් සැපයීමේ බලශක්ති පරිභෝජනයේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා, අකාර්යක්ෂම අවුරුදු 19-20 පැරණි සිසිලන යන්ත්‍ර සහ ආර්ථිකමය ප්‍රයෝජනයේ ලක්ෂ්‍යය පසුකර ඇති පැය 24 පුරා ක්‍රියාත්මක වන අමතර ද්‍රව්‍ය ප්‍රතිස්ථාපනය කර නව ශීතකාරක සවි කරන ලදී.

එබැවින් ගිවිසුම්ගත කාලසීමාව තුළ ව්‍යාපෘතිය නිම කරන ලද අතර පර්යන්ත ගොඩනැගිල්ලේ බලශක්ති පරිභෝජනය 35% සිට 40% දක්වා වැඩි දියුණු කරන ලදී.



නව සිසිලන යන්ත්‍ර ස්ථාපනය කිරීම

බ.ජා.ගු. හි දොරටුව අසල R6 සහ R7 විවේකාගාරයෙහි හි වායු සම්කරණ පද්ධතිය වැඩිදියුණු කිරීම

- බ.ජා.ගු. හි මගී පර්යන්ත ගොඩනැගිල්ලේ (PTB) වායු හැසිරවීමේ ඒකකවල සිසිලන දඟර ආදේශ කිරීම යනාදිය

මානව සහ අනෙකුත් සම්පත් යෙදවීම හරහා කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

ගු.ගු.සේ.ස විසින් පහත සඳහන් පරිදි 2020 වර්ෂය තුළ වැඩි ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා ඵලදායී කාර්ය මණ්ඩල යෙදවීමේ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කරන ලදී.

වැඩමුර පදනම මත කාර්යයන් සඳහා කාර්ය මණ්ඩලය කැඳවීම

කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ ගුවන් තොටුපළේ සමස්ත ක්‍රියාකාරිත්වයේ විශාල පහත වැටීමක් නිරීක්ෂණය විය. එබැවින්, සීමිත ක්‍රියාකාරිත්වය සැලකිල්ලට ගනිමින් සමාගම තුළ කොවිඩ්-19 වෛරසය පැතිරීම වැළැක්වීමේ උපාය මාර්ගයක් ලෙස, සේවකයින් වැඩමුර පදනම මත රාජකාරී සඳහා කැඳවනු ලැබීය.

නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පය ක්‍රියාත්මක කිරීම

නිවසේ සිට රාජකාරී කළ හැකි කාර්ය මණ්ඩලය සඳහා නිවසේ සිට වැඩ කිරීමේ සංකල්පය ද ක්‍රියාත්මක විය. ගු.ගු.සේ.ස ඉතිහාසයේ මෙවැනි උපාය මාර්ගයක් අනුගමනය කළ පළමු අවස්ථාව මෙය විය. එය වෛරසය පැතිරීමේ අවදානම අඩු කළ අතර ගු.ගු.සේ.ස හට කිසිදු බාධාවකින් තොරව මෙහෙයුම් කටයුතු කරගෙන යාමට හැකි විය.

Zoom MS Teams වැනි රැස්වීම් පැවැත්වීම සඳහා නවතම අතථ්‍ය සන්නිවේදන වේදිකා භාවිතා කිරීම

මීට අමතරව, මෙම වසංගත තත්ත්වය තුළ, ගු.ගු.සේ.ස ICAO-නිර්දේශිත පිළිවෙත් අනුගමනය කරන අතරම සමාගමට සහ ඉන් පිටතට වෛරසය මැඩපැවැත්වීම සඳහා සේවක සංචලනයන් සුවිශේෂී ලෙස අඩු මට්ටමක තබා ඇත. වසංගතය හේතුවෙන් එක් සේවා මුරයක සේවකයින්ට සේවයට වාර්තා කිරීමට නොහැකි වුවහොත් අංශවලට උපස්ථ සැලසුම් තිබුණි.

ඉහත සියලු උපක්‍රම අනුගමනය කිරීමෙන්, ආයතනය පුරා මෙහෙයුම් අකාර්යක්ෂමතාව අවම කර ගැනීමට සමාගමට හැකි විය.

03. අර්බුද මධ්‍යයේ පුළුල් වූ සේවා ගුණාත්මක භාවයෙන් වසංගතය ජය ගැනීම

බ.ජා.ගු කාර්ය මණ්ඩලය කොවිඩ්-19 වසංගතයට එරෙහිව වෙහෙස නොබලා සටන් කරන අතර සේවා විශිෂ්ටත්වය කරා යාමට අධිෂ්ඨාන කර ඇත.

චීනයේ වුහාන් හි ආරම්භ වූ කොවිඩ්-19 වසංගතය ගෝලීය වසංගතයක් ලෙස ලොව පුරා ව්‍යාප්ත වීමට පටන් ගත් දා සිට, ගු.ගු.සේ.ස ක්‍රියාශීලී වූ අතර හැකි සෑම පූර්වාරක්ෂාවක්ම ගනිමින් සූදානමින් සිටියේය. අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ උපදේශ අනුව මේ සියලු ක්‍රියාමාර්ග කාලෝචිත ලෙස ක්‍රියාත්මක කරන ලදී. මේ මුළු කාලයම අවදානම් සහ අවිනිශ්චිත බව තිබියදීත්, ගු.ගු.සේ.ස කාර්ය මණ්ඩලය අපගේ දැක්ම හඹා යාම සඳහා වෙහෙස නොබලා සේවය කරති. මිලියන සංඛ්‍යාත ජනතාවගේ ජීවිතවලට තර්ජනයක් වෙමින් පවතින කොවිඩ්-19 වෛරසය ලොව පුරා ව්‍යාප්ත වෙමින් පවතින අතර, මෙරට සිවිල් ගුවන් සේවා සපයන්නා ලෙස ගු.ගු.සේ.ස විසින් ශ්‍රී ලංකා සෞඛ්‍ය බලධාරීන් විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ යටතේ පූර්වාරක්ෂාව ක්‍රියාත්මක කිරීමට සෞඛ්‍ය බලධාරීන්ට සහ අනෙකුත් ආයතනවලට පහසුකම් සැලසීමෙන් වැදගත් කාර්යභාරයක් ඉටු කළේය.





මගී පහසුකම

මෙරටට පැමිණෙන මගීන්ගේ නිරෝධායන ක්‍රියාවලිය ආරම්භ වූයේ වෛරසයෙන් විල්ල වී ඇති ගෝලීය තර්ජනය හඳුනා ගැනීමෙන් පසුවය. ඒ අනුව, චීනයේ වුහාන් හි අතරමං වූ ශ්‍රී ලාංකික සිසුන් පිරිසක්, ගුවනින් ම.රා.ජා.ගු වෙත ගෙන යන ලද අතර, නිරෝධායන ක්‍රියාවලියට යවන ලද පළමු මගීන් කණ්ඩායම වේ. මුලදී, ශ්‍රී ලංකා සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් අනුව, 2020 මාර්තු 19 දින සිට ක්‍රියාත්මක වන පරිදි ශ්‍රී ලංකාවේ සියලුම ජාත්‍යන්තර ගුවන්තොටුපළවල් අභ්‍යන්තර, ජාත්‍යන්තර වාණිජ මගී ගුවන් ගමන් සඳහා වසා දමන ලදී. සියළුම ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් ගමන් ඉතා ප්‍රවේශමෙන් හසුරුවන ලද අතර ගුවන් යානා හැසිරවීමට නව ක්‍රමවේදයන් අනුගමනය කරන ලදී. ගු.ගු.සේ.ස හි සියලුම සේවකයින්, සුළු සේවකයාගේ සිට ඉහළ විධායක නිලධාරීන් දක්වා තම ජීවිත පරදුවට තබා පැය 24 පුරාම වැඩ කරයි.

මෙම ක්‍රියාදාමයේදී මගීන්ගේ පහසුව ඉහළ නැංවීම සඳහා ආහාරපාන, දුරකථන පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සපයන ලදී. මෙම නිරෝධායන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේදී ගු.ගු.සේ.ස, ශ්‍රී ලංකන් ගුවන් සේවය, ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා යුද හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය සහ අනෙකුත් යුධ හමුදාවන්හි කාර්යමණ්ඩලයේ උපරිම කැපවීම සහ පරිත්‍යාගය ලබා ගැනීමට ගුවන්තොටුපළ ක්‍රියාකරු ලෙස ගු.ගු.සේ.ස නායකත්වය ගත්තේය. ගු.ගු.සේ.ස හි ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය, ඔවුන්ගේ කාර්යභාරය හුදු රැකියාවකට වඩා ජාතික වගකීමක් ලෙස සැලකූහ. වසංගත කාලපරිච්ඡේදය තුළ ඔවුන්ගේ දායකත්වය අතිශයින් වැදගත් විය.

වෛරසය වැළැක්වීමේ මූලික සූදානම ගුවන්තොටුපළවල දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා සිදු කරන ලදී. සෞඛ්‍ය මාර්ගෝපදේශ සකස් කරන ලද අතර එම කාර්යය මෙහෙයවීම සඳහා ප්‍රධාන පාර්ශවකරුවන්ගේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සමඟ විශේෂ කමිටුවක් පිහිටුවන ලදී. සම්බන්ධීකරණ කටයුතු සඳහා ප්‍රාදේශීය නියෝජිතයන් ලෙස නිලධාරීන් පත් කරන ලදී.

සෞඛ්‍ය මාර්ගෝපදේශ සම්බන්ධයෙන් කොට්ඨාස සේවකයින් සමඟ, සෞඛ්‍ය හා සනීපාරක්ෂක ආරක්ෂණයන් සමඟ සේවා ස්ථානය නිරීක්ෂණය කිරීම, සේවකයින්ගේ ආරක්ෂිත ද්‍රව්‍ය අවශ්‍යතා හඳුනා ගැනීම. සමාජ දුරස්ථභාවය, මුහුණු ආවරණ පැළඳීම, සේවා ස්ථානයේ අත් සනීපාරක්ෂක යන්ත්‍ර තැබීම යනාදී සියලු පූර්වාරක්ෂක පියවරයන්, සියලුම කාර්ය මණ්ඩලයේ උෂ්ණත්වය පරීක්ෂා කිරීම, පුද්ගලික ආරක්ෂක උපකරණ (PPE) පැළඳීම සහ අනෙකුත් නිර්දේශිත භාවිතයන් අනුගමනය කරන ලදී. සේවකයින්ගේ රාජකාරියට බාධා කිරීම සීමා කිරීමට සමාගම ප්‍රතිපත්ති අනුගමනය කළ අතර වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා උපරිම පූර්වාරක්ෂාව අනුගමනය කරන ලදී. කොවිඩ්-19 රෝග ලක්ෂණ ඇති සහ PCR පරීක්ෂණයට භාජනය වූ සේවකයින් සඳහා එහි ප්‍රතිඵල ලැබෙන තුරු යැවීමට ප්‍රවාහන පහසුකම් සපයන ලදී.

කටුනායක බ.ජා.ගු හි පිටත්වීමේ මහජන ආලින්දය පුළුල් කිරීම

ගු.ගු.සේ.ස විසින් දර්ශනීය වාතාවරණයක් සහ ඔවුන්ගේ ආදරණීයයන් සමඟ ගුවන් යානයට ගොඩවීමට පෙර පිටත්ව යන මගීන්ට වඩාත් ප්‍රීතිමත් කාලයක් ලබා දීම සඳහා බ.ජා.ගු හි පිටත්වීමේ මහජන ආලින්දය පුළුල් කර ඇත. මෙම මහජන ආලින්දය පුළුල් කිරීම සඳහා රුපියල් මිලියන 238 ක වියදමින් ගු.ගු.සේ.ස විසින් සම්පූර්ණයෙන්ම අරමුදල් සපයන ලදී. මෙම නව ඉදිකිරීම මගින් පිටත්වන මගීන්ට සහ ඔවුන්ගේ අමුත්තන්ට ආහාර පාන භුක්ති විඳිමින් පිටත්ව යන තෙක් රැඳී සිටීමට විශාල ඉඩක් ලබා දී ඇත. සියලුම පහසුකම් සහිතව උද්‍යාන ප්‍රදේශය දෙසට දැනට පවතින පිටවීමේ මහජන ආලින්දය පුළුල් කරමින් නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම සහ මහජන ආලින්දය වටා පිටත විදුරු පැනල් සහිත උද්‍යාන දර්ශනයක් ලබා දීම මෙම ව්‍යාපෘතිය සමන්විත විය.



ගු.ගු.සේ.ස අලුතින් පුළුල් කරන ලද පිටත්වීමේ මහජන ආලින්දය

ගමන් මලු තීරය දිගු කිරීමේ ව්‍යාපෘතිය

පවත්නා පැමිණීමේ ගමන් මලු තීරය අංක 05 සැකසීම, සැපයීම, ස්ථාපනය කිරීම සහ දිගු කිරීම බ.ජා.ගු ආරම්භ කරන ලදී. සියලුම සැලසුම් කිරීම, සැකසීම සහ ස්ථාපනය කිරීම ශ්‍රී ලාංකික ඉංජිනේරුවන් සහ ප්‍රාදේශීය පාර්ශ්ව විසින් සිදු කරන ලදී.

මෙම ව්‍යාපෘතියේ සම්පූර්ණ කොන්ත්‍රාත් මුදල රුපියල් මිලියන 44 ක් වූ අතර විශාල ගුවන් යානා හැසිරවීමට 200% ධාරිතාව වැඩි කිරීම, ශ්‍රී ලංකාව පදනම් කරගත් නිෂ්පාදකයින්ගෙන් අමතර කොටස් සහතික කිරීම සහ විදේශ මුදල් ඉතුරුම් වැනි ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා එය ක්‍රියාත්මක කරන ලදී.

04. වැඩි දියුණු කළ ආරක්ෂාව සහ සෞඛ්‍යය සමඟින් වසංගතය ජය ගැනීම

ආරක්ෂාව බොහෝ විට මගීන් තුළ විශ්වාසය ගොඩනඟයි, එබැවින් ආරක්ෂණ අංශ සපුරාලීම සහතික කිරීම සඳහා සමාගම සහ ගනුදෙනුකරුවන් අතර කටයුතු තීව්‍ර කිරීමේදී ඉදිරි පෙළ කාර්ය මණ්ඩලය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මගීන් දිනාගැනීමට මෙන්ම නව ගුවන් සේවා ආකර්ෂනය කර ගැනීම සඳහා සේවා විශිෂ්ටත්වයේ ප්‍රධාන සාධකයක් ලෙස මෙය නිරීක්ෂණය කළ හැකිය.

බ.ජා.ගු හොඳම භාවිතයන් අනුගමනය කරයි

ප්‍රධාන ජාත්‍යන්තර ගුවන්තොටුපළ ඉදිරි තර්ජනයට මුහුණ දීමට සූදානම්ව තබා ඇත.

කොවිඩ්-19 වැළැක්වීම සඳහා ගු.ගු.සේ.ස හි පූර්වාරක්ෂාව ලෙස "විශාල පිරිසිදු කිරීමේ වැඩසටහන්" මාලාවක් ආරම්භ කරන ලද අතර එය පුරාවටම අඛණ්ඩව පැවතුනි. කොරෝනා වයිරස් පැතිරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව ගු.ගු.සේ.ස සහ අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩලය සමඟ එක්ව ගු.ගු.සේ.ස හි සවිස්තරාත්මක නිර්දූෂණය කිරීමේ වැඩසටහන් නැවත නැවතත් පවත්වන ලදී. තවද, ඉහළ ස්පර්ශක ප්‍රදේශ පිරිසිදු කිරීම සහ විෂබීජහරණය කිරීමේ සංඛ්‍යාතයන් සිදු කරන ලදී. අත් සනීපාරක්ෂකයේ සිට PCR පරීක්ෂාව දක්වා, ගු.ගු.සේ.ස ආයතනය විවැනි වසංගත තත්ත්වයක් තුළ හොඳම මගී අත්දැකීමක් නිර්මාණය කිරීමට මූලිකත්වය ගත්තේය.

නව PCR පරීක්ෂණ රසායනාගාරය බ.ජා.ගු හි පිහිටුවන ලදී.

කොවිඩ්-19 බලපෑමට ලක් වූ මගීන් ශ්‍රී ලංකාවට පැමිණීමෙන් පසු රෝග විනිශ්චය කිරීමේ අදහසින්, ගු.ගු.සේ.ස විසින් බ.ජා.ගු හි PCR පරීක්ෂණාගාරයක් ඉදිකිරීමට පහසුකම් සලසා ඇත. මෙම PCR රසායනාගාරය සඳහා ගු.ගු.සේ.ස විසින් රුපියල් මිලියන 16.5 ක අරමුදල් ලබා දී ඇත. එය ස්ථාපිත කර මාස 6ක් ඇතුළත ගු.ගු.සේ.ස හි මගීන්ට, කාර්ය මණ්ඩලයට, අනෙකුත් පාර්ශ්වකරුවන්ට සහ වඩාත් වැදගත් ලෙස ගුවන්තොටුපළ අවට ප්‍රජාවට PCR පරීක්ෂණ 100,000කට අධික ප්‍රමාණයක් සිදු කිරීමට හැකි විය.

ම.රා.ජා.ගු. හි පූර්ණ පරිමාණ හදිසි අභ්‍යාස

ගුවන්තොටුපළ හදිසි සැලසුම් කමිටුව විසින් 2020 මාර්තු 10 වන දින ම.රා.ජා.ගු හිදී පූර්ණ පරිමාණ හදිසි අභ්‍යාසයක් පවත්වන ලදී.

මෙම සමස්ත අභ්‍යාසයේ ප්‍රධාන අරමුණ වූයේ ජාත්‍යන්තර ගුවන්තොටුපළක හදිසි අවස්ථාවක් සඳහා සියලුම බාහිර හා අභ්‍යන්තර ආයතනවල කාර්යක්ෂමතාව සහ සූදානම සහතික කිරීමයි. ජාත්‍යන්තර සිවිල් ගුවන් සේවා සංවිධානයට (ICAO) අනුව, ගුවන් යානා හදිසි සැලසුම්කරණයේ පරමාර්ථය වන්නේ හදිසි අවස්ථාවකදී ඇතිවිය බලපෑම් අවම කිරීම, විශේෂයෙන්ම ජීවිත බේරා ගැනීම සහ ගුවන් යානා මෙහෙයුම් පවත්වාගෙන යාමයි.

මෙම අභ්‍යාසයේදී ශ්‍රී ලංකන් ගුවන් සේවය, ශ්‍රී ලංකා යුද හමුදාව ශ්‍රී ලංකා ගුවන් හමුදාව, ශ්‍රී ලංකා පොලිසිය, දිස්ත්‍රික් ආපදා කළමණාකරණ මධ්‍යස්ථානය හම්බන්තොට හි නිලධාරීන්, විගමන හා ආගමන දෙපාර්තමේන්තුව,ශ්‍රී ලංකා රේගුව, සෞඛ්‍ය අමාත්‍යාංශය සහ අනෙකුත් සියලුම අභ්‍යන්තර හා බාහිර සම්බන්ධ ආයතන එය සාර්ථක කර ගැනීම සඳහා ක්‍රියාකාරිව සම්බන්ධ විය.

ම.රා.ජා.ගු. ඒවැනි පූර්ණ පරිමාණ හදිසි අභ්‍යාසයක වැදගත්කම වූයේ ජාත්‍යන්තර වාණිජ ගුවන් ගමන් නැවත ආරම්භ කිරීමට සූදානම් වන මොහොතක හදිසි අවස්ථාවක් සඳහා මෙහෙයුම් සූදානම සහතික කිරීමයි.

05. වැඩි දියුණු කළ ආරක්ෂාව සමඟ වසංගතය ජය ගැනීම

ගුවන්තොටුපළක් යනු ආරක්ෂාව පිළිබඳ පළමු හැඟීම ඇති කරන ස්ථානයකි. ජාත්‍යන්තර මඟින් ගැන සලකා බැලීමේදී, ගුවන්තොටුපළවල් පිටත් වීමට මොහොතකට පෙර අවසන් හැඟීම ඇති කරයි. එය ගුවන් සේවා ආරක්ෂක කාර්ය මණ්ඩලය අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා මඟින් සමඟ සහයෝගයෙන් කටයුතු කරන මධ්‍යස්ථානයකි.

ආරක්ෂක සේවා මිණුම් සලකුණු සේවා-තුළ බෙදා හැරීම වැදගත් වේ. දශක කිහිපයකට පෙර IATA විසින් වර්ධනය කරන ලද එවැනි මිණුම් සලකුණු වැදගත් ගුවන් ආරක්ෂණ තීරණ ගැනීමට සහාය විය.

බ.ජා.ගු. නවීනතම ආරක්ෂක තාක්ෂණ සහ පියවරයන්ගෙන් සමන්විතය.

බ.ජා.ගු. හි අත්‍යවශ්‍ය ක්‍රියාකාරී පාලන මධ්‍යස්ථානයක් වන සිදුවීම් විධාන සහ පාලන මෙහෙයුම් මධ්‍යස්ථානය 2020 නොවැම්බර් 30 දින විවෘත කරන ලදී. මෙම මධ්‍යස්ථානය බ.ජා.ගු. ඉහළට ඔසවා තැබීම සඳහා සංවර්ධනය කරන ලදී.

ICAO වැනි ජාත්‍යන්තර නියාමන ආයතනවලට අනුකූලව ජාත්‍යන්තර ප්‍රමිතීන්. සිදුවීම් විධාන සහ පාලන මෙහෙයුම් මධ්‍යස්ථානය විසින් ආරක්ෂාව සම්බන්ධ හදිසි අවස්ථා සහ හදිසි අවස්ථා වන පැහැරගැනීම්, පැහැරගැනීමට තැත් කිරීම්, බෝම්බ තර්ජන සහ කඩාකප්පල්කාරී ක්‍රියා ආදිය ඵලදායී ලෙස කළමනාකරණය කරනු ඇත.

තවද, නව තාක්ෂණික වැඩිදියුණු කිරීමේ වැඩසටහනක් හඳුන්වාදීමට සමගාමීව, පුපුරණ ද්‍රව්‍ය අනාවරණය (ETD) තාක්ෂණය ආරම්භ කරන ලදී. ETDs යනු පුපුරණ ද්‍රව්‍ය අනන්‍ය ලෙස හඳුනා ගැනීමට සහ හඳුනා ගැනීමට හැකියාව ඇති පද්ධති වේ.

ගුවන්තොටුපළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකාවේ සිවිල් ගුවන් තොටුපළවල ගුවන් ආරක්ෂක සේවා සපයන්නා ලෙස සහතිකය ලබාගෙන ඇත.

CAASL විසින් සිදු කරන ලද සහතික කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීමෙන් පසු, 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ විධිවිධාන අනුව අදාළ අනුකූලතාවය සඳහා සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත සතුටුදායක ලෙස ඉදිරිපත් කිරීම මත ගු.ගු.සේ.ස හට ගුවන්සේවා ආරක්ෂක සේවා සපයන්නාගේ බලපත්‍රය ලැබුණි.

ඊට අමතරව, කොවිඩ්-19 වැළැක්වීමේ පියවරයන් සඳහා දායක වෙමින්, සෑම ඇතුල්වීමේ දොරටුවකම උෂ්ණත්වමානයන් යොදවා ඇති අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් PP උපකරණ වලින් සමන්විත විය. මුර සංචාර නායකයින් 30 ක් සහ ආරක්ෂක මාර්ශල්වරුන් 03 දෙනෙක් ICAO අධීක්ෂක පාඨමාලාව සම්පූර්ණ කළහ. නියෝජ්‍ය ආරක්ෂක මාර්ශල්වරුන් 08 දෙනෙකු ගුවන් ආරක්ෂක (AVSEC) කළමනාකරු සහතික කිරීමේ වැඩසටහන සම්පූර්ණ කර ඇත. නව එක්ස් කිරණ පද්ධතිවල ක්‍රියාකරු පුහුණුව ලබන කාර්ය මණ්ඩලය 300 ක්, ක්‍රියාකරු පුහුණුව ලබන කාර්ය මණ්ඩලය 225 ක් යෙදවීමෙන් සංවිධානයේ ආරක්ෂක අංශ තවදුරටත් ශක්තිමත් විය. බ.ජා.ගු., ර.ගු, ම.රා.ජා.ගු. යා.ජා.ගු, සහ ම.ජා.ගු හි අභ්‍යන්තර තත්ත්ව පාලන පරීක්ෂණ 2020 දී සිදු කරන ලදී.

ගු.ගු.සේ.ස විසින් C1 වර්ගයේ X-කිරණ උපකරණ 02ක්, ද්විත්ව දක්න X-කිරණ උපකරණ 04ක් සහ ETD යන්ත්‍ර 10ක් වැනි නව ආරක්ෂක උපකරණ සඳහා ආයෝජනය කරන ලදී.



ගු.ගු.සේ.ස. ගුවන් සේවා ආරක්ෂක සැපයුම්කරු ලෙස සහතික කර ඇත.

2020 ගමන් මග ත්‍රිත්ව පතුල් රේඛාව භාවිතා කරමින් (3 PS)

ත්‍රිත්ව පතුල් රේඛාව අනුව ලාභ අරමුණු සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු දෑ

ආයතනික ලාභදායීතාවය පිළිබඳ සංකල්පය බහුවිධ පැති ඇත. මෙයට පිරිවැය - ඵලදායීතාවය, ආදායම් වර්ධනය, වත්කම් මත ප්‍රතිලාභ (ROA), ආයෝජන මත ප්‍රතිලාභ (ROI), කොටස් මත ප්‍රතිලාභ (ROE), විකුණුම් මත ප්‍රතිලාභ (ROS), ද්‍රවශීලතාවය සහ තවත් බොහෝ දේ ඇතුළත් වේ. කාර්ය සාධනය යනු මූල්‍ය ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) භෞතිකකරණය කිරීමයි. මූල්‍ය සමාලෝචනයේදී ලාභ උත්සුකයන් සාකච්ඡා කෙරේ.

ත්‍රිත්ව පතුල් රේඛාවෙහි අන්තර්ගත අවධානය

චිත්තවේගීය බුද්ධිමත් ආකාරයකින් සමාගමක් මානව ඉදිරිදර්ශනය අඟය කරන ආකාරය පිළිබඳව පුද්ගල අංශ සියල්ල සමඟ කටයුතු කරයි.

ගු.ගු.සේ.ස සිය ජාතික වගකීම ඉටු කරමින් විදේශයන්හි අතරමංව සිටින ශ්‍රී ලාංකිකයින් නැවත සිය රට කරා ගෙන්වා ගැනීමේ මෙහෙයුමට තවදුරටත් පහසුකම් සපයයි.

ආපසු ගෙන්වා ගැනීමේ ගුවන් මෙහෙයුම් ආරම්භ වූ දා සිට, කොවිඩ්-19 වසංගතය හේතුවෙන් පනවන ලද සංචාරක සීමාවන් හේතුවෙන් විවිධ රටවල අතරමං වූ ශ්‍රී ලාංකිකයින්ට පැමිණීමට බ.ජා.ගු. පහසුකම් සලසා දී ඇත.

සියලුම පාර්ශ්වකරුවන්ගේ හවුල්කාරිත්වය ඇතිව බ.ජා.ගු. හි විශේෂ මගී පැමිණීමේ සැලැස්මක් ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා සෞඛ්‍ය බලධාරීන්ගේ මඟපෙන්වීම යටතේ සියලුම පූර්වාරක්ෂක පියවර ක්‍රියාත්මක කිරීම සහතික කිරීමට කටයුතු යොදා ඇත.

මෙම අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ සියලු අභියෝග මධ්‍යයේ වුවද ගුවන්තොටුපළේ සේවා පහසුකම් වැඩිදියුණු කිරීමට ගු.ගු.සේ. ස වෙහෙස නොබලා කටයුතු කර ඇත. නිදසුනක් වශයෙන්, නිත්‍ය ගමන් සඳහා ගුවන්තොටුපළ නැවත විවෘත කරන විට මගීන්ට ප්‍රසන්න සංචාරක අත්දැකීමක් ලබා දෙන නව ආසන සැකැස්මක් සහිතව මගීන්ට පිටත්වීමට ප්‍රමාණවත් ඉඩක් ලබා දෙමින් මහජන ආලින්දය පුළුල් කරන ලදී.

ගු.ගු.සේ.ස හි කාර්ය මණ්ඩලය සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ කාර්ය මණ්ඩලය එක්ව, මගීන්ගේ සුවපහසුව සහතික කරමින් නිර්දේශිත සියලුම ආරක්ෂක ප්‍රමිතීන් සපුරා ඇති බව සහතික කිරීමට උපනන්දුවෙන් කටයුතු කරයි. ගුවන්තොටුපළ ක්‍රියාකරු ලෙස, බ.ජා.ගු. සිය ජාතික වගකීම ඉටු කිරීමේදී සැමවිටම ඉදිරියෙන් සිටී.

සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය (CATC) මානව ප්‍රාග්ධනය නඟා සිටුවීමේ සිය උත්සාහයන් දිගටම කරගෙන යන ලදී.

වසංගතයේ ආරම්භයත් සමඟ, CATC ද මූලින් ක්‍රියා විරහිත වූ නමුත් ඉක්මනින්ම සමාගමේ විශ්වාසනීය පුහුණු ආයතනය වීමේ මෙහෙවර ඉටු කිරීමට විකල්ප ක්‍රම සොයා ගන්නා ලදී.

CATC සිය අතථ්‍යය පන්ති කාමර වැඩමුළු සකසන ලද්දේ එමඟින් සම්ප්‍රදායික පන්ති කාමරයක් තුළ පුහුණුව සම්පූර්ණ වශයෙන්ම තනි පුද්ගලයෙකුට ලබා ගත හැකි පරිදිය. එයට සාම්ප්‍රදායික පුවරු මෙන්ම පරිගණක පාඩම ශ්‍රව්‍ය දෘශ්‍ය දේද ඇතුලත්ය. අතථ්‍යය රැස්වීම් මෘදුකාංගය හැර පවතින සම්පත් පමණක් උපයෝගී කර ගන්නා ලදී. මෙමඟින් ATC හට ඕනෑම වැඩසටහනක් දියත් කළ හැකි විය.

CATC හි අතථ්‍ය පන්ති කාමර වැඩමුළු

මීට අමතරව, නව පාඨමාලා නවයක් එකතු කරමින් CATC හි ඉලෙක්ට්‍රොනික ඉගෙනීම සඳහා ද්වාරය ශක්තිමත් විය. මෙම සියලුම පාඨමාලා සමාගම් සේවකයින්ට අවශ්‍ය පරිදි අනුගමනය කළ හැකිය. ඒවා ජංගම-හිතකාමී වන අතර එහිදී ස්මාර්ට් උපාංගයකින් අනුගමනය කළ හැකිය.



CATC හි ඉලෙක්ට්‍රොනික ඉගෙනීම සඳහා අතුරුමුහුණත

ලාභදායී විකල්පවල සියල්ල ඇතුළත් පිරිවැය සලකා බැලීමෙන්, 2020 දී සමාගම් සේවකයින්ට ලබා දුන් පුහුණුවෙන් ලැබුණු මුළු ඉතුරුම් රුපියල් මිලියන 378 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර වාණිජ පුහුණුව මඟින් රුපියල් මිලියන 1.6 කට වැඩි ඇමෙරිකානු ඩොලර් 3,000 ක ආදායමක් උපයා ඇත.

CATC විසින් පුහුණුව තුළින් කරන ලද ඉතුරුම් කොටස



- ගුවන් සන්තරණ සේවා
- ඉලෙක්ට්‍රොනික සහ ගුවන් සන්තරණ ඉංජිනේරු
- ගිනි හා මුදවා ගැනීමේ සේවා
- ගුවන්තොටුපළ කළමනාකරණය
- ආරක්ෂක සේවා
- සියලුම අංශ/ඒකක

ගුවන් ගමනාගමන පාලකවරුන් සඳහා පුහුණුව

පාඨමාලා සංවර්ධන ඒකකය (CDU) ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු පුහුණු අංශයේ විෂය කරුණු දායකත්වය ඇතිව ප්‍රමිතිගත පුහුණු පැකේජය (STP), "භෞමික ගුවන්විදුලි සම්බන්ධක ස්ථාපන සැලසුම්" (TRLIP) (STP අංක 179/212/COM OPS TRLIP) ICAO වලංගු කරන්නාගේ අධීක්ෂණය යටතේ CNS ඉංජිනේරුවන්ගේ භාවිතය සඳහා සාර්ථකව සංවර්ධනය කරන ලදී.

මෙම STP සම්පූර්ණයෙන්ම ඉලෙක්ට්‍රොනිකව ඉගෙන ගත හැකි වන අතර ICAO TRAINAIR PLUS පාඨමාලා පුස්තකාලයේ ඇති එවැනි STP කිහිපයෙන් එකකි. මෙම සංවර්ධනයත් සමඟම, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු පුහුණු අංශය ඉලෙක්ට්‍රොනික අධ්‍යාපනය සඳහා සම්පූර්ණ කළමනාකරණ අතුරු මුහුණතක් සංවර්ධනය කරන ලදී. ඉලෙක්ට්‍රොනික අධ්‍යාපන ද්වාරය සත්කාරකත්වය සපයනු ලබන්නේ තොරතුරු තාක්ෂණ අංශය විසිනි. CATC ශ්‍රී ලංකා යනු සිවිල් ගුවන් සේවා පුහුණු ප්‍රජාව තුළ ඉලෙක්ට්‍රොනික අධ්‍යාපනයෙහි පුරෝගාමියෙකි.

ගුවන් ගමනාගමන සේවා පුහුණු අංශය විසින් අලුතින් බඳවාගත් ගුවන් ගමනාගමන පාලකවරුන් 24 දෙනෙකු සඳහා ගුවන් යානා පාලන පාඨමාලාව - ICAO 052 පවත්වන ලදී. දීර්ඝ ප්‍රමාදයකින් පසුව මෙම බඳවා ගැනීම් සිදු කරන ලද අතර මෙතෙක් බඳවාගෙන ඇති විශාලතම කණ්ඩායමක් වන මෙම කණ්ඩායම 'රැකියාව කරන විටම පුහුණුව' (OJT) පිළිබඳව පුහුණු කර යෙදවීම අත්‍යවශ්‍ය විය. ගුවන් ගමනාගමන සේවා (ATS) පුහුණු අංශය මෙම අභියෝගය භාරගත් අතර වසංගතය සහ විශාල කණ්ඩායම් ප්‍රමාණය විසින් පනවන ලද බාධාවන් මධ්‍යයේ පුහුණුව සඳහා ඉතා නව්‍යකරණයක් ලබා දුන්නේය. මෙය අලුතින් ආරම්භ කරන ලද ADACEL 3D කුළුණ සිමියුලේටරය මත පවත්වන ලද පළමු ගඟන පාලන පාඨමාලාව ද විය. මෙම කණ්ඩායම 2021 මුල් භාගයේදී OJT මත යොදවනු ඇත.



ATC කුළුණ සිමියුලේටරයෙහි ප්‍රායෝගික පුහුණුව

ත්‍රිත්ව පතල් රේඛාව අනුව ජෛව ගෝලීය අරමුණු සම්බන්ධයෙන් සැලකිලි දැක්වීම්

එනම් කාබන් පියසටහන් හෝ සමස්ත පරිසරය සමඟ ආයතනික ගනුදෙනු කරන්නේ කෙසේද යන්න වන අතර වෙනත් ආකාරයකින් කිවහොත්, සංවිධානයක් පරිසරය ආරක්ෂා කරයිද, නැතහොත් එය පෘථිවිය විනාශ කරයිද යන්නයි.

කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට පරිත්‍යාග කිරීම

ගු.ගු.සේ.ස හි සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ සේවකයින් කොවිඩ්-19 ට එරෙහිව සටන් කිරීම සඳහා අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ මෙහෙවරට සහයෝගය දැක්වීම සඳහා ඔවුන්ගේ දවසේ වටිනා රුපියල් මිලියන 10 ක වැටුප 'කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදල'ට පරිත්‍යාග කරන ලදී. මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජ ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc- සභාපති ගු.ගු.සේ.ස සහ උප සභාපති රජිවසිරි සූරියආරච්චි සමඟ එක්ව චෙක්පත 2020 අප්‍රේල් 9 වැනි දින අතිගරු ජනාධිපතිතුමා වෙත භාර දෙන ලදී.



සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට පරිත්‍යාග කිරීම

බලශක්ති අඩු කිරීම හරහා පාරිසරික ගැටළු පවත්වා ගැනීම – බ.ජා.ගු

බ.ජා.ගු හි විදුලි පරිභෝජනය සඳහා සාමාන්‍ය මාසික ගෙවීම රුපියල් මිලියන 60 - 70 කි. 2020 මාර්තු මාසයේදී, නැවත ගෙන්වා ගැනීම සහ විශේෂයෙන් අවසර ලත් ගුවන් මෙහෙයුම් හැර, කොවිඩ්-19 හේතුවෙන් රට වෙත වාණිජ මගී ගුවන් ගමන් අත්හිටුවීමට රජය තීරණය කළේය, එමඟින් මගින් සංඛ්‍යාව මෙන්ම ආදායම විශාල ලෙස අඩු විය. සමාගමේ සම්පූර්ණ මෙහෙයුම් වියදම්වලින් විදුලි පිරිවැය 50% ක් දරන අතර, එබැවින් එය විදුලි පිරිවැය අඩු කිරීමේ අභියෝගයක් ගෙන එයි. මගීන් සංඛ්‍යාව අඩු වුවද, විදුලි පරිභෝජනයට වැඩිම දායකත්වයක් සපයන වායු සම්කරණය නිසා විදුලි පිරිවැය සමාන්තරව අඩු නොවිය. ඒ නිසා විදුලි පරිභෝජනය අඩු කිරීම විශාල අභියෝගයක් විය.

මෙම ක්‍රියාවලියේදී, අපි පහත මාර්ගෝපදේශ මත පදනම්ව ක්‍රියා කළෙමු.

1. බලශක්ති නාස්තිය අඩු කිරීම
2. මගී සුවපහසුව
3. ශ්‍රම බලකායේ කාර්යක්ෂමතාව

බලශක්ති පරිභෝජන දත්ත අනුව, මුළු පරිභෝජකයෙන් 60% -70% අතර කොටස මුළු ගුවන්තොටුපළෙහිම වායු සම්කරණ පද්ධතිය සඳහා වැය වෙයි. එබැවින් බලශක්ති අඩුකිරීමේ වැඩසටහන සඳහා මාර්ගය විදුලි ඉංජිනේරු අංශය සහ යාන්ත්‍රික ඉංජිනේරු අංශය එක්ව ක්‍රියාත්මක කරන ලදී. වැඩසටහන අතරතුර අනුගමනය කරන ලද ප්‍රධාන පියවර කිහිපයක් පහත දැක්වේ.

i. බලශක්ති දත්ත විශ්ලේෂණය කර ඉහළ බලශක්ති පරිභෝජනය සහිත පද්ධති හඳුනා ගැනීම.

ii. සේවකයින් සඳහා 26 ºC හි අවම උෂ්ණත්ව මට්ටම පවත්වා ගැනීම සඳහා උපදෙස් හා වායු සංසරණය අවම කිරීම සඳහා වායු සම්කරණ මාර්ගෝපදේශ යැවීම.

iii. මගී පර්යන්ත ගොඩනැගිල්ලේ මගී උපයෝගිතා රටාව අධ්‍යයනය කර තෝරාගත් පොකුරුවලට වායු සැපයුම වසා දැමීම.

මෙම ක්‍රියාවලියේදී ගු.ගු.සේ.ස සේවකයින් කාලෝචිත අවශ්‍යතාවය අවබෝධ කර ගනිමින් ඔවුන්ගේ සහයෝගය ලබා දෙන ලදී. මෙම වැඩසටහනින් 2019 වසරට සාපේක්ෂව 2020 වසර සඳහා රුපියල් මිලියන 200 කට වඩා ඉතිරි කර ඇත.

සමාප්ති සටහන්

2020 වසර අභියෝගාත්මක වසරක් වුවද,

වර්ෂය	පිරිවැය ශ්‍රී ලංකා රුපියල් මිලියන	බලශක්ති GWh
2018	787	36.57
2019	797	37.16
2020	582	27.02

විදුලි පිරිවැය - ප්‍රධාන සැපයුම් බ.ජා.ගු (ශ්‍රී ලංකා රුපියල් මිලියන)



අපගේ දැක්ම හඹායමින් ...

මුළු විදුලි බිල (ශ්‍රී ලංකා රුපියල් මිලියන)



බලශක්ති පරිභෝජනය (KWh මිලියන)



අපි "අපගේ දැක්ම හඹා යමින්", ත්‍රිත්ව පතුල් රේඛාව ක්‍රියාවට නංවමින් සිටියෙමු. අනාගතයේදී ගු.ගු.සේ.ස එහි දැක්ම වෙත යොමු කිරීමට තරම් අපි ශක්තිමත් වෙමු.

අපගේ දැක්ම හඹායමින් ...

මූල්‍ය සමාලෝචනය

2020 වසර ගු.ගු.සේ.ස. සඳහා අභියෝගාත්මක මූල්‍ය වර්ෂයක් විය. විශේෂයෙන්ම 2020 මාර්තු මාසයේ සිට කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් ගුවන් ගමන් සඳහා ඇති ඉල්ලුම පහත වැටීම හේතුවෙන් සමාගමේ මූල්‍ය ක්‍රියාකාරිත්වයට දැඩි ලෙස බලපෑවේය. මෙම කාලය තුළ පැතිරීම වැළැක්වීමේ පියවරක් ලෙස පැමිණීමේ මෙහෙයුම් සඳහා ගුවන්තොටුපළ වරින් වර වසා දැමීමට බලධාරීන්ට සිදු විය. රටේ කොවිඩ්-19 හි සම්ප්‍රදායික මූලාශ්‍රවලින් ආදායම් උත්පාදනයට බාධාවක් විය. එහි ප්‍රතිඵලයක් ලෙස, වසර සඳහා ගු.ගු.සේ.ස. හි මුළු ආදායම පෙර වසරට වඩා 70%ක පහත වැටීමක් නියෝජනය කරමින් රුපියල් බිලියන 7.8 කට සීමා විය.

එනමුත්, ඒවා මෙහෙයුම් පරිමාවන් සමඟ දැඩි ලෙස අන්තර් සම්බන්ධතාවයක් වී නොමැති බැවින් මෙහෙයුම් පිරිවැයෙහි සැලකිය යුතු අඩුවීමක් සිදු නොවිය. තවද, අහිතකර සාර්ව ආර්ථික පරිසරයක් මත ශ්‍රී ලංකා රුපියල 2020 වසර තුළදී දිගින් දිගටම අවප්‍රමාණය වූ අතර සමාගමේ මූල්‍යමය වශයෙන් ශ්‍රී ලංකා රුපියල් බිලියන 1.5 ක විනිමය අලාභයක් පිළිබිඹු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෑත ඉතිහාසයේ ප්‍රථම වතාවට 2020 වසර සඳහා ගු.ගු.සේ.ස. විසින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 2.5 ක ශුද්ධ අලාභයක් වාර්තා කළ අතර, එය පෙර වසරට සාපේක්ෂව 123% ක පහත වැටීමක් පෙන්නුම් කරයි. කෙසේ වෙතත්, වසර ගණනාවක් තිස්සේ එකතු වූ සමාගමේ ශක්තිමත් රඳවාගත් ඉපැයීම් මගින් මෙම අලාභවලට ඔරොත්තු දිය හැකිය.



2020 වර්ෂය තුළ ප්‍රධාන ආදායම් ධාවකයන්ගේ හැසිරීම

මගීන්
2,375,056
76%

ගුවන් යානා
20,881
66%

පියාසර කිරීම්
16,370
64%

භාණ්ඩ
150,075 මෙට්‍රික් ටොන්
42%

මූල්‍යමය කාර්යසාධනය

ආදායම

2020, ගු.ගු.සේ.ස. හි ආදායම් ප්‍රවාහයන් ප්‍රධාන වශයෙන් ගඟන නාවික සහ ගඟන නාවික නොවන (වාණිජ්‍ය මෙහෙයුම්) වලින් උපයාගත් ආදායම පිළිවෙලින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 2.3 සහ ශ්‍රී ලංකා රුපියල් බිලියන 5.3 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා රුපියල් මිලියන 153 ක් ලෙස සටහන් කර ඇති විදේශ විනිමය ලාභය වෙනත් ආදායමෙහි ප්‍රධාන වශයෙන් සමන්විත වේ.

සාමාලෝචනයට ලක්වූ වසර තුල ගඟන නාවික ආදායම

රු. බිලියන



රු.බිලියන 2.3ක් වූ අතර මෙය 2019 වර්ෂයෙහි රු.බිලියන 5.4ක් වාර්තා කල අතර එමගින් 58%ක පහල වැටීමක් පෙන්නුම් කෙරිනි. මෙයට පාදක වූයේ මාර්තු මස සිට ශ්‍රී ලංකාව ඇතුළු අනෙකුත් රටවල් පනවා තිබූ ජාත්‍යන්තර සංචරණ සීමා හේතුවෙන් ගුවන් ගමන් සඳහා ඉල්ලුමට තදින්ම පහත වැටුනු අතර එමගින් ගුවන්ගමන් කෙරෙහි බලපෑමක් ඇතිවිය.

ශ්‍රී ලංකා රුපියල් බිලියන



සමාලෝචිත වර්ෂය සඳහා ගඟන නාවික නොවන ආදායම් ශ්‍රී ලංකා රුපියල් බිලියන 5.3 ක් වූ අතර පෙර වසරට සාපේක්ෂව 74% කින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 14.9 ක පහත වැටීමක් පෙන්නුම් කළේය. සියලුම ගඟන නාවික නොවන ආදායම් කාණ්ඩවල (අනුග්‍රාහක ගාස්තු, ගුවන් යානාවට නැගීමේ ගාස්තු, බදු කුලී සහ වෙනත් ගඟන නාවික නොවන ආදායම්). මෙම අඩු වීම මූලික සඳහා මූලික වූයේ තීරුබදු රහිත බදුකුලී ගෙවන්නන්ගේ අනුග්‍රාහක ගාස්තු සහ ගුවන් යානා ඉන්ධන භාවිතය අඩු වීම වන අතර මගීන් සහ ගුවන් යානා සංචලන පහල වැටීමට මෙය හේතුවිය.

වගකිවයුතු ආයතනික පුරවැසියෙකු ලෙස, ගු.ගු.සේ.ස. සමාගම 2020 මාර්තු සිට දෙසැම්බර් දක්වා සන්නිවේදන ක්‍රියාකරුවන් සහ භාණ්ඩ ක්‍රියාකරුවන් හැර අනෙකුත් සියලුම සිල්ලර බදුකුලී ගෙවන්නන්ගේ කුලිය සම්පූර්ණයෙන්ම සහ 50% ක් නිදහස් කරනු ලැබූ අතර එමගින් ඔවුන්ට යම් සහනයක් දානය කලත් සමාගමෙහි ආදායම් මාර්ගවලට දැඩිලෙස පහර වැදී තිබිණි. 2020 ජූලි මස සිට බලපැවැත්වෙන පරිදි කො.ජා.ර.ගු. ක්‍රියාකරුවන් වෙත තවත් 50% ක බදුකුලී නිදහස් කිරීමක් ලබා දෙන ලදී. මෙමඟින් මෙම වර්ෂය සඳහා කුලී ආදායම අඩුවීම පැහැදිලි කරයි.

අඩු ගුවන් යානා සහ මගී සංචලනය මගින් මෙහෙයවනු ලබන ඌන උපයෝජන මට්ටම් හේතුවෙන් අනෙකුත් ගගන නාවික නොවන ආදායම් වලට අහිතකර බලපෑම් ඇතිවිය.

රු. බිලියන



ලාභදායිත්වය

2020 මූල්‍ය වර්ෂය සඳහා, ගු.ගු.සේ.ස. විසින් ශ්‍රී ලංකා රුපියල් බිලියන 4.6 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇති අතර, එය පෙර වසරේ වාර්තා කළ ශ්‍රී ලංකා රුපියල් බිලියන 12.2 ක ලාභයට වඩා 138% අඩුය. බදු ගෙවීමට පෙර පාඩුව කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ රුපියල් මිලියන 878 ක ශුද්ධ මූල්‍ය ආදායම මගින් වර්ෂය සඳහා මෙහෙයුම් අලාභය අර්ධ වශයෙන් ඉවත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාගම 2020 වර්ෂය සඳහා බදු ගෙවීමට පෙර රුපියල් බිලියන 3.7 ක අලාභයක් වාර්තා කර ඇත. තවද, විලම්බිත බදු (ආපසු හැරවීම) සම්බන්ධ ගිණුම්කරණ ගැලපීමක් ලාභදායිත්ව කෙරෙහි හිතකර ලෙස බලපෑවේය. ඒ අනුව, වර්ෂය සඳහා සමාගමේ බදු පසු අලාභය රුපියල් බිලියන 2.5 කි.

ශ්‍රී ලංකා රුපියල් බිලියන



ශුද්ධ මූල්‍ය (පිරිවැය) / ආදායම

ශුද්ධ මූල්‍ය (පිරිවැය)/ආදායම යනු විදේශ මුදල් වලින් නියෝජන වන ණය පරිවර්තනය කිරීමේදී දරන විනිමය ලාභ සහ අලාභය, පොලී ආදායම සහ පොලී වියදම් ශුද්ධ ප්‍රතිඵලයයි. වර්ෂය සඳහා වාර්තා කරන ලද ශුද්ධ මූල්‍ය ආදායම පෙර වසරේ රුපියල් බිලියන 3.02 ට සාපේක්ෂව මෙම වසරේ රුපියල් බිලියන 0.88 ක් විය. පසුගිය වසරේ රුපියල් බිලියන 0.16 ක විනිමය ලාභයට සාපේක්ෂව රුපියල් බිලියන 2.3 ක ණය පරිවර්තනය මත විනිමය අලාභය ශුද්ධ මූල්‍ය ආදායම අඩුවීමට ප්‍රධාන හේතුව විය. සියලුම ප්‍රධාන විදේශ මුදල් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය වීමෙන් මෙය පැහැදිලි වේ. අනෙක් අතට, අඩු වූ පොලී අනුපාත පොලී ආදායමට සෘණාත්මකව බලපෑ අතර එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වසරට සාපේක්ෂව ආදායම රුපියල් බිලියන 0.5කින් පහත වැටුණි. කෙසේ වෙතත්, ගු.ගු.සේ.ස. විසින් ඇමෙරිකානු ඩොලර් ස්ථාවර තැන්පතු සඳහා ඇමෙරිකානු ඩොලර් මිලියන 179 සිට ඇමෙරිකානු ඩොලර් මිලියන 193 දක්වා ආයෝජන වැඩි කිරීම මගින් අඩු කරන ලද පොලී අනුපාතවල අහිතකර බලපෑම පාලනය නොකළේ නම් එය වඩා වැඩි වනු ඇත.



මෙහෙයුම් වියදම්

ගු.ගු.සේ.ස. හි මෙහෙයුම් වියදම් 2019 වසරේ රුපියල් බිලියන 13.5 සිට 8% කින් රුපියල් බිලියන 12.4 දක්වා අඩු විය. කාර්ය මණ්ඩල බෝනස් සම්පූර්ණයෙන්ම කපා හැරීම, නිවාඩු මුදල් ඉපයීම 50% කින් ද සීමිත මෙහෙයුම් හේතුවෙන් අලුත්වැඩියා සහ නඩත්තු වියදම් 43% කින් ද සීමිත මෙහෙයුම් හේතුවෙන්, විශේෂයෙන් 2020 මාර්තු සිට දෙසැම්බර් දක්වා මාස නවයක කාලය තුළ මෙහෙයුම් වියදම් කෙරෙහි හිතකර බලපෑමක් ඇති විය.



විනිමය අනුපාත

ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටවලට වසංගතයේ පුළුල් ආර්ථික බලපෑම දුර්වල මූල්‍ය තත්ත්වයන් සහ විදේශ විනිමය උත්පාදනය සඳහා සංචාරක ව්‍යාපාරය සහ ප්‍රේෂණ මත යැපීම ප්‍රකාශ කර ඇත. මෙම කොන්දේසි ශ්‍රී ලංකා රුපියල මත සැලකිය යුතු පීඩනයක් ඇති කළ අතර, එය වසරින් වසර 2.5% කින් අවප්‍රමාණය වී 2020 වසර අවසානයේ දී ශ්‍රී ලංකා රුපියල් 184.12/ඇමෙරිකානු ඩොලර් (මිලදී ගැනීමේ අනුපාතය) ලෙස පැවතියේ, 2020 විදේශ විනිමය සංචිත සංරක්ෂණය කිරීමේ අරමුණින් රටට අත්‍යවශ්‍ය නොවන ආනයන මත රජය විසින් වසර මැද දී ඇති කරන ලද සීමා කිරීම් සමඟ ය.

ඇමරිකානු ඩොලරය, යුරෝ සහ ජපන් යෙන් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි විකුණුම් අනුපාත 2020 මාර්තු මාසයේදී තියුනු ලෙස අවප්‍රමාණය වීමත් සමඟ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතාවය හේතුවෙන් අඛණ්ඩව අවප්‍රමාණය විය. 2020 වසර අවසානයේ ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීම ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව 3.2% ක්, යුරෝවලට සාපේක්ෂව 12.9% ක් සහ ජපන් යෙන් වලට සාපේක්ෂව 8.5% ක් විය.

මූල්‍ය තත්ත්වය

වත්කම්

2020 දෙසැම්බර් 31 වන දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය රුපියල් බිලියන 103.2 ක් වූ අතර කාලපරිච්ඡේදය ආරම්භයේ දී එය රුපියල් බිලියන 108.5 ක් විය. මෙම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වෙළඳ ණය ගැතියන් සහ මූල්‍ය වත්කම්වල ආයෝජන පහත වැටීමයි. වසර තුළදී, සමාගම විසින් බොල් ණයගැතියන් වෙනුවෙන් රුපියල් මිලියන 643.5 ක ප්‍රතිපාදනයක් සිදු කරන ලද අතර එහි ප්‍රතිඵලයක් ලෙස වෙළඳ ණයකරුවන්ගේ ශේෂය සැලකිය යුතු ලෙස පහත වැටුණි. අනෙක් අතට, සමාගම කෙටි කාලීන ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා රුපියල් බිලියන 1.5ක් වටිනා මූල්‍ය වත්කම්වල ආයෝජන ඉවත් කර ගැනිනි.

මුදල් ප්‍රවාහයේ පීඩනය අඩු කිරීමේ අරමුණින්, ගු.ගු.සේ.ස. විසින් එහි ප්‍රාග්ධන වියදම් නැවත නිරීක්ෂණය කර අත්‍යවශ්‍ය නොවන වියදම් සීමා කරන අතරම, බ.ජා.ගු.හි පිටත්වීමේ මහජන ආලින්දය පුළුල් කිරීම, විගමන ප්‍රදේශය නැවත ස්ථානගත කිරීම සහ මගී ආලින්ද වැනි කෙරිගෙන යන ඇතැම් ව්‍යාපෘතිවල අරමුදල් අවශ්‍යතා සඳහා සුපරාලන අතර එමඟින් මගී පහසුකම් සැලසීම වැනි අත්‍යවශ්‍ය අංග අඛණ්ඩය කරගෙන ගියේය. මෙය පෙර වසරට සාපේක්ෂව රුපියල් බිලියන 1.9කින් හෝ දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීමේ වියදම් 47% කින් අඩුවීම සහ 2019 ට සාපේක්ෂව නොනිමි ප්‍රාග්ධන කටයුතු ශ්‍රීලංකා රුපියල් බිලියන 1.2 කින් හෝ 16% කින් වැඩි වීම මගින් පිළිබිඹු වේ.

වසර තුළ මුළු වත්කම් ශේෂය රුපියල් බිලියන 5.06 කින් පහත වැටුණු අතර එය ආරම්භක ශේෂය හා සසඳන විට 4.7% ට සමාන වේ.

ශ්‍රී ලංකා රුපියල් බිලියන



කාරක ප්‍රාග්ධනය

සමාලෝචිත වර්ෂය අවසානයේ ගු.ගු.සේ.ස. හි ජංගම වත්කම් සහ ජංගම වගකීම් පිළිවෙලින් ශ්‍රී ලංකා රුපියල් 47.6 සහ ශ්‍රී ලංකා රුපියල් බිලියන 6.2 ක් වූ අතර ශුද්ධ කාරක ප්‍රාග්ධන ශේෂය ශ්‍රී ලංකා රුපියල් 41.4 කි.

පෙර වසරට සාපේක්ෂව, මෙය "වත්කම්" යටතේ ඉහත සඳහන් කර ඇති හේතු නිසා ජංගම වත්කම් පහත වැටීම හේතුවෙන් කාරක ප්‍රාග්ධනයේ 10% අඩුවීමකි. වසර තුළ කාරක ප්‍රාග්ධනයේ සුළු ක්ෂරණය තිබියදීත්, සමාගමට එහි ජංගම වගකීම්වලින් හත් ගුණයකට සමාන කෙටි කාලීන ද්‍රවශීල වත්කම් ඇති බැවින්, එහි වගකීම් පමණක් නොව, එහි දිගුකාලීන ණය බැඳීම් 90% ට වඩා පහසුවෙන් ආවරණය කළ හැකිය.

ශ්‍රී ලංකා රුපියල් බිලියන



ණය සහ ප්‍රාග්ධන ව්‍යුහය

2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මුළු ණය ගැනීම් රුපියල් බිලියන 51.2 ක් වූ අතර එය 2019 ට සාපේක්ෂව 1% ක සුළු පහත වැටීමක් පෙන්නුම් කළේය. ගු.ගු.සේ.ස. විසින් විදේශ ණය ප්‍රාග්ධන ආපසු ගෙවීම රුපියල් බිලියන 3.7 ක් වන අතර මුළු ණය ලැබීම් රුපියල් බිලියන 1.08 වන අතර ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයෙන් (JICA) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ සංවර්ධන ව්‍යාපෘතිය (BIADP) දෙවන අවධිය අදියර 2 සඳහා ලැබුණු රුපියල් මිලියන 683.8 ට සමාන විදේශ මුදල් ණයක් සහ ලංකා බැංකුවෙන් ලබා ගත් රුපියල් මිලියන 400 ක දේශීය කෙටි කාලීන ණයක් 2020 වර්ෂය තුළදී ලැබුණි. විදේශ මුදල් වලින් නම් කරන ලද ණය සඳහා රුපියල් බිලියන 2.3 ක පරිවර්තන අලාභය ණය ආපසු ගෙවීමේ බලපෑම අඩු කරමින් ශේෂය වැඩිවීමට බලපා ඇත.

ශ්‍රී ලංකා රුපියල් බිලියන



සමාගමේ මුළු වත්කම් පදනම 2020 දෙසැම්බර් 31 වන විට රුපියල් බිලියන 103.2 ක වන අතර කොටස් හිමියන්ගේ අරමුදල් සහ කොටස් 36%, ජංගම නොවන වගකීම් 58% සහ ජංගම වගකීම් 6% මගින් අරමුදල් සපයන ලදී. වර්ෂයේ ආරම්භය හා සසඳන කල සමාගමේ ප්‍රාග්ධන ව්‍යුහයේ ප්‍රමාණාත්මක වෙනසක් සිදු නොවීය. සමාලෝචිත වර්ෂය අවසානයේ දී ණය හා ප්‍රාග්ධන අනුපාතය 1.38 ක් වූ අතර එය පෙර වසර අවසානයේ පැවති 1.31 හි අගය හා සසඳන විට ණයවල සුළු වැඩිවීමක් පමණි.

ශ්‍රී ලංකා රුපියල් බිලියන



මුදල් ප්‍රවාහය

2020 දෙසැම්බර් 31 දිනට ගු.ගු.සේ.ස. හි මුදල් සහ මුදල් සමාන ද රුපියල් මිලියන 826.2 කි. මෙම මුදලින් අඩකට වඩා කෙටි කාලීන රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති අතර ඉතිරිය බැංකුවේ මුදල් සහ අතේ ඇති මුදල් වේ. සමාගම කෙටි කාලීන බැංකු තැන්පතු සඳහා රුපියල් බිලියන 41.9 ක් ආයෝජනය කර ඇත. මුදල් සහ මුදල් සමාන ද ශේෂය කාලපරිච්ඡේදය ආරම්භයේදී රුපියල් බිලියන 2.5 ක ශේෂයට සාපේක්ෂව 67% නියෝජනය කරමින් තියුණු පහත වැටීමක් පෙන්නුම් කළේය.

මෙහෙයුම් ක්‍රියාකාරකම් 2019 වර්ෂයේ මෙහෙයුම් වලින් රුපියල් බිලියන 3.4 ක මුදල් ගලා ඒමට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා රුපියල් බිලියන 2.1 ක ශුද්ධ මුදල් පිටතට ගලා යාමට හේතු වී ඇත. කොවිඩ්-19 බලපෑමට ලක් වූ ගුවන් තොටුපල මෙහෙයුම් මගින් මෙය පැහැදිලි කෙරේ.

ගු.ගු.සේ.ස. හි 2020 වර්ෂය තුළ අනුගමනය කරන ලද විචක්ෂණශීලී ආයෝජන උපායමාර්ගය එහි ආයෝජන ක්‍රියාකාරකම් වලින් ධනාත්මක ප්‍රතිඵල ලබා ගත් අතර පෙර වසරේ මුදල් පිටතට ගලා ගිය රුපියල් බිලියන 7.1 හා සසඳන විට රුපියල් බිලියන 3.1 ක මුදල් ගලා ඒමක් ලබා ගැනීමට හැකි විය. සමාගම විසින් විවිධ සංවර්ධන ව්‍යාපෘති සහ ඵලදායිතා වැඩිදියුණු කිරීම් ආශ්‍රිත ආයෝජන සඳහා රුපියල් බිලියන 2.2 ක මුදලක් ආයෝජනය කර ඇත.

සෑම දෙනාම හොඳින් දන්නා හේතුව නිසා ව්‍යාපෘති ප්‍රගතිය මන්දගාමී වීම නිසා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් මුදල් ගලා ඒම තරමක් අඩු විය. කෙසේ වෙතත්, සමාගම ගෙවිය යුතු සියලුම ණය ආපසු ගෙවීම සිදු කළේය. ඒ අනුව, මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් භාවිතා කිරීම් පෙර වසරේ වාර්තා වූ ශ්‍රී ලංකා රුපියල් බිලියන 2 කට සාපේක්ෂව රුපියල් බිලියන 2.7 ක් විය.

ප්‍රාග්ධන කළමනාකරණය

සමාගමේ ප්‍රාග්ධන කළමනාකරණ උපාය මාර්ගයේ මූලික පරමාර්ථය වන්නේ ශක්තිමත් ප්‍රාග්ධන පදනමක් සහ සෞඛ්‍ය සම්පන්න ප්‍රාග්ධන අනුපාත පවත්වා ගනිමින් එහි ව්‍යාපාරවලට සහාය වීම සහ එහි කොටස් හිමියන්ගේ වටිනාකම උපරිම කිරීමයි. සමාගම එහි ශුද්ධ ණය සහ කොටස් අනුපාතය මත පදනම්ව ප්‍රාග්ධන උපයෝජනය නිරීක්ෂණය කරයි. 2020 දෙසැම්බර් 31 සහ 2019 වන විට ශුද්ධ ණය හා කොටස් අනුපාතය පහත පරිදි වේ:

		රුපියල්
දෙසැම්බර් 31 දිනට	**2020**	2019
ණය ගැනීම්	**51,172,796,305**	51,560,331,853
අඩු: මුදල් සහ බැංකු ශේෂයන්	**(42,758,863,147)**	(45,864,301,175)
ශුද්ධ ණය ගැනීම්	**8,413,933,157**	5,696,030,677
කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි මුළු ප්‍රාග්ධනය	**36,982,901,557**	39,230,657,250
ශුද්ධ ණය/ ප්‍රාග්ධන අනුපාතය	**19%**	13%

කොටස් හිමියන්ට ආරෝපණය කළ හැකි මුළු කොටස් ප්‍රමාණය ශ්‍රී ලංකා රුපියල් බිලියන 2.2 කින් පහත වැටී ඇති අතර, මූලික වශයෙන් 2020 මූල්‍ය වර්ෂය තුළ සිදු වූ පාඩුව මගින් දායක විය.

අගය එකතු කිරීමේ ප්‍රකාශනය

			රු.000
		2020	**2019**
ආදායම්		**7,575,860**	25,652,253
වෙනත් ආදායම්		**212,551**	40,989
මූල්‍ය ආදායම්		**3,665,085**	4,164,672
ආයුගණක උපකල්පන වෙනස්වීම් මත ඇතිවන ලාභ		**377,899**	81,435
		11,831,395	29,939,349
පරිපාලන සහ ආයතනික වියදම්		**(2,130,456)**	(2,504,506)
එකතු කල අගය		**9,700,939**	27,434,843

එකතු කළ අගය බෙදා හැරීම			**%**		%
සේවකයින් හට	වැටුප් සහ ප්‍රතිලාභ	**7,414,763**	**76**	8,128,456	30
රජයට	බදු	**-**	**0**	4,159,769	15
කොටස් හිමියන්ට	ලාභාංශ	**-**	**0**	500,000	2
ණය ප්‍රාග්ධන සපයන්නන්ට	පොලී	**1,289,674**	**13**	1,325,978	5
ව්‍යාපාරය තුල රඳවා ගැනීම්	ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය	**2,853,960**	**29**	2,856,562	10
ව්‍යාපාර තුළ රඳවා ගැනීම්/ (භාවිත කිරීම්)	සංචිත	**(1,857,458)**	**-18**	10,464,078	38
		9,700,939	**100**	27,434,843	100

එකතු කල අගය බෙදීයාම

ශ්‍රී ලංකා රුපියල් බිලියන



මානව ප්‍රාග්ධන කළමනාකරණය

මානව සම්පත් කළමනාකරණය යනු තරඟකාරී වාසියක් ලබා ගැනීමට උපකාර වන ආයතනයක පුද්ගලයින්ගේ ඵලදායී කළමනාකරණය සඳහා වූ උපාය මාර්ගික ප්‍රවේශයයි. ඵලදායී මානව සම්පත් කළමනාකරණය සේවා යෝජකයාගේ උපාය මාර්ගික අරමුණු සඳහා සේවයේ සේවක කාර්ය සාධනය උපරිම කරයි. මානව සම්පත්වල මූලික පරමාර්ථය වන්නේ සංවිධානයට මිනිසුන් හරහා සාර්ථකත්වය ළඟා කර ගත හැකි බව සහතික කිරීමයි.

මානව ප්‍රාග්ධනය සංවිධානයක සේවයේ නියුතු පුද්ගලයින්ගේ දැනුම, කුසලතා සහ හැකියාවන්ගෙන් සමන්විත වන අතර සමාගමක වෙළඳපල වටිනාකමේ අංගයකි. ප්‍රධාන සංවිධානයේ මානව මූලද්‍රව්‍ය වන්නේ ඉගෙනීමට, වෙනස් කිරීමට, නව්‍යකරණයට සහ නිසි ලෙස අභිප්‍රේරණය කරන ලද නිර්මාණාත්මක තෙරපුම සැපයීමට හැකියාව ඇති ඒවා වන අතර එමඟින් සංවිධානයේ දිගුකාලීන පැවැත්ම සහතික කෙරේ.

ගු.ගු.සේ.ස. හි මානව ප්‍රාග්ධනය එහි ඉපැයීමේ විභවය, ඵලදායිතාව සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා මූලික දායකත්වය සපයනු ලබන බව අපි මෙම විශ්වාසය සැබවින්ම පිළිගනිමු. ගු.ගු.සේ.ස. මානව සම්පත් උපායමාර්ගය සැලසුම් කර ඇති අතර සමාගම සඳහා හොඳම දක්ෂතා ආකර්ෂණය කර ගැනීම, තෝරා ගැනීම, අභිප්‍රේරණය කිරීම, සංවර්ධනය කිරීම සහ රඳවා තබා ගනිමින් තරඟකාරී වාසි ලබා දීම කෙරෙහි අවධානය යොමු කර ඇති බැවින්, සංවිධානයේ වර්ධනයට සහ යහපැවැත්මට පහසුකම් සපයන ප්‍රධාන වත්කම ලෙස මානව සම්පත් අපි සලකමු.

ගු.ගු.සේ.ස. රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම සහ කීර්තිමත් ආයතනයක් වීම නිසා වෙළඳපොලේ හොඳම දක්ෂයින් ආකර්ෂණය කර ගැනීමට අපට හැකියාව ලැබේ. 2020 වර්ෂයේදී අපගේ ශ්‍රම බලකාය 4,098 ක් විය. අපගේ දැක්ම හඹා යාම සඳහා සමස්ත සංවිධානය මෙහෙයවීම සඳහා ඵලදායී හා උපාය මාර්ගික ආකාරයකින් අපි මානව සම්පත් කළමනාකරණය කරන්නෙමු.

අපගේ කාර්ය මණ්ඩලය පිළිබඳ දළ විශ්ලේෂණය

සමාගමේ ආයතනික සැලැස්ම මත පදනම්ව, මානව සම්පත් අංශය අනෙකුත් අංශවල නිර්දේශය සමඟ වර්ෂය සඳහා කාර්ය මණ්ඩල අවශ්‍යතා පුරෝකථනය කරයි. සමාගමට වඩාත්ම දක්ෂ අපේක්ෂකයින් බඳවා ගැනීමට හැකි වන පරිදි අපේක්ෂකයින් සමඟ සෑම තනතුරක් සඳහාම අදාළ සුදුසුකම්, පළපුරුද්ද සහ කුසලතා සිතියම්ගත කිරීම මගින් තෝරා ගැනීම සිදු කෙරේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අනෙකුත් වසරවලට සාපේක්ෂව 2020 දී බඳවා ගැනීම් සහ උසස්වීම් සැලකිය යුතු ලෙස අඩු විය. පහත ප්‍රස්ථාරයෙන් දැක්වෙන්නේ 2020 වර්ෂයේ බඳවාගැනීම් සහ උසස්වීම්වල තත්ත්වයයි.

බඳවා ගැනීම් සහ උසස්වීම්



2020 වසර සඳහා බඳවා ගැනීම් පහත පරිදි වේ:

වර්ගය	2020 දී බඳවා ගැනීම්		එකතුව
	බාහිර	අභ්‍යන්තර	
විධායකයින්	26	15	41
සුපරීක්ෂක/තාක්ෂණ නිලධාරීන්	0	1	1
ලිපිකාර සහ සමාන්තර ශ්‍රේණි	4	0	4
පුහුණු සහ අර්ධ පුහුණු කම්කරුවන්	11	0	11
සුළු සේවකයින් සහ නුපුහුණු	8	0	8
සමස්ත	49	16	65

වයස් විශ්ලේෂණය

2020 දෙසැම්බර් 31 දිනට සේවකයින්ගේ වයස් විශ්ලේෂණය පහත පරිදි වේ:





ස්ත්‍රී පුරුෂ භාවය විශ්ලේෂණය

2020 දෙසැම්බර් 31 දිනට සේවකයින්ගේ ස්ත්‍රී පුරුෂ භාවය විශ්ලේෂණය පහත පරිදි වේ.



සේවක ව්‍යාප්තිය

සමස්ථ සේවක ව්‍යාප්තිය පහතින් දැක්වෙයි.



සේවකයින් සඳහා අපගේ පුහුණු සහ සංවර්ධන මූලපිරීම්

2020 වසර මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් සැලකිය යුතු අභියෝගාත්මක වසරක් වූ අතර එහිදී අපට සාම්ප්‍රදායික පුහුණු ක්‍රමවලට වඩා ඉගෙනීමේ සහ සංවර්ධන අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමේ නව ක්‍රම සොයා ගැනීමට සිදු විය.

නව සාමාන්‍ය තත්ත්වයට ප්‍රතිචාර දක්වමින්, මානව සම්පත් අංශය විසින් සමාගම් ආයතනික ජාලය හරහා ප්‍රවේශ විය හැකි "මාර්ගගත ඉගෙනුම් ද්වාරය" හඳුන්වා දෙන ලදී.

ගු.ගු.සේ.ස. හි සියලුම සේවකයින්ට ඔවුන්ගේ සේවක අර්ථසාධක අංකය භාවිතා කිරීමෙන් සරලව මාර්ගගත ද්වාරයට සම්බන්ධ විය හැක. සේවකයින්ගේ අවශ්‍ය දැනුම වැඩි දියුණු කිරීම සඳහා කළමනාකරණය, තොරතුරු තාක්ෂණය සහ ඉංජිනේරු විද්‍යාව වැනි විවිධ ක්ෂේත්‍රවල ඉගෙනුම් ද්‍රව්‍ය තිබේ.

වසරේ අග භාගයේදී, දැඩි සෞඛ්‍ය මාර්ගෝපදේශ යටතේ අප විසින් ගෘහස්ථ පුහුණු වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. අභියෝගාත්මක පරිසරයක් පැවතියද, පුහුණු පැය 4,631ක් ආවරණය වන පරිදි සේවකයින් 507ක් පුහුණු කිරීමට අපට හැකි විය.

තවද "බුද්ධිමත් නායකයා" කණ්ඩායම සඳහා විශේෂ බාහිර පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අපට හැකි විය.

අපගේ සේවකයින්ගේ කාර්ය සාධන කළමනාකරණය

ගු.ගු.සේ.ස. හි කාර්ය සාධන කළමනාකරණ පද්ධතිය සමාගමේ ආයතනික අරමුණු සහ අරමුණු වලට අනුකූල වේ. ගු.ගු.සේ.ස. කාර්ය සාධන කළමනාකරණ පද්ධතියේ අරමුණ වන්නේ සංවිධානයේ ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගනිමින් සියලුම ගු.ගු.සේ.ස. සේවකයින්ගේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීමයි. කාර්ය සාධන ප්‍රතිඵල පුහුණු සහ සංවර්ධන අවස්ථා සැපයීම, වෘත්තීය සංවර්ධන අවස්ථා සහ අනුප්‍රාප්තික සැලසුම්කරණය සමඟ සම්බන්ධ වී ඇති අතර එහිදී එය කාර්ය සාධන හිඩැස්, පුහුණු අවශ්‍යතා, උසස්වීම් සහ ත්‍යාග නිර්ණය කිරීමේදී භාවිතා වේ.

ගු.ගු.සේ.ස. සතුව දැනට සේවකයෙකුගේ කාර්ය සාධනය මැනීම සඳහා ප්‍රායෝගිකව කාර්ය සාධන කළමනාකරණ පද්ධති දෙකක් ඇත.

1. කාර්ය සාධන කළමනාකරණ සහ සංවර්ධන පද්ධතිය (PMDS) S-10 සිට S-14 දක්වා වැටුප් පරිමාණයන් දරන සේවකයින් සඳහා
2. 180◦ තක්සේරු පද්ධතිය S-1 සිට S-9 දක්වා වැටුප් පරිමාණයන් දරන සේවකයින් සඳහා

PMDS යටතේ, ජ්‍යෙෂ්ඨ කළමනාකාර සහ කළමණාකාර මට්ටම යටතේ වර්ගීකරණය කරන ලද නිලධාරීන් රැකියාවේ අරමුණු සහ චර්යාත්මක නිපුණතා පිළිබඳ මිදුම් මට්ටම් සලකුණු සපුරාලීමේදී ඇගයීමට ලක් කෙරේ. එහි ප්‍රධාන පියවර වන්නේ ඉලක්ක සහ කාර්ය සාධන ප්‍රමිතීන් සැකැස්මයි. (පුද්ගලයාගේ සංවර්ධන ඉලක්ක)

1. වසර මැද සමාලෝචන
2. ශ්‍රේණිගත කිරීමේ කාර්ය සාධනය
3. කාර්ය සාධනය මත පදනම් වූ ක්‍රියාව
4. සේවකයින් නිර්දේශ කිරීම.

S-1 සිට S-9 දක්වා වැටුප් පරිමාණයන් දරන අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලය 180◦ තක්සේරු පද්ධතිය භාවිතයෙන් ඇගයීමට ලක් කළ යුතුය. මෙම කාර්ය සාධන කළමනාකරණ පද්ධතිය යටතේ සේවකයින්ගේ රැකියා දැනුම, කුසලතා සහ ආකල්ප ඇගයීමට ලක් කෙරේ. 180◦ තක්සේරු පද්ධතියේ ප්‍රධාන පියවර වන්නේ:

1. ස්වයං තක්සේරුව පිරවීම
2. තක්සේරු සම්මුඛ පරීක්ෂණය
3. සේවා අධීක්ෂක විසින් කාර්ය සාධන ඇගයීම් වාර්තාව පිරවීම
4. දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් කාර්ය සාධන ඇගයීම් වාර්තාව පිරවීම

ගු.ගු.සේ.ස. හි කාර්යය සාධන කළමනාකරණ පද්ධති



ඉහත දක්වා ඇති පරිදි කාර්ය සාධන කළමනාකරණ පද්ධති දෙක පැවැත්වීමෙන් පසු 2020 වර්ෂය තුළ මුළු සේවකයින් 2,290 කට ඔවුන්ගේ වාර්ෂික වැටුප් වර්ධක ප්‍රදානය කරන ලදී.

ඇගයීමේ ක්‍රමය



ගු.ගු.සේ.ස. වෙත අපගේ සේවක කැපවීම

ගුවන්තොටුපළවල පරිපාලකයෙකු ලෙස ගු.ගු.සේ.ස. විසින් ගුවන් තොටුපළවල ගුණාත්මකභාවය සහ අලංකාරය පවත්වා ගැනීම හේතුවෙන් ගුවන් තොටුපළවල මෙහෙයුම් නවතා තිබියදීත් දෛනික කටයුතු පවත්වාගෙන යා යුතුය. එබැවින්, කොවිඩ්-19 වසංගතය නොතකා අපගේ සේවකයින් දෛනික නඩත්තු කටයුතුවල නිරත වී ඇත. එය අපගේ සේවකයින්ගේ පක්ෂපාතිත්වය පෙන්වීය. ගු.ගු.සේ.ස. හට ද එහි සේවකයකුගේ වැටුප පෙර වසරේ තිබූ මට්ටම තුළම පවත්වාගෙන යා හැකි විය. ආර්ථික අවපාතය යටතේ පවා සේවකයින්ගේ කැපවීම වෙනුවෙන් අපගේ කළමනාකාර්ත්වය ඵලෙස ගෞරවය එක් කළේය.

සේවකයින් සඳහා අපගේ සුභසාධන ක්‍රියාකාරකම්

ගු.ගු.සේ.ස. විසින් සේවකයින්ට සුභසාධන පහසුකම් සපයනු ලබන්නේ ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සහ උපරිම ඵලදායිතාව ප්‍රවර්ධනය කිරීම තුළින් ඔවුන් දිරිමත් කිරීමේ අරමුණ ඇතිවය. එබැවින් සේවකයින්ට ප්‍රමාණවත් සුබසාධනයක් ලබා දීමට ප්‍රමුඛත්වය දීම මිල අධික තීරණයක් විය හැකි නමුත් දිගුකාලීන ප්‍රතිලාභ අතිමහත් ය. එය ගු.ගු.සේ.ස. හට එහි හොඳ සහ දක්ෂ සේවකයින් දිගු කාලයක් රඳවා තබා ගැනීමට ඉඩ ලබා දී ඇත.

ගු.ගු.සේ.ස. අපගේ සේවා දායකයන්ගේ සුභසාධනයේ වැදගත්කම සම්පූර්ණයෙන් වටහාගෙන ඔවුන් සඳහා පුළුල් පරාසයක පහසුකම් සපයන අතර සමාගම් වෛද්‍ය යෝජනා ක්‍රමය, මරණ සඳහා පරිත්‍යාග යෝජනා ක්‍රමය, කාර්ය මණ්ඩල ණය, කාර්ය මණ්ඩල ප්‍රවාහන සේවය, නිවාඩු බංගලා පහසුකම්, කාර්ය මණ්ඩල නිල නිවාස, නිවාස ණය 5% පොළී ආපසු ගෙවීම සහ විදේශ වන්දනා ගමන් සඳහා මූල්‍ය ආධාර ඇතුලත් වේ. මෙම සුභසාධන ක්‍රියාකාරකම් මගින් ව්‍යාපාර වර්ධනයට සහ ගු.ගු.සේ.ස. හි තරඟකාරිත්වය ඉහළ නැංවීමට මඟ පාදන සේවකයින් දිරිමත් කිරීම සහ පෙළඹවීම සිදුවිය.

සේවක වෛද්‍ය යෝජනා ක්‍රමය

ගු.ගු.සේ.ස. සතුව විශේෂිත සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමයක් ඇත. එහිදී සේවකයින්ට ගෘහස්ත හෝ බාහිරින් ප්‍රතිකාර ලබා ගත හැකිය. මෙම යෝජනා ක්‍රමය සේවයේ තහවුරු කරන ලද සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල් ඒකක සඳහා ක්‍රියාත්මක වේ. ලබා ගත හැකි යෝජනා ක්‍රම රුපියල් 150,000 සිට රුපියල් 350,000 දක්වා පරාසයක පවතින අතර සේවකයින්ට ඔවුන්ගේ අවශ්‍යතාවලට ගැලපෙන දේ තෝරා ගැනීමට හැක. දිවයින පුරා විසිරී ඇති ලියාපදිංචි රෝහල් 47 ක සෞඛ්‍ය සේවා සපයන්නන්ගෙන් ණය පදනම මත තවදුරටත් ගෘහස්ථ සේවාව ලබා ගත හැක.

කොළඹ වරාය නගරයට ගු.ගු.සේ.ස. සේවකයින්ගේ දරුවන් සඳහා සංවිධානය කරන ලද ක්ෂේත්‍ර චාරිකාව.

ගු.ගු.සේ.ස. විසින් 2020 සැප්තැම්බර් 18 වන දින ගු.ගු.සේ.ස. කාර්ය මණ්ඩලයේ දරුවන් සඳහා CHEC වරාය නගරය වෙත විශේෂ ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කරන ලදී. ශ්‍රී ලංකාවේ තනි විශාලතම විදේශ ආයෝජනය වන වරාය නගරය ව්‍යාපෘතිය නැරඹීමට 7 සිට 13 ශ්‍රේණි දක්වා පාසල් සිසුන් 200 දෙනෙකුට මෙම දුර්ලභ අවස්ථාව ලබා දෙන ලදී.

ඉන්දියන් සාගරයේ උණුසුම් ජලය ආශ්‍රිතව ජීවත් වීමට විධිමත් අසමසම සැලැසුමකට අනුව ඉදිවන දකුණු ආසියාවේ ප්‍රමුඛතම නේවාසික, වෙළඳ හා ව්‍යාපාරික ගමනාන්තය පිළිබඳ සිසුන් දැනුවත් කිරීම සඳහා ගු.ගු.සේ.ස. විසින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

මෙම සංචාරයේදී හෙක්ටයාර් 269ක මුහුදෙන් ගොඩකරගත් ගොඩබිම් ක්‍රියාවලිය නැරඹීමට සිසුන්ට අවස්ථාව හිමිවිය. වරාය නගරය ව්‍යාපෘතියේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වරාය නගරයේ ප්‍රධාන සැලැස්ම සහ මූල්‍ය ප්‍රදේශය, මධ්‍යම උද්‍යාන වාසය, දූපත් වාසය, තොටුපළ සහ ජාත්‍යන්තර දූපත ඇතුළු ව්‍යාපෘතියේ විවිධ පරිශ්‍ර 5 පැහැදිලි කරන ලදී.

ගු.ගු.සේ.ස. බැඩ්මින්ටන් තරඟාවලිය 2020

ගු.ගු.සේ.ස. හි සභාපතිවරයාගේ මඟපෙන්වීම යටතේ, SWRC විසින් අභ්‍යන්තර ගෘහස්ථ බැඩ්මින්ටන් තරඟාවලියක් සංවිධානය කරන ලදී. මෙම තරඟාවලිය 2020 සැප්තැම්බර් 17 සිට 18 දක්වා ආරක්ෂක අංශයේ ගෘහස්ථ බැඩ්මින්ටන් ක්‍රීඩාංගණයේදී පැවැත්වුණු අතර සමාගම විසින් මෙවැනි ගෘහස්ථ බැඩ්මින්ටන් තරඟාවලියක් සංවිධානය කරන ලද පළමු අවස්ථාව මෙය විය.

අපගේ සේවකයන් ඇගයීම සහ ත්‍යාග පිළිගැන්වීම

සේවක පිළිගැනීමේ වැඩසටහන

ගු.ගු.සේ.ස. හි සේවකයින් ඇගයීම් හා පිළිගැන්මේ වැඩසටහන පළමුවරට 2020 සැප්තැම්බර් 17 සිවිල් ගුවන් සේවා අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. මෙම උත්සවය, ගරු ප්‍රසන්න රණතුංග - සංචාරක අමාත්‍ය, මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc - සභාපති ගු.ගු.සේ.ස., රජීවසිරි සූරියආරච්චි - උප සභාපති සගු.ගු.සේ.ස. සහ කපිතාන් තේමිය අබේවික්‍රම - සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යක්ෂවරුන් සහ ගු.ගු.සේ.ස. හි අනෙකුත් නිලධාරීන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

2018 සහ 2019 වසර සඳහා ප්‍රධාන එමගින් කාණ්ඩ පහක් යටතේ සේවකයන්ගෙන් අයදුම්පත් කැඳවන ලද අතර, වෘත්තීය සමිති, ප්‍රාදේශීය නියෝජිතයන්, අංශ ප්‍රධානීන්, අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සහ අමාත්‍යාංශයේ නිලධාරීන් නියෝජනය කරන කමිටු තුනක මැදිහත්වීමෙන් දැඩි හා විනිවිදභාවයෙන් යුත් තෝරා ගැනීමේ ක්‍රියාවලියක් සිදු කරන ලදී.

ඔවුන්ගේ කැඳවීමේ රාජකාරියෙන් ඔබ්බට ක්‍රියා කළ සේවකයින් අවසන් වටය සඳහා තෝරා ගන්නා ලද අතර, උත්සවයේ දී නායකත්වය, කණ්ඩායම් ක්‍රියාකාරකම්, නිර්මාණශීලිත්වය සහ නවෝත්පාදන, පාරිභෝගික සත්කාර සහ විවෘත යන කාණ්ඩ පහක් යටතේ පළමු, දෙවන, තුන්වන සහ කුසලතා සම්මාන ප්‍රදානය කරන ලදී.







සේවක පිළිගැනීමේ සම්මාන උළෙල



ගු.ගු.සේ.ස. හි සේවක ඇගයීම් සහ වැඩසටහන සිවිල් ගුවන්සේවා අධිකාරියේ ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

අපගේ සේවකයන්ගේ සෞඛ්‍යය සහ ආරක්ෂාව

කොවිඩ්-19 පැතිරීම මැඩපැවැත්වීමට පියවර

කොවිඩ්-19 වසංගත ව්‍යාප්තිය මධ්‍යයේ ගත් මුලපිරීම් රට තුළ කොවිඩ්-19 පැතිරීමත් සමඟ සමාගම තුළ කොවිඩ්-19 පැතිරීම මැඩපැවැත්වීම සඳහා බොහෝ මුල පිරීම් ගෙන ඇත. සේවකයින්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, ආරක්ෂණ උපාංග හඳුනා ගැනීම සහ වැළැක්වීමේ මාර්ගෝපදේශ සකස් කිරීම සම්බන්ධයෙන් සමාගමේ ප්‍රධාන මෙහෙයුම් ක්ෂේත්‍රවලින් සමන්විත මෙහෙයුම් කමිටුවක් පිහිටුවන ලදී. තවද, ආරක්ෂිත පියවරයන් පහසුවෙන් ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා අංශ සම්බන්ධීකාරකවරුන් පත් කරන ලදී.

කොවිඩ්-19 වැළැක්වීමේ පියවරක් ලෙස මසකට රුපියල් මිලියන 3.2 ක පමණ මුදලක් වැය කරමින් අවශ්‍ය සියලුම ආරක්ෂණ උපාංග ද්‍රව්‍ය ගු.ගු.සේ.ස. විසින් සේවකයන්ට ලබා දෙන ලදී. තවද, ආරක්ෂක පියවර පිළිබඳව සේවකයින් දැනුවත් කරන ලද අතර, ගු.ගු.සේ.ස. තුළ කොවිඩ්-19 මැඩපැවැත්වීම සඳහා කමිටුව විසින් අඛණ්ඩ අධීක්ෂණ පද්ධතියක් සිදු කරන ලදී. නිවසේ සිට වැඩ කිරීම (WFH) සංකල්පය සමාගමට හඳුන්වා දෙන ලද අතර සෞඛ්‍ය මාර්ගෝපදේශවලට අනුකූලව කාර්ය මණ්ඩල සංචලනයන් පාලනය කිරීම සඳහා නව සේවා මුර විධිවිධාන ද හඳුන්වා දෙන ලදී.



උෂ්ණත්ව නිරීක්ෂණය - බ.ජා.ගු. හි දී

සේවක පුහුණුව සහ සංවර්ධනය

ගු.ගු.සේ.ස. හි විසින් සේවකයින් සඳහා ඔවුන්ගේ කාර්යක්ෂමතාව, සේවා පරිසරයේ ඵලදායීතාවය සහ ඔවුන්ගේ මානසික සහ චිත්තවේගීය සමතුලිතතාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් පුහුණු සහ සංවර්ධන වැඩසටහන් කිහිපයක් පවත්වන ලදී. ගු.ගු.සේ.ස. විසින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන් කිහිපයක් පහත දැක්වේ.

Trainair Plus වැඩසටහන

TRAINAIR PLUS වැඩසටහන අනෙකුත් සාමාජිකයින් විසින් සංවර්ධනය කරන ලද පාඨමාලා බෙදා හැරීමට සාමාජික පුහුණු මධ්‍යස්ථානයකට අවසර දෙයි. CATC විසින් මෙම ප්‍රතිලාභය ප්‍රයෝජනයට ගනිමින් අවස්ථා දෙකකදී ගුවන්සේවා අධ්‍යයන සඳහා ගල්ෆ් මධ්‍යස්ථානය (GCAS) එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ අබුඩාවේ විසින් සංවර්ධනය කරන ලද STP "ගුවන්තොටුපළ කණ්ඩායම් සුපරීක්ෂාකාරී" පාඨමාලාව ගුවන් සේවා ආරක්ෂක සහ ගුවන්තොටුපළ කළමනාකරණයේ අධීක්ෂණ මට්ටමේ නිලධාරීන් 40 දෙනෙකු සඳහා පවත්වන ලදී.

ගුවන්සේවා අධ්‍යනය පිළිබඳ ඩිප්ලෝමා වැඩසටහන

2020 පෙබරවාරි 10 වැනි දින සිවිල් ගුවන්සේවා පුහුණු අංශ ශ්‍රවණාගාරයේ පැවති වර්ණවත් උත්සවයකදී "ගුවන්සේවා අධ්‍යයන ඩිප්ලෝමා" වැඩසටහන සාර්ථකව නිම කළ 7 වැනි සිසුන් කණ්ඩායමට ඩිප්ලෝමාව ප්‍රදානය කරන ලදී.

මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගි වූ ගු.ගු.සේ.ස.සභාපතිතුමන් විසින් වාණිජ අභ්‍යාසලාභීන් ලෙස ලියාපදිංචි වූ තරුණ ගුවන්නියමුවන් 8 දෙනෙකු සහ බාහිරව වැඩසටහන අනුගමනය කළ සමාගමේ සේවකයින් 10 දෙනෙකු සඳහා ඩිප්ලෝමාව ප්‍රදානය කරන ලදී. ICAO ඊළඟ පරම්පරාවේ ගුවන් සේවා වෘත්තිකයන්ගේ (NGAP) මුලපිරීම් සඳහා දායක වන රජය සතු ආයතනයක් විසින් පිරිනමන ගුවන් සේවා ක්ෂේත්‍රයේ එකම ඩිප්ලෝමා වැඩසටහන මෙයයි.



'ගුවන්සේවා අධ්‍යයන ඩිප්ලෝමාව' සාර්ථකව නිම කළ 7 වැනි සිසුන් කණ්ඩායම.

ගුවන්සේවා අධ්‍යාපන වැඩසටහන්

ගු.ගු.සේ.ස. හි විසින් 2020 අගෝස්තු 26 වන දින ජාත්‍යන්තර ගුවන්සේවා සහ ගුවන්සේවා විද්‍යාලයේ (IAAC) සිසුන් සඳහා ගුවන් සේවා අධ්‍යාපන වැඩසටහනක් සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩසටහනේ අරමුණ වූයේ ගුවන්සේවා ක්ෂේත්‍රයේ වර්තමාන තත්ත්වය, ගුවන්තොටුපළ මෙහෙයුම්, භාණ්ඩ මෙහෙයුම් සහ ගුවන් සේවා කර්මාන්තයේ වෘත්තීය සංවර්ධනය පිළිබඳ වෘත්තීය ගුවන්සේවා පාඨමාලා හඳුරන සිසුන් දැනුවත් කිරීමයි. බ.ජා.ගු. හි සිදුවෙමින් පවතින නවතම සංවර්ධන ව්‍යාපෘති දැක බලා ගැනීමට සහ කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වය තුළ බ.ජා.ගු. හි ගුවන්තොටුපළ මෙහෙයුම් පරිසරය අධ්‍යයනය කිරීමට සිසුන්ට අවස්ථාවක් ලැබුණි.

මානව සම්පත් කළමනාකරණ පද්ධතියේ අපගේ මුලපිරීම්

ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය යටතේ මානව සම්පත් කළමනාකරණ පද්ධතිය (HRMS) ක්‍රියාත්මක කිරීමේදී මානව සම්පත් අංශය විසින් තම සන්ධිස්ථාන සපුරා ඇත. ERP ප්‍රධාන ව්‍යාපෘතිය යටතේ පවතින, වියයුතු ක්‍රියාකාරී අවශ්‍යතා පිරිවිතර (FRS) හි පියවර මානව සම්පත් කණ්ඩායම විසින් සාර්ථකව නිම කර ඇත. ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මානව සම්පත් උපායමාර්ගිකව කළමනාකරණය කිරීමට විශාල වශයෙන් දායක වන මානව සම්පත් පද්ධති සහ ක්‍රියාවලීන්ගේ සම්පූර්ණ ඩිජිටල්කරණය සඳහා මෙම ප්‍රයත්නය දායක වනු ඇත. යෝජිත HRMS මගින් මානව සම්පත් සහ පරිපාලන කටයුතුවල භෞතිකව කල ලේඛන කටයුතු කරනු ඇති අතර ගු.ගු.සේ.ස හි දැක්ම සහ මෙහෙවර සාක්ෂාත් කර ගැනීම සඳහා බෙහෙවින් දායක වන මානව සම්පත් උපයෝජනයේ ඵලදායිතාව වැඩි දියුණු කිරීම සඳහා උපාය මාර්ගික දිශානතියකින් පුද්ගල කාරණා කෙරෙහි සැලකිය යුතු ලෙස අවධානය යොමු කිරීමට කාර්ය මණ්ඩලයට හැකි වේ.

අවදානම් කළමනාකරණය



ඵලදායී අවදානම් කළමනාකරණය යනු ශක්‍ය උපාය මාර්ගෝපදේශික සහ සංවර්ධන අවස්ථා ගවේෂණය කිරීමේ ප්‍රධාන සාර්ථක සාධකයකි.

ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණය අපගේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ අත්‍යවශ්‍ය අංගයකි. ලොව පුරා සිටින මගීන් අතර සෑම දිනකම ශ්‍රී ලංකාව ආඩම්බරයට පත්කිරීම අපගේ අරමුණයි. එකී වටිනාකම නිර්මාණය කරමින් සහ ආරක්ෂා කරන අතරම කාර්ය සාධනය වැඩි කරමින් අපගේ දැක්ම සාක්ෂාත් කර ගැනීමට සහාය වේ.

බ.ජා.ගු., ම.රා.ජා.ගු, ම.ජා.ගු, ර.ගු. සහ යා.ජා.ගු. යන ජාත්‍යන්තර ගුවන්තොටුපළ පහක් කළමනාකරණය සහ සංවර්ධනය කරන ශ්‍රී ලංකා රජයේ (GOSL) ව්‍යවස්ථාපිත සේවා සපයන්නා වශයෙන්; ගු.ගු.සේ.ස. සංවිධානය සිය මෙහෙයුම් හා මූල්‍ය ක්‍රියාකාරිත්වයන්ට පමණක් නොව රටේ ප්‍රතිරූපයට ද තර්ජනයක් වන අවදානම් රාශියකට උර දී සිටී.

ඉහත කරුණු මනසේ තබාගෙන, ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය සංවර්ධනය කර ඇත්තේ සංවිධානයේ ආයතනික අරමුණු සාක්ෂාත් කර ගැනීමේ හැකියාව ශක්තිමත් කිරීම සඳහා ය. ආයතනික පාලන රාමුවේ එක් ප්‍රධාන අංගයක් ලෙස ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ සඵලතාවය සඳහා මෙම ක්‍රියාවලිය එහි වැදගත්කම සනාථ කරන හෙයින් අධ්‍යක්ෂක මණ්ඩලය විසට වගකිව යුතුය. අවදානම් කළමනාකරණය පිළිබඳ සමස්ථ ප්‍රවේශයකට සහ අවදානම් වල බලපෑම අවම කිරීම වෙනුවෙන් ප්‍රතිකර්ම මෙන්ම උපායමාර්ගික, උපායශීලී සහ මෙහෙයුම් මට්ටම්වල කළමනාකරණ ක්ෂණික අනතුරු ඇඟවීම් ලබා ගැනීම සඳහා සමස්ත ක්‍රියාවලියේ සාර්ථකභාවය පිළිබඳ අඛණ්ඩ පරීක්ෂණයකට අධ්‍යක්ෂක මණ්ඩලය සහාය වේ.

මෙම ප්‍රයත්නයට සහයෝගය දැක්වීම සඳහා, ගු.ගු.සේ.ස. මණ්ඩලය අවදානම් කළමනාකරණය, ආයතනික උපායමාර්ගික කළමනාකරණ ක්‍රියාවලියේ කොටසක් බවට සහතික කිරීම සඳහා පැහැදිලි මාර්ගයක එළඹීමේ අභිප්‍රායයෙන් නිශ්චිත ක්‍රියා පටිපාටියක් සහිත ක්‍රියාකාරී නියෝජිතයින්ගෙන් සමන්විත අභ්‍යන්තර කමිටුවක් පිහිටුවීය. ව්‍යාපාර ප්‍රතිලාභ උපරිම කිරීම සඳහාත් අවදානම් කළමනාකරණය කිරීම සඳහාත් මෙම පිහිටුවන ලද කමිටුවෙන් කාලානුරූපව සහ තාවකාලිකව ඉදිරිපත් කිරීම් අධ්‍යක්ෂක මණ්ඩලයට ලබා දෙනු ඇත.

ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව 2020

අවදානම් කළමනාකරණයේ ගු.ගු.සේ.ස. හි අරමුණු පහත පරිදි වේ,

- ගු.ගු.සේ.ස. හි උපායමාර්ගික හා මෙහෙයුම් අරමුණු සාක්ෂාත් කර ගැනීමේ හැකියාව සහ ව්‍යාපාර/කර්මාන්ත විශාල වශයෙන් වැඩි දියුණු කිරීම.
- විවිධ අවදානම් හඳුනා ගැනීම සහ ඇගයීම.
- ව්‍යාපාරික පරිසරය තුළ ඇති වන අවස්ථා ප්‍රයෝජනයට ගනිමින් හානිකර තර්ජන අඩු කිරීම සහ/හෝ ඉවත් කිරීම.
- සමාගම තුළ සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීමට සහාය වීම.
- ගු.ගු.සේ.ස. තුළ අවදානම් පිළිබඳ වඩා හොඳ සන්නිවේදනයක් පවත්වා ගැනීම.
- සමාගමේ පැවැත්මට සහ දිගු කාලීන වර්ධනයට සහාය වීම මෙන්ම ගු.ගු.සේ.ස. හි නියම හිමිකරුවන් වන මහජනතාවට සාධාරණය ඉටුකිරීම.

ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ රාමුව

ඉහත අරමුණු වලට අනුකූලව ගු.ගු.සේ.ස. හි අවදානම් කළමනාකරණ රාමුව සැලසුම් කර ඇති අතර එය රූප සටහනක් මඟින් මෙහි දක්වා ඇත.

1. අවදානම් සහිත ප්‍රදේශ හඳුනාගන්න

අවදානම් හඳුනාගැනීමේ අරමුණ වන්නේ සංවිධානයේ අවිනිශ්චිතතාවයට නිරාවරණය වීම තීරණය කිරීමයි. අවදානම් හඳුනා ගැනීම සඳහා ගු.ගු.සේ.ස. හි උපායමාර්ග සහ අරමුණු පිළිබඳ මනා දැනුමක් අවශ්‍ය වේ, ගුවන් නිෂ්පාදන/සේවා, වෙළෙඳපොළ සහ බාහිර සාධකවල එනම්; සමාගම ක්‍රියාත්මක වන නීතිමය, දේශපාලන, ආර්ථික, සමාජ, තාක්ෂණික හා පාරිසරික බලපෑම පිළිබඳ අඛණ්ඩ අධ්‍යයනයක් අවශ්‍ය වේ. අවදානම් හඳුනා ගැනීම යනු අසාර්ථකත්වයන් හඳුනා ගැනීම සහ අහිතකර බව මෙන්ම ඒවායෙහි ප්‍රතිවිපාක හඳුනා ගැනීමයි. බාහිර පරිසරයේ වෙනස්වීම් හේතුවෙන් පැනනගින ධනාත්මක අපගමනයන් ප්‍රයෝජනයට ගැනීම ද එයට ඇතුළත් වන අතර එයින් අදහස් කරන්නේ බාහිර පරිසරයේ ඇති අවස්ථා හඳුනාගෙන ඒවා වැඩි ආදායමක් බවට පරිවර්තනය කර ගැනීමයි.

2. අවදානම් තක්සේරු කරන්න

අවදානම් තක්සේරුව මඟින් අරමුණු සාක්ෂාත් කරගැනීමට බලපෑම් කළ හැකි සිදුවීම් පිළිබඳව ඇගයීමක් කළමනාකරණයට ලබාදීමට අදහස් කෙරේ. අපගේ අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාවලියට අවදානම් හඳුනාගැනීම තුළින් තක්සේරුවක් සිදුකිරීමට අපේක්ෂා කරයි.

අවදානම් හඳුනා ගැනීම සඳහා ගු.ගු.සේ.ස. ප්‍රවේශ ක්‍රම දෙකක් අනුගමනය කරයි - ඉහළ සිට පහළට (කළමනාකරණය හොඳින් දනී) සහ පහළ සිට ඉහළට (ක්‍රියාකාරීන් හොඳම දේ දනී). පසුපසට වැඩ කිරීමෙන් සහ විය හැකි සෑම අවස්ථාවකම සලකා බැලීමෙන් අවදානම් සඳහා හේතු සොයා බැලීම සඳහා ගු.ගු.සේ.ස. මූල හේතු විශ්ලේෂණය අනුගමනය කරයි.

ගු.ගු.සේ.ස. අවදානම් කළමනාකරණ චක්‍රය



3. අවදානම් ප්‍රතිචාර ඇගයීම සහ තෝරාගැනීම

අවදානම හඳුනා ගැනීම සහ ව්‍යාපාරයට එහි බලපෑම මත පදනම්ව ගු.ගු.සේ.ස. තීරණ ගනී. එක් එක් විශේෂිත අවදානම ගු.ගු.සේ.ස. හි අවදානම් පැතිකඩ සමඟ සංසන්දනය කිරීමෙන් පිළිගත යුතුද නැත්නම් හැසිරවිය කළ යුතුද යන්න පිළිබඳව තීරණය කරයි. තේරීම් ප්‍රතිකාර මඟින් අවදානම් දරා ගත හැකි මට්ටමකට ගෙන ඒමට උපකාරී වේ.

4. අවදානම් කළමනාකරණ තාක්ෂණ ක්‍රියාත්මක කිරීම

- අවදානම් වාර්තා කිරීම: ගු.ගු.සේ.ස. හි අවදානම් වාර්තා කිරීම අවදානම් කළමනාකරණය සඳහා පාලන පද්ධති, භාවිතා කරන ක්‍රියාවලීන් ආමන්ත්‍රණය කරයි. අවදානම් හඳුනා ගැනීම සහ ඒවාට ප්‍රතිචාර දැක්වීම, සැලකිය යුතු අවදානම් කළමනාකරණය සඳහා භාවිතා කරන ක්‍රම සහ පද්ධති අධීක්ෂණය සහ සමාලෝචනය.
- අවදානම් හැසිරවීම: අවදානම් ප්‍රතිචාර යනු විකල්ප ක්‍රියාමාර්ග සලකා බැලීමේදී අවදානම අවම කිරීම සඳහා පියවරයන් තෝරා ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියයි. මෙම ක්‍රියාවන් තුලට ගු.ගු.සේ.ස. හි අවදානම් රුචිය මත රඳා පවතින අවදානම් වළක්වා ගැනීම, අඩු කිරීම, බෙදාගැනීම සහ පිළිගැනීම ඇතුළත් වේ.
- අවශේෂ වාර්තා කිරීම: අනෙකුත් සියලුම ප්‍රධාන අවදානම් වලට ප්‍රතිකාර කිරීමෙන් පසු ඉතිරි වන අවදානම් වාර්තා කිරීම.
- අධීක්ෂණය: අවදානම් ප්‍රතිකාරය සකස් කර ක්‍රියාත්මක කළ පසු, එය ක්‍රියාත්මක කිරීමේ සාර්ථකත්වය අවදානම් කළමනාකරණ කණ්ඩායමේ අධීක්ෂණය මත රඳා පවතී.

5. අවදානම් නැවත ඇගයීම

පිළිගත හැකි මට්ටමකට අවදානම අවම කළ පසු, තවදුරටත් අවදානම පාලනය කිරීම සඳහා අඛණ්ඩව අවදානම නිරීක්ෂණය කළ යුතුවේ. ඕනෑම අවස්ථාවක අවදානම නැවත හිස ඔසවන බවක් පෙනේ නම්, අවදානම් කළමනාකරණ චක්‍රය විශ්ලේෂණ අදියරෙන් නැවත පටන් ගත යුතුය. ගු.ගු.සේ.ස. හි අවදානම් චක්‍රය අඛණ්ඩ ක්‍රියාවලියක් ලෙස පුනරාවර්තනය වන අතර අවදානම් කළමනාකරණ චක්‍රයේ සෑම අදියරකදීම අවශ්‍යතා පැන නගින විට වෙනස් කිරීම් සිදු කෙරේ. චක්‍ර ක්‍රියාවලිය තුළ එකතු කරන ලද ඕනෑම තොරතුරක් ක්‍රියාවලිය පිරිපහදු කිරීම සඳහා යොදා ගනී.

අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක වේ

ඉහත කළමනාකරණ ක්‍රියාවලීන්හි අවදානම් ලේඛනගත කිරීමේ අරමුණ ඇතිව ගු.ගු.සේ.ස. අවදානම් ලේඛනයක් පවත්වාගෙන යයි.

අවදානම් තක්සේරුව සෑම විටම ගුවන් මෙහෙයුම් සඳහා අවදානම් කළමනාකරණ අවදානම් තක්සේරු ක්‍රියාවලියේ වඩාත්ම අභියෝගාත්මක කොටස විය. ගු.ගු.සේ.ස. පුළුල් පරාසයක අවදානම් කළමනාකරණය කරයි.

1. මූලෝපායික හා මෙහෙයුම් අවදානම
2. ආරක්ෂාව සහ සෞඛ්‍යය හා සම්බන්ධ අවදානම
3. මානව සම්පත් හා සම්බන්ධ අවදානම
4. මූල්‍ය අවදානම
5. කීර්තිනාමය සහ
6. නීතිමය අවදානම

මූලෝපායික හා මෙහෙයුම් අවදානම

ගු.ගු.සේ.ස. සෑම විටම එහි දැක්ම හා මෙහෙවර සඳහා කටයුතු කිරීමට කැපවී සිටී. මෙයට අනුකූලව, වාර්ෂිකව වසර තුනක කාලයක් සඳහා ආයතනික සැලැස්ම සකස් කෙරේ. ඒ අනුව, සියළුම මෙහෙයුම් අංශ සිය ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටින අතර, ක්‍රියාකාරී සැලසුම් අධීක්ෂණය කිරීම සහ ඇගයීම තුළින් ආයතනික අරමුණු වලින් බැහැර වීමේ අවදානම අවම කෙරේ. තවද ගු.ගු.සේ.ස, ගුවන් හා සංචාරක කර්මාන්තයේ වර්ධනයන් සමග ඇතිවන සෘණාත්මක හෝ ධනාත්මක (අවස්ථා) වෙළඳපොළ පිළිබඳ නිරන්තර අවධානයෙන් සිටියි.

ගු.ගු.සේ.ස. වසර කිහිපයක් තිස්සේ වැඩි වන මඟි ඉල්ලුමට පහසුකම් සැලසීමේ අභියෝගයට මුහුණ දී සිටී (කොවිඩ්-19 වසංගතය හේතුවෙන් 2020 දී හැර). මෙය බ.ජා.ගු. හි සේවා ගුණාත්මක භාවයට බලපාන බැවින් ගුවන්තොටුපළ ක්‍රියාකරුවෙකු ලෙස තරඟකාරීත්වයට බලපා ඇත. දිගු කාලීන අවදානම් අවම කිරීමේ පියවරක් ලෙස බ.ජා.ගු. සංවර්ධන සැලැස්මට අනුව ගුවන්තොටුපළ යටිතල පහසුකම් සංවර්ධනය සිදු කෙරෙමින් පවතින අතර, ගුවන්තොටුපළ භාවිතා කරන්නන් සඳහා ඉහළ සේවාවක් ලබා දීම සඳහා ඉක්මනින් පැමිණිය හැකි වන පරිදි ගුවන්තොටුපළේ එදිනෙදා කටයුතු හා සම්බන්ධ ගැටලු හඳුනා ගැනීම සඳහා මගීන්ගේ පැමිණිලි නිරීක්ෂණය කෙරේ.

කොවිඩ්-19 පැනනැගීමත් සමඟ, වෙනත් ඕනෑම ගුවන්තොටුපළ ක්‍රියාකරුවෙකු පරිදිම ගු.ගු.සේ.ස. මෙහෙයුම් හා උපායමාර්ගිකව සම්පූර්ණයෙන්ම වෙනස් අභියෝග මාලාවකට මුහුණ දුන්නේය.

මේ සඳහා ප්‍රවේසම් සැලසුම් මෙන්ම අවම කිරීමේ ක්‍රම අවශ්‍ය විය. ගුවන්තොටුපළ රටට ප්‍රධාන දොරටුව වන බැවින් ගු.ගු.සේ.ස. වහාම ක්‍රියාත්මකවී සාමාන්‍ය වාණිජ මෙහෙයුම් සඳහා ගුවන්තොටුපළ වසා දැමීම, ගුවන් ගමන් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාපටිපාටීන් අනුගමනය කරමින් ඉහළ අවදානම් සහිත ඇතැම් රටවල් සඳහා සංචාරක තහනම පැනවීම සම්බන්ධයෙන් රජය විසින් ගනු ලැබූ තීරණයන්ට සහාය විය. වසංගතයේ අහිතකර බලපෑමට ඔරොත්තු දීම සඳහා ගුවන්සේවා සහ සංචාරක පුනර්ජීවන උපාය මාර්ග සංවර්ධනය කිරීම සඳහා කාලය ගත කරන අතරම මහජනතාව, මගීන් සහ සියලුම ගුවන්තොටුපළ සේවකයින් අතර කොවිඩ්-19 පැතිරීම වැළැක්වීම සඳහා පුළුල් පූර්වාරක්ෂක පියවර මාලාවක් ක්‍රියාත්මක කිරීමද එයට ඇතුළත් විය. මෙමගින් ශ්‍රී ලංකාවේ ගුවන්සේවා සහ සංචාරක ව්‍යාපාරයේ කෙටි කාලීන සහ දිගු කාලීන පුනර්ජීවනය ඉලක්ක කර ඇත

ආරක්ෂාව සහ සෞඛ්‍යය හා සම්බන්ධ අවදානම

සියලුම ගුවන්තොටුපළ භාවිතා කරන්නන්ගේ ආරක්ෂාව සහ ප්‍රවේසම සහතික කිරීම සාර්ථක ගුවන්තොටුපළ ක්‍රියාකරුවෙකු වීමට පූර්ව අවශ්‍යතාවයකි. ගු.ගු.සේ.ස. සිය සෑම ගුවන්තොටුපළකම ආරක්ෂාව, ප්‍රවේසම සහ සෞඛ්‍ය සම්බන්ධ අවදානම් අවම කිරීමට උනන්දු වෙයි. ගුවන්තොටුපළ සේවාව, ගු.ගු.සේ.ස. ආයතනය විශේෂයෙන්ම බිම් හසුරුවන්නා ලෙස අනෙකුත් ආයතනයන්හි විවිධ අංශවල ඒකාබද්ධ උත්සාහයකි. එබැවින්, අවදානම අවම කිරීම සඳහා සියලුම මෙහෙයුම් මට්ටම් නිරීක්ෂණය කරනු ලැබේ.

අනෙක් අතට, දේශීය හා ජාත්‍යන්තර සිවිල් ගුවන්සේවා බලධාරීන් විසින් නිශ්චිතව දක්වා ඇති නියාමන අවශ්‍යතා දැඩි ලෙස අනුගමනය කරනු ලබන අතර ආරක්ෂාව සහ ප්‍රවේසම ආශ්‍රිත අවදානම් අවම කිරීම සඳහා එකී නියාමන පිළිපැදීම අනිවාර්ය වේ. මෙය කීර්තිනාමය පිළිබඳ අවදානම්, මෙහෙයුම් අවදානම් සහ නීතිමය අවදානම් වැනි අවදානම් අවම කිරීමට ද උපකාරී වේ. තවද, අවදානම් මාරු කිරීමේ යාන්ත්‍රණයක් ලෙස සමාගම ඇතැම් සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ අවදානම් ද සහතික කර ඇත.

සමාලෝචිත වර්ෂය තුළ, වසංගතයේ ප්‍රතිඵලයල් ලෙස පැවති අඩු මෙහෙයුම් ප්‍රමාණය හේතුවෙන් ඉහත සඳහන් අවදානම් අඩු මට්ටමක පැවතුනි. කෙසේ වෙතත්, ගුවන්තොටුපළ මෙහෙයුම් වලදී කොවිඩ්-19 ආශ්‍රිත සෞඛ්‍ය මාර්ගෝපදේශ පිළිපැදීම ඉතා වැදගත් වූ අතර එය ගු.ගු.සේ.ස. විසින් සාර්ථකව ක්‍රියාත්මක කරන ලදී. එබැවින්, සෞඛ්‍ය අවදානම් අවම කිරීම තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා ගු.ගු.සේ.ස. විශ්වාසයෙන් ACL ගුවන්තොටුපළ සෞඛ්‍ය ප්‍රතීතනය සඳහා ඉල්ලුම් කළේය.

මානව සම්පත් හා සම්බන්ධ අවදානම

නූතන ලෝකයේ තාක්ෂණික, පාරිසරික සහ සමාජ-ආර්ථික වර්ධනයන් මගින් පාර්ශවකරුවන්ගේ වර්ධනය වන ගමනාගමනය සහ සංකීර්ණ අපේක්ෂාවන් සපුරාලීම සඳහා ගුවන්තොටුපළේ මෙහෙයුම් පුළුල් කිරීම් ශ්‍රම බලකාය සඳහා පුහුණුව සඳහා ආයෝජනය කිරීමේදී සලකා බලනු ලැබේ. එබැවින්, සමාගමේ අවදානම් රුචිකත්වයට ගැලපෙන පරිදි ශ්‍රම බලකාය යල්පැනීමේ අවදානම අවම වේ. බුද්ධි ගලනය වීමේ අවදානම මානව සම්පත් සම්බන්ධයෙන් සමාගමට සැලකිය යුතු තර්ජනයක් ද වේ. දැනුම, යුතුකම් සහ වගකීම්වල සුමට සංක්‍රමණයක් අපේක්ෂා කරන බැවින්, ගු.ගු.සේ.ස. හි අනාගත නායකයින් පුහුණු කිරීම සඳහා විශේෂයෙන් නිර්මාණය කරන ලද වැඩසටහනක් හරහා මෙය අවම කර ඇත.

මූල්‍ය අවදානම

ගු.ගු.සේ.ස. හි ව්‍යාපාරික මෙහෙයුම් ණය අවදානම්, විදේශ මුදල් අවදානම්, පොලී අනුපාත අවදානම සහ ද්‍රවශීලතා අවදානම් වැනි මූල්‍ය අවදානම් මාලාවකින් සමන්විත වේ. මූල්‍ය අවදානම් වල ස්වභාවය අනුව සුදුසු අවම කිරීමේ ක්‍රම සමාගම අනුගමනය කරයි.

කීර්තිනාමය සම්බන්ධ අවදානම

ශ්‍රී ලංකාවේ ගුවන්තොටුපළ ක්‍රියාකරු ලෙස සමාජය අපව දකින්නේ කෙසේද යන්න උගෙනීමට ගු.ගු.සේ.ස. උනන්දු වෙයි. එබැවින්, අපගේ වටිනාකම් දාමයේ සියලුම හවුල්කරුවන් තෘප්තිමත් කිරීම සඳහා සමතුලිතතාවයක් ඇති කිරීම සඳහා අංශක 360 ක විශ්ලේෂණයක් සිදු කරනු ලැබේ. සිදුවිය හැකි කීර්තිනාම හානි වැළැක්වීම සඳහා අදාළ පාර්ශ්ව සමඟ ඵලදායී සන්නිවේදනයක් ගොඩනැගීමට සියලුම ප්‍රධාන සමාජ මාධ්‍ය වේදිකා සමීපව නිරීක්ෂණය කරනු ලැබේ.

නීතිමය අවදානම

විවිධ නියාමන අවශ්‍යතාවලට අනුකූල නොවීම සමාගමට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට හේතු වනු ඇත. සමහර නීතිමය අවදානම් කීර්තිමත් අවදානම, මෙහෙයුම් අවදානම, සහ මූල්‍ය අවදානම වැනි වෙනත් අවදානම් සමඟ සම්බන්ධ වේ. එබැවින්, ගු.ගු.සේ.ස. අවදානම් කළමනාකරණ පද්ධතිය දැනට පවතින නීති හෝ නවතම නියාමන අවශ්‍යතාවලට අනුකූල වීමට කළමනාකරණය දිරිමත් කරයි. සමාගමේ නීති අංශය නීතිමය අවදානම වඩා හොඳින් අවම කිරීම සඳහා මාර්ගගත නොවන අනුකූලතා පිළිබඳ ඉහළ කළමනාකාරීත්වයට උපදෙස් දෙයි.

සාමූහික පාලනය

1. සමස්ත විග්‍රහය

පසුගිය වසර 37 තුළ, ශක්තිමත් පාලන රාමුවක් සහතික කිරීමට ගු.ගු.සේ.ස. කැපවී සිටී. එය එදිනෙදා ව්‍යාපාරික කටයුතුවල ඵලදායී කළමනාකරණයක් සහ දිගුකාලීන පැවැත්මක් පවත්වා ගැනීමට උපකාරී වේ.

සාමූහික පාලනය යනු ව්‍යාපාර මෙහෙයවන සහ පාලනය කරන පද්ධතියයි. අධ්‍යක්ෂ මණ්ඩල වලට ඔවුන්ගේ අධීක්ෂණ කාර්යභාරය පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට උපකාර කිරීමේදී ඵලදායී පාලන රාමුව ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. රාමුවට ඵලදායී පාලනයකට දායක වන ගුණාංග සහ පාලන අවදානම් ආමන්ත්‍රණය කිරීමේ මෙවලම් තිබිය යුතුය. පාර්ශවකරුවන් කෙරෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ වගකීම් සමඟ කළමනාකාරිත්වයේ වගකීම් ගැලපෙන්නේ කෙසේද යන්න තක්සේරු කිරීම සඳහා හොඳ ආයතනික පාලන රාමුවක් මඟින් වඩාත් සවිමත් නිර්මාණයක් සපයයි.

සාමූහික පාලන රාමුව විභව, විවිධ අවශ්‍යතා වලින් පැන නගින නියෝජිතායතන ගැටලුව අවම කිරීමට මූලික වශයෙන් දායක වේ. ඊට අමතරව යහපාලනය සහ ආචාර ධර්ම, විනිවිදභාවය, වගවීම වැනි ඵලදායී අධ්‍යක්ෂ මණ්ඩල භාවිතයන්හි අනෙකුත් ප්‍රධාන අංගයන් ව්‍යාපාරික ආයතනයේ දිගුකාලීන සාර්ථකත්වය සහ තිරසාර බව සහතික කිරීම සඳහා සාමූහික පාලනය තුළ අන්තර්ගත වේ. සමස්තයක් වශයෙන්, සමාගමක අඛණ්ඩතාව සහ කාර්යක්ෂමතාවය තහවුරු කිරීමේ ප්‍රධාන සාධකයක් වන්නේ යහපත් සාමූහික පාලනයයි.

කොටස් හිමියන්ගේ වටිනාකම සහ තිරසාර වර්ධනය ආරක්ෂා කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා වෙනත් ඵලදායී පාලන පද්ධති සහ කර්මාන්තයේ හොඳම භාවිතයන් අනුගමනය කිරීමට සහ භාවිතා කිරීමට ගු.ගු.සේ.ස. කැපවී සිටී. යහපත් සාමූහික පාලනය අඛණ්ඩ ව්‍යායාමයක් වන අතර සාමූහික පාලන රාමුව යටතේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සමස්ත අවශ්‍යතා සඳහා ආයතනික පාලනයේ ඉහළම ප්‍රමිතීන් අනුගමනය කිරීමට ඇති කැපවීම ගු.ගු.සේ.ස. හඳුනා ගන්නා අතර නැවත නැවත අවධාරණය කරයි ගු.ගු.සේ.ස. හි සාමූහික පාලන රාමුව තිරසාර ව්‍යාපාර ආකෘතියක් නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම සහ නඩත්තු කිරීම සඳහා අත්‍යවශ්‍ය වන වගවීම, වගකීම, සහභාගීත්වය සහ විනිවිදභාවය යන සාධාරණත්වයේ මූලික මූලධර්ම මත ගොඩනගා ඇත.



රූපය 1: ගු.ගු.සේ.ස. හි සාමූහික පාලන රාමුව

සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම සහ සදාචාරාත්මක ප්‍රමිතීන් පවත්වා ගැනීම තුළින් ඉලක්ක තිරසාර ලෙස සැපයීම, මෙහෙයුම් කාර්ය සාධනය සහ මූල්‍ය කාර්ය සාධනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය කොටස් හිමියන්ට සහ අනෙකුත් පාර්ශවකරුවන්ට වගකිව යුතුය. ගු.ගු.සේ.ස. විසින් 2007 අංක 7 දරන සමාගම් පනතේ සියලුම අනිවාර්ය විධිවිධාන, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ 2017 ආයතනික පාලනය පිළිබඳ හොඳම පරිචයන් සංග්‍රහය සහ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ අනුගමනය කරමින් යහපාලනය සඳහා මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වාණිජ රාජ්‍ය ව්‍යවසාය 'A' වර්ගීකරණය යටතේ මෙම වාර්තාව සවිස්තරාත්මකව පෙන්නුම් කරයි.

ගුවන් තොටුපල සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම
වාර්ෂික වාර්තාව 2020

1.1. ගු.ගු.සේ.ස හි පාලන ව්‍යුහය



* ගු.ගු.සේ.ස. හි, 2003 වසරේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද යහපාලන මාර්ගෝපදේශයන්ට අනුකූලව සභාපතිවරයා විසින් සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා යන ද්විත්ව භූමිකාවන් ඉටු කරයි.

2. අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන වගකීම්වලට ඇතුළත් වන්නේ:

- සමාගමේ දිගුකාලීන සාර්ථකත්වය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගත් තිරසාර, ඉහළ මට්ටමේ, මධ්‍යම සහ දිගු කාලීන උපායමාර්ග සැකසීමේදී සමාගමට මෙහෙයවීම සහ මඟ පෙන්වීම ලබා දීම.
- ව්‍යවසාය අවදානම් කළමනාකරණ රාමුවේ විෂය පථය තුළ මෙහෙයුම් සිදු කරන බව සහතික කිරීම.
- පාලන සහ අනුකූලතා පද්ධතින් අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය සිය වගකීම් ඉටු කිරීමේදී, විවෘතභාවය, ඵලදායී සංවාදය සහ නිර්මාණාත්මක විසම්මුතිය සංස්කෘතියක් ප්‍රවර්ධනය කරන අතර, සේවක සවිබල ගැන්වීමට සහ නියැලීමට පහසුකම් සපයන පරිසරයක් සහතික කරන අතර සියලු පාර්ශවකරුවන්ට වටිනාකමක් නිර්මාණය කරයි. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ සමාගමේ අනෙකුත් සේවකයන් දක්වා පහළට වැටෙන වෘත්තීය ප්‍රමිතීන් සහ ආයතනික වටිනාකම් ප්‍රවර්ධනය කිරීම මගින් අධ්‍යක්ෂ මණ්ඩලය දිරිමත් කර ඔවුන්ගේ හඬ ශක්තිමත් කරයි.

3. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සහ පැමිණීම

අධ්‍යක්ෂවරුන්ට සහ කළමනාකාරිත්වයට රැස්වීම්වලදී සාකච්ඡා කිරීම සඳහා අවශ්‍ය සියලුම ප්‍රධාන සහ උපායමාර්ගික තොරතුරු සකස් කිරීමට හැකිවන පරිදි ප්‍රමාණවත් දැනුම්දීමක් ලබා දීමෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සැලසුම් කර ඇත. අධ්‍යක්ෂවරුන්ට සෑම රැස්වීමකටම අවම වශයෙන් දින හතකට පෙර න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සපයනු ලබන අතර ඔවුන්ට අන්තර්ගතය අධ්‍යයනය කිරීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙනු ලැබේ.

යෝග්‍ය තීරණයකට එළැඹීම සඳහා සියලු අංශ නිසි ලෙස සාකච්ඡා කර ආමන්ත්‍රණය කර ඇති බව සහතික කිරීම සඳහා එක් එක් න්‍යාය පත්‍ර අයිතම සඳහා පූර්ව කාලය වෙන් කර ගනිමින් රැස්වීම් පැවැත්වීමේදී වෘත්තීය සහ ක්‍රමානුකූල ප්‍රවේශයක් භාවිතා කරනු ලැබේ. අමතර තොරතුරු

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ නම්	තනතුර	පැමිණීම
මේජර් ජෙනරාල් (විශ්‍රාමික) ජී ඒ චන්ද්‍රසිරි RWP USP VSV ndc psc	සභාපති	14/14
ආර් සූරියආරච්චි	උප සභාපති	13/14
ඒ එස් සී වරුෂහෙන්නැදිගේ	අධ්‍යක්ෂ	14/14
එස් එන් සුමනසේකර	අධ්‍යක්ෂ	14/14
ඉංජිනේරු එස් එම් ඒ යූ එස් මංචනායක	අධ්‍යක්ෂ	14/14
ඩී ඒ ද ලිවේරා	අධ්‍යක්ෂ	14/14
සී පී විතාරන	අධ්‍යක්ෂ	13/14
ආර් ඒ පී විජේරත්නසේකර	අධ්‍යක්ෂ	10/14
ඩී ඒ පී වීරත්න PC	අධ්‍යක්ෂ	10/14
ඒ ඒච් එස් ගුණවර්ධන	ගුවන්සේවා හා අපනයන කලාප සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂක	12/14
ඉල්ලා අස් වුණ		
පී ටී වීරසිංහ	අධ්‍යක්ෂ	08/14
ආර් එම් ඒ රත්නායක	අධ්‍යක්ෂ/ භාණ්ඩාගාර නියෝජිත	12/14
එස් ඩී කරුණාරත්න	අධ්‍යක්ෂ	02/14

ඉදිරිපත් කිරීමට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දීමට අවශ්‍ය වූ විට අංශ ප්‍රධානීන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට ආරාධනා කර කැඳවයි.

වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 14ක් කැඳවා ඇති අතර අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ පැමිණීම ඉහත පරිදි වේ.

4. අපගේ ප්‍රවේශය සහ කැපවීම

ගු.ගු.සේ.ස යනු සම්පූර්ණයෙන්ම රජය සතු සමාගමක් වන අතර එහි අධ්‍යක්ෂ මණ්ඩලය උපායමාර්ගික මඟ පෙන්වීම සඳහා රජයට වගකිව යුතුය.

යහපාලනය හරහා සමාගමේ අධීක්ෂණය සහ අපගේ පාර්ශවකරුවන් සඳහා උපරිම වටිනාකමක් ලබා දීමේ අපගේ මූලික පරමාර්ථය සපුරාලීමේ ක්‍රියාවලියේදී ඵලදායී වගවීම සහ විනිවිදභාවය යන රාමුවක් තුළ සුදුසු ව්‍යාපාරික තීරණ ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශය විසින් නිර්දේශිත ආයතනික පාලන නියාමන රාමුව මගින් සමාගම මෙහෙයවනු ලැබේ. මෙම පාලන රාමුව මූලික මූලධර්ම පහකින් සමන්විත වේ.

අ) නායකත්වය සහ මඟ පෙන්වීම

ආ) විනිවිදභාවය සහ අඛණ්ඩතාව



රූපය 2: අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරයන් සහ වගකීම්

සේවා නියුක්තිය හෝ ව්‍යාපාරය පමණක් නොව කළමණාකාරිත්වය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ථ ආකල්පයම වේ. ස්වාධීන විනිශ්චයන් සැපයීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණ කාර්යභාරය වේ.

සියළුම අධ්‍යක්ෂවරුන්හට සමාගමේ අභ්‍යන්තර හා බාහිර තොරතුරු වලට ස්වාධීනව සහ ඒකාබද්ධව ප්‍රවේශ විය හැක. අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රියාපටිපාටීන් අනුගමනය කළේද යන්න සහ නීතිමය අවශ්‍යතා මත වූ මාර්ගෝපදේශ සපයන බවට සමාගම් ලේකම්වරයා සහතික කරයි.

මීට අතිරේකව, සමාගම් ලේකම් විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුවත් තීරණ ගැනීමට හැකි වන පරිදි ප්‍රමාණවත් තොරතුරු සහිත වෙනත් අදාළ ලියකියවිලි සමඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ දැනුම්දීම්, රැස්වීම් වාර්තා සහ මාණ්ඩලික පත්‍රිකා බෙදා හරිනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ පිළිබඳ පසු විපරම් ද ලේකම් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඇ) එහි ප්‍රධාන කොටස් හිමියා ලෙස රජයට වගවීම

ඈ) පාර්ශ්වකරුවන්ගේ නීත්‍යානුකූල අවශ්‍යතා හඳුනා ගැනීම

ඉ) කාලීන හා තුලනාත්මක හෙළිදරව් කිරීමේ මූලධර්ම

5. නායකත්වය සහ මඟ පෙන්වීම

සංගමයේ ලිපිවලට අනුකූලව සංචාරක අමාත්‍යවරයා විසින් පත් කරන ලද ව්‍යාපාර කළමනාකරණය සහ මූල්‍ය පාලනය යන ක්ෂේත්‍රවල පළපුරුද්ද සහ දැනුම සහිත සාමාජිකයින්ගෙන් සමන්විත අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ සමාගමේ ව්‍යාපාර සහ මෙහෙයුම් කළමනාකරණය කෙරේ.

සංවිධානයේ සාමූහික පාලන ප්‍රතිපත්ති මෙහෙය වීමේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීමේ වගකීම දරන සභාපතිවරයා අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අතර, යහපාලනය ඇති කිරීම සහ ඵලදායී බව සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක සහ විධායක නොවන සාමාජිකයන් අතර ඵලදායී වැඩ සබඳතා පවත්වාගෙන යාමද සභාපතිවරයා සහතික කරයි. අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්වරයාගේ සහාය ඇතිව සභාපතිවරයා සහතික කරයි:

ඇ) අධ්‍යක්ෂ මණ්ඩල ක්‍රියා පටිපාටි අනුගමනය කරනු ලබන බව

ඈ) තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලයට නියමිත වේලාවට බෙදා හරිනු ලබන බව

අධ්‍යක්ෂ මණ්ඩලය රජය සහ එහි පාර්ශවකරුවන් වෙනුවෙන් සමාගමේ භාරකාරත්වයේ ව්‍යවස්ථාපිත වගකීමක් ඉටු කරයි. ඔවුන්ගේ ප්‍රධාන කාර්යයන් වන්නේ:

අ) සමාගම එහි දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයවීම.

ආ) සමස්තයක් ලෙස සමාගමේ කළමනාකරණය, මෙහෙයුම් සහ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම.

අධ්‍යක්ෂ මණ්ඩලය, අධ්‍යක්ෂවරුන් 10 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඉන් 8 දෙනෙක් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ද දෙදෙනෙකු විධායක අධ්‍යක්ෂවරුන්ද වේ. අධ්‍යක්ෂමණ්ඩලයේ බහුතරයක් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන අතර ඔවුන් සංග්‍රහයේ අවශ්‍යතා අනුව ඉහල කීර්තියක් ඇති අය වේ. මෙමගින් අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය කළමණාකාරිත්වයේ ස්වාධීනත්වය පිළිබිඹු කරයි. මෙය අධ්‍යක්ෂවරුන්ගේ පෞද්ගලික සම්බන්ධතාවන්, තැනැත්තෙක්,

6. අධ්‍යක්ෂ මණ්ඩලයේ නායකත්වය සඳහා වෙන් කර ඇති කරුණු

සමාගම විසින් හොඳින් ව්‍යුහගත සාමූහික පාලන රාමුවක් ක්‍රියාත්මක කර ඇති අතර එය සියලුම ව්‍යාපාරික ඒකක හරහා සම්මත කර ඇති අතර තිරසාර කොටස් හිමියන්ගේ වටිනාකම පවත්වා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

අ) 2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ විධිවිධානවල විෂය පථය තුළ ගොඩනගා ඇති එහි නිශ්චිත මෙහෙවර මත පදනම්ව සමාගම සඳහා දැක්ම සහ මඟ පෙන්වීම ලබා දීම සහ එය රජයේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සඳහා වඩාත් හොඳින් සේවය කළ හැකි ආකාරය.

ආ) 2007 අංක 7 දරන සමාගම් පනතේ සහ සංගමයේ වගන්තිවල විධිවිධානවලට අනුකූලව නීතිමය අවශ්‍යතා සපුරාලීම සහ සමාගම ක්‍රියාත්මක වන බව සහතික කිරීම.

ඇ) රජයට සහ අනෙකුත් ප්‍රධාන පාර්ශවකරුවන්ට ප්‍රශස්ත ප්‍රතිලාභ

ලබා ගැනීම සඳහා අවදානම් කළමනාකරණය ඇතුළු විවිධ ප්‍රතිපත්ති සැකසීම.

ඈ) රාජ්‍ය ප්‍රතිපත්ති අරමුණු වරින් වර සමාලෝචනය කිරීම සහ අනාගත වර්ධනය සඳහා දිගු කාලීන ඉලක්ක සහ අරමුණු සැකසීම සඳහා උපාය මාර්ගික මඟ පෙන්වීම් සැපයීම.

ඉ) වගකීම් බෙදාහැරීම මඟින් ප්‍රමාණවත් වගවීමක් සහතික කිරීම.

7. මෙම ධාරිතාවයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා වෙන් කර ඇති කරුණු

අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන අරමුණු කෙටියෙන් කිවහොත්, සෘජුවම ඔවුන්ගේ විෂය පථයට අයත් වන්නේ:

ඇ) ව්‍යාපාරයේ සමස්ත දිශානතිය තක්සේරු කිරීම සහ උපායමාර්ග ක්‍රියාත්මක කිරීම.

ආ) පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා විශ්වාසනීය රාජකාරිය.

ඇ) සමාගම සිය මෙහෙයුම්වල දී නිසි මාර්ගයේ ගමන් කරන බව සහතික කිරීම සඳහා කළමනාකරණ තොරතුරු වාර්තා මඟින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ කාර්ය සාධනය අධීක්ෂණය කිරීම සහ ඇගයීම.

ඈ) පාලන භාවිතයන්හි සවිලතාවය සහතික කිරීම.

ඉ) අනෙකුත් අංශ අතර අභ්‍යන්තර පාලන ඇතුළුව අවදානම් තක්සේරුව සහ කළමනාකරණය සඳහා ආකෘතියක් ක්‍රියාත්මක කිරීම,

ඊ) අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රතිපත්ති ආකෘතිගත ඇති ආකාරයටම ආයතනයේ සහ මහජනතාවගේ යහපත උදෙසා ක්‍රියාත්මක වන බවට සහතික වීම.

උ) ප්‍රතිඵල අභිමත අපේක්ෂාවන්ට අනුකූල නොවන්නේ නම්, ඉලක්ක සපුරා ගැනීම සහතික කිරීම සඳහා ප්‍රමාදයකින් තොරව ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගන්න.

ඌ) කළමනාකරුවන් ලෙස දක්ෂ පුද්ගලයින් පත් කිරීම සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය අතර ප්‍රමාණවත් බලය පැවරීමක් ඇති බව සහතික කිරීම.

එ) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE) රැස්වීම් සහ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට සහභාගි වීම හෝ අවශ්‍ය වූ විට ඒ සඳහා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත අධිකාරිය පැවරීම.

8. සාමූහික පාලන අංශයන්හි විගණන සහ කළමනාකරණ කමිටුවේ (AUMC) භූමිකාව

8.1. විගණන කළමනාකරණ කමිටුව

විගණන කළමනාකරණ කමිටුව පිහිටුවා ඇත්තේ PED/12 ජේදය 7:4:1 ප්‍රකාරව ගු.ගු.සේ.ස. හි කටයුතු අධීක්ෂණය කිරීමේදී සහ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල සහ ගු.ගු.සේ.ස. හි ක්‍රියා පටිපාටිවල අඛණ්ඩතාව සහතික කිරීම සඳහා පාලක සභාවට සහාය වීම සඳහාය.

විගණන කළමනාකරණ කමිටුවෙහි මූලික කාර්යභාරය වන්නේ සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව, සමාගමේ අභ්‍යන්තර පාලන සහ අවදානම් කළමනාකරණ පද්ධති සහ නීතිමය සහ නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම සම්බන්ධයෙන් එහි අධීක්ෂණ වගකීම් ඉටු කිරීමේදී මණ්ඩලයට සහාය වීමයි. බාහිර විගණකවරුන්ගේ කාර්ය සාධනය, සුදුසුකම් සහ ස්වාධීනත්වය සහ සමාගම විසින් සිදු කරනු ලබන අභ්‍යන්තර විගණන කාර්යයේ ප්‍රමාණවත් බව සහ කාර්ය සාධනය ද විගණන කළමනාකරණ කමිටුවෙහි විෂයපථයට අයත් ය.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සමාලෝචනය කර අනුමත කර ඇති කමිටුවේ යොමුකිරීමේ අනුදේශයන්හි කාර්යයන් සහ වගකීම්වල විෂය පථය ප්‍රමාණවත් ලෙස දක්වා ඇත. ගිණුම්කරණ සහ මූල්‍ය ක්‍රියාකාරකම්, පරිපාලන රෙගුලාසි (AR), මූල්‍ය රෙගුලාසි (FR) සහ ගු.ගු.සේ.ස. රෙගුලාසි ආවරණය වන පරිදි රජයේ රෙගුලාසිවලට අනුකූල වීම සහ අනුකූල වීම සහතික කිරීම සඳහා විගණන කළමනාකරණ කමිටුව මඟින් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කර ඇත.

විගණනය කරන ලද මූල්‍ය තොරතුරුවල අඛණ්ඩතාවයට දායක වීම සඳහා බාහිර හා අභ්‍යන්තර විගණන කාර්යයන් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඒ අනුව, ඒවා අවම වශයෙන් කාර්තුවකට වරක්වත් විගණන කමිටුව විසින් අධීක්ෂණය කර ඵලදායී ලෙස ඇගයීමට ලක්කිරීම වැදගත් වේ ගු.ගු.සේ.ස. හි රේඛීය අමාත්‍යාංශය වන සංචාරක අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයට ගු.ගු.සේ.ස. හි විගණන කාර්යයන් ඵලදායී සහ ඵලදායී ලෙස ඇගයීමට ලක් කර ඇති බවට සහතිකයක් අවශ්‍ය වේ. ඇගයීම්වල විෂය පථය ඇතුළුව අදාළ සියලු කරුණු ඇතුළත් විය යුතුය:

- ඇගයීම් කාලය තුළ සිදු කරන ලද කාර්යයේ ගුණාත්මකභාවය.
- විගණන නිලධාරීන්ගේ හැකියාව සහ පළපුරුද්ද.
- රජයේ සහ අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් එහි වාර්තාකරණයේ රේඛාවේ යෝග්‍යතාවය.

විගණන හා කළමනාකරණ කමිටුව විසින් දැනට පවතින පද්ධති සහ ක්‍රියා පටිපාටි නිරන්තරව සමාලෝචනය කර ඇති අතර යම් අපගමනය නිරීක්ෂණය කිරීමේදී පවතින පද්ධති වැඩිදියුණු කිරීමට යෝජනා වරින් වර එහි අනුමැතිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. විගණකාධිපති සහ අභ්‍යන්තර විගණකවරුන් විසින් මතු කරන ලද විමසීම් සහ අදාළ අවදානම් ඉවත් කිරීම සඳහා ගනු ලබන නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ප්‍රමාණවත් සහ ඵලදායී බව සහතික කිරීම සඳහා අදාළ අංශ විසින් ලබා දී ඇති පිළිතුරු ද කමිටුව විසින් සමාලෝචනය කර ඇත.

8.2. විනිවිදභාවය සහ අඛණ්ඩතාව

ව්‍යාපාරයක හෝ පාලන සන්දර්භය තුළ විනිවිදභාවය යනු අවංකභාවය සහ විවෘත භාවයයි. විනිවිදභාවය සහ වගවීම සාමාන්‍යයෙන් සාමූහික පාලනයේ ප්‍රධාන කුළුණු දෙක ලෙස සැලකේ. අඛණ්ඩතාව යනු වෙන කිසිවෙකු ළඟ නොමැති වුවත් නිවැරදි දේ කිරීමයි. එය සදාචාරාත්මක සාධර්ම මත පදනම්ව පුද්ගලයෙකු කරන ඕනෑම දෙයක් අවංකව හා ස්ථාවරව කටයුතු කිරීමට ඇති හැකියාවයි.

වැඩිදියුණු කළ පාලනයක්, වගවීමක් සහ විනිවිදභාවයක් ඉල්ලා සිටින සමාගමේ මූල්‍ය වාර්තාකරණයේ අඛණ්ඩතාව හඳුනාගෙන ආරක්ෂා කිරීමේ අරමුණින් විගණන සහ කළමනාකරණ කමිටුව සංවිධානාත්මක සංස්කෘතිය සහ භාවිතයන් නිරන්තරයෙන් අධීක්ෂණය කර සමාලෝචනය කර ඇත. භාණ්ඩාගාරයේ රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මත පදනම්ව සමස්ත ප්‍රසම්පාදන ක්‍රියාවලිය සමාගමේ වැදගත් ක්‍රියාකාරකම්වලින් එකක් වන අතර භාණ්ඩ හා සේවා

අත්පත් කර ගැනීමේදී පූර්ණ විනිවිදභාවයෙන් යුත් ක්‍රියා පටිපාටි සපයයි.

8.3. අභ්‍යන්තර විගණනය

AUMC හට ගු.ගු.සේ.ස. අභ්‍යන්තර විගණන සහ තත්ත්ව සහතික (IA & QA) අංශයේ සහාය ලැබේ. IA & QA හි ප්‍රධානි AUMC හි කැඳවුම්කරු ලෙස ක්‍රියා කර සභාපතිවරයාට වාර්තා කරයි. IA & QA අංශයේ ප්‍රධාන අවධානය යොමු වන්නේ ගුවන් තොටුපළ සේවාවන්හි ඇතැම් ක්ෂේත්‍ර සඳහා ගුණාත්මක ප්‍රමිතීන් සතුටුදායක ලෙස සපුරා ඇති බවට සහතික වන අතරම අභ්‍යන්තර පාලනවල ප්‍රමාණවත් බව, අඛණ්ඩතාව සහ සඵලතාවය ඇගයීම මගින් සමස්ත පවතින අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ ස්වාධීන සමාලෝචනයක් පැවැත්වීම සහ අභ්‍යන්තර පාලනයන් ශක්තිමත් කිරීම සඳහා කළමනාකාරිත්වයට සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීමයි. අභ්‍යන්තර විගණනය විසින් අභ්‍යන්තර පාලනයන්හි ප්‍රමාණවත්භාවය සහ සඵලතාවය සහ සමාගමේ නීති සහ රෙගුලාසි සහ ස්ථාපිත ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූල වීම පිළිබඳව සභාපතිවරයා වෙත නිරන්තරයෙන් වාර්තා කරන ලදී. අභ්‍යන්තර විගණනයට ඇතුළත් වන්නේ:

අ) පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය පිළිබඳ සමාලෝචනය.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලබන ප්‍රධාන තීරණ ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට සහතික වීම.

ඇ) ගු.ගු.සේ.ස. හි එක් එක් අංශයේ විෂය පථයට ගැනෙන කළමනාකරණ තීරණ සහ ක්‍රියාකාරකම් පිළිබඳ අවදානම් තක්සේරුව ඇගයීම් සහ නිර්දේශයන් කිරීම, AUMC වෙත සහ ගු.ගු.සේ.ස. හි සභාපති වෙත. ඉදිරිපත් කිරීම.

ඈ) පද්ධති සහ පාලන සම්බන්ධයෙන් බාහිර විගණකවරුන් විසින් අවදානම් තක්සේරු කිරීම් පිළිබඳව නිරීක්ෂණ කිරීම.

ඉ) ආදායම් සහ වියදම් සම්බන්ධයෙන් තත්කාර්ය සහ කාලානුරූපී මූල්‍ය සමාලෝචන සහ එහි පිළිගැනීම මෙන්ම වාර්තා කිරීම.

ඊ) තෝරාගත් ගුවන්තොටුපළ පහසුකම් සහ ගුවන්තොටුපළ සේවා සම්බන්ධයෙන් තත්ත්ව විගණන සිදු කිරීම.

උ) ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයට අදාළ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීම.

9. ගු.ගු.සේ.ස. හි ප්‍රධාන කොටස් හිමියා ලෙස රජයට වගවීම

පූර්ණ වශයෙන්ම රජය සතු ව්‍යාපාරයක් ලෙස, රජයට වගවීම රේඛීය අමාත්‍යාංශය හරහා පහත සඳහන් යාන්ත්‍රණය භාවිතා කරමින් ගු.ගු.සේ.ස. විසින් ක්‍රියාත්මක කරනු ලැබේ.

9.1 පාර්ලිමේන්තුව

2002 මැයි 24 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ PE/PF 21 ප්‍රකාර මුදල් වර්ෂය අවසානයේ සිට දින 150ක් ඇතුළත සමාගමේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය.

9.2 පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE)

සමාගමේ කාර්ය සාධනය සමාලෝචනය කිරීමට සහ සමාගම කාර්ය සාධන ඉලක්ක සපුරා ගන්නා සහ සමාජ වගකීම් ඉටු කරන ප්‍රමාණය තක්සේරු කිරීමට පොදු ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට (COPE) බලය ඇත. කෝප් කමිටුව විසින්, කැඳවූ විට සභාපති, අධ්‍යක්ෂවරුන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් එක්ව සංචාරක අමාත්‍යාංශයේ ලේකම්, ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා, සමාගමේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් කිසියම් විමසීමක් සහ සැලකිලිමත් වන කරුණු සඳහා ප්‍රතිචාර දැක්වීමට සඳහාසමාලෝචන සඳහා පැමිණ සිටිය යුතුය.

9.3 පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාව

2015 දෙසැම්බර් 19 දින පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද යෝජනාවට අනුව ගු.ගු.සේ.ස. ප්‍රවාහන හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව යටතට පත් වේ. කමිටුවේ ප්‍රධාන අරමුණ වන්නේ සමස්ත ව්‍යාපෘති ප්‍රගතිය, කාර්ය සාධනය සහ වෙනත් විශේෂ කරුණු ඇගයීම සහ අධීක්ෂණය කිරීමයි. සමස්ත ක්‍රියාවලිය තුළම වාස්තවිකත්වය පවත්වා ගැනීම සඳහා විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ ප්‍රධානත්වයෙන් ආංශික අධීක්ෂණ කාරක සභාව පත් කර ඇත.

9.4 මුදල් ඇමති/ මහාභාණ්ඩාගාරය

රාජ්‍ය ව්‍යවසාය ඇතුළුව රාජ්‍ය අංශයේ මූල්‍ය විනය සම්බන්ධයෙන් මුදල් ඇමති හෝ ඔහු වෙනුවෙන් භාණ්ඩාගාරය වගකිව යුතුවේ. කාර්ය සාධනය අධීක්ෂණය කිරීමත්, ප්‍රඥප්ති, රීති සහ රෙගුලාසි ආදියට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සහ අමාත්‍යවරයාට අදාළ ඕනෑම කරුණක් පිළිබඳව වාර්තා කිරීම සඳහා භාණ්ඩාගාර නියෝජිතයකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරනු ලැබේ. සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර නියෝජිත ආර් එම් ඒ රත්නායක විසින් මෙම කාර්යය ඉටු කරන ලදී.

රාජ්‍ය ව්‍යවසායන්හි මූල්‍ය කළමනාකරණය සහ පාලනය අධීක්ෂණය කිරීමේ වගකීම පවතින්නේ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව (DPE), මතය.

9.5 සංචාරක අමාත්‍යාංශය

සංචාරක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ප්‍රධාන ගිණුම්කරණ නිලධාරියා සමාගමේ මූල්‍ය පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් රජයට වගකියන අතර මෙම වපසරිය යටතේ මෙම වසර තුළ අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ පහත සඳහන් කරුණු නිතිපතා සමාලෝචනයට භාජනය කරන ලදී.

අ) ආයතනික සැලැස්ම සහ අයවැය

ආ) වත්මන් වර්ෂය තුළ සිදු කරන ලද ප්‍රාග්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්ය කාර්ය සාධනය

ඇ) සමස්තයක් ලෙස වසරේ කළමනාකරණ ලිපිය සහ මූල්‍ය කාර්ය සාධනය ඇතුළුව විගණන හාරදීම්

ඈ) කෝප් කමිටුවේ හෝ වෙනත් ඕනෑම ව්‍යවස්ථාපිත/නියාමන ආයතනයක රැස්වීම් වලින් පැන නගින කරුණු

10. පාර්ශවකරුවන්ගේ නීත්‍යානුකූල අවශ්‍යතා හඳුනා ගැනීම

ආයතනයක් පාර්ශ්වකරුවන්ට හොඳින් සලකන විට, වර්ධනයේ අපේක්ෂාවන් සපුරාලන විට සහ ප්‍රජා වගකීම් සහ නීතිමය අනුකූලතාවය සම්බන්ධයෙන් කීර්තියක් ඇති විට පාර්ශ්වකරුවන්ගේ වටිනාකම වැඩි දියුණු වේ. සමාගමේ මූලික පරමාර්ථය ලෙස සමාගමේ පාර්ශවකරුවන්ගේ (කොටස් හිමියන්, ගනුදෙනුකරුවන්, සේවකයන් සහ ප්‍රජාව ඇතුළුව) අවශ්‍යතා උපරිම කිරීම කෙරෙහි අවධානය යොමු කිරීම කළමනාකරණ විධි ක්‍රමයක් ලෙස හඳුන්වනු ලැබේ. මෙම ප්‍රවේශයේ පරමාර්ථය වන්නේ සංවිධානයේ නිෂ්පාදනයන්හි ගුණාත්මකභාවය ඉහළ නංවන අතරම පිරිවැය පාලනය වැඩි දියුණු කරන අතරම කුසලතා වැඩි දියුණු කරන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම මගින් පාර්ශවකරුවන්ගේ වටිනාකම උපරිම කිරීම සහ සමාගමේ සේවකයින්ගේ චිත්ත ධෛර්යය සහ සංවිධානය සම්පත් සහ පෝෂණය රැස් කරන ප්‍රජාවේ දියුණුව සුරක්ෂිත කිරීමයි. ඒ අනුව, ගු.ගු.සේ සමාගම සියලු කටයුතු රජය සහ අනෙකුත් අනුබද්ධ ආයතන ඇතුළු පාර්ශවකරුවන්, ගු.ගු.සේ.ස. හි කටයුතු, සේවකයින්, ගුවන්තොටුපළ භාවිතා කරන්නන් (ගුවන් සේවා, මගීන් සහ ගුවන්තොටුපළ තුළ තම ව්‍යාපාර පවත්වාගෙන යන ව්‍යාපාරික ප්‍රජාව) සපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සහ සමස්තයක් වශයෙන් ප්‍රජාව කෙරෙහි සියලුම නෛතික පාර්ශවකරුවන් වෙත ඇති නිත්‍යානුකූල සහ අනෙකුත් බැඳීම් හඳුනා ගනියි. මෙම බැඳීම් දිගුකාලීන පාර්ශවකරුවන්ගේ වටිනාකම ප්‍රශස්ත කිරීම සඳහා වන අතිමහත් රාජකාරියේ කොටසක් ලෙස සලකනු ලැබේ.

පහත සඳහන් ක්ෂේත්‍රවලින් සමන්විත සුදුසු ආයතනික භාවිතයන් සඳහා එහි කැපවීම පෙන්නුම් කරයි:

අ) නියාමන ආකෘතිය උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරිත්වය විසින් නිසි උද්‍යෝගය.

ආ) ගුවන්තොටුපළ මෙහෙයුම් පිළිබඳ ව්‍යවස්ථාපිත සේවා සපයන්නා ලෙස ක්‍රියා කරමින් රජයේ වගකීම් ඉටු කිරීම.

ඇ) ණයහිමියන් සහ මූල්‍ය ආයතන වෙත ඇති වගකීම් නිසි කලට සපුරාලීම.

ඈ) සාධාරණ වෙළඳාමට අදාළ වගකීම් අඛණ්ඩව සපුරාලීම සහ සැපයුම්කරුවන් සහ අනෙකුත් සේවා සපයන්නන් සමඟ ගනුදෙනු කිරීමේදී සාධාරණ පදනමක් සහතික කිරීම.

ඉ) ප්‍රජාවට බලපාන සදාචාරාත්මක ආචාර ධර්ම ව්‍යාපාරික පරිචයන් සහතික කිරීම.

ඊ) නීතියෙන් නියම කර ඇති පරිදි සියලුම මෙහෙයුම් සහ ක්‍රියාකාරකම් සිදු කිරීම සහ සුදුසු පරිදි උසස්ම පරිචයන් අනුගමනය කිරීම.

උ) සියලුම ගුවන්තොටුපළ භාවිතා කරන්නන්ට නොවෙනස්ව සැලකීම.

ඌ) සේවකයින්ට සාධාරණව, ගෞරවාන්විතව සහ සමානත්වයෙන් සැලකීම.

11. කාලෝචිත සහ සමබර අනාවරණය කිරීම්

විචක්ෂණ තීරණ ගැනීම සඳහා ගැඹුරෙන් යුතුව සහ පුළුල් ලෙස කාලෝචිතව, නිවැරදි තොරතුරු සැපයීම අභ්‍යන්තරව මෙන්ම බාහිරව ද අපගේ තොරතුරු අනාවරණය කිරීමේ මූලික හරය වේ. සමාගමේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නියම කර ඇති චක්‍රලේඛ සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs/LKASs)

ඇතුළුව සියලුම නීති සහ රෙගුලාසිවල අනාවරණය කිරීමේ අවශ්‍යතාවලට අනුකූල වීම සහතික කරයි.

ව්‍යාපාර, අවදානම් ආකෘතිය, මූල්‍ය තත්ත්වය සහ මෙහෙයුම් කාර්ය සාධනය සහ ආයතනයේ ප්‍රවණතා අවබෝධ කර ගැනීමට කොටස් හිමියන්ට උපකාර කිරීමේ අරමුණින් ගු.ගු.සේ.ස. පාර්ශවකරුවන් සමඟ ඵලදායී හා අවංක සන්නිවේදනයක් පවත්වාගෙන යයි. සමාගම බොහෝ කාලීන මෙන්ම තත්කාර්ය වාර්තා සහ විශ්ලේෂණය කරන ලද තොරතුරු භාවිතයක් ලෙස සහ ඉල්ලුම මත සපයනු ලැබේ. ආයතනික මෙහෙයුම්වල සැබෑ තත්ත්වය සහ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳව සේවකයින් යාවත්කාලීන වේ. අන්තර් ජාලය සමාගම තොරතුරු අරමුණු ඉටු කරයි සේවකයින්හට තොරතුරු බෙදා හැරීම උසස් කිරීමේ අරමුණින් අපගේ ව්‍යාපාරයට බලපාන සහ අප ක්‍රියාත්මක වන ප්‍රජාවට බලපාන නීති සහ රෙගුලාසි සංවර්ධනය කිරීම, බලාත්මක කිරීම සහ සංශෝධනය කිරීම සිදු වන සෑම අවස්ථාවකම ගු.ගු.සේ.ස. පොදු ප්‍රතිපත්තිමය සංවාදයකට දායකත්වය සපයයි.

12. සමාගම් ලේකම්

අධ්‍යක්ෂමණ්ඩල ක්‍රියා පිළිවෙත් අනුගමනය කිරීම සහ නිරන්තර

සමාලෝචනය සහතික කිරීම සඳහා සමාගම් ලේකම්වරයා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි.

අධ්‍යක්ෂමණ්ඩල වාර්තා සහ ලියවිලි පවත්වා ගැනීමට අමතරව අධ්‍යක්ෂමණ්ඩල ලේකම් තොරතුරු කාලීනව සහ නිවැරදි සැපයීම සහතික කිරීම අධ්‍යක්ෂමණ්ඩල ලේකම්වරයා සහාය ලබා දෙයි. මතු කරන ලද සහ වාර්තා කිරීමට බලාපොරොත්තු වන සියලුම ගැටළු ලේකම් විසින් ප්‍රමාණවත් විස්තර සහිතව ලේඛනගත කර ඇත.

සමාගම් ලේකම් මූලික වශයෙන් වගකිව යුතු වන්නේ අදාළ ව්‍යවස්ථාපිත, නව රෙගුලාසි වලට අනුකූලවීම සහතික කිරීම සහ පාලන කරුණු වලදී කළමණාකාරීත්වය සහ ව්‍යවස්ථාපිත අධිකාරීන් අතර සම්බන්ධයක් ද වේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. AVA/A/AASL/01/20/17
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 31 May 2021

සභාපති
ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන සහ අනෙකුත් නීති හා නියාමන අවශ්‍යතා පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්වාගණනය කළ මතය

සී/ස ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගමේ("සමාගම") 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුවට මා විසින් ඉදිරිපත් කළ යුතු වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත.

මෙම වාර්තාවේ 1.2 ඡේදයෙන් දක්වා ඇති තත්වාගණනය කළ මතය සඳහා බලපෑම යන කරුණෙහි බලපෑම හැර, 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ දක්වා ඇති සමාගමේ මූල්‍ය ප්‍රකාශන රජයේ ප්‍රාග්ධන වියදම් (වැයශීර්ෂ අරමුදල) සහ රඳවා ගත් සංචිත අරමුදල සමඟ ඒකාබද්ධ කිරීමේ පදනම පැහැදිලි කරන 2.1.1 යන මූල්‍ය ප්‍රකාශන සටහන කෙරෙහි මම අවධානය යොමු කරමි. 2005 අගෝස්තු 17 දිනැති කැබිනට් තීන්දුව මත පදනම්ව, 2006 පෙබරවාරි 09 දිනැති අංක PE/GOCO/1/1 දරන ලිපිය මඟින් පහත සඳහන් කොන්දේසි සපුරාලන ලෙස භාණ්ඩාගාර ලේකම් සමාගමට නියෝග කර ඇත.

i. දැනට රජයට අයත් ගුවන් තොටුපලේ ඉඩම සහ ගොඩනැගිල්ල සහ සමාගම සතු අනෙකුත් චංචල හා නිශ්චල වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කිරීම

ii. දැනට ශ්‍රී ලංකා රජය මඟින් සේවා සපයනු ලබන ගුවන් තොටුපල සංවර්ධනයට අදාළ වගකීම් භාර ගැනීම සහ

iii.එලෙස මාරු කරන ලද ශුද්ධ වත්කම් සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීම

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

කෙසේ වෙතත්, සමාගම විසින් රජය සතු ඉඩම් සහ ගොඩනැගිලි සහ වෙනත් නිශ්චල හා චංචල වත්කම් තක්සේරු නොකර වගකීම් පමණක් පවරා ගෙන ඇති අතර ශුද්ධ වත්කම් හුවමාරු කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට කොටස් නිකුත් කිරීම හෝ ගිණුම් වෙත ගෙන ඒම සිදු කර නොමැත.

මම ශ්‍රී ලංකා විගණන ප්‍රමිත (SLAUSs) වලට අනුකූලව මගේ විගණනය සිදු කළෙමි. මගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපතිගේ වගකීම් වලදී එම ප්‍රමිති යටතේ මගේ වගකීම් තවදුරටත් විස්තර කෙරේ. මගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීමට මා ලබා ගත් විගණන සාක්ෂි ප්‍රමාණවත් හා සුදුසු යැයි මම විශ්වාස කරමි.

1.3. සමාගමේ 2020 වාර්ෂික වාර්තාවට ඇතුළත් අනෙකුත් තොරතුරු

අනෙක් තොරතුරු සමාගමේ 2020 වාර්ෂික වාර්තාවට ඇතුළත් කර ඇති නමුත් මෙම විගණකගේ වාර්තා දිනයට පෙර මම ලබා ගත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳ මාගේ විගණක වාර්තාව ඇතුළත් නොවේ. අනෙක් තොරතුරු සඳහා කළමණාකාරිත්වය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ අදහස අනෙක් තොරතුරු ආවරණය නොකරන අතර ඒ පිළිබඳව කිසිදු ආකාරයක සහතික කිරීමේ නිගමනයක් මම ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනය සම්බන්ධව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙක් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ භෞතිකව නොගැලපෙනවාද නැත්නම් විගණනයේදී ලබාගත් මගේ දැනුම එම තොරතුරුවලින් නිරූපණය වෙනවාද නැත්නම් වෙනත් ප්‍රමාණාත්මකව වැරදි ආකාරයකින් නිරූපණය වෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණන වාර්තා දිනයට පෙර මා ලබා ගත් අනෙකුත් තොරතුරු මත මම ඉටු කළ කාර්යය මත පදනම්ව, මෙම වෙනත් තොරතුරුවල ප්‍රමාණාත්මක වැරදි වැටහීමක් ඇතැයි මම නිගමනය කරන්නේ නම්, එම කරුණ වාර්තා කිරීමට මට සිදු වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4. මූල්‍ය ප්‍රකාශන සඳහා කළමනාකාරිත්වයේ සහ පාලන වගකීම දරන අයගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වැරදි හෝ වංචා හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිලියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකාරිත්වයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමණාකාරිත්වයේ වගකීමක් වන අතර, කළමණාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමණාකාරිත්වයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තා කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීමේ වගකීම පරිපාලනයට සම්බන්ධ අය වෙත පැවරේ.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳව නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් ඇතිවිය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චයභාවය හා වෘත්තීය සැකමුසුභාවය සහිතව ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලිපි ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවන් ඇතිවීමට හේතු වේ.
- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- කළමනාකරණය විසින් අනුගමන කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල සාධාරණත්වය ඇගයීම
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතභාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදාගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතභාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම්, මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය සංශෝධනය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළුව මූල්‍ය ප්‍රකාශන වල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සහ සාධාරණ ප්‍රකාශනයක් ලබා ගත හැකි අයුරින් මූල්‍ය ප්‍රකාශන පදනම් වූ ගනුදෙනු සහ සිදුවීම් නියෝජනය කරන්නේද යන්න තක්සේරු කිරීම

මගේ විගණනයේදී මා හඳුනා ගන්නා අභ්‍යන්තර පාලනයේ යම් සැලකිය යුතු අඩුපාඩු ඇතුළුව, වෙනත් කරුණු අතර, සැලකිය යුතු විගණන සොයා ගැනීම් සම්බන්ධයෙන් පාලන කටයුතු සම්බන්ධයෙන් වගකීම දරණ අය සමඟ මම සන්නිවේදනය කරමි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

2. අනෙකුත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතෙහි සහ 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත විධිවිධාන ඇතුළත් වේ.

2.1.1. 2007 අංක 7 දරණ සමාගම් පනතේ 163 (1) වගන්තිය හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තිය අනුව විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන ඇති අතර මගේ විභාගයෙන් පෙනී යන පරිදි සමාගම විසින් නිසි ගිණුම් වාර්තා තබා ඇත.

2.1.2. සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරණ සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

2.1.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iii) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පසුගිය වසරට අදාළ මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි ඉදිරිපත් කර ඇත.

2.1.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (අෑ) (iv) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පෙර වසරේදී මා විසින් ඉදිරිපත් කරන ලද සියලුම නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් වේ.

2.2. සිදු කරන ලද ක්‍රියා පටිපාටි සහ ලබා ගත් සාක්ෂි මත පදනම් වූ කරුණු කාරණා වලට පමණක් සීමා වූ අතර කිසිවක් මගේ අවධානයට යොමු වී නැත;

2.2.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අෑ) වගන්තියේ අවශ්‍යතාවය අනුව සමාගමේ සාමාන්‍ය පාලන කටයුතු වලින් බැහැර වූ කොන්ත්‍රාත්තුවක් පිළිබඳව සමාගමේ ඕනෑම පාලක මණ්ඩලයේ සාමාජිකයෙකුට සෘජු හෝ වක්‍ර උනන්දුවක් ඇති බව ප්‍රකාශ කිරීම.

2.2.2. පහත සඳහන් කරුණු හැරුණු කොට 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඒ) වගන්තියේ අවශ්‍යතාවය අනුව සමාගමේ පාලන අධිකාරිය විසින් නිකුත් කරන ලද අදාළ ලිඛිත නීතිය, සාමාන්‍ය සහ විශේෂ උපදෙස් වලට අනුකූලව සමාගම කටයුතු කර නැති බව ප්‍රකාශ කිරීම.

නීතිය / මඟ පෙන්වීම සඳහා යොමුව	විස්තරය
(අ) 2010 අංක 14 දරණ සිවිල් ගුවන් සේවා පනතේ 14 වන වගන්තිය	2020 දෙසැම්බර් 31 දින වන විටත් ගඟන යාත්‍රාංගනය ස්ථාපිත කිරීම හෝ ව්‍යාප්ත කිරීම පිළිබඳ ප්‍රධාන සැලැස්මක් සමාගම විසින් සකස් කර නොතිබුණි.
(ආ) සාමූහිකපාලනය සඳහා වූ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ පිළිබඳව 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/12.	
9.2 ඡේදය (අෑ)	ආයතනයේ සංවිධාන සටහන සහ අනුමත කරන ලද සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයෙහි රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි.

නීතිය / මඟ පෙන්වීම සඳහා යොමුව	විස්තරය
(ii) 9.3.1 ඡේදය (i)	සමාගමේ බඳවා ගැනීමේ හා උසස්වීම් යෝජනා ක්‍රමය (SOR) මහා භාණ්ඩාගාරයේ එකඟතාවයෙන් අදාළ අමාත්‍යාංශය විසින් අනුමත කර නොතිබුණි.
(iii) 9.14 ඡේදය	මානව සම්පත් කළමනාකරණ ක්‍රියා පටිපාටි අත්පොත මහා භාණ්ඩාගාරයේ එකඟතාවය සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර නොමැත.

2.2.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයට අනුකූලව සමාගම සිය බලතල, කර්තව්‍යයන් හා රාජකාරි ඉටු නොකළ බව ප්‍රකාශ කිරීම

2.2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූලව සහ කාලානුරූපව අදාළ නීති වලට අනුකූලව සමාගමේ සම්පත් ආර්ථික වශයෙන්, කාර්යක්ෂම ලෙස හා ඵලදායීව ප්‍රයෝජනයට ගෙන නොමැති බව ප්‍රකාශ කිරීම

2.5. වෙනත් කරුණු

(අ) වත්මන් තාක්ෂණයට අනුකූල ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතියක් 2021 මැයි 31 දින වන විටත් සමාගමට හඳුන්වා දී නොමැත.

(ආ) වත්කම් සංකේත ක්‍රමය සහ නිසි පරිදි යාවත්කාලීන කරන ලද වත්කම් ලේඛනය විගණනය සඳහා ලබා දී නොතිබුණි.

(ඇ) බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතියේ දෙවන අදියර සඳහා ජපන් යෙන් මිලියන 74,397 ක අරමුදල් සැපයීම සඳහා සමාගම 2012 මාර්තු 28 සහ 2016 මාර්තු 24 දිනවල ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය සමඟ ගිවිසුම් දෙකකට එළඹී ඇත. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 82 ක් දක්වා අරමුදල් විශාල ප්‍රමාදයක් සහිතව 2020 මාර්තු 04 දින ප්‍රදානය කර තිබුණි. අරමුදල් ප්‍රයෝජනයට නොගැනීම හේතුවෙන් 2013 අප්‍රේල් 20 සිට 2021 අප්‍රේල් 20 දක්වා සමාගම ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ආයතනයට රුපියල් මිලියන 328 ක මුදලක් ගෙවා ඇත. ව්‍යාපෘතිය ප්‍රමාද වීමට නව පර්යන්ත ගොඩනැගිල්ලේ වහලයේ සැලසුම වෙනස් කිරීම හේතු වී ඇත.

(ඈ) 2019 දී යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපල රු.මි. 218ක පිරිවැයක් දරා ඉදිකිරීම් ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් හෝ පරිසර බලපෑම් තක්සේරුවක් සිදු කර නොතිබුණි. යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි මෙහෙයුම් අලාභය 2019 සහ 2020 වර්ෂ වල පිළිවෙලින් රුපියල් මිලියන 46.5 ක් සහ රුපියල් මිලියන 61.1 කි.



ඩබ්ලිව් පී සී වික්‍රමරත්න
විගණකාධිපති

විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සටහන්	2020	2019
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය			
ආදායම	5	**7,575,860,368**	25,652,253,207
වෙනත් ආදායම්	6	**212,551,351**	40,988,731
පරිපාලන සහ ආයතනික		**7,788,411,718**	25,693,241,938
ආයතන හා පරිපාලන වියදම්	7	**(12,399,179,310)**	(13,489,524,663)
මෙහෙයුම් (අලාභ) ලාභ		**(4,610,767,592)**	12,203,717,275
මූල්‍ය ආදායම		**3,665,084,724**	4,164,672,412
මූල්‍ය වියදම්		**(2,787,071,806)**	(1,146,396,268)
ශුද්ධ මූල්‍ය (පිරිවැය) / ආදායම	8	**878,012,919**	3,018,276,144
බදු පෙර (අලාභය)/ලාභය		**(3,732,754,673)**	15,221,993,419
ආදායම් බදු වියදම්	9	**1,228,325,046**	(4,225,984,067)
වර්ෂය සඳහා (අලාභ) /ලාභය		**(2,504,429,627)**	10,996,009,352
කොටසක **(අලාභ)/ඉපැයීම්**	10	**(12,522)**	54,979
වෙනත් විස්තීර්ණ ආදායම්			
විශ්‍රාමික පාරිකෝෂිත ගණනයේදී උපකල්පන වල වෙනස්කම් මත පැන නගින ලාභ/(අලාභ)	23	**497,235,788**	113,104,013
ආයුගණක ලාභ/(අලාභ) මත විලම්බිත බදු	13	**(119,336,589)**	(31,669,124)
වෙනත් විස්තීර්ණ ආදායම් එකතුව		**377,899,199**	81,434,889
වර්ෂය සඳහා සමස්ත විස්තීර්ණ ආදායම		**(2,126,530,428)**	11,077,444,241

පිටු අංක 95 සිට 120 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

දෙසැම්බර් 31 දිනට	සටහන්	2020	2019
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	11	**37,892,565,842**	39,871,567,518
ප්‍රාග්ධන නොනිමි වැඩ	11	**8,781,032,278**	7,538,459,297
අස්පෘශ්‍ය වත්කම්	12	**40,239,429**	29,997,570
විලම්බිත බදු වත්කම්	13	**1,967,973,553**	2,119,369,228
		48,681,811,103	49,559,393,613
දිගු කාලීන ආයෝජන			
ණයකර වල ආයෝජනය	14	**5,638,300,000**	5,638,300,000
දිගු කාලීන බැංකු තැන්පතු		**1,169,874,563**	-
සමාගම් නිලධාරීන් සඳහා ණය	16.1	**81,019,448**	102,102,012
ජංගම වත්කම්			
තොග	15	**837,088,722**	961,025,239
වෙළෙඳ සහ වෙනත් ලැබිය යුතු දෑ	16	**3,215,746,028**	6,149,586,940
ලැබිය යුතු ආදායම් බදු	26	**833,368,210**	-
කෙටි කාලීන බැංකු තැන්පතු		**41,932,637,264**	43,384,359,019
මුදල් හා මුදල් සමාන දෑ	17	**826,225,883**	2,479,942,157
		47,645,066,108	52,974,913,355
මුළු වත්කම්		**103,216,071,222**	108,274,708,980
හිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධනය සහ සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය	18	**20,000,200**	20,000,200
සංචිත	19	**1,077,266,769**	1,067,076,769
රඳවාගත් ඉපැයුම්	20	**35,885,634,588**	38,143,580,281
		36,982,901,557	39,230,657,250
ජංගම නොවන වගකීම්			
ණය ගැනීම්	21	**43,433,321,775**	43,812,598,207
ණයකර	22	**4,000,000,000**	4,000,000,000
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම	23	**5,482,533,223**	5,484,473,009
විලම්බිත බදු වගකීම	13	**6,129,418,466**	7,389,802,597
විලම්බිත රාජ්‍ය ප්‍රදාන	24	**986,349,954**	1,034,044,256
		60,031,623,418	61,720,918,069
ජංගම වගකීම්			
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ	25	**2,462,071,717**	2,789,389,542
ණය ගැනීම්	21	**3,739,474,530**	3,747,733,646
ගෙවිය යුතු ආදායම් බදු	26	**-**	786,010,474
		6,201,546,247	7,323,133,661
මුළු වගකීම්		**66,233,169,665**	69,044,051,730
මුළු හිමිකම් සහ වගකීම්		**103,216,071,222**	108,274,708,980

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමෙන් බැඳේ. මෙම මූල්‍ය ප්‍රකාශන සඳහා 2021 මැයි 31 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

සභාපති

අධ්‍යක්ෂ

මෙම මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කර ඇති බව මම සහතික කරමි.

නිල මූල්‍ය අංශ ප්‍රධානී

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2021 මැයි 31 දින අත්සන් කරන ලදි.

පිටු අංක 95 සිට 120 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සටහන	ප්‍රකාශිත ප්‍රාග්ධනය	වෙනත් සංචිත	රඳවාගත් ඉපයුම්	එකතුව
2019 ජනවාරි 1 දිනට ශේෂය		20,000,200	1,048,226,769	27,410,951,697	28,479,178,666
පෙර වසර ගැලපීම්		-	-	174,034,344	174,034,344
වර්ෂය සඳහා ලාභය		-	-	10,996,009,352	10,996,009,352
වෙනත් විස්තීර්ණ ආදායම්					
පශ්චාත් සේවක ප්‍රතිලාභ බපැදිම්වල ආයුගණන අලාභය		-	-	113,104,013	113,104,013
විශ්‍රාමික ප්‍රතිලාභ ආයුගණන ලාභ/(අලාභ) මත විලම්බිත බදු		-	-	(31,669,124)	(31,669,124)
බදු හැර වෙනත් විස්තීර්ණ ආදායම්		-	-	81,434,889	81,434,889
මුළු විස්තීර්ණ ආදායම		-	-	11,077,444,241	11,077,444,241
පෙර වසර ගැලපීම්		-	-	-	-
ගෙවූ ලාභාංශ	28	-	-	(500,000,000)	(500,000,000)
සංචිත හිණුමට මාරු කිරීම්		-	18,850,000	(18,850,000)	-
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය		**20,000,200**	**1,067,076,769**	**38,143,580,281**	**39,230,657,250**
2020 ජනවාරි 1 දිනට ශේෂය		20,000,200	1,067,076,769	38,143,580,281	39,230,657,252
පෙර වසර ගැලපීම්		-	-	(121,225,264)	(121,225,264)
වර්ෂය සඳහා (අලාභ)/ලාභය		-	-	(2,504,429,627)	(2,504,429,627)
වෙනත් විස්තීර්ණ ආදායම්					
පශ්චාත් සේවක ප්‍රතිලාභ බැඳිම්වල ආයුගණන ලාභය		-	-	497,235,788	497,235,788
ආයුගණන ලාභ/මත විලම්බිත බදු		-	-	(119,336,589)	(119,336,589)
ආදායම් බදු හැර වෙනත් විස්තීර්ණ ආදායම්		-	-	377,899,199	377,899,199
මුළු විස්තීර්ණ ආදායම		-	-	(2,126,530,428)	(2,126,530,428)
ගෙවූ ලාභාංශ	28	-	-	-	-
සංචිත හිණුමට මාරු කිරීම්		-	10,190,000	(10,190,000)	-
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		**20,000,200**	**1,077,266,769**	**35,885,634,588**	**36,982,901,557**

පිටු අංක 95 සිට 120 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය	සටහන	2020	2019
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහ			
ආදායම් බදු වියදම් වලට පෙර (පාඩුව)/ලාභය		**(3,732,754,673)**	15,221,993,419
ගැලපීම්:			
ක්ෂය වීම්	11	**2,820,686,229**	2,833,801,655
අස්පෘශ්‍ය වත්කම් ක්‍රමක්ෂය	12	**16,599,094**	15,710,737
පෙර වසර සඳහා අවප්‍රමාණය/ක්‍රමක්ෂය ගැලපීම	11	**58,885,481**	24,741,823
ණය පරිවර්තන මත විනිමය හුවමාරු (ලාභ) / අලාභ	21	**2,268,147,704**	(156,729,149)
ස්ථාවර තැන්පතු පරිවර්තන මත (ලාභ) / අලාභ සඳහා ගැලපීම	21	**(770,750,076)**	(22,852,159)
ආයෝජන ආදායම	8	**(3,681,564,853)**	(4,170,366,019)
දේපල, පිරියත සහ උපකරණ විකිණීමේදී (ලාභය) / අලාභය		**(39,386,993)**	-
පෙර වසර ගැලපීම්		**(124,200,415)**	4,954,135
විලම්බිත රාජකා ප්‍රදාන ක්‍රමක්ෂය	24	**(47,694,302)**	(47,991,874)
මූල්‍ය පිරිවැය	8	**1,289,674,178**	1,325,977,575
විශ්‍රාමික ප්‍රතිලාභ සැලැස්ම සඳහා ප්‍රතිපාදන	23	**912,386,047**	902,827,685
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පෙර මෙහෙයුම් ලාභය		**(1,029,972,579)**	15,932,067,829
තොග අඩු වීම/(වැඩි වීම)		**123,936,517**	(106,297,621)
වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ අඩු වීම/(වැඩි වීම)		**2,442,334,045**	(95,363,794)
වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ / (අඩු වීම)		**(275,084,982)**	(4,182,268,063)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උපයන මුදල්		**1,261,213,001**	11,548,138,350
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	23	**(417,090,045)**	(398,606,099)
පොලී ගෙවීම්		**(1,341,907,020)**	(1,208,745,458)
ආදායම් බදු ගෙවීම්	26	**(1,617,818,533)**	(6,578,684,186)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද/ (භාවිතා කරන ලද) ශුද්ධ මුදල්		**(2,115,602,598)**	3,362,102,607
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත සහ උපකරණ අත්පත් කර ගැනීම	11	**(2,140,848,433)**	(4,062,917,255)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම	12	**(27,720,585)**	(4,894,820)
ණයකර වල ආයෝජනය	14	**-**	(1,054,300,000)
බැංකු තැන්පතු වල මුදල් ආපසු ගැනීම/ශුද්ධ (ආයෝජනය)		**1,052,597,268**	(9,234,374,009)
දේපල, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලැබෙන ආදායම		**39,387,040**	-
පොලී ලැබීම්		**4,173,071,721**	3,287,369,590
ණයකර නිකුතුවෙන් ලැබීම්		**-**	4,000,000,000
සේවක ණය ප්‍රදාන		**(124,931,128)**	(112,742,893)
සේවක ලැබීම්		**146,013,692**	120,930,596
රජයේ ප්‍රදාන ලැබීම්		**-**	3,289,973
ආයෝජන ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද ශුද්ධ මුදල්		**3,117,569,575**	(7,057,638,817)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලැබූ මුදල් ප්‍රවාහය			
ලාභාංශ ගෙවීම්	28	**-**	(500,000,000)
ණය ලැබීම්	21	**1,083,791,280**	2,150,087,177
ණය ආපසු ගෙවීම්	21	**(3,739,474,532)**	(3,641,472,283)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් උත්පාදනය කරන ලද/(භාවිතා කරන ලද) ශුද්ධ මුදල්		**(2,655,683,251)**	(1,991,385,108)
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩි වීම්/ (අඩු වීම්)		**(1,653,716,274)**	(5,686,921,317)
වර්ෂ ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දෑ	17	**2,479,942,157**	8,166,863,474
වර්ෂ අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	17	**826,225,883**	2,479,942,157

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

(සටහන් වල සියළුම අගයන් වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ශ්‍රී ලංකා රුපියල් වලින් දැක්වේ)

1. ආයතනික තොරතුරු

1.1. පොදු තොරතුරු

ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම ("සමාගම") යනු ශ්‍රී ලංකාවේ සංස්ථාපිත සහ නේවාසික පෞද්ගලික සීමිත සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළේ පිහිටා ඇත.

1.2 මූලික ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළදී සමාගමේ මූලික ක්‍රියාකාරකම් වූයේ ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන් යටතේ ගුවන්තොටුපළවල් කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා ගුවන් තොරතුරු කලාපය හරහා පියාසර කරන ගුවන් යානා සහ ආගමන ගුවන් යානා සඳහා ගුවන් යානා සංචලන සේවා සැපයීම සහ සේවා භාවිතා කරන්නන් සඳහා අවශ්‍ය අනෙකුත් පහසුකම් සැපයීමයි.

1.3 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අවසර ලබා දුන් දිනය

2021 මැයි 31 දින අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවකට අනුව 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා වන ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) පුද්ගලික සමාගමේ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීමට අවසර දී ඇත.

2. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනය කළ ප්‍රතිපත්ති ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දක්වා ඇත. වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ඉදිරිපත් කරන ලද සෑම වසරකම මෙම ප්‍රතිපත්ති අඛණ්ඩව අදාළ වේ.

2.1 පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) වලට අනුකූලව ය. සමහර මූල්‍ය වත්කම් හා වගකීම් සාධාරණ ලෙස තක්සේරු කිරීම සහ විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම අනුව හඳුනාගැනීම සඳහා සාධාරණ අගය අනුව වෙනස් කරන ලද අතර මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලබන්නේ වෛතිහාසික පිරිවැය පදනම යටතේ ය.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා ඇතැම් තීරණාත්මක ගිණුම් ඇස්තමේන්තු භාවිතා කිරීම අවශ්‍ය වේ.

සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියේදී කළමනාකරණය සිය විනිශ්චයභාවය ක්‍රියාත්මක කිරීම අත්‍යාවශ්‍යය. උපකල්පන සහ ඇස්තමේන්තු වැනි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වැදගත් වන අංශයන් 4 වන සටහනෙහි දක්වා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා රුපියල් වලින් ය. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූල වේ.

2.1.1. ඒකාබද්ධ කිරීම

මෙම මූල්‍ය ප්‍රකාශන මඟින් පහත සඳහන් කරුණු ද ඇතුළත්ව සමාගමේ ඒකාබද්ධ තත්ත්වය පෙන්නුම් කරයි:

ඇ) ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානයන් නියෝජනය කරන වැය ශීර්ෂ අරමුදලය සහ

ආ) රඳවා ගත් ආදායම් අරමුදල

මෙම තොරතුරු නීතිපතිගේ මතය අනුව 2011 වර්ෂය දක්වා වෙන වෙනම සකස් කර ඉදිරිපත් කර ඇත.

සමාගමේ වත්කම් හා බැරකම් ඒකාබද්ධ කිරීම සඳහා 2005 අගෝස්තු 17 දිනැති කැබිනට් අනුමැතියේ දී ලබා දුන් කැබිනට් සංදේශයේ 3.5 ඡේදය යටතේ සඳහන් ව්‍යවස්ථාපිත සංශෝධන ආරම්භ කිරීමට පියවර ගැනීම සඳහා අවශ්‍ය නීතිමය සංශෝධන පිළිබඳව ගුවන් සේවා අමාත්‍යාංශයට සමාගම විසින් සිදු කළ ඉල්ලීම පරිදි මේ සම්බන්ධයෙන් සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් නීතිපතිවරයාගේ අදහස විමසන ලදී.

ඉහත කැබිනට් අනුමැතියේ අවශ්‍යතාවය වූයේ 1983 දී සමාගම පිහිටුවීම සහ ගුවන් තොටුපල අධිකාරිය විසුරුවා හැරීම, ඉතිරි වත්කම් හා බැරකම් සමඟ ගුවන්තොටුපළ අධිකාරිය සතු වත්කම් වලින් කොටසක් පමණක් සමාගමට පැවරීම හා ඉතිරි වත්කම් හා බැරකම් වැය ශීර්ෂ හා රඳවා ගත් ආදායම් අරමුදල් යටතේ රඳවා තබා ගෙන ගිණුම් ගත කිරීම හේතුවෙනි.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/LKAS) අනුකූල වීම සඳහා ඒකාබද්ධ සමාගම ඉහත අරමුදල් දෙකෙහි වාර්තා කර ඇති වත්කම් භාවිතා කරමින් ආර්ථික ප්‍රතිලාභ උපයන පරිදි සමාගමේ මූලික මෙහෙයුම් ක්‍රියාකාරකම්වල නිරත වීමේ පදනම යටතේ අදාළ වත්කම් හඳුනා ගැනීමටත් අදාළ වගකීම් වාර්තා නොකර ණය සේවා ගෙවීමේ වගකීම් සඳහා පමණක් ඒකාබද්ධ ගිණුම් සැකසීමටත් එමඟින් මූලික ගිණුම්කරණ සංකල්ප වලින් බැහැරවීම් නිසාය. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 ජුනි 28 දිනදී, අනුමැතිය ලබා දුන්නේය.

2.1.2. අනුකූලතා ප්‍රකාශනය

සමාගම් පනතේ විධිවිධාන වලට සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLFRS/LKAS) අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

2020 දෙසැම්බර් 31 දින සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් (එනම් සමාගමේ "මූල්‍ය ප්‍රකාශන") ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් සකස් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) සහ සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූලව සංසන්දනාත්මක තොරතුරු සමඟ ඉදිරිපත් කර ඇත.

මෙම ප්‍රමිති www.casrilanka.com හි දක්වා ඇත.

2.1.3. සන්සන්දනාත්මක තොරතුරු

වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම් ඉදිරිපත් කළ සෑම වසරකම ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

2.1.4. මිනුම් පදනම

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය තුළ දැක්වෙන පහත සඳහන් ද්‍රව්‍යමය කරුණු හැර සමාගමේ මූල්‍ය ප්‍රකාශන වෛතිහාසික පිරිවැය පදනම මත සකස් කර ඇත :

ආයෝජන දේපල - සාධාරණ වටිනාකම

කෙටි කාලීන ආයෝජන - ලාභ හෝ

අලාභ ගිණුම තුළින් හඳුනා ගන්නා සාධාරණ අගයන් ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් - සාධාරණ වටිනාකමට අගය කර ඇත.

ශුද්ධ නිශ්චිත ප්‍රතිලාභ වගකීම - නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන අගයට හඳුනා නොගත් ආයු ගණන වාසි එකතු කොට ඉන් හඳුනා නොගත් අතීත සේවා පිරිවැය සහ හඳුනා නොගත් ආයුගණන පාඩු අඩුකොට වටිනාකම හඳුනාගෙන ඇත.

2.1.5. ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල්

සමාගමේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර ඇති අයිතමයන් මනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රධාන ආර්ථික පරිසරයේ මුදල් (ක්‍රියාකාරී මුදල්) වර්ගය භාවිතා කරමිනි. මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය. මෙම වර්ෂය තුළ සමාගමේ ඉදිරිපත් කිරීම් සහ ක්‍රියාකාරී මුදල් වල කිසිදු වෙනසක් සිදු වී නොමැත.

2.1.6. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාගමේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉදිරිපත් කර ඇති වත්කම් හා වගකීම් ඒවායේ ස්වභාවය අනුව කාණ්ඩ කර ඒවායේ සාපේක්ෂ ද්‍රවශීලතාවය සහ කල් පිරීමේ රටාව පිළිබිඹු වන අනුපිළිවෙලකට ලැයිස්තු ගත කර ඇත. මූල්‍ය ප්‍රකාශන වලට බලපාන උද්ධමන සාධක සඳහා කිසිදු ගැලපීමක් සිදු කර නොමැත. පිළිගත් මුදල් පියවා ගැනීම සඳහා නීත්‍යානුකූලව බලාත්මක කළ හැකි අයිතියක් ඇති විට හා ශුද්ධ මුදල පියවා දැමීමට අදහස් කරන විට හෝ ගිණුම්කරණ ප්‍රමිතියකින් හෝ අර්ථ නිරූපණයකින් අවසර දී ඇති පරිදි වත්කම් උපලබ්ධි කර වගකීම් බේරුම් කිරීමට අවසර දී ඇති විටෙක , සහ සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති වල විශේෂයෙන් හෙළිදරව් කර ඇති අවස්ථාවක පමණක් මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් එකිනෙකට හිලව් කර මූල්‍ය ප්‍රකාශනයේ වහි ශුද්ධ මුදල වාර්තා කර ඇත.

2.1.7. ප්‍රමාණාත්මකභාවය හා සමුච්චිත අගයන් දැක්වීම

සෑම ප්‍රමාණාත්මක අගයක් සහිත සමජාතීය අයිතමයන් පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කෙරේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (LKAS) අංක 1, වනම් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම මඟින් අවසර දී ඇති පරිදි, ප්‍රමාණාත්මකභාවය අනුව ස්වභාවය හෝ ක්‍රියාකාරිත්වය අසමාන අයිතමයන් වෙනම ඉදිරිපත් කෙරේ.

2.1.8. වෘත්තීයමය තීන්දු ගැනීම හා ඇස්තමේන්තු භාවිතය

සමාගමේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සඳහා කළමනාකාරිත්වය විසින් යොදාගන්නා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා වූ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම් වල ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන වලට එළඹීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (SLFRS/LKAS) සමඟ අනුකූල වීම අවශ්‍ය වේ. මෙහිදී සත්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලට වඩා වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පදනම් කරගන්නා උපකල්පන අඛණ්ඩව සමාලෝචනය කෙරේ. ගිණුම් ඇස්තමේන්තු වල සංශෝධනයන් අවශ්‍ය වූ වහාම සිදු කෙරේ.

2.1.9. අඛණ්ඩ පැවැත්ම

කළමනාකාරිත්වය විසින් සමාගමේ කටයුතු අඛණ්ඩව කරගෙන යාමට ඇති හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අනාගතයේ දී ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් සම්පත් සමාගම සතුව ඇති බවට සෑහීමකට පත් වේ. තවද, සමාගමේ අඛණ්ඩ පැවැත්මට ඇති හැකියාව කෙරෙහි සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි කිසිදු ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ගැන කළමනාකරණය දැනුවත්ව නොමැත. එම නිසා, සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය සැලකිල්ලට ගනිමින් මූල්‍ය ප්‍රකාශන සකස් කෙරේ.

2.1.10. මූල්‍ය උපකරණ

මූල්‍ය උපකරණයක් යනු කිසියම් ආයතනයක මූල්‍ය වත්කම් සහ වෙනත් ආයතනයක මූල්‍ය වගකීම් හෝ කොටස් උපකරණ උපදවන ඕනෑම ගිවිසුමකි.

2.1.11. විලම්බිත බදු වත්කම්

අනාගතයේ බදු අය කළ හැකි ලාභ ලැබීමට ඉඩ ඇති බවත් ඒ බදු ලාභ සඳහා හිලව් කර ගැනීමට මෙම බදු අලාභ ප්‍රයෝජනයට ගත හැකිය යන පදනමෙන් බදු අලාභ වලට අදාළව විලම්බිත බදු වත්කම් හඳුනාගෙන ඇත. අනාගත බදු සැලසුම් කිරීමේ උපාය මාර්ගයන් සමඟ අනුගත හැකි විලම්බිත බදු වත්කම් අගය සහ අනාගත බදු අය කළ හැකි ලාභයේ මට්ටම මත පදනම්ව මෙම අනුමාන කිරීම් සිදු කෙරේ.

2.1.12. ප්‍රතිපත්ති සහ හෙළිදරව් කිරීම්

නව හා සංශෝධිත ගිණුම්කරණ ප්‍රමිති සහ අර්ථ නිරූපණයන්

ගිණුම්කරණ ප්‍රමිති සංශෝධන කිහිපයක් 2020 ජනවාරි 01 දිනෙන් පසුව ආරම්භ වන වාර්ෂික කාලසීමාවන් සඳහා බලපැවැත්වේ. කෙසේ වෙතත් මෙම සංශෝධන මඟින් සමාගමේ මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් නැත.

මූල්‍ය වාර්තාකරණය සඳහා වූ සංකල්පීය රාමුවෙහි ඇති වූ සංශෝධන

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින් මූල්‍ය වාර්තාකරණය සඳහා සංශෝධිත සංකල්පීය රාමුවක් නිකුත් කර ඇති අතර එය වහාම ක්‍රියාත්මක වන පරිදි ගිණුම්කරණ ප්‍රමිත සැකසුම් තීරණ වලදී භාවිතා කෙරේ. මෙයට පහත සඳහ ප්‍රධාන වෙනස්කම් ඇතුළත් වේ,

- මූල්‍ය වාර්තාකරණයේ අරමුණ තුළ භාරකාරත්වය සඳහා ඇති ප්‍රමුඛතාවය වැඩි කිරීම.
- මධ්‍යස්ථභාවයේ අංගයක් ලෙස විචක්ෂණභාවය ප්‍රතිස්ථාපනය කිරීම.
- නෛතික ආයතනයක් හෝ ආයතනයක කොටසක් විය හැකි වාර්තාකරණ ආයතනයක් නිර්වචනය කිරීම
- වත්කම් හා වගකීම් වල නිර්වචන සංශෝධනය කිරීම.
- හඳුනාගැනීම සඳහා පැවති ලාභදායිතා සීමාවන් ඉවත් කිරීම සහ වත්කම්/වගකීම් හඳුනානොගැනීම සඳහා මඟ පෙන්වීම් එකතු කිරීම.
- අගය කිරීමට ඇති විවිධ මිනුම් පදනම් සඳහා මඟ පෙන්වීම් එකතු කිරීම.
- ලාභය හෝ අලාභය සැකසීම මූලධර්මයේ මූලික කාර්ය සාධන දර්ශකය වන අතර, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් ආදායම් හා වියදම් වාර්ෂිකව ප්‍රතිවර්ත්‍රීකරණය කළ යුතු අතර එමඟින් මූල්‍ය ප්‍රකාශන වල අදාළත්වය හෝ විශ්වාසනීය නියෝජනය වැඩි කෙරේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 සහ ප්‍රමිත අංක 8 සඳහා සංශෝධන

"ප්‍රමාණාත්මක" යන්නෙහි අර්ථ දැක්වීම සෙසු ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම සහ "නිර්වචනය" යන යෙදුමේ යම් යම් කරුණු පැහැදිලි

කිරීම සඳහා "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස්වීම් සහ වැරදි" පිළිබඳව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය ප්‍රමිති අංක 1 සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 18 වෙත සංශෝධන නිකුත් කළේය.

නව නිර්වචනයේ සඳහන් වන්නේ 'තොරතුරු වාර්තා කිරීම අතපසු වීම, වැරදි ලෙස ප්‍රකාශ කිරීම හෝ අපැහැදිලි ලෙස ප්‍රකාශ කිරීම, පොදු අවශ්‍යතා සඳහා ප්‍රකාශයට පත්කරන මූල්‍ය වාර්තා පරිශීලකයන් විසින් ගනු ලබන තීරණ වලට බලපානු ඇතැයි බලාපොරොත්තු විය හැකි අවස්ථාවන්හිදී ප්‍රමාණාත්මක ලෙස සැලකෙන අතර එම මූල්‍ය තොරතුරු නිශ්චිත වාර්තා කිරීමේ ආයතනයක් පිළිබඳව තොරතුරු සපයයි.

SLFRS අංක 03 ට සංශෝධන

අත්පත් කර ගන්නා ලද ක්‍රියාකාරකම් සහ වත්කම් සමූහයක් යනු ව්‍යාපාරයක්ද නැති ද යන්න නිශ්චය කර ගැනීමට ආයතනවලට උපකාර කිරීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය විසින්, SLFRS 3 හි ව්‍යාපාරයක් නිර්වචනය කිරීමට අදාළව සංශෝධන නිකුත් කළේය. මෙම සංශෝධන මඟින් ව්‍යාපාරයක් වීම සඳහා කිසියම් ආර්ථික කටයුත්තක් සැපිරිය යුතු වන අවම අවශ්‍යතාවයන් පැහැදිලි කරයි. පෙර පැවති නිර්වචනය මඟින් ආවරණය නොවූ ඕනෑම ආයතනයක් සඳහා නව නිර්වචනය ආදේශ කිරීමට වෙළෙඳපොළ සහභාගී වන්නන්ට හැකියාවක් ඇත්දැයි යන තක්සේරුව ඉවත් කිරීම, අත්පත් කරගැනීමේ ක්‍රියාවලියක් කොතෙක් දුරට වැදගත් ද යන්න තක්සේරු කිරීමට ආයතනවලට උපකාර කිරීම සඳහා මඟ පෙන්වීමක් එක් කිරීම සහ ව්‍යාපාරයක නිර්වචනය හා එහි නිමැවුම් අර්ථ දැක්වීම පටු කිරීම සහ විකල්ප සාධාරණ අගය සඳහා සාන්ද්‍රණ පරීක්ෂණයක් හඳුන්වා දීම මෙහි අරමුණ වී ඇත. මෙම සංශෝධන මඟින් නව නිදර්ශන උදාහරණ ලබා දෙන ලදී.

2.1.13. කොවිඩ්-19 ව්‍යාපාර හා මෙහෙයුම් කෙරෙහි ඇති කරන බලපෑම්

පවතින කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර හා සංචරණය සීමා කිරීම 2020 මාර්තු මස මැද භාගයේ සිට සමාගමේ ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපෑවේය.මෙම මූල්‍ය වර්ෂය තුළ 2019 මූල්‍ය වර්ෂය හා සසඳන විට සමස්ත ගුවන් ගමන් සංඛ්‍යාව සහ මගී සංචලනය පිළිවෙලින් 66% සහ 76% කින් අඩු වී ඇත. මෙම කාලය තුළදී විදේශ මුදල් වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි හි අගය අඩු වීම හේතුවෙන් විදේශ මුදල් දේශීය මුදලට පරිවර්තනය කිරීමේදී සමාගමට සැලකිය යුතු විනිමය පාඩුවක් සිදු විය. කෙසේ වෙතත්, විගණන වාර්තාවේ දිනය වන විට බොහෝ රටවල් සිය සංචරණ සීමා කාලය ඉවත් කර තිබේ.

සමාගම විසින් ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය බලධාරීන් විසින් ප්‍රකාශයට පත් කරන ලද සියළුම සෞඛ්‍ය හා ආරක්ෂිත මාර්ගෝපදේශ අනුගමනය කරන ලදී.

ලබා ගත හැකි තොරතුරු මත පදනම්ව 2020 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම නිර්ණය කිරීමේ දී කළමනාකරණ සමාගම විසින් දැනට පවතින සහ අපේක්ෂා කළ සංචරණ සීමාවලින් පසු සමාගම තුළ ඇති වන ආර්ථික බලපෑම් සහ ඉදිරියේදී අඛණ්ඩ පැවැත්මේ පදනම තක්සේරු කර ඇත.

මුදල් ප්‍රවාහයට ඇති අහිතකර බලපෑම, සැපයුම් සුරක්ෂිත කිරීමේ හැකියාව, අපේක්ෂිත ආදායම් මාර්ග, ණය එකතු කිරීමේ හා කළමනාකරණය කිරීමේ පුරුදු සහ අත්‍යවශ්‍ය නොවන ප්‍රාග්ධන වියදම් කල් දැමීමේ හැකියාව සහ ශක්තිමත් ආදායම් මාර්ග වැඩි කිරීමට මෙන්ම ණය ගැතියන් පිළිබඳ දැඩි පසු විපරම් ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකාරිත්වය විශ්වාස කරයි. සංචරණ සීමා ලිහිල් කිරීම සහ ව්‍යාපාරික කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් කිරීමත් සමඟ ගිණුම් වර්ෂයේ දෙවන කාර්තුව අවසන් වන විට සමාගම සිය සාමාන්‍ය ක්‍රියාකාරී මට්ටමට පැමිණෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

අවදානම් සහ ප්‍රතිඵල ලැබීමේ සම්භාවිතාවය නිසි ලෙස සලකා බැලීමෙන් පසු, මෙම වාර්තාව ලබා දුන් දින සිට ඉදිරි මාස 12 තුළදී ව්‍යාපාරය අඛණ්ඩව කරගෙන යාමට සහ සංචරණ සීමා දැමීමෙන් ඇතිවන අවදානම් අවම කිරීමට සමාගමට ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් සහ ව්‍යාපාර සැලසුම් තිබීම ගැන අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් වේ.

විදේශ විනිමය අවදානම, ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම යන අවදානම් අවම කිරීමට කළමනාකරණය සැලසුම් කරන ආකාරය සහ එහි බලපෑම මූල්‍ය ප්‍රකාශන සඳහා වෙනම සටහන් ලෙස හෙළිදරව් කෙරේ.

2.2 විදේශ විනිමය පරිවර්තනය

(අ) ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල්

මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් අයිතමයන් මිනිනු ලබන්නේ සමාගම ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් උපයෝගී කරගනිමිනි (ක්‍රියාකාරී මුදල්) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරනු ලබන්නේ සමාගමේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් වීකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් ය.

(ආ) ගනුදෙණු සහ ශේෂයන්

ගනුදෙණු සිදු වූ දිනවල විනිමය අනුපාත උපයෝගී කරගනිමින් විදේශ මුදල්වලින් සිදු වූ ගනුදෙනු ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කෙරේ. එවැනි ගණුදෙනු පියවීමෙන් සහ විදේශ වත්කම් වල වසර අවසානයේ දී නියම කරන ලද මුදල් වත්කම් හා බැරකම් විනිමය අනුපාත වලට පරිවර්තනය කිරීමෙන් සිදු වන විදේශ විනිමය ලාභ හා පාඩු සාමාන්‍යයෙන් විස්තීර්ණ ආදායමක් ලෙස හඳුනා ගැනේ. මුදල් ප්‍රවාහ ආරක්ෂණය සඳහා සුදුසුකම් ලැබීමට සහ ශුද්ධ ආයෝජන ආරක්ෂණය සඳහා සුදුසුකම් ලැබීමට හෝ විදේශීය මෙහෙයුමක ශුද්ධ ආයෝජනයෙන් කොටස් හිමිකාරිත්වයක් ලැබීමට ඒවා සම්බන්ධ නම් එවැනි විදේශ විනිමය ලාභ හා පාඩු කොටස් වශයෙන් කල් දමා ඇත.

ණය ගැනීම් සහ මුදල් හා මුදල් වලට සමාන විදේශ විනිමය ලාභ හා පාඩු "මූල්‍ය ආදායම හෝ පිරිවැය" යටතේ ණය ගැනීම් සම්බන්ධ විදේශ විනිමය ලාභ හා පාඩු සහ මුදල් සහ මුදල් සමාන දෑ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ "මූල්‍ය ආදායම හෝ පිරිවැය" යටතේ ඉදිරිපත් කර ඇත. අනෙකුත් සියළු විදේශ විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෝ "වෙනත් ලාභ/(අලාභ) ශුද්ධ යටතේ දක්වා ඇත." වෙනත් ශුද්ධ (පාඩු) / ලාභ) තුළ ඇති විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ ඉදිරිපත් කෙරේ.

සාධාරණ අගය තීරණය කළ දිනයේ විනිමය අනුපාත උපයෝගී කරගනිමින් විදේශීය මුදලින් ඇති මුදල්මය නොවන සාධාරණ අගයෙන් පරිවර්තනය කෙරේ. සාධාරණ වටිනාකමකින් යුත් වත්කම් හා බැරකම් පිළිබඳ පරිවර්තන වෙනස්කම් සාධාරණ වටිනාකම ලාභයේ හෝ අලාභයේ කොටසක් ලෙස වාර්තා වේ. උදාහරණයක් වශයෙන්, මුදල් නොවන වත්කම් සහ වගකීම් වල පරිවර්තන වෙනස්කම් සාධාරණ ආදායම් ලාභයේ හෝ අලාභයේ කොටසක් ලෙස

විස්තාරණ ආදායමෙන් හඳුනාගෙන ඇති අතර වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ ලෙස වර්ගීකරණය කර ඇති කොටස් වැනි මුදල් නොවන වත්කම් වල පරිවර්තන වෙනස්කම් වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනා ගනේ.

2.3 වර්තමාන සහ විලම්බිත ආදායම් බදු

කාල සීමාව සඳහා වන බදු වියදම වර්තමාන සහ විලම්බිත බදුවලින් සමන්විත වේ. අපේ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අඳාල වන හෝ සෘජුවම ප්‍රාග්ධනයෙහි හඳුනා ගැනීමද හැර බදු හඳුනාගනු ලබන්නේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයෙහිය. හෝ සෘජුවම ප්‍රාග්ධනයෙහි පිළිගත් අයිතමයන්ට අදාළ වන තාක් දුරට, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ ය. මෙම අවස්ථාවෙහිදී, බද්ද පිළිවෙලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් හෝ සෘජුවම හිමිකමක් ලෙස පිළිගනු ලැබේ. වර්තමාන ආදායම් බදු ගාස්තුව ගණනය කරනු ලබන්නේ වාර්තා කරන දිනයේදී සම්මත කරන ලද හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කරන ලද බදු නීති පදනම් කරගෙන ය.

අදාළ බදු රෙගුලාසි අර්ථ නිරූපණයට භාජනය වන අවස්ථා සම්බන්ධයෙන් කළමනාකරණය විසින් බදු වාර්තා වල ඇති තොරතුරු වරින් වර තක්සේරු කරයි. බදු අධිකාරීන්ට ගෙවීමට අපේක්ෂා කරන මුදල් ප්‍රමාණයන් මත සුදුසු අවස්ථාවන්හිදී ප්‍රතිපාදන වෙන් කරනු ලැබේ.

වත්කම් හා බැරකම් වල බදු පදනම් අතර තාවකාලික වෙනස්කම් සහ ඒවා මූල්‍ය ප්‍රකාශන වල හඳුනාගන්නා අගයන් මත වගකීම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත ආදායම් බද්ද හඳුනාගනු ලැබේ.

කෙසේ වෙතත්, විලම්බිත බදු වගකීම් කිරීතිනාමය මූලික හඳුනාගැනීමකින් හඳුනාගනු නොලැබේ; ගනුදෙනුවකදී වත්කම් හෝ වගකීම් මුලින් හඳුනා ගැනීමෙන් ව්‍යාපාර සංයෝජනයක් හැර වෙනත් ගනුදෙනුවකදී ගිණුම්කරණයට හෝ බදු ගෙවිය යුතු ලාභයට හෝ අලාභයට බලපාන්නේ නැතිනම් විලම්බිත ආදායම් බදු හඳුනා නොගනේ. වාර්තා කරන ලද දිනට අදාළව බලපැවැත්වූ හෝ සැලකිය යුතු ලෙස බලාත්මක කර ඇති බදු අනුපාත (සහ නීති) උපයෝගී කරගනිමින් විලම්බිත ආදායම් බදු තීරණය කරනු ලබන්නේ අදාළ විලම්බිත ආදායම් බදු වත්කම් උපලබ්ධි වන විට හෝ විලම්බිත ආදායම් බදු වගකීම පියවන විටය.

විලම්බිත ආදායම් බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් ප්‍රයෝජනයට ගත හැකි අනාගත බදු අය කළ හැකි ලාභයක් ලැබීමට ඉඩ ඇති තාක් දුරට පමණි. වර්තමාන බදු වගකීම් වලට වරෙහිව වත්මන් බදු වත්කම් පියවා ගැනීම සඳහා නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි අයිතියක් ඇති විට සහ විලම්බිත ආදායම් බදු වත්කම් හා වගකීම් එකම බදු අධිකාරිය විසින් අය කරනු ලබන ආදායම් බදුවලට අදාළ වන විට විලම්බිත ආදායම් බදු වත්කම් හා වගකීම් පියවනු ඇත

2.4. තොග

යල් පැන ගිය සහ සෙමින් සංචලනය වන අයිතමයන් සඳහා නියමිත අඩු කිරීම් වලින් පසු පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් අඩු අගයට තොගය ගණනය කෙරේ.

2003 දෙසැම්බර් 31 දිනට පෙර මිලදී ගත් ආ ගිනි නිවීමේ උපකරණ සඳහා වූ අමතර කොටස් සහ පාරිභෝගික ද්‍රව්‍ය තක්සේරුවක් මත පදනම් වූ අතර පසුව බර තැබූ සාමාන්‍ය අගයට ගණනය කරන ලදී.

තොග එහි වර්තමාන ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය හඳුනා ගනු ලබන්නේ ඉන්ධන හැර බර තැබූ සාමාන්‍ය අගයට මත වන අතර එය මුලින්, ප්‍රථම-ලැබීම්-ප්‍රථම-නිකුතු ක්‍රමයට (FIFO) අගය කෙරේ.

වසර 10 කටත් වැඩි කාලයක් සංචලන නොවූ සියලුම තොග සඳහා සමාගම ප්‍රතිපාදන සිදුකර ඇත.

2.5. වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ

වෙළඳ ණය මුලින් සාධාරණ අගයට හඳුනාගත් අතර පසුව හානිවීම් සඳහා ප්‍රතිපාදන අඩුකර ඵලදායී පොලී ක්‍රමයක් භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන ඇත.

වෙනත් ලැබීම් බොල්ණය හා අඩමාන ණය සඳහා වෙන්කිරීමකින් පසු පිරිවැයට හඳුනා ගනු ලැබේ.

2.6. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යනු අතැති මුදල්, ඉල්ලූම් තැන්පතු සහ කෙටිකාලීන අධික ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන ලෙස අර්ථ දක්වා ඇති අතර ඒවා ක්ෂණිකව මුදල් බවට පහසුවෙන් පරිවර්තනය කළ හැකි අතර වටිනාකම වෙනස් වීමේ අවදානම සුළු වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා, මුදල් සහ මුදල් සමාන දෑ ලෙස අතැති මුදල් හා, බැංකු අයිරා සහ බැංකු වල තැන්පතු වලින් ශුද්ධ අගය හඳුනා ගනු ලැබේ. කෙටි කල් පිරිමි සහිත ආයෝජන එනම් අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු කාලයක් තුළ කල් පිරෙන ආයෝජන මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

2.7. දේපල, පිරියත සහ උපකරණ

සියළුම දේපල, පිරියත සහ උපකරණ මුලින් පිරිවැයට හඳුනාගෙන ඇති අතර ඓතිහාසික පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ පසු අගයට දක්වා ඇත. ඓතිහාසික පිරිවැයට අයිතමයන් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම අදාළ වන වියදම් ඇතුළත් වන අතර අයිතමය කඩා බිඳ දැමීමේ හා පැවතුණු ස්ථානයෙන් ඉවත් කිරීමේ හා එම ස්ථනය ප්‍රතිෂ්ඨාපනය කිරීමේ පිරිවැය, අයිතමයක් අත්පත් කර ගැනීමේදී හෝ යම් තොග නිෂ්පාදනය කිරීම හැර වෙනත් අරමුණු සඳහා යම් කාල පරිච්ඡේදයක් තුළ අයිතමයක් භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගමකට දැරීමට සිදු විය හැකි වගකීම් පිළිබඳ මූලික ඇස්තමේන්තු ද එයට ඇතුළත් වේ.

සමාගම විසින් ඉදි කරන ලද වත්කම් සඳහා දරණ ලද පිරිවැය එනම් ද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රමය සහ නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය කොටසක් ඇතුළත් වේ.

අයිතමය හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා ඒමට ඉඩ ඇති විට සහ වත්කමෙහි පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකි විට, වත්කමට අදාළ පසුකාලීන පිරිවැය වත්කමෙහි ධාරණ අගයට ඇතුළත් කර හෝ සුදුසු නම්, වෙනම වත්කමක් ලෙස පිළිගෙන අගය කරනු ලැබේ.

ප්‍රතිස්ථාපනය කරන ලද කොටස්වල ධාරණ අගය හඳුනා නොගනේ. සියලුම අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු වියදම් සඳහා ඒවා දරන ලද මූල්‍ය වර්ෂය තුළදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනේ.

දිගු කාලීන ප්‍රාග්ධන ව්‍යාපෘති වල පිරිවැය එම ප්‍රාග්ධන ව්‍යාපෘති තවමත් අවසන් නොමැති නම් එම වත්කම් ප්‍රයෝජනයට ගැනීමට හැකිවන තෙක් කෙරිගෙන යන වැඩ ලෙස ඉදිරියට ගෙන යනු ලැබේ.

දේපල, පිරියත සහ උපකරණ ප්‍රයෝජනයට ගන්නා විට එය ක්ෂය කිරීම ආරම්භ වන අතර එම කාලය තුළ අයිතමය නිෂ්ක්‍රීයව පැවතුනද එය ගිණුම්වලින් ඉවත් කරන තුරු පවතිනු ඇත. අයිතමයේ මුළු පිරිවැය හා සැසඳීමේදී සැලකිය යුතු වටිනාකමක් ඇති දේපල, පිරියත සහ උපකරණ

අයිතමයක සෑම කොටසක්ම වෙන වෙනම ක්ෂය කළ යුතුය. ඉඩම් ක්ෂය නොකෙරේ. සෙසු වත්කම් වල ක්ෂය වීම ගණනය කරනු ලබන්නේ ඒවායේ ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය තුළ ඒවායේ පිරිවැය බෙදා වෙන් කිරීම සඳහා සරල මාර්ග ක්‍රමයට ය.

වත්කම් වල ඵලදායී ජීව කාලය පහත පරිදි ඇස්තමේන්තු කර ඇත:

ගොඩනැගිලි	අවුරුදු 50 ට වැඩි
පිරියත සහ යන්ත්‍රෝපකරණ	අවුරුදු 04 සිට 20 දක්වා
මෝටර් වාහන	අවුරුදු 04 සිට 15 දක්වා
ලී බඩු, සවි කිරීම් සහ කාර්යාල උපකරණ	අවුරුදු 08ට වැඩි
සන්නිවේදනය සහ ගඟන නාවික උපකරණ	අවුරුදු 05 සිට 10 දක්වා
වෙනත් උපකරණ	අවුරුදු 08 කට වැඩි
ගුවන්තොටුපළ යටිතල පහසුකම්	අවුරුදු 08 සිට 50 දක්වා

වත්කම්වල ධාරණ අගය ඇස්තමේන්තුගත උපලබ්ධි අගයට වඩා වැඩි නම් එහි ධාරණ අගය වහාම එහි අය කර ගත හැකි වටිනාකමට ලියා හැරිය යුතුය.

සෑම ප්‍රධාන සුපරීක්ෂණයක්ම සිදු කරන විට, වත්කම් හඳුනා ගැනීමේ නිර්ණායක සපුරාලන්නේ නම් එහි පිරිවැය පිරියත සහ උපකරණවල ධාරණ අගය අනුව හඳුනා ගනේ.

දේපල, පිරියත සහ උපකරණ අයිතමයක් භාවිතයෙන් ඉවත් කිරීමේදී හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් බලාපොරොත්තු නොවන අවස්ථාවක දී හඳුනාගැනීම නතර කෙරේ. වත්කම් හඳුනා ගැනීම අත්හිටුවීමේදී මතුවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් (ශුද්ධ ඉවතලන ආදායමේ සහ වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස ගණනය කෙරේ) වත්කම ඉවත් කළ වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට ඇතුළත් වේ.

වත්කම් වල සුන්බුන් අගය, ඵලදායී ජීව කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රම සමාලෝචනය කර සුදුසු ආකාරය අනුව ගැලපීම් සිදුකොට සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේදී සමාලෝචනය කෙරේ.

වත්කම් විකුණා දැමීමේ ලාභ සහ අලාභ තීරණය කරනු ලබන්නේ අදාළ වත්කමේ විකුණුම් ආදායම එහි ධාරණ අගය සමඟ සංසන්දනය කිරීමෙන් වන අතර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ වෙනත් ආදායම් යටතේ හඳුනා ගනේ.

දේපල, පිරියත සහ උපකරණවල අපහායනය

දේපල, පිරියත සහ උපකරණ යටතේ හඳුනා ගැනෙන වත්කම්වල අපහායනය සඳහා සමාලෝචනයක් සිදු කරනුයේ සිදුවීම් හෝ තත්වයන්හි වෙනස්වීම් හේතුවෙන් එහි ධාරණ වටිනාකම ආපසු ලබා ගත නොහැකි බව පෙන්නුම් කරන විටය. එබඳු යම් සලකුණක් තිබේ නම් සහ ධාරණ අගයන් වත්කම විකිණීමෙන් ලැබෙනු ඇතැයි අපේක්ෂා කළ හැකි ප්‍රමාණයට හෝ වත්කම භාවිතා කිරීමෙන් ඉපයිය හැකි වටිනාකමට වඩා වැඩි නම්, වත්කම් වසේ උපලබ්ධි කර ගත හැකි අගයට ලියා හරිනු ලැබේ. සමාන ස්වභාවයේ වත්කම් සඳහා කලින් සිදු කළ ප්‍රත්‍යාගණන ලාභ/පාඩු සඳහා ගැලපීමක් සිදු කිරීමේ අවශ්‍යතාවයක් නොමැති නම්, වත්කම් අපහායන පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දී වියදමක් ලෙස හඳුනා ගනේ.

2.8. ප්‍රකාශිත ප්‍රාග්ධනය

සාමාන්‍ය කොටස් හිමිකම වශයෙන් වර්ගීකරණය කර ඇත.

2.9. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් ලබා ගත් භාණ්ඩ හෝ සේවා සඳහා කළ යුතු ගෙවීම් වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ තුළ අඩංගු වේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් ඉල්ලූ විට හෝ වාර්තා කළ දින සිට වර්ෂයක් ඇතුළත ගෙවීමට බැඳී ඇති වගකීම් වේ. ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති අයිතම නම්, වාර්තා කළ දින සිට වසරක කාලයකට වඩා වැඩි කාලයක් ගෙවීම සඳහා කාලය ලැබෙන වගකීම් ය.

වෙළෙඳ හා ගෙවිය යුතු දෑ මුලින් ගණුදෙනු මිලට හඳුනාගත් අතර පසුව ඵලදායී පොලී ක්‍රමය භාවිතයෙන් බේරුම් කළ අගයට මනිනු ලැබේ.

2.10. ණය ගැනීම්

ණය ගැනීම් මුලින් හඳුනාගනු ලැබුවේ සාධාරණ වටිනා අඩකලපසු අගයයි මෙන්, ගනුදෙණු පිරිවැය අනුව ය. ණය ගැනීම් පසුව හඳුනාගනු ලබන්නේ බේරුම් කරන ලද අගය යටතේ ය; සඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් ණය ගන්නා කාල සීමාව තුළදී ලැබුණු ණය මුදල (ශුද්ධ ගනුදෙනු සඳහා වැයකළ වියදම් අඩු කළ පසු) සහ වගකීම් බේරුම් කිරීමේ අගය අතර ඕනෑම වෙනසක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දී හඳුනා ගනේ.

ණය පහසුකම් ස්ථාපිත කිරීමේදී ගෙවනු ලබන ගාස්තු ණය වල ගනුදෙනු පිරිවැය ලෙස හඳුනාගනු ලබන අතර ඒමඟින් යම් යම් පහසුකම් හෝ සියල්ලම අඩු කර ගැනීමට ඉඩ ලැබේ. මෙම අවස්ථාවෙහිදී, අඩු කිරීම් සිදු වන තුරු ණය ගෙවීම කල් දමනු ලැබේ. පහසුකම් වලින් සමහරක් හෝ සියල්ලම අඩු කළ හැකි බවට සාක්ෂි නොමැති තාක් දුරට, ණය ගෙවීම ද්‍රවශීලතාවය ලබාගැනීම සඳහා පෙර ගෙවීමක් ලෙස ප්‍රාග්ධනීකරණය කර එය අදාළ පහසුකම පවතින කාල සීමාව තුළ ගෙවනු ඇත.

2.11. ණය ගැනීමේ පිරිවැය

සුදුසුකම් ලත් වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය කිරීම සඳහා සෘජුවම අදාළ කළ හැකි සාමාන්‍ය සහ නිශ්චිත ණය පිරිවැය, ඒවා අපේක්ෂිත ප්‍රයෝජනය සඳහා සූදානම් වීමට සැලකිය යුතු කාලයක් ගත කළ යුතු වත්කම් වනවිට ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා සැලකිය යුතු ලෙස සූදානම් වන තාක් කල්, එම වත්කම් සඳහා පිරිවැයක් ලෙස එකතු කෙරේ. සුදුසුකම් ලබන වත්කම් සඳහා වැය වන තාක් කල් නිශ්චිත ණය ගැනීම් වල තාවකාලික ආයෝජනය මත උපයන ආයෝජන ආදායම ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසු වන ණය ගැනීමේ පිරිවැය වලින් අඩු කෙරේ. අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ලාභය හෝ අලාභය වශයෙන් පිළිගනු ලබන්නේ ඒවා දරා ඇති කාලය තුළ ය.

2.12. ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස සමාගමට වර්තමාන නෛතික හෝ නිර්මාණාත්මක වගකීම් ඇති විට ප්‍රතිපාදන හඳුනා ගන්නා අතර, එම වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ඇතුළත් සම්පත් ගලා ඒම, අගය විශ්වාසදායක ලෙස මැනිය හැකි වීම අවශ්‍යය. මුදල් වල කාල අගයෙහි බලපෑම ප්‍රමාණාත්මක නම්, ප්‍රතිපාදන වටිනාකම තීරණය වන්නේ අපේක්ෂිත අනාගත මුදල් ප්‍රවාහයන් බදු ගෙවීමට පෙර ඉපයුම් අනුපාතයකින් වට්ටම් කිරීමෙන් සහ මුදල් වල කාල වටිනාකම පිළිබඳ වර්තමාන වෙළෙඳපොළ

තක්සේරුව පිළිබිඹු වන ආකාරයේ ගැලපීමක් කිරීමෙන් පසුව ය. වට්ටම් කිරීම භාවිතා කරන අවස්ථාවන්හිදී, කාලය ගතවීම හේතුවෙන් සිදු කරන ප්‍රතිපාදන වැඩි කිරීම පොලී වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

2.13. විශ්‍රාමික ප්‍රතිලාභ බැඳීම්

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

නිශ්චිත දායකත්ව සැලැස්මක් යනු විශ්‍රාම වැටුප් සැලැස්මක් වන අතර එමඟින් සමාගම ස්ථාවර දායක මුදල් වෙනම ආයතනයකට ගෙවයි. වර්තමාන හා පූර්ව කාල පරිච්ඡේදයන්හි සමාගමේ සේවකයන්ට අදාළ ප්‍රතිලාභ සියළුම සේවකයින්ට ගෙවීමට අරමුදලේ ප්‍රමාණවත් වත්කම් නොමැති නම් තවදුරටත් දායක මුදල් ගෙවීමට සමාගමට නීතිමය හෝ නිර්මාණාත්මක බැඳීම් නොමැත. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු විශ්‍රාම වැටුප් සැලැස්මක් වන අතර එය දායක සැලැස්මක් නොවේ.

සාමාන්‍යයෙන් වයස, සේවා කාලය සහ වන්දි වැනි සාධක එකක් හෝ කිහිපයක් මත රඳා පවතින නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම මඟින් විශ්‍රාම යාමේදී සේවකයෙකුට ලැබෙන විශ්‍රාම වැටුප් ප්‍රමාණය විස්තර කෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ විශ්‍රාම වැටුප් සැලැස්ම සම්බන්ධයෙන් මූල්‍ය තත්ත්වය ප්‍රකාශනයේ දී වගකීම හඳුනාගනු ලබන්නේ කලාසීමාව අවසානයේදි නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගයෙන් සැලසුම් වත්කම්වල සාධාරණ අගය අඩුකිරීමෙනි.

නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම තීරණය වන්නේ, ප්‍රතිලාභ ගෙවනු ලබන මුදලේ වටිනාකමකින් යුත් උසස් තත්ත්වයේ ආයතනික බැඳුම්කරවල පොලී අනුපාත උපයෝගී කරගනිමින් ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා ඒම වට්ටම් කිරීමෙන් සහ කල් පිරීමේ කොන්දේසිවලට අදාළ විශ්‍රාම වැටුප් වගකීම එවැනි බැඳුම්කර සඳහා පුළුල් වෙළඳපොලක් නොමැති රටවල රජයේ බැඳුම්කර වල වෙලඳපොල අනුපාතය භාවිතා කෙරේ.

සමාගම විසින් නිශ්චිත ප්‍රතිලාභ වගකීම් ගණනය කිරීම සඳහා වර්ෂය සඳහා ස්වාධීන ආයුගණක තක්සේරුකරුවෙකුගේ ඇගයීම් සේවාවන් ලබාගෙන ඇත.

පළපුරුද්ද මත කරනු ලබන ගැලපීම් සහ තත්ත්ව උපකල්පන වල වෙනස් වීම් නිසා ඇතිවන තත්ත්ව ලාභ හා පාඩු ඒවා පැන නැගෙන කාල පරිච්ඡේදයේදී වෙනත් විස්තීර්ණ ආදායම හරහා හඳුනා ගැනේ.

(ආ) නිශ්චිත දායක සැලසුම්

සමාගමේ සියලුම සේවකයින් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයින් වන අතර, එම සේවකයින්ගේ මූලික වැටුපෙන් හෝ ඒකාබද්ධ වැටුපෙන් පිළිවෙලින් 12% ක් සහ 3% ක් වශයෙන් දායක වේ.

2.14. ප්‍රදාන සහ සහනාධාර

වත්කම්වලට අදාළ මුදල් ප්‍රදාන වත්කමක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පිරිවැයට හඳුනාගෙන ඇති අතර වත්කමේ ඵලදායී ආයු කාලය පුරා ක්‍රමානුකූලව විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට බැර කෙරේ.

2.15. මූල්‍ය නොවන වත්කම් වල අපහායනය

අවිනිශ්චිත ඵලදායී ජීව කාලයක් ඇති වත්කම් - නිදසුනක් වශයෙන්, කීර්තිනාමය හෝ භාවිතා කිරීමට සූදානම් තත්ත්වයක නැති අස්පෘශ්‍ය වත්කම් - ක්‍රමක්ෂය කළ නොහැකි අතර වාර්ෂිකව අපහායනය වී ඇත්දැයි සඳහා පරීක්ෂා කෙරේ. ධාරණ අගය අය කර ගත නොහැකි බව සිද්ධීන් හෝ තත්වයන් වෙනස් වීම් මඟින් පෙන්නුම් කරන සෑම අවස්ථාවකදීම ණය ගෙවීමට යටත් වන වත්කම් අපහායනය සඳහා සමාලෝචනය කෙරේ.

වත්කම්වල ආපසු අයකර ගත හැකි ප්‍රමාණය ඉක්මවන ධාරණ අගයක් ඇති විට අපහායන අලාභයක් හඳුනා ගැනේ. වත්කමේ ආපසු අය කර ගත හැකි අගය යනු වත්කමේ සාධාරණ අගයෙන් වත්කම විකිණීමට දරන පිරිවැය අඩු කළ පසු අගය හා වත්කම දැනට භාවිතා කරන අයුරෙන් ඉපයිය හැකි ආදායම යන දෙකෙන් වැඩි අගය වේ. අපහායනය තක්සේරු කිරීමේ අරමුණු සඳහා වත්කම් විවිධ මට්ටම් වලට කාණ්ඩ කර ඇති අතර ඒ කාණ්ඩ සඳහා වෙන වෙනම හඳුනාගත හැකි මුදල් ප්‍රවාහයන් ඇත (මුදල් උත්පාදන ඒකක). එක් වාර්තා කිරීමේ දිනයේදී වත්කම් අපහායනය ආපසු හැරවිය යුතුද යන්න තීරණය කිරීම සඳහා අපහායනය වූ කීර්තිනාමය හැර මූල්‍ය නොවන වත්කම් සමාලෝචනය කෙරේ.

2.16. මූල්‍ය වත්කම්

2.16.1. වර්ගීකරණය

සමාගම සිය මූල්‍ය වත්කම් පහත දැක්වෙන කාණ්ඩ වලට වර්ගීකරණය කරයි: ලාභ හෝ අලාභ ඔස්සේ ක්‍රමක්ෂය සාධාරණ අගයට හඳුනාගන්නා වත්කම් හා වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා වත්කම් වශයෙනි. මුල් හඳුනාගැනීමේදී මූල්‍ය වත්කම් වර්ගීකරණය මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලක්ෂණ සහ ඒවා කළමනාකරණය කිරීමට සමාගම භාවිතා කරන ව්‍යාපාර ආකෘතිය මත රඳා පවතී.

(අ) ක්‍රමක්ෂය පිරිවැය

වත්කම් මනිනු ලබන්නේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් මුලින්ම හඳුනාගැනීමේදී ගනු ලැබූ අගයෙන්, මූලික ආපසු ගෙවීම් අඩු කර, එම ආරම්භක මුදල සහ කල්පිරීමේ මුදල අතර ලාභ/ අලාභ වල සමුච්චිත අගය එකතු කිරීමට හෝ අඩු කිරීමට අවශ්‍ය ගැලපීම සිදු කිරීමෙන් පසු අගයට ය. සඵලදායී පොලී ක්‍රමය උපයෝගී කරගනිමින් පොලී ආදායම ගණනය කෙරෙන අතර එය ලාභ හා අලාභ තුලින් හඳුනාගනු ලැබේ.

සාධාරණ අගයෙහි වෙනස්කම් වත්කම් ගිණුම්වලින් ඉවත් කරන විට හෝ නැවත වර්ගීකරණයකට ලක් කළ විට ලාභ හා අලාභ තුළින් හඳුනා ගැනේ.

(ආ) වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් සාධාරණ අගය

ණය සහ ලැබීම් - පොලී ආදායම, අපහායන ලාභ හා අලාභ සහ විදේශ විනිමය ලාභ හා අලාභ වලින් කොටසක්, ලාභ හා අලාභ වශයෙන් හඳුනාගනු ලබන්නේ වත්කම් සඳහා ක්‍රමක්ෂය අඩු කිරීමට පසු පිරිවැයට හඳුනාගැනීමට සමාන පදනමක් මත ය. සාධාරණ අගයේ වෙනස්වීම් මුලින් වෙනත් විස්තීර්ණ ආදායමෙන් හඳුනා ගැනේ. වත්කම් ගිණුම්වලින් ඉවත් කරනවිටහෝ නැවත වර්ගීකරණය කරන විට, වෙනත් විස්තීර්ණ ආදායමෙහි කලින් හඳුනාගෙන තිබූ අතර සාධාරණ අගයන්හි වත්කම්

ලාභ හා අලාභ හරහා මූල්‍ය වත්කම් වශයෙන් නැවත වර්ගීකරණය කිරීමේදී, ඒ මත පදනම්ව සෑම විටම සාධාරණ අගයට වත්කම් මනිනු ලබන අතර වෙනත් විස්තීර්ණ ආදායමෙන් ලාභ හා අලාභය කෙරෙහි බලපැවැත්වෙන පරිදි එය ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

කොටස් වල ආයෝජනය - ආර්ථික ප්‍රතිලාභ එම ආයතනයට ගලා ඒමට ඉඩ ඇති බවත් එම මුදල විශ්වාසදායක ලෙස මැනිය හැකි බවත්, ලාභාංශ ගෙවීම් ලැබීමට ආයතනයේ අයිතියත් තහවුරු වූ විට හඳුනා ගැනේ. ලාභාංශ ලාභ හා අලාභ ඔස්සේ හඳුනාගනු ලබන්නේ ආයෝජනයේ පිරිවැයෙන් කොටසක් නැවත අයකර ගැනීම පැහැදිලිව නියෝජනය නොකරන්නේ නම් පමණි. නැතිනම් ඒවා වෙනත් විස්තීර්ණ ආදායමෙහි ඇතුළත් කළ යුතු ය. සාධාරණ අගයේ වෙනස්වීම් වෙනත් විස්තීර්ණ අදායම් ප්‍රකාශයෙහි හි හඳුනාගෙන ඇති අතර වත්කම විකිණීම හෝ අපහායනය වීම සිදු වුවද කිසි විටෙකත් ලාභ හා අලාභ ලෙස නැවත වර්ගීකරණය නොකෙරේ.

(ඇ)ලාභ හා අලාභ තුළින් සාධාරණ අගය

වෙනත් විස්තීර්ණ ආදායම් තුළින් ක්‍රමක්ෂය අඩු කරන ලද පිරිවැය හෝ සාධාරණ අගය සඳහා වන නිර්ණායකයන් සපුරාලන්නේ නැති වත්කම් ලාභ හා අලාභ ඔස්සේ සාධාරණ අගයට මනිනු ලැබේ.

2.16.2. හඳුනා ගැනීම හා මිනුම් කිරීම

මූල්‍ය වත්කම් නිතිපතා මිලදී ගැනීම් සහ විකිණීම ලභ හා අලාභ ගිණුම හරහා සමාගම වත්කම් මිලදී ගැනීමට හෝ විකිණීමට එකඟ වූ දිනයේදී හඳුනා ගැනේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනානොගන්නා මූල්‍ය වත්කම් මුලින් සාධාරණ අගයට ගනුදෙනු පිරිවැය එකතු කර මුලින් හඳුනා ගනු ලැබීය. සාධරණ අගයක් දරන මූල්‍යවත්කම සාධාරණ වටිනාකමට ලාභ අලාභ හි හඳුනා ගන්නා අතර ආයෝජන වලින් මුදල් ගලා ඒමේ අයිතිය කල් ඉකුත් වූ විට හෝ මාරු කළ විට සහ සමාගමේ සියළුම අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු වශයෙන් මාරු කළ විට මූල්‍ය වත්කම් ගිණුම්වලින් ඉවත් කෙරේ.

"ලාභ හෝ පාඩු තුළින් සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම්" කාණ්ඩයේ සාධාරණ අගයේ වෙනස් වීම් හේතුවෙන් ඇති වන ශුද්ධ ලාභ හෝ අලාභ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන කාල සීමාව තුළ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කෙරේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට හඳුනාගන්නා මූල්‍ය වත්කම් වලින් ලැබෙන ලාභාංශ ආදායම සමාගමට ගෙවීම් ලැබීමේ අයිතිය තහවුරු වූ විට වෙනත් ආදායම් යටතේ ලෙස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ දී හඳුනාගනු ලැබේ.

විකිණීම සඳහා යොදා ගත හැකි යැයි වර්ගීකරණය කර ඇති මූල්‍ය හා මූල්‍ය නොවන සුරැකුම්පත් වල සාධාරණ අගයෙහි වෙනස්වීම් වෙනත් විස්තීර්ණ අදායමක් ලෙස හඳුනා ගැනේ.

2.17. මූල්‍ය උපකරණ හිලව් කිරීම

හඳුනාගත් ප්‍රමාණය හිලව් කිරීමට නීතියෙන් බලකළ හැකි අයිතියක් ඇති විට සහ ඒ සමගම වගකීම පියවූ විට මූල්‍ය වත්කම් සහ වගකීම් එකිනෙකට හිලව් වන අතර ශුද්ධ අගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වාර්තා කරයි. නෛතිකව බලාත්මක කිරීමේ අයිතිය අනාගත සිදුවීම් මත අසම්භාව්‍යයක් නොවියයුතු අතර සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල දී මෙන්ම සමාගමේ හෝ අදාළ පාර්ශවයන්ගේ පැහැර හැරීම, බුන්වත්වීම හෝ සමාගම හෝ සමාන තැනැත්තාගේ බංකොලොත් වීම යන සිදුවීම්වල දී බලාත්මක වියයුතුය.

2.18. මූල්‍ය වත්කම් අපහායනය

සමාගම මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ අපහායනය වීම පිළිබඳව විෂයාත්මක සාක්ෂි ඇත්ද යන්න සෑම වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසානයේදීම තක්සේරු කරයි. මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් කාණ්ඩ වල අගය අඩුවීමක් හෝ අගය අඩුවීම අනුව පාඩුවක් මූලිකව හඳුනා ගත් වත්කම් (පාඩුවක් සිදුවන අවස්ථාවක්) සහ පාඩු සිදුවීමක් (හෝ සිදුවීම්) වැනි සිදුවීම් ගණනාවක ප්‍රතිඵලයක් ලෙස ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ මත බලපාන්නේ නම් එය විශ්වාසදායි ලෙස තක්සේරු කළ හැකිය.

අපහායනය වීමේ සාක්ෂිවලට ණය ගැතියන් හෝ

ණයගැති කාණ්ඩ වල සැලකිය යුතු මූල්‍ය අපහසුතා, පොලී හෝ මුල් මුදල ගෙවීම පැහැර හැරීම හෝ නොගෙවා සිටීම, බුන්වත් වීමේ සම්භාවිතාව හෝ වෙනත් මූල්‍ය අපහසුතා ඇතුළත් වන අතර නිරීක්ෂණය කළ දත්ත මඟින් හිඟ මුදල්වල වෙනස්වීම් හෝ ප්‍රමාදවීම් සමඟ සම්බන්ධිත ආර්ථික කොන්දේසි වැනි අනාගත මුදල් ප්‍රවාහ වල සැලකියයුතු අඩුවීමක් ආදිය පෙන්නුම් කිරීම ඇතුළත් වේ.

සියලු ණය සුරැකුම්, ණය සහ වෙළෙඳ ලැබිය යුතු දෑවල අපේක්ෂිත ණය අලාභ මාස 12ක හෝ ජීව කාල පදනමෙන් වාර්තා කළ යුතු යැයි ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 9 (SLFRS 09) මඟින් ඉල්ලා සිටීයි. වෙළෙඳ ලැබියයුතු දෑ සඳහා පාඩු දීමනාව නිතරම මනිනු ලබන්නේ අපේක්ෂිත ණය පාඩු ජීවකාලය (ECL) ට සමාන ප්‍රමාණයකටය. මූලික හඳුනාගැනීමේ සිට සහ අපේක්ෂිත ණය පාඩු තක්සේරු කරන විට මූල්‍ය වත්කමක ණය අවදානම සැලකියයුතු ලෙස වැඩි වී ඇද්ද යන්න තීරණය කිරීමේ දී සමාගම අධික පිරිවැයක් හෝ උත්සාහයක් නොමැතිව ලබාගත හැකි අදාළ සාධාරණ සහ සහයවන තොරතුරු සලකා බලයි. සමාගමේ ඓතිහාසික අත්දැකීම් සහ අනාගත තොරතුරුද ඇතුලුව දැනුවත්වූ ණය තක්සේරු කිරීම් මත පදනම් වූ ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු මෙහි ඇතුළත් වේ. දින 365කට වැඩි ණය සඳහා මූල්‍ය වත්කමක ණය අවදානම සැලකියුතු ලෙස වැඩිවේ යයි සමාගම උපකල්පනය කරයි.

2.19. මූල්‍ය වගකීම්

සමාගමේ මූල්‍ය වගකීම් යටතට වෙළෙඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ, බැංකු ණය සහ අනෙකුත් ණය ගැනීම් සහ අහිතකර මූල්‍ය ඉදිරි ගිවිසුම් ආදිය ඇතුළත් වේ. ලාභ හෝ පාඩු හරහා සාධාරණ අගයකට දක්වන මූල්‍ය වගකීම් හැර අනෙකුත් සියලු මූල්‍ය වගකීම් ආරම්භයේ දී ඒවායේ සාධාරණ වටිනාකමින් හඳුනාගන්නා අතර පසුව වට්ටම් කිරීමේ ප්‍රතිඵලය නොවැදගත් නම් සඵල පොලී ක්‍රමය භාවිත කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන අතර ඒ අනුව ඒවා පිරිවැයට සඳහන් කරනු ලබයි.

2.20. ආදායම් හඳුනාගැනීම

ආදායම හඳුනාගැනීම කරනුයේ සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම සිදු වේයැයි අපේක්ෂා කළ හැකි ආදායම් හා ඒ ආශ්‍රිතව ඇතිවන හෝ

ඇතිවිය හැකි වියදම් විශ්වාසයෙන් යුතුව මැනිය හැකි ප්‍රමාණයට පමණි. ආදායම ලැබූ ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය හෝ වෙළඳ වට්ටම් හෝ විකුණුම් බදුවල ලැබිය යුතු ශුද්ධ අගය මත මනිනු ලැබේ. ආදායම හඳුනාගැනීමේ අරමුණ සඳහා පහත සඳහන් විශේෂිත නිර්ණායකයන් භාවිතා කරයි.

අ) සේවා සැපයීමේදී

සේවා සැපයීමෙන් ලැබුණු ආදායම එම සේවාව සැපයූ හෝ ක්‍රියාත්මක කළ ගිණුම් කාලපරිච්ඡේදය තුළදී හඳුනාගනියි.

ආ) පොලිය

අය කර ගැනීමේ අවිනිශ්චිතතාවයක් නොමැතිනම් පොළිය උපචිත ආකාරයෙන් හඳුනා ගනියි.

ඇ) බදු කුලී ආදායම්

කුලී ආදායම කුලී ගිවිසුමෙහි විස්තර කොට ඇති පරිදි උපචිත පදනම මත හඳුනා ගනී.

ඈ) වරලත් ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු

අදාල ගිවිසුමේ හරයට අනුකූලව වරලත් (පැවරුම්) ගාස්තු සහ අනුග්‍රාහක ගාස්තු උපචිත පදනම මත හඳුනා ගනියි.

ඉ)ජාත්‍යන්තර/දේශීය ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම්

ගොඩබැසීමේ සහ නැවතුම් ආදායම, අවම ගාස්තු සහ ගුවන් තොටුපොළේ අංගනයෙහි නැවතුම් කාලයට යටත්ව උපරිම ඉහළ නැංවීමේ බර මත පදනම්වන අතර උපචිත පදනම මත හඳුනාගනියි.

ඊ) හරහා පියාසර ආදායම

හරහා පියාසර ආදායම උපරිම ඉහළ නැංවීමේ බර හා පදනම්ව ගණනය කරන අතර උපචිත පදනම මත හඳුනා ගනියි.

උ) ගුවන් පාලම් ආදායම

ගුවන් පාලම් ආදායම ගුවන් පාලම පාවිච්චි කරන කාලය සහ ගුවන් යානා වර්ගය මත පදනම්ව ගණනය කරයි. ආදායම උපචිත පදනම මත හඳුනා ගනියි.

ඌ) ගුවන් යානයට නැඟීමේ බදු

ගුවන් යානයට නැඟීමේ බදු ශ්‍රී ලංකා සිවිල් ගුවන් අධිකාරිය විසින් මූල්‍ය පනතට අනුව එකතු කරනු ලබන අතර ඇමෙරිකා ඩොලර් 9.75ක් ලෙස ගු.ගු.සේ. සමාගමට ප්‍රේෂණය කරයි. ආදායම මුදල් පදනම මත හඳුනා ගනියි.

එ) ඇතුළුවීමේ අවසරපත් ගාස්තු

(වාහන) නැවතුම් ගාස්තු සහ දැනුම් දීම් පුවරු

ආදායම හඳුනා ගැනීම සහ එකතු කිරීම මුදල් පදනම මත සිදුවේ.

ඒ) වෙනත්

විවේකාගාර ආදායම් ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනම මත හඳුනා ගනියි. දැවීමේ උපකරණ ආදායම් උපචිත පදනම මත හඳුනා ගනියි. අනෙකුත් ආදායම් මූලාශ්‍ර ගෙවීමේ ක්‍රමය අනුව මුදල් සහ උපචිත පදනමෙන් හඳුනා ගනියි.

3. මූල්‍ය අවදානම් කළමනාකරණය

3.1 මූල්‍ය අවදානම් සාධක

සමාගමේ ක්‍රියාකාරකම් විවිධ මූල්‍ය අවදානම් වලට විවෘතව පවතී. එනම් වෙළෙඳපොළ අවදානම (විදේශ මුදල් අවදානම්, මුදල් ප්‍රවාහ සහ සාධාරණ අගයේ පොලී අනුපාත අවදානම ඇතුළුව), ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම වේ.

(අ)වෙළෙඳපොළ අවදානම

(i) විදේශ විනිමය අවදානම

සමාගම විනිමය අනුපාතයන්හි උච්ඡාවචනයන්ට සංවේදී වන අතර ප්‍රධාන වශයෙන් එක්සත් ජනපද ඩොලර් (ඇ.ඩො.), යුරෝ සහ ජපන් යෙන් වලට අනුව ශ්‍රී ලංකා රුපියලේ උච්ඡාවචනයන්ට විවෘතව පවතී. සමාගමේ ක්‍රියාකාරී මුදල් වන්නේ ශ්‍රී ලංකා රුපියල් වන අතර බොහෝ ගනුදෙණු සිදුකරනු ලබන්නේ රුපියල් වලිනි. අනෙකුත් මුදල් බොහොමයක් විදේශ ණය ගෙවීමේ අරමුණු සඳහා විදේශ මුදල් ලෙස සැලකේ. සමහර වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මෙන්ම වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු දෑ ද විදේශ මුදලින් සිදුකරයි.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කෙරෙන බැවින්, පරිවර්තන අවදානම සහ ගනුදෙනු අවදානම යන දෙකෙන්ම විදේශ විනිමය උච්ඡාවචනයන්ගේ බලපෑමට ලක්වෙයි. විදේශ මුදල්වල විනිමය අනුපාත වෙනස්කම් සමාගමේ ලාභ හෝ පාඩු කෙරෙහි බලපායි. උදාහරණයක් ලෙස එක්සත් ජනපද ඩොලරයට වරෙහිව ශ්‍රී ලංකා රුපියල දුර්වල වීම භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව හරහා විදේශ මුදලින් ලබාගෙන ඇති ණය ගෙවීමට යාමේදී සමාගමේ ලාභදායීතාවයට අහිතකර ලෙස බලපෑ හැකිය.

ඇමෙරිකානු ඩොලර්, යූරෝ සහ ජපන් යෙන් වලට වරෙහිව අනෙකුත් සියළු විචිල්‍යයන් නොවෙනස්ව තිබියදී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකයෙහි වියහැකි සාධාරණ වෙනස්කම්වලට සමාගමේ සංවේදීතාවය පහත දැක්වෙන වගුවෙන් පෙන්නුම් කරයි. සමාගමේ මූල්‍ය උපකරණ සමාගමේ ඉදිරිපත් කරන සහ ලිඛිත මුදල් වන ශ්‍රී ලංකා රුපියල්වලින් නම් කල පසු ඇමෙරිකානු ඩොලර්, යූරෝ සහ ජපන් යෙන් විනිමය අනුපාතයන්ගේ වෙනස්වීම්වල බලපෑම පහත වගුවෙන් දක්වා ඇත.

(ii) මුදල් ප්‍රවාහය සහ සාධාරණ වටිනාකමේ පොලී අනුපාත අවදානම

සමාගමේ පොලී අනුපාත අවදානම ඇ.ඩො., යූරෝ, සහ ජපන් යෙන් මඟින් ගනු ලැබූ දීර්ඝකාලීන ණයගැනීම්වලින් පැන නඟියි. මේවා ස්ථාවර අනුපාතයකට නිකුත් කරනු ලබන අතර එමඟින් ණය ගැනීම මත මුදල් ප්‍රවාහ පොලී අනුපාත අවදානම ලිහිල් කරයි. මෙය තවදුරටත් විචල්‍ය අනුපාතවලට මුදල් දැරීම මඟිනුත් ලිහිල් වෙයි. ස්ථාවර අනුපාතයන්ට නිකුත් කළ ණය ගැනීම සමාගම සාධාරණ වටිනාකම් පොලී අනුපාත අවදානමකට නිරාවරණය කරයි.

සමාගම මෙම පොලී අනුපාතයන්ගේ චලනය පසුගිය වසර පුරාම සලකා බැලූ අතර පොලී අනුපාතයන්ගේ මෙම චලනය හිමිකම මත ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන බවට නිගමනය කර ඇත.

(ආ) ණය අවදානම

ණය අවදානම මතුවන්නේ බාහිර පාර්ශවයන්ගේ වෙළෙඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ මඟිනි.

(ඇ) ද්‍රවශීලතා අවදානම

මුදල් ප්‍රවාහ පුරෝකථනය මූල්‍ය අංශය විසින් ක්‍රියාත්මක කරයි. මෙහෙයුම් අවශ්‍යතාවලට සෘජුව මුදල් ඇති බවට සහතික කිරීමට සමාගමේ ද්‍රවශීල අවශ්‍යතා පුරෝකථනය කිරීම මූල්‍ය අංශය මඟින් අධීක්ෂණය කරයි. එවැනි පුරෝකථන සමාගමේ ණය මූල්‍යයනය සැලසුම්, අනුකූලතා සම්මුතීන්, අභ්‍යන්තර ශේෂ පත්‍ර අනුපාත ඉලක්ක සමඟ අනුකූල වේ නම් සහ සමඟ නම් බාහිර රෙගුලාසි සහ නෛතික අවශ්‍යතා - උදාහරණයක් ලෙස මුදල් සීමාවන් සැලකිල්ලට ගනියි.

කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා පවත්වා ගන්නා ප්‍රමාණයට වඩා ඇති සමාගම සතු අතිරික්ත මුදල් ද්‍රවශීලතා අවදානම ලිහිල් කර ගැනීමට රජයේ සුරැකුම්වල ආයෝජනය කරයි.

3.2 ප්‍රාග්ධන අවදානම කළමණාකරණය

ප්‍රාග්ධනය කළමනාකරණය කිරීමේදී සමාගමේ අරමුණු වන්නේ කොටස් හිමියන් වෙත ප්‍රතිලාභ ලබාදීම පිණිස සමාගම අඛණ්ඩව පවත්වා ගැනීමේ හැකියාව ආරක්ෂා කිරීම, අනෙකුත් උනන්දු පාර්ශවකරුවන්ට ප්‍රතිලාභ ලබා දීම සහ ප්‍රාග්ධන පිරිවැය අඩු කිරීම සඳහා ප්‍රශස්ත ප්‍රාග්ධන ව්‍යුහයක් පවත්වා ගැනීම වේ.

ප්‍රාග්ධන ව්‍යුහය

ප්‍රාග්ධන ව්‍යුහය ගැලපීම හෝ පවත්වා ගැනීම පිණිස සමාගම කොටස් හිමියන් වෙත ගෙවනු ලැබූ ලාභාංශ ගැලපීම, කොටස් හිමියන් වෙත ගෙවනු ලබන ප්‍රතිලාභ ගැලපීම, නව කොටස් නිකුත් කිරීම හෝ ණය අඩුකිරීම සඳහා වත්කම් විකිණීම් කරනු ඇත. සමාගම ලාභාංශ ප්‍රකාශයට පත් කිරීමට පෙර ලාභාංශ අනුපාතය පවත්වා ගැනීම පිණිස බැන්වත් බව තක්සේරු කරයි. කර්මාන්තයේ අනෙකුත් ආයතන සමඟ සමපාත වීමට සමාගම කෝලන අනුපාතය පදනම්න් ප්‍රාග්ධනය අධීක්ෂණය කරයි. මෙම අනුපාතය මුළු ණය, මුළු ප්‍රාග්ධනයෙන් බෙදීමෙන් ගණනය කරයි. ණය ලෙස ගණනය කරනුයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන "ජංගම සහ ජංගම නොවන" මුළු ණය ගැනීම වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන පරිදි මුළු

ප්‍රාග්ධනයෙන් බෙදීමෙන් ගණනය කරයි. ණය ලෙස ගණනය කරනුයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන "ජංගම සහ ජංගම නොවන" මුළු ණය ගැනීම් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වෙන පරිදි මුළු ප්‍රාග්ධනය " හිමිකම" ලෙස ගණනය කරයි.

ශ්‍රී ලංකා රුපියලට වරෙහිව ඇ.එ. ඩොලර් විනිමය අනුපාතයේ සංවේදීතාවය

	2020 ලාභයේ වැඩිවීම/(අඩුවීම) ශ්‍රී ලංකා රුපියල්	2019 ලාභයේ වැඩිවීම/(අඩුවීම) ශ්‍රී ලංකා රුපියල්
ඇ.එ. ඩොලර් වලින් 10% ක වැඩිවීම / අඩුවීම (2019 - 10%)	**(90,301,302)**	33,954,668
ඇ.එ. ඩොලර් වලින් 15% ක වැඩිවීම / අඩුවීම (2019 - 15%)	**(135,451,953)**	50,932,002
ඇ.එ. ඩොලර් වලින් 20% ක වැඩිවීම / අඩුවීම (2019 - 20%)	**(180,602,604)**	67,909,336

ශ්‍රී ලංකා රුපියලට වරෙහිව යුරෝ ඩොලර් විනිමය අනුපාතයේ සංවේදීතාවය

	2020 ලාභයේ වැඩිවීම/(අඩුවීම) ශ්‍රී ලංකා රුපියල්	ලාභයේ වැඩිවීම (අඩුවීම) 2019 ශ්‍රී ලංකා රුපියල්
යුරෝ වලින් 10% ක වැඩිවීම / අඩුවීම (2019 - 10%)	**(1,212,899)**	384,807
යුරෝ වලින් 15% ක වැඩිවීම / අඩුවීම (2019 - 15%)	**(1,819,349)**	577,211
යුරෝ වලින් 20% ක වැඩිවීම / අඩුවීම (2019 - 20%)	**(2,425,798)**	769,614

ශ්‍රී ලංකා රුපියලට වරෙහිව ජපන් යෙන් විනිමය අනුපාතයේ සංවේදීතාවය

	2020 ලාභයේ වැඩිවීම/(අඩුවීම) ශ්‍රී ලංකා රුපියල්	2019 ලාභයේ වැඩිවීම/(අඩුවීම) ශ්‍රී ලංකා රුපියල්
ජපන් යෙන් වලින් 10% ක වැඩිවීම / අඩුවීම (2019 - 10%)	**(135,300,569)**	(18,666,560)
ජපන් යෙන් 15% ක වැඩිවීම / අඩුවීම (2019 - 15%)	**(202,950,854)**	(27,999,840)
ජපන් යෙන් 20% ක වැඩිවීම / අඩුවීම (2019 - 20%)	**(270,601,138)**	(37,333,120)

2020 දෙසැම්බර් 31 සහ 2019 දෙසැම්බර් 31 දිනට තෝලන අනුපාතය අනුපාතය පහත පරිදි විය:

	සමාගම	
	2020	2019
මුළු ණය ගැනීම් (සටහන 21 සහ සටහන 22)	**51,172,796,305**	51,560,331,853
අඩුකලා: මුදල් සහ මුදල් සමාන දෑ (සටහන 17)	**(826,225,883)**	(2,479,942,157)
අඩුකලා: කෙටි කාලීන බැංකු තැන්පතු	**(41,932,637,264)**	(43,384,359,019)
ශුද්ධ ණය	**8,413,933,157**	5,696,030,677
මුළු හිමිකම්	**36,982,901,557**	39,230,657,250
මුළු ප්‍රාග්ධනය	**45,396,834,714**	44,926,687,927
තෝලන අනුපාතය	**19%**	13%

ඉහත සඳහන් ණය ගැනීම් සම්පූර්ණයෙන්ම මහා භාණ්ඩාගාරය හරහා බ.ජා.ගු, ර.ගු. සහ ම.රා.ජා.ගු සංවර්ධනය සඳහා රන් පවුම් සහතික මත ලබාගත් ණය වලින් සමන්විත වේ. මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපළේ කොන්ත්‍රාත්කරුගේ හිඟ ශේෂය පියවීම සහ ලංකා බැංකුවෙන් ලබාගත් ණය පියවීම සඳහා ණයකර නිකුත් කර ඇත. වට්ටම් කිරීමේ බලපෑම සැලකිය යුතු නොවන බැවින් ණය ගැනීම්වල සාධාරණ අගය ඒවායේ ධාරණ අගයට සමාන වේ.

3.3. සාධාරණ අගය ඇස්තමේන්තු කිරීම

සාධාරණ අගය මත මනින ලද මූල්‍ය උපකරණ සමාගම සතුව නොතිබුණි.

4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

ඇස්තමේන්තු සහ විනිශ්චයන් අඛණ්ඩව ඇගයීමට ලක් කෙරෙන අතර වෙතිහාසික අත්දැකීම් සහ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ඇතුළු අනෙකුත් සාධක මත පදනම් වේ.

තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ උපකල්පන

සමාගම අනාගතය සම්බන්ධයෙන් ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කරයි. අර්ථදැක්වීම අනුව ගිණුම්කරණ ඇස්තමේන්තු, ප්‍රතිඵල කලාතුරකින් අදාළ සැබෑ ප්‍රතිඵල සමාන වනු ඇත. ඉදිරි මූල්‍ය වර්ෂය තුළ වත්කම් සහ වගකීම් වල ධාරණ අගයට ප්‍රමාණාත්මක ගැලපීමක් ඇති කිරීමේ සැලකිය යුතු අවදානමක් ඇති ඇස්තමේන්තු සහ උපකල්පන පහත දක්වා ඇත.

